325 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 325 - இல. 06
Volume 325 - No. 06

2026 පෙබරවාරි 19වන බ්‍රහස්පතින්දා
2026 பெப்ருவரி 19, வியாழக்கிழமை
Thursday, 19th February, 2026


# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1025]

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1027]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1029-1069]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

අපරාධ මැඩලීම සඳහා රාජ්‍ය ආරක්ෂක යාන්ත්‍රණය ශක්තිමත් කිරීම [තීරුව 1069]

මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් වෙන් කිරීම හේතුවෙන් උතුරු හා නැඟෙනහිර ජන සනත්වයට ඇති කරන බලපෑම [තීරුව 1073]

**2022 අප්‍රේල් මාසයේදී මූල්‍ය බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමේ නීතිමය පදනම:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1079]

**වරප්‍රසාද:**

සභා ගර්භය තුළ විපක්ෂ නායකවරයා සමඟ කළ සංවාදය වීඩියෝගත කර ප්‍රසිද්ධ කිරීම [තීරුව 1088]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) - [ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය] - පළමුවන වර කියවන ලදී [තීරුව 1091]

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 1093-1199]

**විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරුව 1199]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 1201-1206]


# பிரதான உள்ளடக்கம்


**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1025]

**அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை** [ப: 1027]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1029-1069]

**தனி அறிவித்தல் மூல வினா:**

குற்றச் செயல்களை ஒடுக்குவதற்கு அரச பாதுகாப்புப் பொறிமுறையை வலுப்படுத்தல் [ப: 1069]

மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழான நில ஒதுக்கீடு வடக்கு, கிழக்கு மக்களின் குடிப்பரம்பல் மீது ஏற்படுத்தும் தாக்கம் [ப: 1073]

**2022, ஏப்பிரலில் நிதி திவால்நிலையை அறிவித்தமைக்கான சட்ட அடிப்படை:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1079]

**சிறப்புரிமை:**

சபையில் எதிர்க்கட்சித் தலைவருடன் நிகழ்ந்த உரையாடலின் காணொளிப் பதிவை வெளியிட்டமை [ப: 1088]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

கண்டிய திருமண, மணநீக்க (திருத்தம்) - [மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1091]

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1093-1199]

**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1199]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1201-1206]


# PRINCIPAL CONTENTS


AUDITOR-GENERAL'S REPORT [Col. 1025]

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 1027]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1029-1069]

QUESTION BY PRIVATE NOTICE:

Strengthening State Security Mechanism to Suppress Crimes [Col. 1069]

Impact on Demography of North and East Due to Land Allocation Made under Mahaweli Development Project [Col. 1073]

LEGAL BASIS OF DECLARING FINANCIAL BANKRUPTCY IN APRIL, 2022:

Statement by Deputy Minister of Finance and Planning [Col. 1079]

PRIVILEGE:

Release of Video Recording of Conversation with Leader of the Opposition in Chamber [Col. 1088]

PRIVATE MEMBERS' BILLS:

Kandyan Marriage and Divorce (Amendment) - [The Hon. (Mrs.) Rohini Kumari Wijerathna] - Read the First time [Col. 1091]

JUDICATURE (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed [Cols. 1093-1199]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended [Col. 1199]

ADJOURNMENT QUESTIONS [Cols. 1201-1206]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 පෙබරවාරි 19වන බ්‍රහස්පතින්දා***
*2026 பெப்ருவரி 19, வியாழக்கிழமை*
*Thursday, 19th February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XL කොටස;
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLVII කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXII, LXIII, LXIV හා LXV කොටස්;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIX කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIII හා LIV කොටස්; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXVI, XXXVII, XXXVIII, XXXIX, XL, XLI, XLII හා XLIII කොටස්, තෙවැනි කාණ්ඩයේ XXV හා XXVI කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXIII, XXIV, XXV, XXVI, XXVII හා XXVIII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Report on the Deviation of Headline Inflation from the Inflation Target Set Out in the Monetary Policy Framework Agreement for the second and third quarters of the year 2025.

I move that this Report be referred to Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, 2024ஆம் ஆண்டுக்கான இலங்கை தேசிய நீரியல் வாழ் செய்கை அபிவிருத்தி அதிகார சபையின் வருடாந்த அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, දසවන පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 17වන වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් මම ඉදිරිපත් කරන අතර, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් කළ යුතුව තිබෙනවා. ඒ සඳහා මට විනාඩි දෙකක් දෙන්න. විශේෂයෙන්ම මා මෙම වාර්තාව ඉදිරිපත් කරන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධව අපි කරන ලද විමර්ශනයේ ප්‍රතිඵලය මත. මෙම බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මඟින් තමයි ස්ථාපනය කර තිබෙන්නේ. 2025 සැප්තැම්බර් 30 දිනට බැංකුව විසින් නිකුත් කර තිබෙන රුපියල් මිලියන පහට වැඩි ණයවල අය විය යුතු ශේෂය පිළිබඳව අපි සොයා බැලුවා. ඒ යටතේ තිබෙනවා, රුපියල් මිලියන 96,046ක්. එයින් රුපියල් මිලියන 7,972ක් අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කරලා තිබුණා.

ඒ අතරින් විශාලතම ණය, ඒ කියන්නේ ප්‍රධාන loans හතරක් පිළිබඳව අපි බැලුවා. ඒ non-performing loans හතර ගැන කිව්වොත්, RPI (Pvt.) Limited කියන මාලදිවයින් සමාගමකට දුන් ඩොලර් මිලියන 9ක ණය, Technopark Development Company එකට දුන් රුපියල් මිලියන 750ක ණය, ඊළඟට Bimputh Finance PLC එකට - ඒක ඇත්තටම ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන සමාගමක් - 2016දී දුන් රුපියල් මිලියන 200ක් සහ 2019දී දුන් රුපියල් මිලියන 100ක ණයක් තිබෙනවා. ඒ අය ණය ගන්නේ ආයතනික ඇපකරයක් - corporate guarantee එකක් - තියලා. ඒ කියන්නේ, Daya Group of Companies තමයි Bimputh Finance PLC එකට ණය දෙන්න ඇප වෙන්නේ.

නමුත්, මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. 2025 පෙබරවාරි මාසයේ දී කොළඹ වාණිජ මහාධිකරණය මඟින් මේ සමාගම ඇවර කරන්න - wind up කරන්න - liquidation order එකක් දෙනවා. HDFC බැංකුවෙන් නඩුවක් පවරලා තිබෙනවා, මේ Bimputh Finance PLC එක රුපියල් මිලියන 350කට අධික ණයක් ගෙවලා නැහැ කියලා. එම නඩුව සම්බන්ධයෙන් තමයි කොළඹ වාණිජ මහාධිකරණය මේ liquidation order එක දෙන්නේ. හැබැයි, මේ liquidation order එක ඇවිල්ලා මෙම winding up ක්‍රියාවලිය සිදු වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව - NSB එක - මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැහැ. ඒ නිසා, තමන් විසින් දෙන ලද ණය මුදල සහ පොලිය දිගින් දිගටම අය කර ගැනීමක් සිදු කරලා නැහැ. අන්තිමට කොහොම හරි රුපියල් මිලියන 258කට වැඩි ප්‍රමාණයක ණයක් ගෙවන්න ඉතිරිව තිබිය දී තමයි මේ සමාගම wind up කරන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම 2018 ජූනි මාසයේ RPI (Pvt.) Limited කියන මාලදිවයිනේ ලියාපදිංචි සමාගමකට ඇමෙරිකානු ඩොලර් මිලියන 9ක loan එකක් දී තිබෙනවා. ඇත්තටම ඒක දෙන්නේ මහජන බැංකුවත් එක්ක එකතු වෙලා. ඒ කියන්නේ, syndicated loan එකක් විධියට තමයි ඒක දෙන්නේ. මහජන බැංකුව ඩොලර් මිලියනයකුත්, මේ ආයතනයෙන් ඩොලර් මිලියන 9කුත් දෙනවා. ඇත්ත ප්‍රශ්නය, NSB එකට විදේශ සමාගමකට මෙහෙම ණයක් දෙන්න බැඳීමක් නොමැති වීමයි. ඒ නිසා තමයි ඒක syndicated loan එකක් විධියට දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ පැහැදිලි කිරීම අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, විනාඩියක් දෙන්න, මේ කාරණාව සම්පූර්ණ කර මගේ කරුණු පැහැදිලි කිරීම ඉක්මනින් අවසන් කරනවා.

එහෙම සමාගමක් නැතිව තිබියදීත් ණය දීලා කිසිම ප්‍රාග්ධන මුදලක් නැවත ගෙවලා නැහැ. අන්තිමට ඩොලර් මිලියන 14.73ක් දක්වා මේක වැඩි වනවා. ණය සහන කාලයන් දෙනවා; ඒවා දීර්ඝ කරනවා. නමුත් ලබා ගැනීමේ ක්‍රමයක් නැහැ. අන්තිමට ඒ ආයතනය මාලදිවයින ඇතුළේ ඉදිකරපු villa එකකුත් නැහැ. Water villa කියන කොටසේ physical progress එක සියයට බින්දුවක්ව තිබියදී තමයි මේ ණය දෙන්නේ. මෙවැනි ගැටලු ගණනාවක් සහිතව තමයි NSB එක කටයුතු කළේ. මේ පිළිබඳව විශේෂයෙන්ම සොයා බලා කටයුතු කරන්න කියන නිර්දේශය අපි මේ වාර්තාවත් සමඟ ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විශාල කාර්යභාරයක් සිදු කරනවා. මේ හෙළිදරව් කරපු කරුණුත් වැදගත්. එම නිසා ආණ්ඩු පක්ෂය පැත්තෙන්, එහෙම නැත්නම් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පැත්තෙන් ඉදිරිපත් කිරීමක් කරනවා නම් අපි කැමැතියි, මේ පිළිබඳව සුදුසු පාර්ලිමේන්තු දවසක අවශ්‍ය විවාදයක් ලබා දීලා ගරු සභාපතිතුමා ඉදිරිපත් කරපු කරුණු විශ්ලේෂණාත්මකව කථා කරන්න.

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) රන්න, කහඳාව, අංක 91 යන ලිපිනයෙහි පදිංචි එච්.එච්. සමන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කතරගම, දෙටගමුව, දෙවන පෙළ, අංක 66/2 යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ.සී. ප්‍රියදර්ශන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මාමඩල, පල්ලෙරොට, අංක 293 යන ලිපිනයෙහි පදිංචි ආර්.ඒ. විජිත කුමාර රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මතුගම, අලුත්ගම පාර, නොම්මර 143/10 යන ලිපිනයෙහි පදිංචි කේ.ටී. අමරාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දර්ගා නගරය, අධිකාරීගොඩ, නාසිම් මාවත, අංක 89/20 යන ලිපිනයෙහි පදිංචි එම්.එන්.එම්. ෆස්මින් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

Hon. Speaker, I present a petition from Mr. K.G.C.M. Gamage of No. 16/6 B, Hospital Road, Ratnapura.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -22/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්: වැටුප් සහ දීමනා
### தற்போதைய பாராளுமன்ற உறுப்பினர்கள்: ஊதியங்கள் மற்றும் கொடுப்பனவுகள்
### MEMBERS OF CURRENT PARLIAMENT: SALARIES AND ALLOWANCES

117/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වන විට ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iii) වැටුප් හා දීමනා නොගන්නා මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் பாராளுமன்றத்தை பிரதிநிதித்துவப் படுத்தும் உறுப்பினர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) பாராளுமன்ற உறுப்பினர்களுக்குத் தற்போது செலுத்தப்படும் ஊதியங்கள் மற்றும் கொடுப் பனவுகள் யாவை என்பதையும்;

(iii) ஊதியங்கள் மற்றும் கொடுப்பனவுகளைப் பெற்றுக்கொள்ளாத உறுப்பினர்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) names of the Members of Parliament who represent Parliament at present;

(ii) amounts paid as salaries and allowances at present to Members of Parliament; and

(iii) names of the Members of Parliament who forgo their salaries and allowances?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ග/.ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (අ) (i) ඇමුණුම I මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම I **සභාගත*** කරමි.

(ii)
- මාසික දීමනාව - රුපියල් 54,285යි.
- මාසික සංග්‍රහ දීමනාව - රුපියල් 1,000යි.
- රියැදුරු දීමනාව - මාසිකව රුපියල් 3,500යි.

(මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය මඟින් රියැදුරෙකු ලබාගතහොත් එම මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුව මඟින් රියැදුරු දීමනාවක් ගෙවනු නොලැබේ.)

- දුරකථන දීමනාව - රුපියල් 50,000යි.
- ප්‍රවාහන දීමනාව - රුපියල් 15,000යි.
- කාර්යාල දීමනාව - රුපියල් 100,000යි.
- රැස්වීම් දීමනාව - දිනකට රුපියල් 2,500යි.

(පාර්ලිමේන්තු රැස්වීම් දිනකට සහභාගි වීම වෙනුවෙන් දිනකට රුපියල් 2,500 බැගින් ගෙවනු ලැබේ.)

- කාරක සභා දීමනාව - දිනකට රුපියල් 2,500යි.

---

***** **පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

(පාර්ලිමේන්තු රැස්වීම් නොපැවැත්වෙන දිනයකදී කාරක සභා රැස්වීමකට සහභාගි වීම සඳහා එක් දිනකට රුපියල් 2,500 බැගින් ගෙවනු ලැබේ.)

- ඉන්ධන දීමනාව

එක් එක් මන්ත්‍රීවරයා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සිට පාර්ලිමේන්තුවට පැමිණීම වෙනුවෙන් ඔවුන් නියෝජනය කරන මැතිවරණ දිස්ත්‍රික්කයට පාර්ලිමේන්තුවේ සිට ඇති දුර ප්‍රමාණය පදනම් කරගෙන සහ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන්ට ඩීසල් ලීටර් 419.76ක ප්‍රමාණයක් පදනම් කර ගනිමින් සෑම මාසයකම පළමු වන දිනට වෙළෙඳ පොළේ ඩීසල් ලීටරයක අනුමත මිල ගණන් අනුව, ඇමුණුම IIහි සඳහන් ආකාරයට, ඉන්ධන දීමනාව ගෙවනු ලැබේ.

ඇමුණුම II

ඉන්ධන දීමනාව

| මන්ත්‍රීවරයා තේරී පත්වූ දිස්ත්‍රික්කය | එක් මන්ත්‍රීවරයෙකුට ලබා දෙන ඉන්ධන (ඩීසල්) ප්‍රමාණය | |
|---|---|---|
| කොළඹ | 283.94 | සෑම මාසයකම 01 (පළමු) වන දිනට වෙළඳපොලේ ඩීසල් ලීටරයක අනුමත මිල ගණන් අනුව එක් එක් මන්ත්‍රීවරයා මැතිවරණයෙන් පත්වූ මැතිවරණ දිස්ත්‍රික්කයට පාර්ලිමේන්තුවේ සිට ඇති දුර ප්‍රමාණය පදනම් කරගෙන සහ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන්ට නිශ්චිත ඩීසල් ලීටර් ප්‍රමාණයක් පදනම් කර ගනිමින් ඉන්ධන දීමනාව ගෙවනු ලැබේ. |
| ගම්පහ | 355.58 | |
| කළුතර | | |
| කෑගල්ල | 426.35 | |
| කුරුණෑගල | | |
| රත්නපුර | | |
| ගාල්ල | | |
| මහනුවර | | |
| මාතලේ | 497.12 | |
| පුත්තලම | | |
| මාතර | | |
| නුවර එළිය | | |
| පොළොන්නරුව | 568.76 | |
| බදුල්ල | | |
| හම්බන්තොට | | |
| වන්නි | | |
| මොණරාගල | | |
| අනුරාධපුර | | |
| ත්‍රිකුණාමලය | | |
| මඩකලපුව | 639.53 | |
| දිගාමඩුල්ල | | |
| යාපනය | | |
| ජාතික ලැයිස්තුව | 419.76 | |

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි වැටුප් හා දීමනා ලබා නොගන්නා බවට, 2025.08.20 දිනැති ලිපිය මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නයන වාසලතිලක මහතා විසින් කරන ලද ලිඛිත දැනුම් දීම අනුව 2025 අගෝස්තු මස සිට වැටුප් හා දීමනා ගෙවීම නතර කර ඇත.

තවද, පාර්ලිමේන්තුව මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා අතරින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225ටම ගෙවනු ලබන ඉන්ධන දීමනාව ලබා නොගන්නා බවට ඇමුණුම IIIහි සඳහන් කර ඇති ගරු අග්‍රාමාත්‍යතුමිය, ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය, අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන් විසින් පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයට ලිඛිතව දැනුම් දී ඇති අතර මේ වන විට ඔවුන්ට එම ඉන්ධන දීමනාව පාර්ලිමේන්තුවෙන් ගෙවනු නොලැබේ.

ඇමුණුම III

1. ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා, පා.ම., කථානායකතුමා
2. ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා, පා.ම., නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා
3. ගරු හේමාලි වීරසේකර මහත්මිය, පා.ම., නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
4. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය පා.ම., අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය
5. ගරු බිමල් රත්නායක මහතා, පා.ම., ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා
6. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, පා.ම., සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා
7. ගරු විජිත හේරත් මහතා, පා.ම., විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා
8. ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා, පා.ම., කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා
9. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා
10. ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා, පා.ම., වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා
11. ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා, පා.ම., ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා
12. ගරු වසන්ත සමරසිංහ මහතා, පා.ම., වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා
13. ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා, පා.ම., රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා
14. ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා, පා.ම., විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා
15. ගරු අනුර කරුණාතිලක මහතා, පා.ම., වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා
16. ගරු සුනිල් කුමාර ගමගේ මහතා, පා.ම., තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා
17. ගරු කුමාර ජයකොඩි මහතා, පා.ම., බලශක්ති අමාත්‍යතුමා
18. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා, පා.ම., කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා
19. ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මහතා, පා.ම., අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා
20. ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා, පා.ම., පරිසර අමාත්‍යතුමා
21. ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා, පා.ම., ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා
22. ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය, පා.ම., කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය
23. ගරු ආනන්ද විජේපාල මහතා, පා.ම., මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා
24. ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා, පා.ම., බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා
25. ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා, පා.ම., නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා
26. ගරු සජිත් ප්‍රේමදාස මහතා, පා.ම., පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
27. ගරු නාමල් කරුණාරත්න මහතා, පා.ම., කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා
28. ගරු චතුරංග අබේසිංහ මහතා, පා.ම., කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා
29. ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා, පා.ම., වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා
30. ගරු රත්න ගමගේ මහතා, පා.ම., ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා
31. ගරු එරංග ගුණසේකර මහතා, පා.ම., නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා
32. ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා, පා.ම., ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා
33. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම., පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා
34. ගරු ආර්.එම්. ජයවර්ධන මහතා, පා.ම., වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා
35. ගරු මහින්ද ජයසිංහ මහතා, පා.ම., කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා
36. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම., ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා
37. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම., ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා
38. ගරු ගමගෙදර දිසානායක මහතා, පා.ම., බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා
39. ගරු වසන්ත පියතිස්ස මහතා, පා.ම., ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා
40. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම., වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා
41. ගරු මුනීර් මුලාෆර් මහතා, පා.ම., ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා
42. ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා, පා.ම., සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා
43. ගරු (නීතිඥ) සුනිල් වටගල මහතා, පා.ම., මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා
44. ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා, පා.ම., සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා
45. ගරු එරංග වීරරත්න මහතා, පා.ම., ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා
46. ගරු උපාලි සමරසිංහ මහතා, පා.ම., සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා
47. ගරු ටී. බී. සරත් මහතා, පා.ම., නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා
48. ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා, පා.ම., කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා
49. ගරු පී. රුවන් සෙනරත් මහතා, පා.ම., පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

50. ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා, පා.ම., අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා
51. ගරු අරුන් හේමචන්ද්‍ර මහතා, පා.ම., විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා
52. ගරු නලින් හේවගේ මහතා, පා.ම., වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා
53. ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය, පා.ම., ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය
54. ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම., බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා
55. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම., ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා
56. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම., තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා
57. ගරු නිශාන්ත ජයවීර මහතා, පා.ම., ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා
58. ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම.,විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා
59. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම., පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකතුමා
60. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.,පාර්ලිමේන්තුවේ විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකතුමා

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පිළිතුර ලබා දීම පිළිබඳව ගරු අගමැතිතුමියට මම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, ඇත්තටම මම මේ ප්‍රශ්නය අහන්න මුල් කර ගත්තේ දසවන පාර්ලිමේන්තුව, ඒ කියන්නේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් අදාළ කරගෙනයි. එම ජන වරමේ එක කාරණයක් හැටියට, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කිසිම මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තු වැටුප ගන්නේ නැහැ කියනවා අපි දැක්කා. හැබැයි, අද ඔබතුමිය ඔප්පු කර පෙන්නුවා, සමගි ජන බලවේගයේ නයන වාසලතිලක මන්ත්‍රීතුමා හැර සෙසු සියලුම මන්ත්‍රීවරු, ඒ කියන්නේ අනෙක් මන්ත්‍රීවරු 224දෙනාම ඉන්ධන දීමනා හැර වැටුප ගන්නවාය කියලා.

එක පැත්තකින් ඔබතුමියලා ජන වරම ගැන කථා කරනවා. ඒක බොහොම හොඳයි. හැබැයි, ඒ ජන වරම ඇතුළේ තිබුණා, වැටුප් රහිතව මේ පාර්ලිමේන්තුව තුළ ස්වේච්ඡාවෙන් වැඩ කරන්න කැමති කට්ටිය ඉන්නවාය කියන එක. ගරු කථානායකතුමනි, අද දින අපට ඔප්පු කරන්න හැකියාව ලැබුණා, සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක් හැර අනෙක් මන්ත්‍රීවරු 224දෙනාම පාර්ලිමේන්තු වැටුප ගන්නවාය කියන කාරණය.

ගරු අගමැතිතුමියනි, දැන් මගේ ළඟ තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණ හැටියට -ජාතික ජන බලවේගය හැටියට නොවෙයි- මැතිවරණ කොමිසමට ලබා දුන් 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රකාශය. ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා මට මේක කියවන්න වෙනවා. මන්ත්‍රී වැටුප් හා දීමනා පිළිබඳව මෙහි සඳහන් වෙනවා. 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒ අයගේ මන්ත්‍රී වැටුප් හා දීමනා හැටියට සඳහන් කර තිබෙනවා, රුපියල් 4,028,397ක්. පාර්ලිමේන්තු මන්ත්‍රී වැටුප්, පළාත් සභා මන්ත්‍රී වැටුප්, පළාත් පාලන මන්ත්‍රී දීමනා, මන්ත්‍රී විශ්‍රාම වැටුප්, පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල දීමනා, පළාත් සභා මන්ත්‍රී කාර්ය මණ්ඩල දීමනා, මන්ත්‍රීවරුන් වාහන විකුණා කරන ලද පරිත්‍යාග, සාමාජික මුදල් හා ප්‍රදානයන්, පූර්ණ සාමාජික, ශාඛා සමිති සාමාජික ගාස්තු, හිතවතුන්ගෙන් ලැබෙන ප්‍රදානයන්, මැතිවරණ ආධාර, ප්‍රකාශන සඳහා ලැබීම් ආදී වශයෙන් මුළු ලැබීම් කියලා ගණනක් සඳහන් වෙනවා, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, ලැබීම් හැටියට ලැබුණු මුදල.

ගරු අගමැතිතුමියනි, ගෙවීම් යටතේ කාර්යාල නඩත්තු, වාහන නඩත්තු, ප්‍රචාරණ කටයුතු, මැතිවරණ කටයුතු වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය තිබෙනවා. නමුත්, මම කාලය ඉතුරු කර ගන්න ඕනෑ නිසා ඒ ගැන කියන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එතකොට මේ සභාවේ කාලයත් ඉතුරු වෙනවා නේ.

ඒ වාගේම නීති කටයුතු, විදේශ ගමන් සඳහා වියදම්, බැංකු ගාස්තු, විගණක ගාස්තු, ධනයෝජන ගිණුමට මාරු කිරීම, නව ඉදිකිරීම් - ගෙවල් හදන්න වාගේ ඒවාට දෙන බව තමයි හැඟෙන්නේ - රක්ෂණ ගාස්තු, වාහන බදු, තෙකලා විදුලි රැහැන් ඇදීම සඳහා, සුබසාධන කටයුතු, වෙනත් ගෙවීම් කියලා මුළු ගෙවීම් දාලා තිබෙනවා. ගරු කථානායකතුමනි, 2015දී ප්‍රාදේශීය සභා, පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබුණු දිරි දීමනා සහ වැටුප් සියල්ල අරමුදලකට යනවා. ඒ අරමුදලෙන්, ගරු මන්ත්‍රීවරුන්ගේ වැසිකිළිය සේදීම හැර අනෙක් සියලු දෙයම කෙරෙනවා කියන කාරණය තමයි මේකෙන් තහවුරු වෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම අතුරු ප්‍රශ්නය අහන්නම්, ගරු කථානායකතුමනි. ගරු අගමැතිතුමියනි, මීට දින තුනකට කලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහිමි කළා. ඒක හොඳයි. රජයේ බදු මුදල්වලින් ලබා දෙන වැටුප් සහ දීමනා සියල්ල අරගෙන ඒ මන්ත්‍රීවරයාගේ සියලු සුබසාධන කටයුතු කරනවා. එතකොට ඒ මන්ත්‍රීවරයාට විශ්‍රාම වැටුපක් ඕනෑ නැහැ. දැන් ජාතික ජන බලවේගයේ කට්ටිය මේ කාරණය තේරුම් ගන්න. ඔබට එහෙම දෙනවාද කියන එකයි මම මේ අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය සඳහා විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ජාතික ජන බලවේගයේ උදවියටත් විශ්‍රාම වැටුපක් නොලැබුණාට මේ ගෙවීම් සියල්ල කෙරුණාම මන්ත්‍රී ධුරයේ නොසිටියත් ඔවුන්ව රැක බලා ගන්න පුළුවන්.

ඔබ පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත ගෙනැල්ලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහිමි කළා කියන කාරණය රටට පෙන්නුවා. නමුත්, ජාතික ජන බලවේගය සහ JVP එකේ සියලු මන්ත්‍රීවරු තමන් පෝෂණය කරලා රැක බලා ගන්නා වැඩ පිළිවෙළට අවශ්‍ය මුදල් ඒ අනුව තමන්ගේ අරමුදලින් ලබා ගන්න කටයුතු කරනවා නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මම චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා රටට පෙන්වා දුන්නා, ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික ජන බලවේගයත් කාලයක් තිස්සේ ඉතාම විනිවිදභාවයකින් accounts පවත්වාගෙන ගිය බව. ඒක මුළු රටටම පෙන්වා දුන් එක ගැන මම එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම යෝජනා කරනවා, සමගි ජන බලවේගය, එක්සත් ජාතික පක්ෂය, පොහොට්ටුව වැනි පක්ෂවල accounts ගැනත් මෙහෙම කථා කරනවා නම් ගොඩක් හොඳයි කියලා. එතකොට අපට සන්සන්දනය කරලා බලන්න පුළුවන් වාගේම කථා කරන්න පුළුවන්, පක්ෂ අරමුදල් කොහොමද එකතු වෙන්නේ, පක්ෂ අරමුදල්වලින් මොනවාද කෙරෙන්නේ කියලා.

**[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]**

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ කාලයක් තිස්සේ මන්ත්‍රී වැටුප හෝ මොනම දීමනාවක්වත් පෞද්ගලිකව ගන්නේ නැහැ, ඒක පක්ෂ අරමුදලකට යනවා කියන එක රටට රහසක් නොවෙයි. ඒක මුළු රටේම මිනිස්සු දන්නවා. ඒක අලුත් කාරණයකුත් නොවෙයි. ඒ වාගේම ඒක විශේෂයෙන් කියන්න ඕනෑ දෙයකුත් නොවෙයි. ඒ විධියටම තමයි ජාතික ජන බලවේගයත් වැඩ කරන්නේ. ඒකත් අලුත් දෙයක් නොවෙයි. ඒක තමයි අපේ දේශපාලන ව්‍යාපාරයේ සංස්කෘතිය. ඒ සංස්කෘතිය අනුව තමයි මේ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉන්න අපේ මන්ත්‍රීවරු සියලුදෙනාත් වැඩ කරන්නේ.

ගරු කථානායකතුමනි, එතුමා අහන ප්‍රශ්නය මොකක්ද, මොන ප්‍රශ්නයටද මම උත්තර දෙන්න ඕනෑ කියන එක මට පැහැදිලි නැහැ. අපි ජීවත් වන ක්‍රමය කොහොමද කිව්වොත්, අපි එකිනෙකා වෙනස්. එකිනෙකාගේ පෞද්ගලිකතා, 159දෙනෙකුගේ ජීවිත කථා මට මේ සභාවේ කියන්න බැහැ නේ, ගරු කථානායකතුමනි. අපි 159දෙනා කොහොම හරි ජීවත් වෙනවා. එච්චරයි මට ඒ ගැන කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මෙතුමියලාගේ සංස්කෘතියේ තිබෙන දෙයක් තමයි, බොරු කියන එක. ඒ අයව රැක බලා ගන්නා ක්‍රමවේදය තමයි මම පැහැදිලි කළේ. ඒ කියන්නේ ඔබට, අපට වැටුප ලැබෙන්නේ බදු මුදලින්. එතකොට ඒ බදු මුදල මන්ත්‍රීවරුන් ගන්නේ නැහැ, පක්ෂ අරමුදලට යනවා කිව්වාට මේ පාර්ලිමේන්තුවේ BoC account එක check කළාම, තිබෙන්නේ මන්ත්‍රීවරයාගේ account එක. එතුමා තමයි cheque එක දෙන්නේ. ඒකෙන් දෙන්නේ භාගයයි. ඒක තමයි යථාර්ථය. ඒකෙන් යම් කිසි මුදලක් තබාගෙන ඉතිරි මුදල දෙනවා. එතකොට, වැටුප ගන්නේ නැහැ කියන කාරණය බොරුවක්. *[බාධා කිරීම්]* හරි, මම ඔප්පු කරලා පෙන්වන්නම්.

ඊළඟට ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* කෑගහන්න එපා. ඔබතුමන්ලා වැටුප් ගන්නවා නේ. ආණ්ඩුවේ ඉන්න ඔබතුමන්ලා වැටුප් ගන්නවා නේ. වැටුප් ගන්නේ නැහැ කිව්වා නේ. දැන් දුකයි. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, සභාව නිහඬ කරලා දෙන්න. මෙතුමන්ලා වැටුප ගන්නේ නැහැ කියලා, දැන් වැටුප් ගන්නවා කියලා අනාවරණය වුණාම දුකයි. *[බාධා කිරීම්]* සභාව නිහඬ කරලා දෙන්න, ප්‍රශ්නය අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය දැන් උත්තර දීලා කියනවා, මම අහපු ප්‍රශ්නය තේරෙන්නේ නැහැ කියලා. නොතේරෙන්න හේතුවකුත් නැහැ. ගරු අගමැතිතුමියනි, මට දෙවැනි වතාවටත් අහන්න තිබෙන්නේ ඒකම තමයි. මම කිව්වේ, ඔබතුමියලා විශ්‍රාම වැටුප අහෝසි කරලා, රටට ලෝකයට වසන් කරලා මේ වැටුප, දිරි දීමනා සියල්ල එකතු කරලා, වංචා සහගතව රටේ ජනතාව දේශපාලන වශයෙන් මුළා කරලා, මේ මන්ත්‍රීවරුන් ඒ බදු මුදලින් ලැබෙන වැටුප්වලින් පෝෂණය කරන ක්‍රමවේදය හදලා ඉවරයි. ඔබ කිව්වේ, විශ්‍රාම ගියාට පස්සේ බදු මුදලින් විශ්‍රාම වැටුප් ගන්න ඕනෑ නැහැ කියලා නේ. හැබැයි, මේ කාරණය හරහා පෙනෙන්නේ නැද්ද, දැනෙන්නේ නැද්ද, තේරෙන්නේ නැද්ද, ඔබතුමන්ලා මේ මුදල එකතු කරලා ගිණුම්වල දමාගෙන, මේ මන්ත්‍රීවරුන් පෝෂණය කරනවා, ඔවුන්ට විශ්‍රාම වැටුපක් හදලා තිබෙනවා කියලා?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එතැන ප්‍රශ්නයක් නැහැ. ඉතින් මට උත්තර දෙන්න දෙයකුත් නැහැ. මොකද, ප්‍රශ්නයක් මතු කළේ නැහැ නේ. ගරු මන්ත්‍රීතුමා කථාවක් නේ කළේ. මේ සතිය පුරාම දිගින් දිගටම අපි දැක්කේ, මෙතුමන්ලාට තේරුම් ගන්න බැරි අපේ දේශපාලන සංස්කෘතිය, අපේ භාවිතාව සහ ඊට හාත්පසින්ම වෙනස් දේශපාලන ව්‍යාපාර, රටේ ජනතාවගේ මුදල් අවභාවිත කරමින් ගන්නා ලද තීන්දු තීරණ අතර සට්ටනය නේ. හිතේ තිබෙන ප්‍රශ්නය තමයි මේ එළියට එන්නේ. ඒ නිසා නේ කොහොම හරි මේ 159දෙනාගේ මොකක් හරි වැරැද්දක් හොයන්න මෙච්චර දඟලන්නේ. මම හිතන විධියට, මේ කියන කරුණු මොකක්වත් ජනතාවට නම් අලුත් නැහැ. එතුමා ප්‍රශ්නයක් ඇහුවේත් නැහැ. ඉතින් මට ඇත්තටම උත්තරයක් දෙන්න විධියකුත් නැහැ. මොකද, ප්‍රශ්නයක් නැතුව මට උත්තර දෙන්න බැහැ නේ.

## මඩකලපුව පෝරතිවුපත්තු සහ මන්මුනෙපත්තු ප්‍රා.ලේ. කොට්ඨාස: පානීය ජල පහසුකම්
## மட்டக்களப்பு, போரதீவுப்பற்று மற்றும் மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவுகள்: குடிநீர் வசதிகள்
## PORATIVU PATTU AND MANMUNAI PATTU DS DIVISIONS, BATTICALOA: DRINKING WATER FACILITIES

353/2024

**3. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාක්කාච්චිවට්ටෙයි, විලාන්තෝට්ටම්, දික්කෝඩෙ-දුම්බාලෙයි සහ මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරාන්කුලම්-ධර්මපුරම් යන ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில், போரதீவுப்பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட காக்காச்சி வட்டை, விளாந்தோட்டம், திக்கோடை - தும்பாளை மற்றும் மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கிரான்குளம் - தர்மபுரம் ஆகிய பிரதேசங்களுக்கு குடிநீர் வசதிகளை வழங்க வேண்டும் என்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) ஆமெனில், மேற்படி பிரதேசங்களுக்கு குடிநீர் வசதிகளை வழங்க நடவடிக்கை எடுக்கப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he accepts that drinking water facilities should be provided to the areas of Kakkachchiwattai, Vilanthottam and Dikkodai-Dumbalai in the Porativu Pattu Divisional Secretary's Division and the Kirankulam-Tharmapuram in the Manmunai Pattu Divisional Secretary's Division of the Batticaloa District; and

(ii) if so, whether steps will be taken to provide drinking water facilities to the above-mentioned areas?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

Sir, the Answer is as follows:

(a) (i) Yes. But, some villages are already covered with pipe-borne water supply.

Porativu Pattu DS Division:

- At present, around 80 per cent of the Kakkachiveddai village has been covered. The total number of families living in the pipe-laid area is 345 and out of that, only 196 families have obtained water connections. Others have not applied so far. Further, the balance 3.5 km pipeline has to be laid to cover the uncovered areas of that village, where only 55 families live.
- Vilanthoddam: One hundred per cent of the areas are covered with pipelines and a number of 213 connections have been given. The total number of families living in the pipe-laid area is 234 and others have not applied for water connections so far.
- Thikkodai - Dumbalai: It is technically not feasible to extend the existing pipeline. It is proposed to upgrade the upstream system by steps such as pumping and transmission main in order to extend the pipeline.

Manmunai Pattu DS Division:

- Kirankulam - Dharmapuram: At present, there is no pipeline and a need to extend.

(ii) Steps have been taken to extend the water supply facility to the above areas.

- Kakkachiveddai Village: The balance 3.50 km pipeline has to be laid to cover the uncovered areas of that village, where only 55 families lilve. The pipe laying is proposed under CEDE Project in 2026.
- Vilanthoddam - One hundred per cent of the area is covered.
- Thikkodai - Dumbalai: Without upgrading the upstream system by steps such as pumping and the transmission main, pipeline extension is not feasible. Design works are being carried out for improvement.
- Kirankulam - Dharmapuram: It is proposed to extend the pipeline under CEDE Project in 2026. Accordingly, bids for supply of pipes are under evaluation and the laying contract document is under preparation. It is expected to complete the above work and supply water to above area by the end of this year.

(b) Not relevant.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! நாங்கள் கேட்டுக்கொண்டதற்கு இணங்க, 2025ஆம் ஆண்டு 14 கிலோமீற்றர் வரையான இணைப்புகளை Water Supply and Drainage Board ஊடாகவும், 8 கிலோமீற்றர் வரையான இணைப்புகளை CEDE ஊடாகவும் நீங்கள் பூர்த்திசெய்து தந்திருக்கிறீர்கள். அதற்கு நான் இந்த இடத்தில் நன்றி சொல்ல வேண்டும். அதேபோல், எங்களுடைய கோரிக்கைக்கு இணங்கவும், நாங்கள் தொடர்ச்சியாக மேற்கொண்ட அழுத்தத்தின் காரணமாகவும், இந்த வருடத்தில் ஆரையம்பதியில் 8 கிலோமீற்றரும், கொக்கட்டிச்சோலையில் 10 கிலோமீற்றரும், களுவாஞ்சிக்குடியில் 13 கிலோமீற்றரும், மண்டூரில் 11 கிலோமீற்றரும் என மொத்தம் 42 கிலோமீற்றர் வரையான இணைப்புகளை CEDE ஊடாகவும், 12 கிலோமீற்றர் வரையான இணைப்புகளை Water Supply and Drainage Board ஊடாகவும் செய்து தருவதற்கு நீங்கள் இணங்கி இருக்கிறீர்கள். எது எப்படி இருந்தாலும், நீங்கள் குறிப்பிட்ட தகவல்களில் சில பிழைகள் இருக்கின்றன. மிக முக்கியமாக, காக்காச்சிவட்டை பிரதேசத்தில் புளியடி கிராமம், நெல்லிக்காடு, பாலையடிவட்டை, 37ஆம் கிராமம், 38ஆம்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

கிராமம், வால்கெட்டுக் கிராமம், வாதக்கல்மடு, பன்சேனை போன்ற கிராமங்களில் நீர் வழங்கல் சம்பந்தமான பிரச்சினைகள் இருக்கின்றன.

மிக முக்கியமாக, போரதீவுப்பற்றில் மட்டக்களப்பிலுள்ள Water Supply and Drainage Board ஊடாகவும், அம்பாறையிலுள்ள Water Supply and Drainage Board ஊடாகவும் இணைப்புகள் வழங்கப்பட்டு இருக்கின்றன. காக்காச்சி வட்டையில் மக்கள் குடிநீர் இணைப்புக்கு விண்ணப்பிக்க வில்லையென நீங்கள் சொன்னீர்கள். இந்தப் பிரதேசத்துக்கு water supplyஐப் பெற்றுக்கொடுப்பதற்கு நான் கிட்டத்தட்ட 10 வருடங்களாக முயற்சி எடுத்து வருகின்றேன். இந்தப் பிரதேசத்துக்கு அம்பாறை மாவட்டத்தில் இருந்துதான் water supply வழங்கப்பட வேண்டும். மட்டக்களப்பில் இருந்து water supplyஐ கொடுக்க முடியாது. நீங்கள் சொன்ன திக்கோடை upstream சம்பந்தமான பிரச்சினை காரணமாக அம்பாறை மாவட்டத்தில் இருந்துதான் நீர் வழங்கல் வர வேண்டும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten your explanation.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir. I will ask him the first Supplementary Question.

அம்பாறை மாவட்டம் என்பது பெரியதொரு நிலப்பரப்பைக் கொண்ட ஒரு பிரதேசம். அந்த மாவட்டத்தில் இருக்கின்ற பெரும்பான்மை சமூகத்தினருக்கு குடிநீர் வழங்காமல் தமிழ் மக்களுக்கு குடிநீர் வழங்குவது என்பது நடக்கப்போகின்ற விடயம் அல்ல.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish asking your question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Yes, Sir.

இதற்கொரு மாற்று வழியாக நாங்கள் ஒரு விடயத்தை முன்மொழிந்து இருக்கிறோம். தற்பொழுது மண்டூரில் water supply office இருக்கும் இடத்திலிருந்து புதிய package system ஒன்றைச் செய்தால் நான் மேற்குறிப்பிட்ட பிரதேசங்களுக்கு குடிநீரை வழங்க முடியும். அந்த நிலத்தை வழங்குவதற்கு பிரதேச செயலாளரும் இணங்கியிருக்கிறார். "குடிநீர் இணைப்புக்கு விண்ணப்பித்து பிரயோசனம் இல்லை. ஆகையால், விண்ணப்பிக்காதீர்கள்" என்று Water Supply and Drainage Board சொல்கிறது. ஏனெனில், அதற்கான இணைப்பு அம்பாறையிலிருந்து வர வேண்டும். எனவே, மண்டூரில் water supply package connectionஐச் செய்வதற்கு ஏதாவது ஏற்பாடு செய்யலாமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා සඳහන් කරන ප්‍රදේශ සම්බන්ධයෙන් මට මේ වෙලාවේ ස්ථිරවම උත්තරයක් දෙන්න බැහැ. Water Supply and Drainage Board එකෙන් මට ලබා දුන් තොරතුරු අනුව තමයි මම ඒ පිළිතුර ඉදිරිපත් කළේ. ඇත්තටම දැන් Water Supply and Drainage Board එකෙන් රට පුරා පිරිපහදු කරන වතුර ප්‍රමාණය ගත්තාම, quantity of production සහ demand අතර gap එකක් තිබෙනවා. ඒ කියන්නේ, produce කරන ප්‍රමාණයට වඩා වැඩි demand එකක් ඇවිත් තිබෙනවා. ඒ නිසා බොහෝ ප්‍රදේශවල වතුර දෙන්නේ පැය දෙකයි; වතුර pressure එකත් මදි. ඒ වාගේ තත්ත්වයන් තිබෙන බව අපි දන්නවා. ඒ නිසා තවදුරටත් අම්පාර ප්‍රදේශයෙන් එන වතුර ඔය කියන ප්‍රදේශයට ලබා දෙන්න පුළුවන්ද, බැරිද කියන එක ගැන Water Supply and Drainage Board එකත් එක්ක සාකච්ඡා කර බලන්න වෙනවා.

ඒ වාගේම, ඔබතුමා අර සඳහන් කරපු ප්‍රදේශවලට ජල සම්පාදන කටයුතු කරන්න පුළුවන් කොහොමද කියලා මම Water Supply and Drainage Board එකත් එක්ක කථා කරලා විපරම් කර බලන්නම්. Connections ඉල්ලා නැහැ කියලා Water Supply and Drainage Board එකෙන් සපයන පිළිතුර පිළිබඳවත් ඔබතුමා සෑහීමකට පත් වන්නේ නැත්නම් මම නැවත ඒ ගැන විමසා බලන්නම්, මොකක්ද ඒ තත්ත්වය කියලා. ඒ වාගේම, package plant එකක් සම්බන්ධයෙන් ඔබතුමා යෝජනාවක් කරනවා. මම ඒක ගැනත් Water Supply and Drainage Board එකත් එක්ක සාකච්ඡා කරලා බලන්නම්. රට පුරා එවැනි බොහෝ යෝජනා තිබෙනවා. නමුත්, Water Supply and Drainage Board එකෙන් යෝජනා කරන plantsවලට වෙන් වන මුදල අපට එක් අවුරුද්දකින්, දෙකකින් සම්පාදනය කරන්න බැහැ. ඒවා බිලියන ගණන්වලින් එන යෝජනා. මම Water Supply and Drainage Board එකත් එක්ක සාකච්ඡා කරලා බලන්නම්, මේ සම්බන්ධයෙන් ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ அமைச்சர் அவர்களே, பதில் வழங்கியமைக்கு நன்றி!

நான் குறிப்பிட்ட project பில்லியன் கணக்கில் செலவாகின்ற ஒன்றல்ல. அது ஒரு சிறிய project. மட்டக்களப்பு மாவட்டத்தில் பில்லியன் கணக்கில் முன்னெடுக்கப்படுகின்ற projects இருக்கின்றன. உதாரணத்துக்கு, முந்தனையாறு project, நூகம், கித்துள் குளங்களை இணைக்கும் project, வாழைச்சேனை நீர் வழங்கல் project ஆகியவற்றைக் குறிப்பிடலாம். இந்த மூன்று projectsஐயும் பூர்த்திசெய்தால் மாத்திரம்தான் மட்டக்களப்பு மாவட்டத்தில் supply தொடர்பான பிரச்சினையை நீங்கள் சொன்னதுபோல தீர்க்கலாம்.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பில் இப்பொழுது District Engineers இரண்டு பேர்தான் இருக்கிறார்கள். எங்களுடைய மாவட்டத்துக்கென water supply சம்பந்தமான design team ஒன்று இல்லை. வெளி மாவட்டங்களில் இருந்துதான் design team வர வேண்டும். நான் கேள்விப்பட்டதன் அடிப்படையில், CEDE தருவதைத் தவிர, நாங்கள் கேட்டுக்கொண்டதற்கு இணங்க, Water Supply and Drainage Boardஆல் 12 கிலோமீற்றருக்கான pipelineஐ நீங்கள் ஒதுக்கி இருக்கிறீர்கள். நீங்கள் 12 கிலோமீற்றருக்குப் பதிலாக 20 கிலோமீற்றர் என்றாலும்கூட, சில நேரம் மட்டக்களப்பில்

அந்த design workஐப் பூர்த்திசெய்வதற்குப் போதியளவு வளங்கள் இல்லை. ஏனென்றால், மட்டக்களப்பில் design team ஒன்று இல்லை. கௌரவ அமைச்சர் அவர்களே, இதில் CEDEஆல் contract basisமூலம் வழங்குகின்ற projectக்கு நீங்களே pipelineக்குத் தேவையான laying workஐ - JCBமூலம் தோண்டி அதற்குரிய பாதையை - தயார்படுத்துகின்றீர்கள். எனினும், Water Supply and Drainage Boardஆல் வழங்குகின்ற 12 கிலோமீற்றருக்குத் தேவையான அந்த வேலைகளைப் பயனாளிகள் அல்லது பிரதேச சபைதான் செய்ய வேண்டும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish asking your question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

என்னுடைய இரண்டாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

புதியவர்களை வேலைக்கு அமர்த்தி, மட்டக்களப்பு மாவட்டத்துக்கென design team ஒன்றை உருவாக்கினால், நீங்கள் சொன்னதுபோல மேலதிக வேலைத்திட்டங்களைச் செய்வதற்கு இலகுவாக இருக்கும். வேறொரு மாவட்டத்தில் இருந்து எங்களுடைய மாவட்டத்துக்கு design team ஒன்றை இணைத்தால், if you attach a design team, is there a possibility of doing that? Because, if you do that, we may be able to work more efficiently in the district.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මඩකලපුව දිස්ත්‍රික්කයට අදාළව ඔබතුමා මතු කරන කාරණය අඩු ප්‍රමාණයකින් සිදු වෙන්න පුළුවන්. නමුත්, අම්පාර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කත් ඇතුළත්ව region එකක් විධියට තමයි National Water Supply and Drainage Board එක වැඩ කරන්නේ. මම ඒ ගැන සොයා බලන්නම්. කොහොමත් දිස්ත්‍රික්ක ගණනාවක ජල සම්පාදන කටයුතු ගැන සොයා බලන්න, ඒ දිස්ත්‍රික්කවල සැලසුම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න මම ගිහිල්ලා තිබෙනවා. තවම මට මඩකලපුව දිස්ත්‍රික්කයට එන්න බැරි වුණා. නුදුරේදීම මඩකලපුව දිස්ත්‍රික්කයට එන්න මම බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගේ ඉල්ලීම පිළිබඳව සලකා බලා ඒ සම්බන්ධයෙන් සොයා බලා අදාළ පරිදි කටයුතු කරන්නම්.

බොහොම ස්තුතියි.

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව: 2020 සිට නිෂ්පාදනය කරන ලද ඖෂධ
## அரச மருந்தாக்கல் கூட்டுத்தாபனம்: 2020இலிருந்து உற்பத்தி செய்யப்பட்ட மருந்துகள்
## STATE PHARMACEUTICALS MANUFACTURING CORPORATION: DRUGS MANUFACTURED SINCE 2020

564/2025

**4.** **ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග සංඛ්‍යාව සහ එම ඖෂධවල නාමයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ඖෂධ අතරින් නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට පෞද්ගලික වෙළඳුන්ට අලෙවි කරන ලද ඖෂධ වර්ග සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ හේතුවෙන් ඉහත සංස්ථාවට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இதுவரையில் அரச மருந்தாக்கல் கூட்டுத்தாபனத்தால் உற்பத்தி செய்யப்பட்டுள்ள மருந்து வகைகளின் எண்ணிக்கையும் குறித்த மருந்துகளின் பெயர்களும் ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) மேற்படி மருந்து வகைகளில் உற்பத்திச் செலவை விடவும் குறைந்த விலையில் தனியார் வர்த்தகர்களுக்கு விற்பனை செய்யப்பட்ட மருந்து வகைகள் மற்றும் அவற்றின் அளவு வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) அதன் காரணமாக மேற்குறிப்பிட்ட கூட்டுத்தாபனத்துக்கு ஏற்பட்டுள்ள இழப்பு எவ்வளவு என்பதையும்;

(iv) அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of varieties of medicinal drugs manufactured by the State Pharmaceuticals Manufacturing Corporation in each year from 2020 to date and the names of such medicinal drugs, separately;

(ii) those medicinal drugs, the varieties of medicinal drugs and their quantities sold to private traders at a price lower than the production cost;

(iii) the loss that the Corporation has incurred due to such sale; and

(iv) the measures that will be taken with regard to this matter?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග සංඛ්‍යාව සහ එම ඖෂධවල නාමයන් ඇමුණුම් 06ක් මඟින් දක්වා තිබෙනවා. මම අදාළ වර්ෂවල නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග සංඛ්‍යාව විතරක් කියන්නම්.

| වර්ෂය | ඖෂධ වර්ග |
|---|---|
| 2020 | 49 |
| 2021 | 49 |
| 2022 | 58 |
| 2023 | 59 |
| 2024 | 53 |
| 2025 | 55 |

(ii) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් පෞද්ගලික වෙළෙඳුන්ට අළෙවි කරන ඖෂධ ඒවා නිෂ්පාදනය කරන ලද අවස්ථාවේ පවතින පිරිවැයට අනුකූලව ලාභාන්තිකයක් සහිතව, මිල තීරණය කර ඇති බැවින් පිරිවැයට වඩා අඩු මිලට ඖෂධ අළෙවි කර නොමැත.

2020 සිට 2025 වර්ෂය දක්වා පෞද්ගලික වෙළෙඳ පොළට අළෙවි කරන ලද ඖෂධ වර්ගවල මිල සහ ප්‍රමාණයන් ඇමුණුම් අංක 7 සිට 12 මඟින් දක්වා තිබෙනවා. ඒවාත් ටිකක් දීර්ඝ ඇමුණුම්.

ඇමුණුම් 1 සිට 12 දක්වා මම **සභාගත*** කරනවා.

(iii) අලාභයක් සිදු වී නොමැත.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, අඩු මිලට ඖෂධ අළෙවි කරලා නැත්නම් කමක් නැහැ. නමුත්, එහෙම අළෙවි කරලා තිබෙනවා කියලා ප්‍රවෘත්තියක් පළ වුණා; මතවාදයක් ගියා. ඒ පිළිබඳව මම නැවත ප්‍රශ්න කරන්නට යන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මට දැනගන්න ඕනෑ කාරණය මෙයයි. ඖෂධ සම්බන්ධ මේ කාරණය වාගේම රෝහල්වල ඇති වී තිබෙන ඖෂධ හිඟය ගැනත් කාලයක් තිස්සේ කථා කරනවා. පසුගිය ඉරිදා දවසේ මගේ සහෝදරයෙක් අසනීප වෙලා, heart attack එකක් ඇවිල්ලා hospital එකේ admit කළත් අවසානයේ ෆාමසි එකෙන් තමයි බෙහෙත් ගෙනැවිත් දෙන්න සිද්ධ වුණේ.

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

අනෙක් කාරණය මේකයි. බෙහෙත් ගැනීමට වෛද්‍යවරයා අපට තුණ්ඩු කැල්ලක් ලියා දෙනවා. රෝහලට යන රෝගීන්වත්, රෝගියා ළඟ ඉන්න කෙනාවත්, කවුරුවත් මේ බෙහෙතේ නම දන්නේත් නැහැ; කියවා ගන්න පුළුවන් විධියට නොවෙයි ඒවා තිබෙන්නේ. අපි ගිහිල්ලා ඒ තුණ්ඩු කැල්ල ඉදිරිපත් කරන එක තමයි ෆාමසි එකේදී කරන්නේ. ඔබතුමා දන්නවා ඇති, NMRA එකේ ලියාපදිංචි නොකළ ඖෂධ වෙළඳ පොළේ අළෙවි කරනවා කියලා අපේ මුජිබුර් රහුමාන් මැතිතුමා NMRA එකටයි, CID එකටයි, දෙකටම පැමිණිලි කළ බව. ඒවායේ ගුණාත්මකභාවයක් නැහැ කියන එක ප්‍රායෝගිකව පැහැදිලියි. බොහොමයක් රෝගීන් මුදල් දීලා එළියෙන් බෙහෙත් ටික අරගෙන රෝහලට දීලා තිබෙනවා. ඒ සඳහා වියදමකුත් දරලා තිබෙනවා. අවසානයේ ඒ බෙහෙත්වල ප්‍රතිඵලයක් නැති නිසා මේ වන විට රෝගීන් විශාල පිරිසක් නොදැනුවත්වම මිය ගිහිල්ලාත් ඇති. පිටින් බෙහෙතුත් ලබාගෙන, අවසානයේ මිය යන්නට සිදු වනවා. මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගන්න රජයට වගකීමක් තිබෙනවා. NMRA එක හරහා නිර්දේශ හදලා තිබෙන්නේ ඒවා අනුගමනය කරමින්, ඒ විධියට ක්‍රියා පටිපාටියක් එක්ක කටයුතු කරන්නයි. NMRA එකේ අනුමැතියකින් තොරව දේශීය වෙළෙඳ පොළේ ඖෂධ තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? අපේ මුජිබුර් රහුමාන් මැතිතුමා කරපු පැමිණිල්ල සම්බන්ධයෙන් මේ දක්වා කරලා තිබෙන්නේ මොකක්ද කියන එක පිළිබඳවත්, රෝහල්වල තිබෙන ඖෂධ හිඟය පිළිබඳවත් ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ප්‍රකාරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියකින් තොරව ඖෂධ භාවිත කරන්නට හෝ අළෙවි කරන්නට නීතිමය හැකියාවක් නැහැ. ජාතික ඖෂධ නියාමන අධිකාරියට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එවැනි සිදුවීම් පිළිබඳව පැමිණිලි ලැබුණාම ඒ ගැන පරීක්ෂණ කරනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ පැමිණිල්ල ගැන මම දන්නවා. ඒ පිළිබඳව අංශ කිහිපයකින් පරීක්ෂණ කරගෙන යනවා. එවැනි ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ අයිතියක් NMRA එකට පවතිනවා. ඒ අනුව අපි කටයුතු කරනවා. ඒක නීතිමය වරදක්. මොකද, අපේ රටේ ලියාපදිංචියකින් තොරව කිසිදු ඖෂධයක් භාවිත කරන්නත් බැහැ; වෙළෙඳ සැලක විකුණන්නත් බැහැ. ඒ වාගේම තමයි කෙනෙකුට ඒක prescribe කරන්නත් බැහැ. ඒක තමයි නීතිය. ඒ අනුව කටයුතු කරනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
අපි මේ පිළිබඳව දන්නවා නේ. වතුර inject කළාය කියලා ඒ සම්බන්ධයෙන්, හිටපු සෞඛ්‍ය ඇමතිවරයෙක් හිරේ ඉන්නවා. මේ කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වෙන ආකාරය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා හොයන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මම අහපු ප්‍රශ්නයට අදාළ නොවුණත් මේ කාරණය පිළිබඳවත් අහන්න කැමැතියි. මේ වනකොට යම් පිරිසක් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් උත්තරයක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔබතුමා ගැසට් එකක් නිකුත් කර තිබෙනවා, "තැපැල් දෙපාර්තමේන්තුවේ බාහිර ආදේශකයන් ලියාපදිංචි ආදේශකයන් ලෙසට පත් කිරීම සඳහා වන ගැසට් නිවේදනය" කියලා. ඒකේ ඔබතුමා, වසර 30,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඇමතිතුමා කැමති නම් උත්තර දෙයි, මේක වැදගත් කාරණයක් නිසා. ඒක නිසා මට අවස්ථාව ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මේකෙදි වයස අවුරුදු 30 සම්පූර්ණ කරපු අයට විතරක් අවස්ථාව දෙන එක ගැන මම මේ කියන්නේ. අනුරාධපුරයේ කණ්ඩායම තමයි මගෙන් මේ ඉල්ලීම කළේ. වසර 6කට, 7කට, 8කට කලින් ඒ අය බඳවා ගන්න වෙලාවේ සුදුසුකම් සපුරපු අය; වයස් සීමාව සපුරපු අය එහි ඉන්නවා. ඔබතුමන්ලා ආදේශකයන් බඳවා ගන්න ගැසට් කරන කොට ඒ අයගේ වයස් සීමාව ඉක්මවා ගිහිල්ලා. ඒ අයට විශේෂයෙන් සලකලා, ඒ වයස 30 කියන සීමාව අවුරුදු 35 හෝ 40 දක්වා වැඩි කර ඒ අයට සාධාරණයක් කර දිය හැකිද කියන බලාපොරොත්තුවෙන් තමයි මේ ඉල්ලීම කරන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, තැපැල් ආදේශකයන් දහසක් ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා අපි කටයුතු කරනවා. රාජ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා නිර්ණායකයක් පවතිනවා. නමුත් තැපැල් ආදේශකයන් හැටියට වැඩ කරපු අය අවුරුදු හත, අට සමහර විට දහය වාගේ කාලයක් අපේ තැපැල් කාර්යාල ආශ්‍රිතව සේවාවක් සපයපු අය. දැන් වයස සම්බන්ධව ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. මුල් කණ්ඩායම බඳවා ගත්තාට පස්සේ ඒ අය සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරනවා. අපේ අදහස තිබෙන්නේ ඒ අයත් බඳවා ගත යුතුයි කියන එක. ඒ සම්බන්ධයෙන් වෘත්තීය සමිතිය මාත් එක්ක සාකච්ඡා කළා. ගරු කථානායකතුමනි, ඒ අයට සාධාරණයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි.

## කදුරුවෙල නගරයේ වෙළෙඳ සංකීර්ණය: වර්තමාන තත්ත්වය
### கதுருவெல நகரிலுள்ள வர்த்தகக் கட்டிடத்தொகுதி: தற்போதைய நிலை
### SHOPPING COMPLEX IN KADURUWELA TOWN: CURRENT STATUS

628/2025

**5.ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කදුරුවෙල නගරයේ අත්හැර දමන ලද වෙළෙඳ සංකීර්ණයක් තිබෙන බව දන්නේද;

(ii) එම වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළෙඳ සංකීර්ණය නැවත භාවිතයට ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கதுருவெல நகரில் கைவிடப்பட்ட வர்த்தகக் கட்டிடத் தொகுதியொன்று உள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) இந்த வர்த்தகக் கட்டிடத் தொகுதியை நிர்மாணிப்பதற்குச் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கட்டிடத் தொகுதியை மீண்டும் பயன் பாட்டுக்குக் கொண்டுவருவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that there is an abandoned shopping complex in Kaduruwela Town;

(ii) the amount that was spent on the construction of aforesaid shopping complex; and

(iii) the measures that will be taken to bring that shopping complex back to use?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙය අත්හැර දමන ලද වෙළඳ සංකීර්ණයක් නොව මෙතෙක් ඉදිකිරීම් අවසන් නොවූ වෙළඳ සංකීර්ණයකි.

(ii) වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මේ වනවිට වැය වී ඇති මුදල රුපියල් 70,470,668.21කි.

(iii) පොළොන්නරුව මහ නගර සභාවේ නව මහා සභාව පත්වීමත් සමඟ මේ පිළිබඳව අවධානය යොමුකර එහි ඉදිකිරීම් නිම කිරීම සඳහා 2026 වසරේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් රුපියල් මිලියන 30ක් ලබා දීම අනුමත කර ඇති අතර, එමඟින් ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, කදුරුවෙල නව වෙළෙඳ සංකීර්ණයට මුල් ගල් තැබුවේ 2022 වර්ෂයේ. එතකොට ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරලා තිබෙනවා රුපියල් මිලියන 65ක්. නගර සභාවේ මුදල් රුපියල් මිලියන 700කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කරලා නගරය මැද තිබෙන වෙළෙඳ සංකීර්ණයක් විධියට මෙය ආරම්භ කරන්න තමයි සැලසුම් කළේ. මේ වෙනකොට මේ සඳහා විශාල මුදලක් වැය වෙලා තිබෙනවා. නමුත්, කාලයක් තිස්සේ මේ වෙළෙඳ සංකීර්ණය වසා දමා තිබෙනවා. ඔබතුමා කිව්ව විධියට මෙය කඩිනමින් ආරම්භ කරයි කියලා අපි හිතනවා. මෙය කඩිනමින් ආරම්භ කරලා මහජනතාවට භාර දෙන්නේ කවදාද කියලා නිශ්චිත දිනයක් තිබෙනවා ද කියලා දැන ගන්න කැමැතියි.

ඒ වාගේම මෙම ප්‍රශ්නයට අදාළ නොවුවත් මෙය යෝජනාවක් විධියට මම ඉදිරිපත් කරන්න කැමැතියි. ජනාධිපතිතුමා අය වැය කථාවේ දී කිව්වා, සියලු දෙනාට විමධ්‍යගත මුදල් සම සේ ලබා දෙනවා කියලා. විමධ්‍යගත මුදල් ලබා දීලා ඒකට චක්‍රලේඛයක් නිකුත් කළා ව්‍යාපෘතියක අවම වටිනාකම රුපියල් ලක්ෂ 5ක් වන යෝජනා ලබා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, මේ සඳහා නව සංශෝධනයක් දැනට ඉදිරිපත් කරලා තිබෙනවා. අදාළ දිසාපතිවරු මේ ගැන දැනුවත් වෙලා නැහැ. අපේ මන්ත්‍රීවරු මේ සඳහා පමණක් යෝජනා භාර දීලා තිබෙනවා. නව සංශෝධනය අනුව, මේ විමධ්‍යගත මුදල් සඳහා ව්‍යාපෘතියක අවම වටිනාකම රුපියල් ලක්ෂ දෙකක් වන යෝජනා දෙන්නත් පුළුවන් කියලා තිබෙනවා. අපි දැන් දිස්ත්‍රික් ලේකම්වරුන්ට කථා කළාම ඒ අය මේ සම්බන්ධව දැනුවත් වෙලා නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ අදාළ දිස්ත්‍රික් ලේකම්වරු වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරුන් මේ සම්බන්ධව දැනුවත් කරන්න කියලා. මොකද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති තමයි අන්තිමේදී මේක අනුමත කරන්නේ. ඉතින් ඒ අයට ඕනෑ ඕනෑ විධියට මේක හසුරුවන්න දෙන්නේ නැතිව, දිස්ත්‍රික් ලේකම්වරුන්ට මේ සම්බන්ධව වගකීම් භාර දීලා මේවා නිවැරදි විධියට ක්‍රියාත්මක කරන්න කියලා මම මේ වෙලාවේ යෝජනා කරනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරපු අතුරු ප්‍රශ්නයේ දෙවැනි කොටසට මම උත්තර දෙන්න යන්නේ නැහැ, ඒක මුල් ප්‍රශ්නයට අදාළ නොවන නිසා. අතුරු ප්‍රශ්නයේ පළමුවන කොටසින් එතුමා ඉදිරිපත් කළේ, මේක අවසාන කරන දිනයක් කියන්න පුළුවන්ද කියන එක. ගරු කථානායකතුමනි, අපි සැලසුම් කළත් ඉදිකිරීමක් වාගේ කටයුත්තක දී නිශ්චිත දිනයක් කියන්න බැහැ. මොකද, විවිධ හේතූන් මත ඒක වෙනස් වෙනවා. එතුමා ඒක පිළිගන්නවා. මේ ගොඩනැඟිල්ල මුලදී ඉදි කරන්න යෝජනා කරලා තිබුණේ මහල් දෙකක් හැටියටයි. එතුමා කිව්වා, ඒ සඳහා මිලියන 65ක් ඇස්තමේන්තු කර තිබෙනවා කියලා. නැහැ, මුලින් ඇස්තමේන්තුවේ තිබුණේ මිලියන 37.18යි. ඒකෙන් මිලියන 29.74ක් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගන්නත්, ඉතිරි මුදල රුපියල් මිලියන 7.43ක් මහ නගර සභා අරමුදලෙන් දැරීමටත් තමයි තීරණය කරලා තිබෙන්නේ. හැබැයි ඊට පස්සේ, මේ ටෙන්ඩර් එක award කළාටත් පස්සේ තීරණයක් ගෙන තිබෙනවා, මේ දෙමහල් ගොඩනැඟිල්ල සිව්මහල් ගොඩනැඟිල්ලක් බවට පත් කරන්න. සිව්මහල් ගොඩනැඟිල්ලක් බවට පත් කිරීමේ දී අත්තිවාරමේ වෙනස්කම් කිරීම සඳහා තවත් රුපියල් මිලියන 13.51ක් වැඩිපුර එකතු වෙනවා. එතකොට මේ වැඩි කිරීමත් එක්ක ඔක්කොම මිලියන 50කට ආසන්න මුදලක් වෙනවා. හැබැයි, ඊට පස්සේ ඇති වුණු කොවිඩ් වසංගතය සහ මිල වැඩිවීම් වැනි තත්ත්වයන් එක්ක එය රුපියල් මිලියන 65ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මම හිතන විධියට, ඒ එතුමන්ලාගේ කාලවලදීම තමයි. ඒ කියන්නේ, මීට පෙර පැවැති පාලන කාලවලදී. මේ වෙනකොට මිලියන 70ක් වියදම් කරලාත් මේ කටයුත්ත අවසාන කරගන්න හැකියාවක් ලැබී නැහැ. ඒ නිසා තමයි අපි මිලියන 30ක් මෙවර වෙන් කරලා මේ කාර්යය අවසාන කරන්න කටයුතු කරන්නේ. කාර්යය අවසාන කරනවා. දිනයක් නිශ්චිතව කියන්න පුළුවන්කමක් නැහැ. ඒකේ තව අමතරව කොටසක් තිබෙනවා. අලුත් එකතු කිරීම් සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවක් මඟින් නිර්දේශයක් ලබාගෙනත් නැහැ. ඒ නිසා මේ ක්‍රියාවලිය ඇතුළේ යම් ගැටලු සහගත බවකුත් දැකගන්න පුළුවන්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විමධ්‍යගත මුදල් සම්බන්ධව තමයි මම යෝජනා කළේ, ගරු ඇමතිතුමනි. ඔබතුමාට පුළුවන්, දිස්ත්‍රික් ලේකම්වරුන්ව දැනුවත් කරන්න. ඒ ගැන තමයි මම මේ සභාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කළේ. මේ වෙනකොට නව චක්‍රලේඛය පිළිබඳව අදාළ දිස්ත්‍රික් ලේකම්වරු දැනුවත් වෙලා නැහැ. ඉතින් මම නැවතත් කියනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමා දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන්න කියලා. මොකද, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට මහජනතාව අතරට යන්න පුළුවන් එකම මාර්ගය තමයි මේක. විමධ්‍යගත මුදල් ලබා දීමෙන් මහජනතාව අතරට යන්න අපට පුළුවන්. ඔබතුමන්ලා ගිය අවුරුද්දේත් විමධ්‍යගත මුදල් අපට ලබා දුන්නේ නැහැ. ඉතිහාසයේ කිසිම දවසක මේ පාර්ලිමේන්තුවේ මෙහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. ස්වේච්ඡා සංවිධාන ඇතුළු ලියාපදිංචි වෙච්ච සෑම ආයතනයකම අවශ්‍යතා විමධ්‍යගත මුදල්වලින් අපි ඒ කාලයේ ඉටු කර දුන්නා. ඔබතුමන්ලා නව ක්‍රමයක් ක්‍රියාත්මක කරලා ලක්ෂ 5ක් වන යෝජනා දෙන්න කියලා තමයි කිව්වේ. ඒක හොඳයි. අපේ ගරු විපක්ෂ නායකතුමාගේ යෝජනාවට ගරු ජනාධිපතිතුමා ඇහුම්කන් දීලා දැන් ඒක සංශෝධනය වුණා. ගරු විපක්ෂ නායකතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, විමධ්‍යගත මුදල් ලබා දීම සඳහා ලක්ෂ 5ක් වන යෝජනා නැතුව, ලක්ෂ 2ක් වන යෝජනා දෙන්න පුළුවන් විධියට ක්‍රියාත්මක කරන්න කියලා එතුමා තමයි යෝජනා කළේ. විහාරස්ථාන, පෙර පාසල් හා පාසල්වලට මේ ප්‍රතිපාදන වෙන් වෙන විධියට විමධ්‍ය මුදල් ලබා දීම ක්‍රියාත්මක කරන්න කියලා විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහත්තයා තමයි ගරු ජනාධිපතිතුමාට යෝජනා කළේ. ඒ නිසා, මේ නව චක්‍රලේඛය අනුව කටයුතු කරන්න කියලා දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒක තමයි මම කියන්නේ.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රතිපාදන ලබා දෙනවා කියන කාරණය සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා මෙතැනටම ඇවිල්ලා ඉතාම හොඳින් පැහැදිලි කිරීමක් කළා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට, සන්නිවේදන ගැටලුවක් තිබෙනවා නම් අපි ඒක ගැන දැනුවත් කරන්න කටයුතු කරනවා.

## ආර්ථික මධ්‍යස්ථාන: ලියාපදිංචි ව්‍යාපාරිකයන්
பொருளாதார மத்திய நிலையங்கள்: பதிவுசெய்யப்பட்ட வியாபாரிகள்
ECONOMIC CENTRES: REGISTERED BUSINESSMEN

1264/2025

**6. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන ලියාපදිංචි ව්‍යාපාරිකයන් සංඛ්‍යාව එක් එක් ආර්ථික මධ්‍යස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගම් ලෙස සංස්ථාගත කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම ආර්ථික මධ්‍යස්ථානවල වර්තමානයේ ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින්නන්ට තම ව්‍යාපාර බාධාවකින් තොරව සිදු කරගෙන යාමටත්, කිසිදු අගතියක් සිදු නොවන බවටත් තහවුරු කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நிறுவப்பட்டுள்ள பொருளாதார மத்திய நிலையங்களில் வியாபார நடவடிக்கை களை மேற்கொள்கின்ற பதிவுசெய்யப்பட்ட வியாபாரிகளின் எண்ணிக்கை ஒவ்வொரு பொருளாதார மத்திய நிலையம் வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட பொருளாதார மத்திய நிலையங்களை வரையறுக்கப்பட்ட கம்பனி களாகக் கூட்டிணைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அந்தப் பொருளாதார மத்திய நிலையங்களில் தற்போது வியாபார நடவடிக்கை களில் ஈடுபட்டுள்ளவர்களுக்கு எவ்வித இடை யூறுகளும் இன்றி, தமது வியாபாரங்களைக் கொண்டு நடாத்துவதற்கும், எவ்விதப் பாதிப்பும் ஏற்படாது என்பதற்கும் உத்தரவாதமளிக்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) separately, the number of registered businessmen operating businesses in each of the economic centres established in Sri Lanka;

(ii) whether steps are being taken to incorporate the said economic centres as limited companies; and

(iii) if so, whether action will be taken to ensure that those currently operating their businesses in the said economic centres can continue their businesses without any obstruction and that they will not face any prejudice?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| අනු අංකය | ආර්ථික මධ්‍යස්ථානයේ නම | මුළු වෙළෙඳ පරිශ්‍ර සංඛ්‍යාව | ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාර කටයුතු කරන ලියාපදිංචි ව්‍යාපාරිකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මීගොඩ | 92 | 92 |
| 2 | පිළියන්දල | 59 | 59 |
| 3 | වැලිසර | 139 | 139 |
| 4 | තඹුත්තේගම | 56 | 56 |
| 5 | නුවරඑළිය | 138 | 138 |
| 6 | කැප්පෙටිපොළ | 70 | 70 |
| 7 | අම්පාර | 23 | 23 |
| 8 | යාපනය | 20 | 08 |
| 9 | කිලිනොච්චිය | 40 | 09 |
| 10 | මඩකලපුව | 50 | 07 |
| 11 | වවුනියාව | 50 | 37 |
| 12 | කුරුඳුවත්ත | 14 | 09 |
| 13 | කන්දහන්දිය | 25 | 13 |
| 14 | වෙයන්ගොඩ | 76 | 62 |
| 15 | රත්මලාන | 118 | 87 |
| 16 | නාරාහේන්පිට | 208 | 135 |
| 17 | ඇඹිලිපිටිය | 46 | 39 |
| 18 | දඹුල්ල | 156 | 161 |
| එකතුව | | **1,380** | **1,144** |

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) අදාළ නොවේ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

පසුබිම් වාර්තාවත් මේ සමඟ තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. පසුබිම් වාර්තාවට අනුව විස්තර විශාල ප්‍රමාණයක් තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය අහන්න මූලික වූ හේතුව මොකක්ද කියලා ඔබතුමා දන්නවා, මෙහි (අ) (iii) ප්‍රශ්නයත් එක්ක. මේ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කරපු කාලයේ ඉඳන් කරගෙන ගියේ කළමනාකාර භාරයක් යටතේ; වෙළඳ අමාත්‍යාංශය යටතේ, දිසාපති යටතේ, ප්‍රාදේශීය ලේකම් යටතේ වැනි භාරයක් යටතේ. නමුත් ඔබතුමා පසුගිය කාලයේ නැෂනල් ඇග්‍රි මාර්කට් (පුද්ගලික) සමාගම කියලා සමාගමක් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන්න ගියා. ඒකට තමයි Cabinet approval එක ගත්තේ. Cabinet approval එක ගත්තාට, National Agri Market Services Limited කියලා සමාගමක් ඔබතුමා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරලා තිබෙනවා. මේ වනකොට ඔබතුමා එහි අධ්‍යක්ෂ මණ්ඩලයට 7දෙනෙක් පත් කරලාත් තිබෙනවා. ඒ 7දෙනාගෙන්, සභාපති හැටියට කේ.ආර්. සේනානායක කියලා කෙනෙකුත්, තව දෙන්නෙකුත් පත් කරලා තිබෙනවා. ඒ ඔබතුමාගේ හිතවතුන්ද, නැත්නම් පක්ෂයේ අයද, කවුද කියලා අපි දන්නේ නැහැ. ඒ අයගේ තනතුරු, ඒගොල්ලන් කරපු සේවාවන් දන්නේ නැහැ. අනික් හතරදෙනා රාජ්‍ය සේවයේ යම් යම් තනතුරු දරන අය කියලා සඳහන් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේකට විරුද්ධතාවක් තිබෙනවා. ඔබතුමා ජීවත් වන තඹුත්තේගම, ඊළඟට කැප්පෙටිපොළ, නුවරඑළිය, දඹුල්ල වැනි ප්‍රදේශවල ඉන්න අය තමයි මේකට විරුද්ධව දැන් campaign එක කරන්නේ. පසුගිය දවසක ඔබතුමා දඹුල්ලට ගියා. ඔබතුමා පත්වීම් ලිපි යවලා තිබුණා, මාර්කට්වල ඉන්න අයට. ඒගොල්ලෝ ඒ පත්වීම් ලිපි භාර ගත්තේත් නැහැ. ඒගොල්ලෝ ඒකට රිට් එකක් අරගෙන තිබෙනවා. ඇමතිතුමා, ඕනෑම දෙයක් අකැමැත්තෙන් කරන්න බැහැ නේ, කැමැත්තෙන් නේ කරන්න පුළුවන්. මේ ආර්ථික මධ්‍යස්ථානවල ඉන්න අයගේ ලොකු විරෝධතාවක් මේකට තිබෙනවා.

ඉතින්, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සම්බන්ධව ඔබතුමා යම්කිසි සමාගමක් පිහිටෙව්වා. ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරලා තිබෙනවා. නමුත් මේ ව්‍යාපාරිකයින්ගේ, මාර්කට්වල ඉන්න අයගේ විරෝධතා තිබුණත්, ඔබතුමා දිගටම මෙය කරගෙන යනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මේක පිළිබඳව විශේෂයෙන් වැරදි චිත්‍ර මවමින්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත් සමහර තොරතුරු වැරදි විධියට දෙමින් මේ National Agri Market Services Limited එක හදන්න මූලික වෙච්ච අරමුණ යට ගහන්න විවිධ උත්සාහයන් ගන්නවා, ව්‍යාපාරිකයින් පිරිසක්. මේ ඔක්කෝම අය නොවෙයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා, National Agri Market Services Limited තමයි අපි අරගෙන තිබෙන්නේ. කැබිනට් මණ්ඩලය පූර්වගත් අනුමැතිය වෙනස් කරලා තිබෙනවා. නැවත කැබිනට් පත්‍රිකාවකින් එය වෙනස් කරලා තිබෙනවා. ඔබතුමාට ඒක හොයා ගන්න පුළුවන්. එම නිසා ඒකේ නීත්‍යානුකූලභාවය පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මේක සම්පූර්ණයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට අයත් සමාගමක්; රාජ්‍ය සමාගමක්. රාජ්‍ය සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම තිබෙනවා, විවිධාකාරයට. භාණ්ඩාගාර ලේකම්වරයා තමයි මේ පත්වීම කරන්නේ. අමාත්‍යාංශ ලේකම්වරු හතරදෙනෙක් සහිතව ඇමතිවරයා පත් කරන තුන්දෙනෙක් මෙහි ඉන්නවා, අවසාන අනුමැතිය දෙන්නේ භාණ්ඩාගාර ලේකම්වරයා. ඒ නිසා දැන් මේ ප්‍රශ්නය තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ගරු කථානායකතුමනි. මේ භාරයේ අයිතිකරුවාත් අමාත්‍යාංශ ලේකම්වරයා. හැබැයි, මේ භාරයේ අයිතිකරු අමාත්‍යාංශ ලේකම්වරයා වුණාට භාරය ගන්නා වූ තීන්දු තීරණ නිසා විවිධ ගැටුම්, විවිධ ගැටලු මතු වෙලා තිබෙනවා. මම එක උදාහරණයක් කියන්නම්.

ගරු කථානායකතුමනි, කුරුඳුවත්ත ආර්ථික මධ්‍යස්ථානය තිබෙනවා නේ. කුරුඳුවත්ත ආර්ථික මධ්‍යස්ථානයේ තිබෙන කඩවලින් කඩ කාමර අංක 9, 10, 11, 12හි හැටන් නැෂනල් බැංකුව විසින් බැංකු කටයුතු පවත්වාගෙන යනවා, ආර්ථික මධ්‍යස්ථානය ඇතුළේ. ආර්ථික මධ්‍යස්ථානයක කඩ කාමර දෙන්නේ ආර්ථික මධ්‍යස්ථානයේ කටයුතු කරන්න මිසක් බැංකුවලට කුලියට දෙන්නවත්, වෙන කාටවත් කුලියට දෙන්න නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, මේ විධියට එක තැනක තිබෙනවා, එක්කෙනෙකුට අයිති කඩ 7ක්. කඩ 7ක්! මා ළඟ එම list එක තිබෙනවා. ඒක ඔබතුමාට බලන්න පුළුවන්. මේ list එක මම සභාගත කළේ ඒකට. ආර්ථික මධ්‍යස්ථානය පවත්වාගෙන යන්න කඩ ටික දුන්නාම, ඒ කඩ ටික කුලියට දෙන වැඩේ පටන් අරගෙන තිබෙනවා. සමහර කඩ විකුණනවා. දඹුල්ලේ කඩ දෙකක් විකුණුවා, දැන් මාස දෙකකට කලින්. එකක් රුපියල් කෝටි පහයි, අනෙක් එක කෝටි හතහමාරයි. රජයේ දේපළ තමයි මේ විකුණන්නේ.

National Agri Market Services Limited හැදුවේ අපේ ආර්ථික මධ්‍යස්ථාන හොඳින් කරගෙන යන්න. අපට තිබෙනවා, ආර්ථික මධ්‍යස්ථාන 18ක්. ඒ ආර්ථික මධ්‍යස්ථාන 18 රටේ විවිධ ප්‍රදේශවල තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ 4ක් තිබෙනවා. ඒ, නාරාහේන්පිට, රත්මලාන, බොරලැස්ගමුව, මීගොඩ. මේ හතර ක්‍රියාත්මක වන්නේ හතර විධියකට. නමුත්, එක විධියකට මේවා ක්‍රියාත්මක වන්න ඕනෑ. විශේෂයෙන් ඒගොල්ලන් ගන්න තීන්දු-තීරණ ක්‍රියාත්මක කරන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ නිසා විධිමත්ව, පිළිවෙළකට ක්‍රියාත්මක වන පහසුකම් සපයන ආයතනයක් තමයි, National Agri Market Services Limited. ඒ National Agri Market Services Limited පවත්වාගෙන යෑමේදී ව්‍යාපාරිකයින්ට පහසුකම් සැපයීමත්, ගොවීන්ට පහසුකම් සැපයීමත්, එතැනට එන පාරිභෝගිකයාට පහසුකම් සැපයීමත් කරන්න තමයි මේ සමාගම කටයුතු කරන්නේ. ඒ සමාගමේ කටයුතු ව්‍යාපාර කටයුතුවලට පහසුවක් මිස බාධාවක් කරන්නේ නැහැ. මේ නිසා ඒගොල්ලන්ට මේකේ ලොකුම ප්‍රශ්නය වුණේ, තමන්ගේ කඩ ටෙන්ඩර් දමනවාද කියන එකයි. අපි ඉතා පැහැදිලිව කියා තිබෙනවා, දැන් කඩ කරන අයට කඩ කරන්න, අපි බිස්නස් කරන්න එන්නේ නැහැ කියලා. කඩේ

---
*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කරන අයට ඒ කඩේ බදු ගිවිසුම වසර පහෙන් පහට අපි continue කරනවා. හැබැයි, රජයේ තක්සේරුව මත අවුරුදු 3න් 3ට කඩ කුලිය වෙනස් වනවා. ඒකට නිශ්චිතව ගිවිසුමක් ගහලා තිබෙනවා. ඒ නිසා ඒ යටතේ පාලනය වෙන්න කළමනාකරණ මණ්ඩලයක් අපි පත් කර තිබෙනවා. දිස්ත්‍රික් ලේකම්වරයා, ප්‍රාදේශීය ලේකම්වරයා, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා, ඊට අමතරව වෙළඳ සංගමය, ගොවි සංගම්, පොලීසිය, බැංකුවක් තිබෙනවා ඒ බැංකුව මේ සියල්ල ඇතුළත් කරපු කළමනාකරණ කමිටුවක් ඒ සඳහා හදලා තිබෙනවා. ඒ කමිටුවට කවුරු හරි ආවේ නැහැ කියලා කමිටුව අක්‍රිය වන්නේ නැහැ. මේක විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන තීරණ නම් කඩාකප්පල් කරන්න හදන්නේ අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. අපි ඒක ක්‍රියාත්මක කරනවා. විධිමත්ව පවත්වාගෙන යන්න තමයි මේ ආයතනය හදලා තිබෙන්නේ. ඒ නිසා මේ ව්‍යාපාරිකයින්වත්, මේ ආයතනයවත් නොමඟ යවන්න සමහර අය කරන චෝදනා අපි භාර ගන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇමතිතුමා යටතේ, ඒ කියන්නේ අමාත්‍යාංශ ලේකම් යටතේ තමයි දැනටත් ඔය ආර්ථික මධ්‍යස්ථානය තිබෙන්නේ. දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම් ඇමතිතුමාගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නවා. පොලීසියේ ASPත් ඒ භාරය යටතේ ඉන්නවා. ඔබතුමාගේ පැත්තෙන් ඔබතුමා කියන එක මම පිළිගන්නම්. ඔබතුමා කියන එක පිළිගත්තත්, වැඩි දේවල් ඕනෑ නැහැ, ඔබතුමාගේ ගමේ - තඹුත්තේගම - ආර්ථික මධ්‍යස්ථානයේ සිටින අය නේ canvassing කරන්නේ, මේක කරන්න ඉඩ දෙන්න එපා කියලා. අපි තඹුත්තේගම මෙලෝ මිනිහෙක් හඳුනන්නේ නැහැ නේ. ඔබතුමාගේ ගමේ වෙළෙන්දන් - ව්‍යාපාරිකයින් - තමයි මේකට විරුද්ධව පළමුවෙන්ම යොමු වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මට විනාඩියක කාලයක් දෙන්න. එතකොට අපි නොවෙයි මේකට විරුද්ධ වෙලා තිබෙන්නේ. එම නිසා ඔබතුමා මේක පිළිගන්න. ඔබතුමාගේ පැත්තෙන් මම පිළිගන්නවා, කඩ විකුණනවා වාගේ දේවල් වෙනවා කියලා. හැබැයි, ඔබතුමා ආර්ථික මධ්‍යස්ථානයට පත් කරලා තිබෙන තුන්දෙනෙක් ඔබතුමාගේ පෞද්ගලික හිතවතුන්. ඔබතුමා නේ පත් කරලා තිබෙන්නේ. ඔබතුමා තමයි මහා භාණ්ඩාගාරයට නම් දීලා තිබෙන්නේ. විෂය භාර කැබිනට් ඇමතිතුමා කියන නම් තුනක්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරලා තිබෙන්නේ.

හැබැයි අද මම කියනවා, මේක ජනාධිපතිතුමාටත් හොඳ නැහැ, ආණ්ඩුවටත් හොඳ නැහැ කියලා. නැති ප්‍රශ්නයක් තමයි ඔබතුමන්ලා ආර්ථික මධ්‍යස්ථානයත් එක්ක හදාගන්නේ. මේක අපි කිව්වා කියලා ලියලා තියාගන්න. අපට මේක කෙරුණත් එකයි, නොකෙරුණත් එකයි. අන්තිමේදි සිද්ධ වන දේ මම කියන්නම්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න අය අහගන්න. ඕකෙන් පස්සේ ඔබතුමාට දඹුල්ලට ගිහිල්ලා බහින්න බැරි වුණා. ඔබතුමාට දඹුල්ල මාර්කට් එකේ ඇවිදින්න බැරි වුණා. ඔබතුමාට මාර්කට් එක ඇතුළට යන්න දුන්නේ නැහැ. ඔබතුමා ඒක පිළිගන්න. මම මේ කියන්නේ මගේ ප්‍රශ්නයක් නොවෙයි. රටේ ප්‍රශ්නයක් තමයි මම මෙතැන ඉදිරිපත් කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේක විවාදයක් කර ගන්න එපා. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඇමතිතුමාට මෙච්චර බලයක් තිබියදී, මොකටද ඔබතුමා නැවත අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන්නේ? දිසාපති ඔබතුමාගේ, අමාත්‍යාංශ ලේකම් ඔබතුමාගේ. අකටයුත්තක් කරනවා නම් ඔබතුමා අලුත් සමාගමක් පත් කිරීම නොවෙයි කළ යුත්තේ, ඔබතුමා තිබෙන සමාගමත් එක්ක වැඩ කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ තමයි ඒක තිබෙන්නේ. භාර විසින් තීරණ ගැනීමේ ප්‍රශ්නයක් තිබෙනවා. Procurement Guidelines අනුව සමහර ඉදිකිරීම් එහෙම කරන්න බැහැ. ඒක තේරුම් ගන්නේ නැතුව තමයි සමහරු මෙච්චර කල් වැඩ කරලා තිබෙන්නේ. දැන් audit queries විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. දීපු සල්ලි ලැබිලා නැහැ, ගිණුම්වල තිබුණු සල්ලි පාවිච්චි කරලා තිබෙනවා, මේවාට වගකිව යුතු අය දැන් නැහැ. වැඩ කරන්න පටන් ගන්නකොට හිටපු සමහර දිස්ත්‍රික් ලේකම්වරු දැන් නැහැ. සමහර අය අනවබෝධයෙන් මේක ගැන කියනවා. අනවබෝධයෙන් කියන එක ගැන මට කනගාටුයි. අපි ලියලා තියාගන්නම්, වෙන්නේ මොකක්ද කියලා බලමු.

අපි නිශ්චිතවම National Agri Market Services Limited එක ස්ථාපිත කරලා ඉවරයි. අධ්‍යක්ෂ මණ්ඩල පත් කරන්නේ එහෙම තමයි. කැබිනට් මණ්ඩල අනුමැතිය අනුව තමයි ඒ සඳහා සුදුසුකම් තිබෙන අය පත් කරන්නේ. ලංකා බැංකුවට පත් කළත්, National Agri Market Services Limited එකට පත් කළත්, National Salt Limited එකට පත් කළත්, Pelwatta Sugar Factory එකට පත් කළත්, එහෙම තමයි පත් කරන්නේ. එහෙම නැතුව වෙනත් ක්‍රම නැහැ. ඒ විධියට තමයි මේකටත් පත් කරලා තිබෙන්නේ. එලෙස පත් කරපු අය ඒ ක්‍රියාවලිය පවත්වා ගෙන යනවා. National Agri Market Services Limited එක අපේ රටේ ආර්ථික මධ්‍යස්ථාන විධිමත්ව කළමනාකරණය සඳහා පිහිටවපු ආයතනයක්. ඒ නිසා මන්ත්‍රීතුමා බලාගෙන ඉන්න. ටික දවසක් යනකොට ඔබතුමාට ඒ ගැන තේරෙයි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -1717/2025- (1), ගරු ආර්.ජී. විජේරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම: ක්‍රමවේදය
## துப்பாக்கி அனுமதிப்பத்திரங்களை வழங்குதல்: பின்பற்றப்படும் நடைமுறை
## ISSUANCE OF FIREARM LICENCES: PROCEDURE FOLLOWED

1719/2025

**8. ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සිවිල් පුද්ගලයෙකුට බලපත්‍ර මත ගිනි අවියක් නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

[ගරු තනුර දිසානායක මහතා]

(ii) එලෙස බලපත්‍ර මත ගිනි අවි ලබා දීම මේ වනවිට නවත්වා තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) ඉහත බලපත්‍ර නිකුත් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය, ක්‍රමවේදය සහ නිර්ණායක කවරේද;

(v) බලපත්‍ර මත ගිනි අවි නිකුත් කිරීමට ආරක්ෂක නිෂ්කාසන ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(vi) එහිදී ඇති වන ප්‍රමාදයන් මඟ හරවා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගිනි අවි ආඥාපනත කාලීනව සංශෝධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) අවසන් වරට ගිනි අවි බලපත්‍ර ගාස්තු සංශෝධනය කර ඇති දිනය කවරේද;

(iii) ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන තිබේ නම්, එම දිනය කවරේද;

(iv) බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැරීමේදී ගෙවනු ලබන දඩ මුදල්වල සංශෝධනයක් කර තිබේද;

(v) බලපත්‍ර විනාශවීමක්, පැවරීමක් හෝ ගිනි අවි අලුත්වැඩියා කිරීමට අදාළ ගාස්තු සංශෝධනය කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஒரு பொதுமகனுக்கு அனுமதிப்பத்திரத்தின்கீழ் துப்பாக்கியொன்றை வழங்குகையில் பின்பற்றப் படும் நடைமுறை யாது;

(ii) அவ்வாறு அனுமதிப்பத்திரத்தின்கீழ் துப்பாக்கி களை வழங்குவது தற்போது நிறுத்தப் பட்டுள்ளதா;

(iii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை;

(iv) மேற்படி அனுமதிப்பத்திரங்களை வழங்குவதற்கு எதிர்பார்க்கும் திகதி, நடைமுறை மற்றும் அளவுகோல்கள் யாவை;

(v) அனுமதிப்பத்திரத்தின்கீழ் துப்பாக்கிகளை வழங்குகையில் பாதுகாப்புத் தடை நீக்கச் சான்றிதழ் பெற்றுக்கொள்ளப்படும் முறையியல் யாது;

(vi) இதன்போது ஏற்படும் தாமதங்களைத் தவிர்ப்ப தற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சுடுகலன் கட்டளைச் சட்டத்தை காலத்துக்கேற்ற வகையில் திருத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(ii) இறுதியாக துப்பாக்கி அனுமதிப்பத்திரம் மீதான கட்டணங்கள் திருத்தப்பட்ட திகதி யாது;

(iii) அதற்காக அமைச்சரவை அங்கீகாரம் பெற்றுக் கொள்ளப்பட்டிருப்பின், குறித்த திகதி யாது;

(iv) அனுமதிப்பத்திரத்துக்கான கட்டணத்தைச் செலுத்தத் தவறும் பட்சத்தில் செலுத்தவேண்டிய தண்டப் பணத்தில் திருத்தம் மேற்கொள்ளப் பட்டுள்ளதா;

(v) அனுமதிப்பத்திரங்கள் சேதமடைதல், உரிமை மாற்றம் செய்யப்படுதல் அல்லது துப்பாக்கி களை பழுதுபார்த்தல் ஆகியவற்றுக்கான கட்டணங்கள் திருத்தப்பட்டுள்ளனவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the procedure followed in issuing a firearm to a civilian on licence;

(ii) whether the issuance of such firearms on licences has been stopped by now;

(iii) if so, the reasons for that;

(iv) the date on which it is expected to issue the above licences, along with the relevant procedure and criteria;

(v) the procedure for obtaining security clearances to issue firearms on licences; and

(vi) the steps that have been taken to avoid delays that occur in this process?

(b) Will he also inform this House -

(i) the steps that have been taken to amend the Firearms Ordinance in a timely manner;

(ii) the date on which the firearms licence fees have been last revised;

(iii) the date on which cabinet approval has been obtained for the said purpose, if any;

(vi) whether there has been any amendment to the fines payable for the failure to pay licence fees; and

(v) whether there have been any amendments to the fees relating to the deterioration, transfer of licences or to repair of firearms?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සිවිල් පුද්ගලයන් සඳහා වගා ආරක්ෂාව, දේපළ ආරක්ෂාව, ජීවිත ආරක්ෂාව, ක්‍රීඩා කටයුතු සඳහා හා මහජන නියෝජිතයන් හා රජයේ නිලධාරි සඳහා යන අංශ යටතේ ගිනි අවි නිකුත් කිරීම සිදු

කරනු ලබයි. එලෙස ගිනි අවි නිකුත් කිරීමේදී 1916 අංක 33 දරන තුවක්කු ආඥාපනත යටතේ හා 1996 අංක 22 දරන තුවක්කු ආඥාපනතේ ප්‍රතිපාදන මෙන්ම ආරක්ෂක ලේකම් විසින් නිකුත් කර ඇති 01/2025 ගිනි අවි චක්‍රලේඛය අනුව ඉහත එක් එක් කාණ්ඩ සඳහා විවිධ නිර්ණායකයන් සලකා බලනු ලබයි. ඒ අනුව අදාළ ආයතනවලින් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගෙන ශ්‍රී ලංකා පොලීසිය හා බුද්ධි අංශ වෙතින් අදාළ ආරක්ෂක නිෂ්කාසන ලබා ගැනීමෙන් අනතුරුව බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(iv) ඉහත (ii) පිළිතුර අනුව අදාළ නොවේ.

(v) ශ්‍රී ලංකා පොලීසිය හා රාජ්‍ය බුද්ධි ප්‍රධානි වෙතින් ආරක්ෂක නිෂ්කාසන වාර්තා කැඳවනු ලබයි.

(vi) ආරක්ෂක නිෂ්කාසන වාර්තා ලබා දීම ශ්‍රී ලංකා පොලීසිය හා රාජ්‍ය බුද්ධි ප්‍රධානි වෙතින් සිදු කරනු ලබන අතර, ඒ ඒ ආයතනයන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදය යටතේ දැනට නිෂ්කාසන වාර්තා ලබා දීම සිදු වේ.

බලපත්‍ර ලබා දෙන අංශ අනුව සමහර විට ප්‍රමාද වීම් සිදු වෙන්න පුළුවන්. ඒ වාගේම පෞද්ගලිකව ලබා දෙන ගිනි අවි සබැඳිවද ඒ, ඒ ක්‍රමවේද අනුගමනය කරනකොටත් ප්‍රමාද සිදු වෙන්න පුළුවන්.

(ආ) (i) 2025 අප්‍රේල් 01වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඒ සඳහා ලැබී තිබෙනවා. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබනවා.

විශේෂයෙන්ම 1916 අංක 33 සහ 1996 අංක 22 දරන තුවක්කු ආඥාපනතේ ප්‍රතිපාදන මේ සඳහා උපයෝගී කර ගන්නවා. 2025 අප්‍රේල් 01වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිලා තිබෙනවා, ඒ ගිනි අවි ආඥාපනත කාලීනව සංශෝධනය කිරීම සඳහා. අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ගිනි අවි ආඥාපනත ඉදිරිපත් කරලා, නව ගිනි අවි පනතක් හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීලා තිබෙනවා. ගිනි අවි නියාමනය සඳහා පත් කරන ලද කමිටුව අවස්ථා කිහිපයකදී රැස් වීමෙන් පසුව ගිනි අවි නියාමනය සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කර ලබා දීලා තිබෙනවා. එය පසුගිය වසරේ ජාතික ආරක්ෂක කවුන්සලයටත් ඉදිරිපත් කරලා ඉන් අනතුරුව නව ගිනි අවි පනතට ඇතුළත් කළ යුතු ප්‍රතිපාදන සමාලෝචනයක් සිදු කරලා තිබෙනවා. ඒ වාගේම වායු තුවක්කු නියාමනය පිළිබඳව ද වගන්ති ඇතුළත් කිරීමට යෝජනා වෙලා තිබෙනවා. එබැවින් නව යෝජනා වශයෙන් ඒ පිළිබඳ නියාමන ප්‍රතිපත්ති සකස් කරමින් පවතිනවා.

රට තුළ නීතිය හා සාමය ආරක්ෂා වන පරිදි ගිනි අවි භාවිත කිරීම ක්‍රමානුකූල හා විධිමත් කිරීම සඳහා අවශ්‍ය වන සංශෝධන ඇතුළත් කිරීම, ගිනි අවි නිකුත් කිරීම හා භාවිත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේද සංශෝධනය කිරීම, පනතේ දක්වා ඇති දඩුවම් හා දඩ මුදල් සංශෝධනය කිරීම, ගාස්තු සංශෝධනය කිරීම, අමාත්‍යාංශ රෙගුලාසි මඟින් සිදු කිරීම සඳහා පනත සංශෝධනය කිරීම, පොදු ස්ථානවල ගිනි අවි භාවිත කිරීම වැළැක්වීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් කිරීම, ඒ වාගේම කෘෂි කාර්මික හා කෘෂි කාර්මික නොවන ලෙස කොටස් කර ඇති ගිනි අවිවල බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කිරීම, බලපත්‍රය විනාශ වූ පසු හා විරූප වූ පසු ගෙවන ගාස්තුව සංශෝධනය කිරීම, ගිනි අවියක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තැබීම සඳහා අය කරනු ලබන ගාස්තුව සංශෝධනය කිරීම, ගිනි අවි පැවරීම සඳහා වන ගාස්තුව සංශෝධනය කිරීම, ගිනි අවි අලුත්වැඩියා බලපත්‍රය සඳහා අය කරනු ලබන ගාස්තුව සංශෝධනය කිරීම සහ මුරකරු අවසර පත්‍ර සඳහා ගාස්තුව සංශෝධනය කිරීම කියන සියලු කරුණු කාරණා ගිනි අවි ආඥාපනත සංශෝධනයේදී සැලකිල්ලට භාජන කිරීම පිළිබඳව අපි ජාතික ආරක්ෂක කවුන්සලයේදී සාකච්ඡා කළා.

(ii) 1995.10.04

(iii) 1995.10.04

(iv) 2025.04.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් 1916 අංක 33 දරන තුවක්කු ආඥාපනත පරිච්ඡින්න කර නව පනතක් සැකසීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇති අතර, එහිදී දඩ මුදල්වල සංශෝධනයක් සිදු කිරීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(v) 2025 අප්‍රේල් 01 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කාරණය විශේෂයෙන්ම මහජන ආරක්ෂාව සම්බන්ධයෙනුත් වැදගත් නිසායි මම අහන්නේ. අපේ රටේ මේ විධියට නිකුත් කරපු ගිනි අවි සම්බන්ධයෙන් සමීක්ෂණයක් කරලා තිබෙනවාද? එහෙම සමීක්ෂණයක් කරලා තිබෙනවා නම්, ඒ කවදාද? ඒ සමීක්ෂණය මඟින් සිදු කරනු ලැබූ කාර්යය සහ හෙළිදරව් වූ කාරණා මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, අපි ගිනි අවි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කළා. ඒ, 2024.11.20 අපේ රජය බලයට ආවාට පසුවයි. 2025.01.01 දින දක්වා ඒ සමීක්ෂණය කරලා තිබෙනවා. එහිදී පෞද්ගලික ආරක්ෂාව සඳහා නිකුත් කර තිබෙන ගිනි අවි නියාමනය කිරීම වෙනුවෙන් හා එක් පුද්ගලයෙකු වෙත ගිනි අවියක් පමණක් ලබා දීමට තමයි අරමුණු කරගෙන තිබෙන්නේ. මේක ඉතා සංකීර්ණ විෂයයක්. ඒ වාගේම අපේ රජය වගකීමකින් යුතුව ඉතා ඇඩ් අවබෝධයකින් මේ සමීක්ෂණය කරන්න අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සමීක්ෂණයෙන් ගොඩක් කරුණු රැස් කර ගත්තා. ඒ අනුව කුමන කාල සීමාවල මේ ගිනි අවි නිකුත් කරලා තිබෙනවාද, දේශපාලනඥයින්ට නිකුත් කරපු ඒවා මොනවාද කියලා සොයා බලන්න ඕනෑ. පසුගිය කාල වකවානුවේ නිකුත් කරලා තිබෙන ගිනි අවි සම්බන්ධයෙන් ගිණුම් තැබීම් කරලා නැහැ. ඒ ස්ථාන මොනවාද කියලා අපිට සොයා ගන්න විධියක් නැහැ. දත්ත නැහැ. ඒවා දීපු ස්ථානත් සොයා ගන්න නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ වාගේම එම කටයුතු අපි දැන් විධිමත් කරන්න, ඒ

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

වෙනුවෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා. මේ ගැන අපි ජාතික ආරක්ෂක කවුන්සලයේදීත් විශේෂයෙන් සාකච්ඡා කළා. ගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් උපදෙස් දුන්නා.

හැකි ඉක්මනින් පනත සංශෝධනය කරලා නිසි නියාමනයක් කරන්න කටයුතු කරනවා. ඒ කියන්නේ, නිකුත් කිරීමේ ක්‍රමවේදය, නැත්නම් පරිහරණය කිරීම යනාදිය සම්බන්ධයෙන් දැඩි නීති ගෙනෙන්න රජයක් හැටියට අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයත් කියන දෙකම එකට එකතු වෙලා තමයි ඒ සම්බන්ධව කටයුතු කරන්නේ. ඒ වාගේම දියුණු රටවල් ගිනි අවි නිකුත් කිරීම සම්බන්ධව භාවිත කරන ක්‍රමවේද පිළිබඳවත් විශේෂ අධ්‍යයනයකුත් කරලා මේ සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මේ විධියට ගිනි අවි ලබා දෙනකොට රජයෙන් ඒ පුරවැසියන්ගෙන් යම් මුදලක් අය කරනවාද? එතකොට ඒ මුදල ගණනය කරන්නේ කොහොමද? ඒ වාගේම ඒගොල්ලන් නැවත ඒ ගිනි අවිය භාර දෙනකොට රජයෙන් ඒ මුදල් නැවත ලබා දෙන්නේ කොහොමද, එහෙම ගෙවීමක් සිද්ධ වෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය විසින් ගිනි අවියේ වර්තමාන තත්ත්වය පරීක්ෂා කරනවා. ඒ අනුව තමයි ආපසු ලබා දෙන මිල තීරණය කරන්නේ. ඊට පසුව ඒ සඳහා කමිටුවක් පත් කරනවා. ඒක ආරක්ෂක අමාත්‍යාංශයේ, මුදල් අමාත්‍යාංශයේ වාගේම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විෂයානුබද්ධ ආයතනවල නියෝජිතයන්ගෙන් සහ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක්. ඒ මඟින් තමයි වටිනාකම තීරණය කරනු ලබන්නේ. ඒ කියන්නේ, විකිණුම් මිලෙන් රජයට ගෙවනු ලබන බදු සහ දෙපාර්තමේන්තු ගාස්තු වාගේම ඒ සම්බන්ධ වෙනත් ගාස්තු අඩු කරලා, අවියේ කාලය, එහි ස්වභාවය මත රජයේ මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව, depreciation value එකත් බලලා ඉතුරු මුදල තමයි ගිනි අවියේ හිමිකරු වෙත ලබා දෙන්න අපි කටයුතු කරන්නේ.

## පුරාවිද්‍යාත්මක ස්ථාන: ගාල්ල දිස්ත්‍රික්කය
## தொல்பொருள் இடங்கள்: காலி மாவட்டம்
## ARCHAEOLOGICAL SITES: GALLE DISTRICT

1808/2026

**9. ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, පුරා විද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථාන පිහිටා ඇති බව දන්නේද;

(ii) බද්දේගම, නාගොඩ, වැලිවිටිය දිවිතුර, නියාගම, තවලම සහ නෙළුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල පිහිටා ඇති පුරා විද්‍යාත්මක ස්ථාන කවරේද;

(iii) එම ස්ථාන අතරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ස්ථාන කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් ප්‍රදේශ අතරින් අතීතයේ උඩරට රාජධානියට අයත්ව තිබූ ප්‍රදේශ කවරේද;

(v) එම ස්ථාන සංරක්ෂණය සඳහා ගනු ලබන පියවර කවරේද;

(vi) එම පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில், தொல்பொருள் முக்கியத் துவம் வாய்ந்த இடங்கள் அமைந்துள்ளன என்பதை அறிவாரா என்பதையும்;

(ii) பத்தேகம, நாகொட, வெலிவிட்டிய திவிதுர, நியாகம, தவலம, நெலுவ ஆகிய பிரதேச செயலகங்களின் ஆளுகைப் பிரதேசத்தில் அமைந்துள்ள தொல்பொருள் இடங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி இடங்களில் தொல்பொருள் திணைக் களத்தின் கண்காணிப்பின்கீழ் காணப்படுகின்ற இடங்கள் யாவை என்பதையும்;

(iv) மேலே (ii)இல் குறிப்பிடப்பட்ட பிரதேசங்களுள் முற்காலத்தில் கண்டி இராசதானிக்கு உரித்தாய் இருந்த பிரதேசங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி இடங்களைப் பாதுகாப்பதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) மேற்படி தொல்பொருள் இடங்கள் தொடர்பாக மக்களைத் தெளிவுபடுத்தும் வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that places of archaeological importance are located in the Galle District;

(ii) the archaeological places located in the Baddegama, Nagoda, Welivitiya Divithura, Niyagama, Thawalama and Neluwa Divisional Secretaries' areas;

(iii) the places, out of the aforesaid places, that are under the supervision of the Department of Archaeology,;

(iv) the areas that were under the Kandyan Kingdom in the past fall within the areas mentioned in (ii) above;

(v) the steps that will be taken to conserve the said places; and

(vi) the programme that is underway to create public awareness regarding the said archaeological places;

(b) If not, why?

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) බද්දේගම, නාගොඩ, වැලිවිටිය දිවිතුර, නියාගම, තවලම සහ නෙළුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව පුරා විද්‍යාත්මක ස්ථාන ලෙස හඳුනාගත් ස්ථාන ඇමුණුමෙහි දක්වා ඇත.

- **ගාල්ල දිස්ත්‍රික්කය - ගැසට් මගින් ප්‍රකාශිත ස්මාරක**

| ස්ථානීය අංකය | ස්ථානයේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | වෙනත් |
|---|---|---|---|---|---|
| 2 | ශ්‍රී ශෛලකූඨාරාම පුරාණ ගල්ලෙන් විහාරය. | බද්දේගම | වවුලගල | වවුලගල | ආරක්ෂිත ස්මාරක- 1505- 2007.07.06 |
| 4 | ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරය. | බද්දේගම | 204, තෙලිකඩ | තෙලිකඩ | ආරක්ෂිත ස්මාරක- 1677 2010.10.21 |
| 5 | අම්පිටිය දේවාල භූමිය. | බද්දේගම | 204, තෙලිකඩ | තෙලිකඩ | ආරක්ෂිත ස්මාරක- 1677 2010.10.21 |
| 6 | පහළ කිඹිය ශෛලයාරාම පුරාණ රජමහා විහාරයේ කටාරම් සහිත ගල්ලෙන. | බද්දේගම | 208, පහළ කිඹිය | පහළ කිඹිය | ආරක්ෂිත ස්මාරක- 1974/16- 2016.07.07 |
| 7 | ජයසිංහාරාම පුරාණ විහාරයේ පැරණි ධර්මශාලාව | නාගොඩ | 216, නාගොඩ | නාගොඩ | ආරක්ෂිත ස්මාරක- 1677 2010.10.21 |
| 8 | පනංගල ගංගාරාම විහාරය. | තවලම | පනංගල | පනංගල | ආරක්ෂිත ස්මාරක- 1677 2010.10.21 |
| 9 | ගංගාරාම පුරාණ විහාරය. | වැලිවිටිය දිවිතුර | 196 ඒ, උනන්විටිය | උනන්විටිය | ආරක්ෂිත ස්මාරක- 1677 2010.10.21 |
| 10 | තවලම අම්බලම | තවලම | 227 ඒ. බටහේන | තවලම | ආරක්ෂිත ස්මාරක - 2317 /57 2023.02.01 |
| | ඇතුමලේ පරණ තොටුපල | නාගොඩ | 215 ඒ මාපලගම | මාපලගම | ආරක්ෂිත ස්මාරක - 2349 /42 2023.09.16 |
| 52 | කරව්ව අම්බලම | නියාගම | 30 ඩී. කරව්ව | කරව්ව | ආරක්ෂිත ස්මාරක - 2349 /42 2023.09.16 |

- **ගාල්ල දිස්ත්‍රික්කය - ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත ස්මාරක**

| ස්ථානීය අංකය | ස්ථානයේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | වෙනත් |
|---|---|---|---|---|---|
| 1 | අම්පේගම ක්ෂේත්‍රාරාමය විහාරය | වැලිවිටිය දිවිතුර | 192, අම්පේගම | අම්පේගම | ගැසට් කිරීමට යෝජනා කර ඇත. |

- **ගාල්ල දිස්ත්‍රික්කය - වෙනත් ස්මාරක**

| ස්ථානීය අංකය | ස්ථානයේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම | ගම | වෙනත් |
|---|---|---|---|---|---|
| 2 | හැඩිදෙමළකන්ද දුටුගැමුණු රජමහා විහාරය | බද්දේගම | සන්දරවල | සන්දරවල | |
| 7 | හැම්මැලිය පුරාණ ගල්ගමු රජමහා විහාරය | බද්දෙගම | හැම්මැලිය | හැම්මැලිය | |
| 8 | බලගොඩ රාජපූජිත ශ්‍රී සුනන්දාරාම පුරාණ රජමහා විහාරය | බද්දේගම | බලගොඩ | බලගොඩ | |
| 11 | බලගොඩ ශ්‍රී සුනන්දාරාම පුරාණ මහා විහාරය | බද්දේගම | බලගොඩ | බලගොඩ | |
| 41 | බද්දේගම ශ්‍රී පාද චෛත්‍යාරාමය | බද්දේගම | බද්දෙගම දකුණ | ගොතටුව | |
| 32 | ගම්මැද්දේගොඩ ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරය | නාගොඩ | ගම්මැද්දේගොඩ | ගම්මැද්දේගොඩ | |
| 16 | ගුරුසිංහගොඩ දීපාරාම පුරාණ විහාරය | වැලිවිටිය - දිවිතුර | ගුරුසිංගොඩ | ගුරුසිංගොඩ | |
| 25 | හත්තක මාලිගාතැන්න පුරාණ විහාරය | නියාගම | 33, හත්තක | හත්තක | |
| 5 | බටුවන්ගල රජමහා විහාරය | නෙළුව | බටුවන්ගල | බටුවන්ගල | |

(iii) දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබෙන නඩත්තු කලාප කාර්යාල හරහා මේ ස්ථානවල අධීක්ෂණ කටයුතු සිදු වනවා.

(iv) අපට තිබෙන තොරතුරු අනුව නිශ්චිතව උඩරට රාජධානිය නියෝජනය කරන බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරයත්, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනන්ගල ගංගාරාම විහාරයත්, වැලිවිටිය දිවිතුර ගංගාරාම පුරාණ විහාරයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ නිශ්චිතව සටහන් වුණු ස්ථාන හැටියට හඳුනාගෙන තිබෙනවා.

(v) වැලිවිටිය දිවිතුර ගංගාරාම විහාරස්ථානයේ විහාරගෙය හා අම්පෙගම ක්ෂේත්‍රාරාම විහාරස්ථානයේ බිතු සිතුවම් සංරක්ෂණය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. කලාප භාර නිලධාරි මඟින් සකස් කර ගත් ප්‍රමුඛතා ලේඛනයක් අනුව එම ස්ථානවල බිතු සිතුවම් සංරක්ෂණය කිරීම සඳහා විශේෂ මැදිහත්වීමක් මේ වනවිටත් සිද්ධ වෙනවා.

(vi) ගරු කථානායකතුමනි, පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව ඉතාම ශෝචනීය තත්ත්වයක් අපට ඉතිහාසය තුළ දැක ගන්න ලැබී තිබෙනවා. යම් යම් අවස්ථාවල ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන නිදන් හොරුන්ගේ නිජබිම් බවට පත් වෙලා තිබුණා. සමහර අවස්ථාවල දේශපාලන අධිකාරිත්වයේ මැදිහත්වීම් සහිතව පවා එම නිදන් හැරීමේ ක්‍රියාවලියක් පසුගිය කාලය තුළ සිද්ධ වෙලා තිබෙනවා. එවැනි ස්ථාන ගණනාවක් අපට නිරීක්ෂණය වෙලාත් තිබෙනවා. ඒ නිසා ඒ තත්ත්වය තේරුම් අරගෙන අපි අමාත්‍යාංශයක් හැටියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල හරහා ඒ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන සංරක්ෂණ කර ගැනීම සඳහාත්, ඒ වාගේම ඒ වටිනාකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහාත් විශේෂ වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතර වශයෙන් මා සඳහන් කරන්න කැමැතියි, අපේ රටේ හඳුනා නොගත් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන විශාල ප්‍රමාණයක් තව තිබෙන බව. ඒ නිසා නව රජය හැටියට අපි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන දහසක් සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් යෝජනා කර තිබෙනවා. ඒ අනුව මේ ස්ථානවලට අදාළ ඒ දැනුවත් කිරීමේ කාර්යයන් සිද්ධ කරමින් පවතිනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පුරාවිද්‍යා සහ ඓතිහාසික තත්ත්වයන් පිළිබඳ කරුණු අපි වැඩියෙන් වශයෙන් මතු කර ගන්න ඕනෑ කාලයක් දැන් පවතින්නේ. ඒ නිසා මම ඔබතුමාට යෝජනාවක් ඉදිරිපත් කරනවා, ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාගේ සහ ලේකම්තුමාගේ නායකත්වයෙන් පුරාවිද්‍යාත්මක ඇගයීම් කරන ප්‍රදේශ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නිතර නිතර රැස්වෙන සංවිධාන ව්‍යුහයක් හදන්න අපට පුළුවන්ද කියලා. එතකොට අපට මේ විෂයය විශේෂයෙන්ම මතු කරලා ගන්න පුළුවන්, දිස්ත්‍රික්කයක් විධියට. ඒ සම්බන්ධව නීතිමය බාධාවක් තිබෙනවාද, අපට එහෙම කමිටුවක් යෝජනා කර එම වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන්ද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණය සාක්ෂාත් කර ගැනීම සඳහා අපි අමාත්‍යාංශයක් හැටියට මේ වනවිටත් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. ඒ අනුව "උරුමයට ජීවයක්" කියන වැඩසටහන යටතේ පුරාවිද්‍යාත්මක ස්ථාන දහසක් සංරක්ෂණය කිරීමේ විශේෂිත වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නට අපි කටයුතු සූදානම් කර තිබෙනවා. විශේෂයෙන්ම ඒ හරහා දිස්ත්‍රික්ක හෝ ප්‍රදේශ පදනම් කර ගත් ප්‍රජා සංරක්ෂණ කමිටු පිහිටුවන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රජා සංරක්ෂණ කමිටුවලට ප්‍රදේශයේ ජනතාවගේ දායකත්වයත්, ඒ වාගේම එම ප්‍රදේශවල සිටින ඒ සම්බන්ධව උනන්දුවක් දක්වන අයගේ සහභාගිත්වයත් ලබාගෙන, ප්‍රජා සංරක්ෂණ කමිටු ව්‍යුහය හරහා එවැනි ස්ථාන නඩත්තු කරන්නත්, රැකබලා ගන්නත් අවශ්‍ය කරන මහ පෙන්වීම කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට නුදුරේදීම අපට පිළිතුරක් සපයා ගන්නට පුළුවන්කමක් ලැබෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය තුළ මේ මොහොත වනවිට දැවෙන ප්‍රශ්නයක් ගැන සාකච්ඡාවට බඳුන් වෙමින් පවතිනවා. අපේ බුද්ධ ශාසනයේ උන්නතියට බාධා වන ගැටලු ගොඩක් පසුගිය කාලයේ මතු වී තිබුණා; භික්ෂූන් වහන්සේලා සිවුරු හැර යාම වාගේ දේවල්. ඒ නිසා එවැනි ගැටලු පිළිබඳව සොයා බැලිය යුතුයි. මම ඊයේ පෙරේදා දවසක මාධ්‍ය සාකච්ඡාවක දැක්කා, මේ හේතුව නිසාම "යතිවර මාපිය නිවහන" කියලා අලුත් වැඩසටහනක් ඔබතුමන්ලා රටට හඳුන්වා දී තිබෙන බව. ඇත්තටම අපට මේ පිළිබඳව තොරතුරු දැන ගන්න අවශ්‍යයි. ඒ කියන්නේ මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ කොහොමද, මේ වැඩසටහන තුළ කොපමණ ප්‍රමාණයකට ආධාර කරන්න පුළුවන්ද, එම ක්‍රියාවලිය ඉදිරියට යන්නේ කොහොමද කියලා මේ සභාව දැනුවත් කළොත් හොඳයි කියා මා හිතනවා. මොකද, ගොඩක් අය මේ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා. ස්වාමීන් වහන්සේලා විශාල ප්‍රමාණයක් මෙම වැඩසටහන ගැන වර්ණනා කරමින් මේ කටයුත්ත කෙරෙන විධියට පිළිබඳව තොරතුරු ලබා දෙන්න කියා අපට කථා කර කියනවා. ඒ නිසා මම මේ පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළේ ඉතාම කාලෝචිත ප්‍රශ්නයක්. මේ දිනවල විශේෂ සාකච්ඡාවට ලක් වෙච්ච මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, අපි අමාත්‍යාංශයක් හැටියට ක්‍රියාත්මක කරන්න යෝජිතව තිබෙන "යතිවර මාපිය නිවහන" කියන විශේෂ වැඩසටහන. කාලාන්තරයක් තිස්සේ බුද්ධ ශාසනයේ ප්‍රධානම කාර්යභාරයක් කරන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ මේ අසීරුතාව පිළිබඳව, අවශ්‍යතාව පිළිබඳව අපි සාකච්ඡා කරමින් සිටියා. නමුත්, ඒ සාකච්ඡාවෙන් ඔබ්බට ගිහින් ඵල දරන යම් ක්‍රියාමාර්ගයක් හැටියට එය ක්‍රියාත්මක කරන්න අපි සමත් වුණා, "යතිවර මාපිය නිවහන" වැඩසටහන යටතේ. ගරු මන්ත්‍රීතුමනි, මේ යටතේ අපි බලාපොරොත්තු වෙනවා ශාසනයට ඇතුළු වන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ දෙමාපියන් වෙනුවෙන් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න. නිවාස සංවර්ධන අධිකාරියත් සම්බන්ධ කරගෙන, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හැටියට අපි බලාපොරොත්තු වෙනවා එවැනි භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 15ක ආධාර මුදලක් ලබා දී නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න. අපි දන්නවා, අපේ භික්ෂු ශාසනයට ඇතුළත් වෙලා ඉන්න භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයකගේ දෙමාපියන් ඉතාම අසීරු ජීවිත ගත කරන අය බව.

අමාත්‍යාංශයක් හැටියට ගරු ජනාධිපතිතුමාගේත් මැදිහත්වීම සහිතව, එතුමාගේ උපදෙස් අනුව අපි මේ සකස් කරපු "යතිවර මාපිය නිවහන" වැඩසටහන වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙනවා. ඉදිරි කාලය තුළ නිවාස 1,000ක් ඉලක්ක කරගෙන මේ වැඩ පිළිවෙළ රට පුරා ක්‍රියාත්මක කරන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා ඈත එපිට දුෂ්කර ගම්මානවලින් භික්ෂු ශාසනයට ඇතුළු වෙච්ච ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ දෙමාපියන් වෙනුවෙන් මේ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන්න. ඒ වෙනුවෙන් මේ වන විටත් විශාල ප්‍රතිචාර ලැබෙමින් තිබෙනවා. අපි මේ අවුරුද්ද තුළම මේ ක්‍රියාවලිය ආරම්භ කර ඉතාම කඩිනමින් එවැනි අවශ්‍යතා තිබෙන දෙමාපියන් වෙනුවෙන් මැදිහත් වීමක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1834/2026- (1), ගරු රුවන්තිලක ජයකොඩි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## උපරිම මිලට වඩා වැඩි මිලට පාරිභෝගික භාණ්ඩ විකිණීම: වැලැක්වීමට ගත් පියවර
## நுகர்வுப் பொருட்களை அதிகபட்ச விலைக்கு அதிகமாக விற்றல்: தடுப்பதற்கான நடவடிக்கை
## SALE OF CONSUMER GOODS AT PRICES OVER MAXIMUM PRICE: PREVENTIVE ACTION TAKEN

22/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon.Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමහර පාරිභෝගික භාණ්ඩ සඳහා වරින් වර රජය විසින් උපරිම මිලක් නියම කරනු ලබන බවත්;

(ii) එම භාණ්ඩ සමහර වෙළෙන්දන් විසින් වැඩි මිලට අලෙවි කරන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම භාණ්ඩ වැඩි මිලට අලෙවි කරන වෙළඳසැල් වටලන ආයතනය කවරේද;

(ii) එම ආයතනය විසින් මාසිකව සිදු කරනු ලබන වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) භාණ්ඩ වැඩි මිලට අළෙවි කරන පුද්ගලයන්ට ලබා දිය හැකි දඩුවම් කවරේද;

(iv) දිගින් දිගටම වැඩි මිලට භාණ්ඩ අළෙවි කරන වෙළඳසැල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சில நுகர்வுப் பொருட்களுக்கு அரசாங்கம் அடிக்கடி அதிகபட்ச விற்பனை விலையை நிர்ண யிக்கின்றது என்பதையும்;

(ii) மேற்படி பொருட்களை குறிப்பிட்ட சில வர்த்த கர்கள் அதிக விலைக்கு விற்பனை செய்கின் றார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(ஆ) (i) மேற்படி பொருட்களை அதிக விலைக்கு விற்பனை செய்யும் வர்த்தக நிலையங்களை சுற்றிவளைக்கும் நிறுவனம் யாது என்பதையும்;

(ii) மேற்படி நிறுவனம் மாதாந்தம் மேற்கொள்ளும் சுற்றிவளைப்புகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) பொருட்களை அதிக விலைக்கு விற்பனை செய்யும் ஆட்களுக்கு வழங்கக்கூடிய தண்ட னைகள் யாவை என்பதையும்;

(iv) தொடர்ச்சியாக அதிக விலைக்குப் பொருட்களை விற்பனை செய்யும் வர்த்தக நிலையங்கள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he admit that -

(i) the Government sets a maximum price for some consumer goods from time to time; and

(ii) those goods are sold by some traders at higher prices?

(b) Will he inform this House the -

(i) name of the agency that raids the shops selling those goods at higher prices;

(ii) number of raids per month carried out by the aforesaid agency;

(iii) penalties that can be imposed on the persons selling goods at higher prices; and

(iv) actions taken against the shops that continue to sell goods at higher prices?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

(ii) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2025 වර්ෂය තුළ දිවයින පුරා මුළු වැටලීම් 23,089ක් සිදු කර ඇත. ඒ අනුව, එම ආයතනය විසින් මාසිකව සාමාන්‍යයෙන් සිදු කරන වැටලීම් සංඛ්‍යාව 1,924ක් පමණ වේ.

(iii)
- 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත සංශෝධනය කරන ලද, 2021 අංක 20 දරන (සංශෝධන) පනත අනුව භාණ්ඩ වැඩි මිලට විකිණීම සම්බන්ධයෙන් පහත දඩුවම් නියම කළ හැකිය.
- තනි පුද්ගලයෙකු සඳහා (පළමු වරද): රු. 100,000 සිට රු. 500,000 දක්වා දඩයක් හෝ මාස 6 දක්වා සිර දඬුවමක් හෝ මේ දෙකම.
- තනි පුද්ගලයෙකු සඳහා (නැවත කරන වරදක්): රු. 200,000 සිට රු. 1,000,000 දක්වා දඩයක් හෝ වසර 1 දක්වා සිර දඬුවමක් හෝ මේ දෙකම.
- සමාගමක් සඳහා (පළමු වරද): රු. 500,000 සිට රු. 5,000,000 දක්වා දඩයක්.
- සමාගමක් සඳහා (නැවත කරන වරදක්): රු. 1,000,000 සිට රු. 10,000,000 දක්වා දඩයක්.

(iv) දිගින් දිගටම නීතිය උල්ලංඝනය කරන වෙළෙන්දන් සඳහා ඉහත සඳහන් කළ පරිදි "නැවත කරන වැරදි" - subsequent offences - යටතේ වැඩි කරන ලද දඩ මුදල් සහ සිර දඬුවම් ලබා දීමට අධිකරණ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1717/2025- (1), ගරු ආර්.ජී. විජේරත්න මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජයේ රෝහල්: උපස්ථායක හිඟය
## அரசாங்க வைத்தியசாலைகள்: கவனிப்பாளர்கள் பற்றாக்குறை
## GOVERNMENT HOSPITALS: SHORTAGE OF ATTENDENTS

1834/2026

**10. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රුවන්තිලක ජයකොඩි මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Ruwanthilaka Jayakody)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජයේ රෝහල්වල සේවය කරනු ලබන උපස්ථායක/ උපස්ථායිකාවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) සේවා අවශ්‍යතාවට සාපේක්ෂව එම රෝහල්වල උපස්ථායකවරුන්ගේ අඩුවක් තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) උසස් තත්ත්වයේ රෝගී සත්කාරක සේවාවක් ලබා දීම සඳහා, එක් උපස්ථායකවරයෙකුට වෙන් කළ යුතු රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ රෝහල්වල අවශ්‍ය ප්‍රමාණයට උපස්ථායකවරුන් නොමැති වීම හේතුවෙන්, රෝගීන්ගේ භාරකරුවන්හට මුදල් ගෙවා බාහිර උපස්ථායකවරුන් ලබා ගැනීමට සිදුව ඇති බවත්;

(ii) දින කිහිපයක් සඳහා උපස්ථායකවරයෙකුගේ සේවය ලබා ගැනීමට අධික වියදමක් දැරීමට සිදු වන බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) රජයේ රෝහල්වල නේවාසික ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා අවශ්‍ය උපස්ථායකවරුන් බඳවා ගැනීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க வைத்தியசாலைகளில் பணியாற்றும் கவனிப்பாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) சேவைத் தேவைப்பாட்டுடன் ஒப்பிடுகையில் மேற்படி வைத்தியசாலைகளில் கவனிப்பாளர்களின் பற்றாக்குறை நிலவுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வெண்ணிக்கை யாது என்பதையும்;

(iv) சிறந்த நோயாளர் பராமரிப்புச் சேவையை வழங்கும் பொருட்டு கவனிப்பாளர் ஒருவருக்குப் பொறுப்பளிக்கக்கூடிய நோயாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரசாங்க வைத்தியசாலைகளில் போதியளவு கவனிப்பாளர்கள் இன்மையால், நோயாளர்களின் பொறுப்பாளர்கள் கட்டணம் செலுத்தி வெளிக் கவனிப்பாளர்களின் சேவையைப் பெற்றுக்கொள்ள வேண்டிய நிலை ஏற்பட்டுள்ளது என்பதையும்;

(ii) சில நாட்களுக்குக் கவனிப்பாளர்களின் சேவையைப் பெற்றுக்கொள்வதற்கு அதிக செலவு ஏற்படுகின்றது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) அரசாங்க வைத்தியசாலைகளில் தங்கி சிகிச்சைப் பெறும் நோயாளர்களுக்குச் சேவையாற்றுவதற்குத் தேவையான கவனிப்பாளர்களை ஆட்சேர்த்துக் கொள்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the total number of attendants serving in government hospitals at present;

(ii) whether there is a shortage of attendants in government hospitals as compared to the service requirement;

(iii) if so, the number; and

(iv) the patient-to-attendant ratio that should be there in order to provide high-quality patient care services?

(b) Will he admit that -

(i) guardians of the patients have had to pay money and obtain the services of external attendants due to the lack of the required number of attendants in government hospitals; and

(ii) a very high cost has to be incurred in order to obtain the service of an external attendant for a few days?

(c) Will he also inform this House whether steps will be taken to recruit the required number of attendants to provide services to inpatients in government hospitals?

(d) If not, why not?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මධ්‍යම රජය යටතේ පවතින රෝහල්වල සේවය කරනු ලබන උපස්ථායක/ උපස්ථායිකාවන්ගේ සංඛ්‍යාව 3,428කි.

(ii) ඔව්.

(iii) 2,838යි.

(iv) එක් එක් රෝහල අනුව ද, ප්‍රතිකාර ලබන ඒකකය අනුව ද, රෝගීන්ගේ තත්ත්වය අනුව ද සාත්තු සේවකයෙකු විසින් රැක බලාගත යුතු රෝගීන් ප්‍රමාණය වෙනස් වන බැවින් නිශ්චිත සංඛ්‍යාවක් සඳහන් කළ නොහැක.

(ආ) (i) රජයේ රෝහල්වල දැනට සිටින උපස්ථායකවරුන් කළමනාකරණය මඟින් රෝගී සත්කාර සේවා පවත්වාගෙන යන අතර, මුදල් ගෙවා බාහිර උපස්ථායකවරුන් ලබා ගැනීම රෝගියාගේ පෞද්ගලික කැමැත්ත මත සිදු වේ.

(ii) අදාළ නොවේ.

(ඇ) සීමිත පදනමින් සාත්තු සේවක තනතුරු 1,000ක් සඳහා බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් තෝරාගෙන ඇති අතර, පත්වීම් ලබා දීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

ඊට අමතරව, විවෘත පදනමින් උපස්ථායක තනතුරු 710ක් බඳවා ගැනීමට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අපරාධ මැඩලීම සඳහා රාජ්‍ය ආරක්ෂක යන්ත්‍රණය ශක්තිමත් කිරීම
### குற்றச் செயல்களை ஒடுக்குவதற்கு அரச பாதுகாப்புப் பொறிமுறையை வலுப்படுத்தல்
### STRENGTHENING STATE SECURITY MECHANISM TO SUPPRESS CRIMES

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, වෙඩි තැබීම්, මනුෂ්‍ය ඝාතන සහ ප්‍රසිද්ධ පුද්ගලයන්ට එරෙහි ප්‍රහාර වර්ධනය වීමත් සමඟ, ඒ වාගේම සිවිල් පුරවැසියන්ගේ ජන ජීවිත අනාරක්ෂිත වීමත් සමඟ, රාජ්‍ය ආරක්ෂක යන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳව ජනතා විශ්වාසය කම්පනයට ලක් වී තිබෙනවා. එම පසුබිම තුළ ශක්තිමත් පොලිස් සේවයක අවශ්‍යතාව වැදගත් වන හෙයින් මම පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

01. ශ්‍රී ලංකා පොලීසියේ එක් එක් තනතුරු සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද? එම පුරප්පාඩු පවතින්නේ කොපමණ කාලයක සිටද? එම පුරප්පාඩු පුරවන්නට ගන්නා පියවර මොනවාද?

02. පසුගිය දශකය තුළ සිදු වූ වෙඩි තැබීම්, මනුෂ්‍ය ඝාතන, සංවිධානාත්මක අපරාධ සිදුවීම් සංඛ්‍යාව වර්ෂ අනුව දක්වන්නේද? එම සිදුවීම් අතුරින් සැකකරුවන් අත් අඩංගුවට ගැනීම්, නඩු පැවරීම් සහ මෙතෙක් විමර්ශන අවසන් නොවූ සිදුවීම් සංඛ්‍යාව වෙන් වෙන්ව දක්වන්නේද?

03. මෙරට සිදු වන අපරාධ රැල්ල මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්තව කටයුතු කරන නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් යැයි රජය සිතන්නේද?

විශේෂයෙන්ම පැලර්මෝ ප්‍රඥප්තිය, ඒ වාගේම UNTOC කියන යන්ත්‍රණ හරහා අපරාධ කල්ලි මර්දනය කිරීමේ, මැඩ පැවැත්වීමේ ක්‍රමවේද භාවිත කරන්නට පුළුවන්. එම ක්‍රමවේද භාවිත කරන්නට රජය කටයුතු කරමින් සිටිනවාද?

04. මෙරට ක්‍රියාත්මක දේශීය හා ජාත්‍යන්තර අපරාධ ජාල මර්දනය සඳහා වත්මන් රජය ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග කවරේද?

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම අමතරව මේ කාරණය කියන්න කැමැතියි. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියක් තිබෙනවා, framework එකක් තිබෙනවා, යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවා, ඒක පුද්ගල පොලිස් නිලධාරීන් සංඛ්‍යාව -per capita policemen- පිළිබඳව. ඒ සංකල්පය අනුව පුද්ගලයෝ 1,000කට 2.2ක වාගේ අනුපාතයක් තිබෙන්නේ. ඒක තමයි ජාත්‍යන්තර ප්‍රමිතිය. අන්න ඒ වාගේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම, ආරක්ෂක අංශවලට ප්‍රවේශ වීම උනන්දු කරවීම වාගේ වැඩසටහන් පිළිබඳව රජය ගෙන තිබෙන ප්‍රතිපත්තිමය තීන්දු සහ ක්‍රියාත්මක කරන තීන්දු මොනවාද කියා මම අහන්න කැමැතියි.

05. වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පොරොන්දුවක් වූ, දිගු කාලයක් විමර්ශන අවසන් නොවී පවතින ප්‍රසිද්ධ සිදුවීම් මෙරට දේශපාලනඥයින්ගේ, මාධ්‍යවේදීන්ගේ සහ ක්‍රීඩකයින්ගේ දේශපාලන ඝාතන ඇතුළු තවත් සිවිල් ප්‍රජාවගේ ඝාතන පිළිබඳව විශේෂ කමිටු හෝ ස්වාධීන පරීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර තිබේද? එසේ නම්, ඒ කවර පුද්ගලයින් සම්බන්ධවද? ඒවායේ ප්‍රගතිය කෙබඳුද?

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, ඝාතනයට ලක් වුණු ලසන්ත වික්‍රමතුංග, ධර්මරත්නම් සිවරාම්, නිමලරාජන්, සුබ්‍රමනියම් සුකිර්දරාජන්, ප්‍රගීත් එක්නැළිගොඩ සහ ප්‍රහාරයට ලක් වුණු, පෝද්දල ජයන්ත, කීත් නොයාර්, උපාලි තෙන්නකෝන්, ලාල් හේමන්ත මාවලගේ ඇතුළු මාධ්‍යවේදීන් හා ඒ තත්ත්වයට පත් වුණු තවත් විශාල පිරිසක් ඉන්න බව. එම අපරාධ මෙහෙයවන්නට කටයුතු කළ අය, ඊට වග කිවයුත්තන් වෙනුවෙන් මොකක්ද ගෙන තිබෙන පියවර? සිදු වන ඝාතන රැල්ල, අපරාධ රැල්ල, මිනීමැරුම් නවතාලීම සඳහා වහාම යම්කිසි අලුත් වැඩ පිළිවෙළකට ප්‍රවේශ වීම අත්‍යවශ්‍යයි. මම මේ අවස්ථාවේ ඒ සඳහා රජය උනන්දු කරවනවා. ඒ පිළිබඳව රජයේ ප්‍රතිචාරය කුමක්ද කියා මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා හෙට දිනයේදී මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කරපු යෝජනාවට මම එකඟයි. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. නමුත්, ඒකට අදාළව පැහැදිලි කිරීමක් කරන්න මට පොඩි අවස්ථාවක් දෙන්න. ගරු කථානායකතුමනි, සමාවෙලා ඔබතුමාගේ අවසර ඇතිව මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අපි ඊළඟ වැඩ කටයුතුවලට යන්නට අවශ්‍යයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක වැදගත් කාරණාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩියක කාලයක් ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි, විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මම මේ සභාවේ යම්කිසි හෙළිදරව්වක් කළ බව, විශේෂයෙන්ම පොලිස් වාර්තාවක් ගැනීමට නම් සිවිල් ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්ගෙන් චරිත සහතිකයක් ගැනීම, නිර්දේශයක් ගැනීම අවශ්‍යයි කියලා. රජය ඒක ප්‍රතික්ෂේප කළා. දැන් ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මම මේ සභාවට ඒ කරුණු නම් ගම් එක්ක ඉදිරිපත් කළා. හෙට දවසේ ඒ අයව CID එකට කැඳවා තිබෙනවා, ඒගොල්ලන්ගෙන් ප්‍රශ්න කරන්න. ගරු කථානායකතුමනි, මම විපක්ෂ නායකවරයා හැටියට මේ සභාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු කාරණා ඉදිරිපත් කළා. ඇත්ත කථාව මම කිව්වේ. ඒ අයගේ නම් ගම් ඔක්කෝම මා ළඟ තිබෙනවා. යසන්ත ආරියසේන, තෙවුනි ජයවර්ධන, සකුෂා රොෂානි කියන අය CID එකට කැඳවා තිබෙනවා. ඇත්තටම යසන්ත ආරියසේන කියන මහත්මයා තමයි ඒ සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති. දැන් ඔහුව CID එකට කැඳවා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මේක බරපතළ ප්‍රශ්නයක්, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට විනාඩියක් ලබා දුන්නා, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මම විනාඩියක කාලයක් ලබා දුන්නා. බොහොම ගෞරවයෙන් ඒ විනාඩිය ඔබතුමාට ලබා දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකවරයා හැටියට මටත්, මේ මන්ත්‍රීවරුන් සියලු දෙනාටත් අයිතියක් තිබෙනවා මේ සභාවේ කරුණු හෙළිදරව් කරන්න. මම හෙළිදරව් කළා, පොලිස් වාර්තා ලබා ගැනීමේදී සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපතිවරයාගේ නිර්දේශය, චරිත සහතිකය ගැනීම අත්‍යවශ්‍යයි කියන කාරණාව. රජය කිව්වා, ඒක එහෙම නැහැ කියලා. ඒ තොරතුරු ලබා දුන්නු අයගේ නම් ටිකත් මම එදා කිව්වා. ඒ අයව හෙට දවසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබෙනවා ප්‍රශ්න කරන්න. මට තොරතුරු ලබා දීලා, ඒ තොරතුරු ලබා දුන්නු අයගේ නම් ගම් පවා මම මේ සභාවේ කිව්වා. මේක හැංගිලා කරපු දෙයක් නොවෙයි. එහෙම කිව්වාට පස්සේ ඒගොල්ලන්ව CID එකට කැඳවන එක හරි ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකට ඔබතුමා තීන්දුවක් දෙන්නට ඕනෑ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්නට ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මට පිළිතුරු දෙන්න බැහැ නේ, ගරු විපක්ෂ නායකතුමා. මහජන ආරක්ෂක අමාත්‍යතුමා තමයි ඒ සම්බන්ධයෙන් පිළිතුරු දෙන්න ඕනෑ. එතුමා පිළිතුරක් ලබා දේවි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

# II

## මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් වෙන් කිරීම හේතුවෙන් උතුරු හා නැඟෙනහිර ජන සනත්වයට ඇති කරන බලපෑම
## மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழான நில ஒதுக்கீடு வடக்கு, கிழக்கு மக்களின் குடிப்பரம்பல்மீது ஏற்படுத்தும் தாக்கம்
## IMPACT ON DEMOGRAPHY OF NORTH AND EAST DUE TO LAND ALLOCATION MADE UNDER MAHAWELI DEVELOPMENT PROJECT

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது கேள்வி, மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் தேசிய இன விகிதத்தின் பிரகாரம் நிலப்பகிர்வு செய்தல் மற்றும் வடக்கு, கிழக்கு மாகாண மக்களின் குடிப்பரம்பல்மீது அது ஏற்படுத்தும் தாக்கம் தொடர்பானது.

பல தசாப்தங்களாக, மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் மேற்கொள்ளப்பட்ட நில ஒதுக்கீடு மற்றும் குடியேற்ற நடவடிக்கைகள் தொடர்பாகத் தமிழ் அரசியல் பிரதிநிதிகளும், பாதிக்கப்பட்ட உள்ளூர் சமூகங்களும் குற்றச்சாட்டுகளை முன்வைத்து வருகின்றனர். குறிப்பாக, சம்பந்தப்பட்ட சுற்று நிருபத்தின்கீழ் அரச காணிகளை ஒதுக்கீடு செய்யும்போது தேசிய இன விகிதாசாரம் பேணப்படாததனால் பூர்வீகமாகத் தமிழர்கள் வாழ்ந்துவந்த பகுதிகளில் இன விகிதாசாரப் பரம்பலில் மாற்றம் ஏற்பட்டுள்ளதாகவும், சிங்கள பௌத்த பேரினவாத அரசினால் திட்டமிட்ட சிங்களக் குடியேற்றம் நடைபெறுவதாகவும் குற்றச்சாட்டுகள் முன்வைக்கப் பட்டுள்ளன.

அண்மைக் காலங்களில் முல்லைத்தீவு, வவுனியா மாவட்டங்களில் இடம்பெறும் கிவுல் ஓயா திட்டத்துடன் தொடர்புடைய நடவடிக்கைகள் மற்றும் மயிலத்தமடு, மாதவனை போன்ற மேய்ச்சல்தரை நிலங்களின் பிரச் சினைகள், குடியேற்றக் கொள்கை மற்றும் நீர்ப்பாசனம் உள்ளிட்ட வளங்களின் சமமான அணுகல் குறித்து பொதுமக்களின் கவலை அதிகரித்துள்ளது. இது தொடர்பில் பொது முக்கியத்துவம் வாய்ந்த அவசர விடயமாக கௌரவ அமைச்சரிடமிருந்து பின்வரும் விளக்கங்கள் கோரப் படுகின்றன.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்விகள் சம்பந்தமான விடயம் மிக முக்கியமானது. ஏனென்றால், இன்று மகாவலி அதிகாரசபையின் ஊடாக காணிகளைப் பெரும் பான்மையினச் சமூகத்திற்கு வழங்குகின்ற திட்டங்களைக் கொண்டுவந்து, காடுகளை அழித்து உருவாக்கியுள்ள நீர்ப்பாசனத் திட்டங்களில் நீர் வற்றும்போது யானைகளுடைய தொல்லைகள் அதிகரித்து இன்று வாழைச்சேனை நகர்ப் பிரதேசம் வரைக்கும் யானைகள் வந்திருக்கின்றன.

(1) 13வது அரசியலமைப்பு திருத்தச் சட்டத்தின்கீழ், அட்ட வணையின் பின்னிணைப்பு IIஇல் அரச நிலங்களைப் பகிர்ந்தளிக்கும்போது தேசிய இன விகிதம் கருத்தில் கொள்ளப்பட வேண்டும் எனக் குறிப்பிடப்பட்டுள்ளது. அதன்படி, மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் தேசிய இன விகிதத்தின் அடிப்படையில் மாவட்ட ரீதியாக வழங்கப்பட்ட நிலங்களின் அளவை இனரீதியான விபரங்களுடன் தெரிவிக்கவும்.

(2) மகாவலி அபிவிருத்தித் திட்டங்கள் ஆரம்பிக்கப் பட்டதிலிருந்து இதுவரை ஒவ்வொரு தேசிய இனத்திற்கும் வழங்கப்பட்டுள்ள நிலத்தின் மொத்த அளவு (ஏக்கரில்) எவ்வளவு? மேலும், தேசிய இன ரீதியாகப் பயனடைந்த குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவு?

(3) வடக்கு மாகாணத்தில் கிவுல் ஓயா திட்டத்திற்காக எத்தனை ஏக்கர் காணி மகாவலி அபிவிருத்தித் திட்டத்தின் கீழிருந்து பெறப்படுகின்றது? வடக்கு பிராந்தியத்திலிருந்து இந்தத் திட்டத்தின்கீழ் எத்தனை குடும்பங்கள் குடியேற்றப்பட்டுள்ளன? மேலும், எத்தனை குடும்பங்கள் குடியேற்றுவதற்குத் திட்டமிடப் பட்டுள்ளன? இந்தத் திட்டத்தின்கீழ் பயனாளர்களைத் தெரிவுசெய்யப் பயன்படுத்தப்பட்ட முறைமை என்ன?

(4) மயிலத்தமடு மற்றும் மாதவனை உள்ளிட்ட பகுதிகளில் உள்ள விவசாய மற்றும் மேய்ச்சல் நிலங்கள் போன்ற உள்ளூர் மக்களால் முன்பு பயன்படுத்தப்பட்ட காணியில் எவ்வளவு பகுதி மகாவலி அபிவிருத்தித் திட்டத்திற்குள் கொண்டுவரப்பட்டுள்ளது?

(5) கிவுல்ஓயா திட்டத்திற்காக 13,000 ஏக்கர் காணி பயன்படுத்தப்படவுள்ளதாக நாங்கள் அறிகின்றோம். அவ்வாறாயின் மயிலத்தமடு, மாதவனை விவசாய மற்றும் மேய்ச்சல் தரைக்காக மகாவலி 'எல்' வலயத்திலிருந்து 3,000 ஹெக்டயர் காணியை விடுவிப்பதில் உள்ள பிரச்சினை என்ன?

(6) மகாவலி 'கே' வலயத்தை புதிதாக உருவாக்கத் திட்டமிடப்பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். இதனை எங்கே உருவாக்குவதற்குத் திட்டமிடப் பட்டுள்ளது? இதற்காகப் பயன்படுத்தப்படவிருக்கின்ற காணியின் விஸ்தீரணம் எவ்வளவு என்பதுடன், இந்த 'கே' வலயத் திட்டத்தின் நோக்கம் என்ன?

(7) நில ஒதுக்கீட்டுக் கொள்கைகள் காரணமாக மக்கள் அமைப்பில் மாற்றம் அல்லது உள்ளூர் தேசிய இனங்களின் இடம்பெயர்வு மற்றும் புறக்கணிப்பு ஏற்படாமல் இருக்க அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் என்ன?

கௌரவ சபாநாயகர் அவர்களே, இது மிக முக்கியமான விடயம். மகாவலி அதிகாரசபையின் ஊடாக இந்தப் பிரதேசங்களிலே உள்ள எங்களுடைய மக்களுக்கு மகாவலி கங்கையின் ஒரு சொட்டுத் தண்ணீர்கூட வராத நிலையில், அவர்களின் காணிகளில் மண் அகழ்வு போன்ற விடயங்களைச் செய்ததனால் இன்று மட்டக்களப்பு விவசாயிகள் வெள்ளத் தினால் பெருமளவு பாதிக்கப்பட்டிருக்கிறார்கள்; ஒரு மூடை நெல்லை 5,000 ரூபாய்க்குகூட விற்க முடியாத சூழலில் இருக்கிறார்கள். அத்துடன், வெள்ளத்தால் பாதிக்கப்பட்ட விவசாயிகள் குறித்த திகதிக்குள் பதியாததால் அவர்களுக்குக் காப்புறுதி வழங்க முடியாது என்று சொல்லப்பட்டிருக்கிறது. இவ்வாறான பின்னணியில்தான் இந்தக் கேள்விகளை நான் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කාලීනව ඉතා වැදගත් ප්‍රශ්නයක් තමයි ඉදිරිපත් කරනු ලැබුවේ. ඒ සඳහා විධිමත් වූ පිළිතුරක් ලබා දිය යුතු බැවින් පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இரண்டு வாரகால அவகாசம் கேட்டிருந்தார். அது எனக்குப் பிரச்சினையல்ல. இது தேசிய முக்கியத்துவம் வாய்ந்த விடயம் என்ற அடிப்படையிலேதான் இந்தக் கேள்வியை நான் முன்வைத்திருக்கிறேன். அந்த வகையிலே, இந்த ஒரு விடயத்தை மாத்திரம் குறிப்பிடுவதற்கு அனுமதியுங்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, අමාත්‍යාංශ නිවේදන.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ස්ථාවර නියෝග 27(2) යටතේ මම අහපු ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා ගරු නියෝජ්‍ය ඇමතිතුමා සති දෙකක කාලයක් ඉල්ලනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, පැහැදිලි කර ගැනීමකට විනාඩි 5 බැගින් ලබා දීම සඳහා අපි ඊයේ Parliamentary Business Committee එකේදීත් එකඟතාවකට ආ බව. ඒ අනුව, පැහැදිලි කර ගැනීමකට විනාඩි 5ක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. පිළිතුරු ලබා දුන්නාට පස්සේ තමයි පැහැදිලි කර ගැනීම කරන්න ඕනෑ. දැන් එතුමා පිළිතුරු දෙන්න සති දෙකක් කල් ගත්තා නේ. එතැනින් පස්සේ ඒක ඉවරයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, I am raising an important matter. I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, අපි ඊයේ Parliamentary Business Committee එකේදී යම් එකඟතාවකට ආවා. ඔබතුමා මූලසුනේ ඉඳන් කරන ක්‍රියාකලාපයත් නිසා තමයි මේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය අතර හැම දාම ගැටුමක් ඇතිවන්නේ. ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. මම ජාතික වැදගත්කමකින් යුතු කාරණයක් නේ, ඇහුවේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2), 92(2)(ආ) සහ 3(2) යටතේ points තුනක් තිබෙනවා. සාමාන්‍යයෙන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්න පුළුවන්. ස්ථාවර නියෝග 27(2)හි පැහැදිලිව සඳහන් කර තිබෙනවා, පක්ෂ නායකයකුට හෝ විපක්ෂ නායකවරයාට විතරයි ප්‍රශ්න අහන්න පුළුවන් කියලා.

රාසමාණික්කම් මන්ත්‍රීතුමා අද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවේ එතුමා පක්ෂ නායකයකු හැටියට පත් කර තිබෙන නිසා. ස්ථාවර නියෝග 3(2) යටතේ point එකක් එදාත් මම ඔබතුමාගෙන් ඇහුවා. ඉස්සරහා පේළියේ පුටු දෙන්නේ විපක්ෂ නායකතුමාටයි, Whipටයි, අදාළ පක්ෂයේ අයටයි විතරයි.

ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට තවම ඒ පුටුව දීලා තිබෙන්නේ ඇයි? එතුමාට වඩා seniorsලා ඉන්නවා. එම නිසා ඒකට උත්තර දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා තමයි ඒ පක්ෂයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, මතක තබාගන්න, ස්ථාවර නියෝග 3(2) යටතේ මන්ත්‍රීවරයන්ට ආසන පැනවීම පිළිබඳව මෙසේ සඳහන් වනවා:

> "කථානායකවරයාගේ අභිමතය පරිදි, කලින් කලට, මන්ත්‍රීවරයන් සඳහා ආසන වෙන්කර දෙනු ලැබිය යුත්තේ ය"

ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, අර්චුනා මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා වාඩිවෙන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මගේ නම සඳහන් කළා. ඔබතුමා ස්ථාවර නියෝග, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ පක්ෂ නියෝජනයට අනුව ඉදිරි පෙළ ආසන දෙකක් හිමියි. ඒ අනුව එම ඉදිරි පෙළ ආසන දෙක ලබා දී තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඊයේ Parliamentary Business Committee එකේදී කිව්වා, ස්ථාවර නියෝගවලට අනුව මේ පාර්ලිමේන්තුවේ වැඩකටයුතු කරනවා කියලා. අර්චුනා මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. ඔබතුමාට ඒක ඇහෙන්නේ නැද්ද, එහෙම නැත්නම් ප්‍රශ්නය මොකක්ද කියලා මම දන්නේ නැහැ. මගේ නම සඳහන් කළාම, ස්ථාවර නියෝග යටතේ මට පැහැදිලි කිරීමක් කරන්න ඉඩ තිබෙනවා.

මට කාරණා දෙකක් කියන්න තිබෙනවා. ස්ථාවර නියෝග 27 (2) යටතේ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් මම මතු කළා. පක්ෂ නායකයකු විධියට මට ඒකට අයිතියක් තිබෙනවා. නියෝජ්‍ය ඇමතිතුමා ඒ සඳහා පිළිතුරු දීමට කල් ඉල්ලනවා. වැඩේ වුණාට පසුව කථා කරලා වැඩක් නැහැ නේ. එම නිසා තමයි ඒ system එක තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා. පොඩ්ඩක් අහගෙන ඉන්න, කථානායකතුමනි. හැමදාම උදැසන මේ පාර්ලිමේන්තුව කලබල වෙන්නේ ඔබතුමාගේ ක්‍රියා කලාපය නිසායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට ඕනෑ විධියට මේ පාර්ලිමේන්තුව run කරන්න බැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට අහන්න දෙන්න. මගේ නම සඳහන් කරපු කාරණයත් කියන්න ඕනෑ. ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයේ seats ගැන අපි බලාගන්නම්. අපේ පක්ෂයට seats දෙකක් තිබෙනවා. එකක ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ඉන්නවා; අනෙක් එකේ මම ඉන්නවා. ඒක වෙන කවුරුවත් ගැටලුවක් කරගන්න ඕනෑ නැහැ. අපේ පක්ෂයට අදාළ seats දෙක පක්ෂයේ අපි බෙදාගෙන තිබෙනවා. ඒක නිසා අපේ පක්ෂය සම්බන්ධව, - கௌரவ சிறீதரன் அவர்களுக்கு முன்வரிசை ஆசனம் ஒதுக்கப்பட்டிருப்பதைப் பற்றி கௌரவ அர்ச்சுனா அவர்கள் கவலைப்பட வேண்டிய அவசியமில்லை. அது எங்களுடைய கட்சியினுடைய உள் விவகாரம். எங்களுடைய கட்சிக்கு இரண்டு ஆசனங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன; நாங்கள் அதிலே அமர்ந்திருக்கின்றோம். அந்த வகையில், அவர் அது சம்பந்தமாகத் தொடர்ந்தும் பேச வேண்டிய அவசியமில்லை.

அடுத்து, மட்டக்களப்பு விவசாயிகளுக்கு காப்புறுதி நிறுத்தப்பட்டுள்ளது. கடந்த 11ஆம் திகதியிலிருந்து காப்புறுதி இல்லையென அறிவிக்கப்பட்டு இருக்கின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අනිල් ජයන්ත ඇමතිතුමා. *[බාධා කිරීමක්]* වාඩි වෙන්න, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා.

## 2022 අප්‍රේල් මාසයේදී මූල්‍ය බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමේ නීතිමය පදනම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## 2022, ஏப்பிரலில் நிதி திவால்நிலையை அறிவித்தமைக்கான சட்ட அடிப்படை: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## LEGAL BASIS OF DECLARING FINANCIAL BANKRUPTCY IN APRIL, 2022: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

Hon. Speaker, on behalf of the Hon. Prime Minister, I answer the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 11.11.2025.

(1) Dr. P.N. Weerasinghe was the Governor of the Central Bank of Sri Lanka at that time. Details of past Governors of the Central Bank are available in its official website.

The "Interim debt standstill" was declared on 12th April, 2022 in line with the international experiences and the prevailing situation in the country. A debt standstill refers to the full or partial cessation of debt servicing in the event of a debt crisis as part of an orderly workout procedure to provide leeway for a restructuring during a predefined and a limited time.

(2) Yes. The Monetary Board recommended the debt standstill to the Ministry of Finance on 11th April, 2022. The debt standstill was announced by the Ministry of Finance on 12th April, 2022. Under the provisions of the Monetary Law Act, the Governor or the Monetary Board of the Central Bank of Sri Lanka had no direct communication channel to Parliament. The following members were in the Monetary Board at the time the Ministry of Finance announced the debt standstill: Dr. P.N. Weerasinghe, Mr. S.P. Jayawardena, PC, Dr. R. Jayamaha and Mr. K. M. M. Siriwardana.

On several occasions, prior to the announcement of the debt standstill by the Government of Sri Lanka, the Monetary Board of the Central Bank of Sri Lanka had provided detailed reports to the former Ministers of Finance on the precarious economic condition of the country, reasons thereof and remedial measures to be taken to address such conditions, acting in terms of Sections 64 and 68 of the Monetary Law Act. Those reports explain the depleted positions of the gross official reserves of the country and the country's challenges in honouring its external debt obligations.

Since the power to enter into foreign loans and guarantees related to Government of Sri Lanka was vested with His Excellency the President and the Minister of Finance under the Foreign Loans Act, No. 29 of 1957, which had been repealed now, the announcement of the debt standstill was initially approved by the former President and the former Minister of Finance on 11th April, 2022, pending debt restructuring supported by an IMF programme. At the time of granting the said approval, the Minister of Finance agreed to submit a Cabinet Memorandum for ratification at the earliest possible Cabinet meeting. Based on the approvals given by the then Hon. President and the Minister of Finance on recommendations of the Monetary Board of the Central Bank of Sri Lanka, the Ministry of Finance took steps to publish the "Interim Policy regarding the servicing of Sri Lanka's External Public Debt" on 11th April, 2022 in a note to the Cabinet, which can be provided as an Annex.

The then Minister of Finance submitted a note to the Cabinet of Ministers on the said policy and the same was ratified by the said Cabinet of Ministers on 16th April, 2022. That Annex can be provided.

On 4th May, 2022, the then Minister of Finance made a statement at the Parliamentary session on the current economic situation and negotiations with the IMF and informed Parliament of the debt standstill and the debt restructuring process. If there were any objections by Parliament, there was still time for Parliament before 18th May, 2022 to reverse the debt standstill with alternative measures, as the debt service suspension would be formally effective only after a grace period of one month from the scheduled date of suspended debt service payment. All subsequent external debt restructuring agreements and the IMF Agreement were approved by successive Ministers of Finance.

(3) As explained in Answer to Question No. 2, the initial decision on the debt standstill approved by the former President and the then Minister of Finance was ratified by the Cabinet of Ministers.

It is observed that the Attorney-General had been informed of the said Cabinet decision, which ratified the Interim Policy regarding the servicing of Sri Lanka's external public debt including the debt standstill.

(4) The Central Bank of Sri Lanka reiterates that the decision to make the announcement of the debt standstill was a decision taken by the Government of Sri Lanka considering the precarious macroeconomic conditions that prevailed in the country during the period under review. The Interim Policy of the Government regarding the servicing of Sri Lanka's external public debt explains prime reasons to take such decision by the Government of Sri Lanka.

The following relevant documents and approvals are available for reference.

* Cabinet Paper No. CP 22/0568/304/042
* Central Bank Letter dated 11th April, 2022
* Cabinet Decision No. CP 22/0568/304/042

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Are you tabling them, Hon. Minister?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Yes. They are available.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Are you going to table all that?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Yes, sure. I **table*** those.

(5) Please refer to the Answer given in Question No. 4. It explains how the process took place under the purview of the Central Bank of Sri Lanka.

(6) The suspension of debt repayments materialized with the approval of the former President, being the Head of the State, together with the former Minister of Finance and the said Minister of Finance had taken steps to apprise Parliament of the said decision.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, will you mention the name of the President?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Let him finish his Answer first.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
However, there was a Fundamental Rights Application bearing No. SC FR 309/2022 filed by two petitioners against the Governor of the Central Bank of Sri Lanka, former Secretary to the Treasury and a few others. Having considered the said Application, the Supreme Court held that there is no merit in the said Application and dismissed the same without granting leave to proceed.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, when the Hon. Minister refers to a President, his name must be given.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can ask questions after he finishes his Answer.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
But, I would not have time to question because you only give me two or three minutes.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You will be given two minutes, Hon. Ravi Karunanayake.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
But, that President's name must be revealed.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

(7) Does not arise, as there was no violation of the Constitution.

To manage public debt of the Government, Parliament had already passed the new Public Debt Management Act, No. 33 of 2024.

(8) A Letter of Intent - LOI - requesting for an Extended Fund Facility was signed by the former President in his capacity as the Minister of Finance and the Governor of the Central Bank of Sri Lanka on 06th March, 2023. The EFF was approved by the Executive Board of the IMF on 20th March, 2023. The EFF Agreement was not submitted to the Parliament before it was approved by the IMF. The current Government had been able to amend several commitments during the fourth review of the EFF. Further negotiations are being conducted with the IMF to accommodate additional spending needs after the cyclone.

As soon as the Hon. President Anura Kumara Dissanayake assumed office, the Government took immediate steps to renegotiate certain terms under the third review of the programme. Consequently, at the conclusion of the Staff-level Agreement in November, 2024, several amendments were introduced to ease the burden on the general public and ensure more equitable outcomes.

The following decisions were taken to provide relief to the people based on the discussions between the Sri Lankan authorities and the IMF. Accordingly,

1. Personal Income Tax Relief

   - The tax-free threshold for Personal Income Tax was increased from Rs. 1.2 million to Rs. 1.8 million for a year of assessment.
   - The tax bracket was expanded from Rs. 500,000 to Rs. 1,000,000 per year of assessment with a tax rate of 6 per cent.

2. Tax Reforms to Support Local Industries and Equity

   - The Value Added Tax - VAT - was removed on the production of local fresh milk and yoghurt made from domestically produced milk to promote child nutrition and the local agriculture.
   - Taxes on properties based on imputed rental income will not be levied until a proper valuation methodology and administrative procedures are established.
   - The Corporate Income Tax rate on service exports was reduced from 30 per cent to 15 per cent.
   - The Withholding Tax of 10 per cent will not be applied to individuals whose total annual assessable income does not exceed Rs.1.8 million.

Despite the continued commitment under the IMF-EFF to achieve a primary surplus target of at least 2.3 per cent of GDP and maintain primary expenditure below 13 per cent of GDP as required under the Public Financial Management Act, No.44 of 2024, the Government successfully negotiated with the IMF to protect social spending and introduced further relief measures, including:

1. On Social Protection and Welfare. Accordingly,

   - The monthly pension was increased by Rs. 3,000.
   - The monthly benefit allowance for vulnerable groups increased.
     - Mainly for poor households: from Rs. 8,500 to Rs. 10,000.
     - For extremely poor groups: from Rs. 15,000 to Rs. 17,500, effective from January, 2025.
   - An education allowance of Rs. 6,000 is given per student from low-income families to purchase school books and stationery.
   - The monthly allowance for kidney patients and persons with disabilities was increased from Rs. 7,500 to Rs. 10,000, and for elderly citizens, from Rs.3,000 to Rs 5,000.

2. Under Public Sector Support,

   - The minimum basic salary of Public Servants was increased by Rs. 15,750, from Rs. 24,250 to Rs. 40,000 with effect from April, 2025, being implemented in three phases.
   - The annual salary increment was raised by 80 per cent - Proposal 39 of the Budget Speech, 2025 - increasing the minimum increment from Rs. 250 to Rs. 450.
   - The Distress Loan limit for Public Servants was raised from Rs. 250,000 to Rs. 400,000.

Through these initiatives, the Government has taken several measures to ensure that the IMF-supported reform programme remains citizen-centred with strong emphasis on equitable burden-sharing, enhanced social protection and transparency in implementation.

Further the declaration of a debt standstill affected Sri Lanka's international reputation and creditworthiness. Major credit rating agencies downgraded the sovereign rating to default categories and the country was effectively excluded from global capital markets. This limited access to new foreign financing raised a perceived risk premium for Sri Lankan debt and constrained private investment inflows.

Rebuilding credibility required the Government to demonstrate consistent policy commitment, fiscal discipline and transparency in negotiations with creditors and international institutions. The ongoing implementation of the IMF-supported programme and the progress achieved so far have been instrumental in gradually restoring the confidence among investors and development partners.

(9) It is common knowledge that the rating agencies do not impose any specific terms and conditions for reinstating Sri Lanka's access to concessional and commercial borrowing.

Since the IMF assessed Sri Lanka's sovereign debt was not sustainable in early 2020, the IMF was unable to provide any financial assistance to Sri Lanka even during the COVID pandemic. In order to restore IMF financing, the Sri Lankan Government had to fulfil two conditions: mainly, to receive financing assurances, to restructure external debt from all official bilateral creditors and engage in good faith relations to restructure commercial debt with all external commercial creditors.

(10) The Minister of Finance announced the Interim Policy regarding the servicing of Sri Lanka's External Debt on 12th April, 2022, suspending selected external debt servicing for an interim period pending an orderly and consensual restructuring of those obligations in a manner consistent with an economic adjustment programme supported by the IMF.

However, now, the Government has been able to establish macroeconomic stabilization with positive indicators mainly in the fields of inflation, GDP growth, interest rate stabilization, private sector credit growth, growth of official Reserves, exchange rate stabilization, Government revenue, fiscal consolidation and the Budget deficit.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Ravi Karunanayake.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඇමතිතුමාගේ පිළිතුර පිළිබඳව මට තිබෙන මූලිකම ප්‍රශ්නය මෙයයි. ව්‍යවස්ථානුකූලව මේ පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලය යම් විධියකින් උල්ලංඝනය කරලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ව්‍යවස්ථා අනුව මේ රටේ මූල්‍ය බලය මේ පාර්ලිමේන්තුව තුළින් පාලනය වන්නේ. ඒ ලැබුණු උත්තරයෙන් ඒක වසන් කරලා, පාර්ලිමේන්තුවෙන් අවසර දෙන්නේ නැතුව මේ රටේ debt standstill එකක් ඇති කරලා තිබෙන බව තමයි කියලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. සමස්තයක් වශයෙන් ගෙවන්නේ නැතුව, හොයලා බලලා යම් යම් දේවල්වලට විතරක් ගෙවලා තිබෙනවා කියලා ඇමතිතුමා පිළිතුරු දුන්නා. පාර්ලිමේන්තුව කියන්නේ ප්‍රාදේශීය සභාවක් නොවෙයි. එතුමා මේ පාර්ලිමේන්තුවේදී උත්තර දුන්නේ රටේ සමස්ත ආර්ථිකය ගැන.

ගරු ඇමතිතුමනි, මට මිනිත්තු පහකින් තමයි ඔබතුමාගෙන් මේ ප්‍රශ්න ටික ඔක්කෝම අහන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව මිනිත්තු දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එම නිසා කරුණාකරලා මම අහන ප්‍රශ්නවලට නිවැරැදිව උත්තර දෙන්න. ඔබතුමා ජනාධිපතිතුමාගේ නම කිව්වේ නැහැ. අපි පාර්ලිමේන්තුව විධියට මේ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන්නේ කොහොමද?

ඒ විතරක් නොවෙයි. ඊයේ වනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Managing Director ලංකාවට ඇවිල්ලා තිබෙනවා. Cyclone "Ditwah" නිසා සිදු වුණු පාඩුව වෙනුවෙන් අපට වැඩිපුර ණයක් ලැබිලාත් නැහැ. ණය ගෙවන්න දීර්ඝ කාලයක් ලැබිලාත් නැහැ. ආයෝජන කිරීමේ හැකියාව ඇති වෙලාත් නැහැ. අපි මෙතැන දේශපාලනය කරන්න ඕනෑ නැහැ. නමුත් මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න කටයුතු කරපු රනිල් වික්‍රමසිංහගේ කාලයේත් මේ කියපු හැම දේකටම අවසර ලබා දීලා තිබුණා. මම අහන්නේ මෙයයි. අපි රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. ඒ ප්‍රශ්නය ඔබතුමන්ලා ඇති කරපු දෙයක් නොවෙයි කියන නිසා තමයි මම මේ කාරණය අහන්නේ.

PAYE tax එකේ සීමාව රුපියල් 150,000 නැතුව රුපියල් 250,000ක් කරන්න කියලා ඊයේ ආව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂගෙන් ඉල්ලුවේ නැත්තේ ඇයි? බදු සියයට 30 නැතුව, සියයට 20ට අඩු කරන්න කියලා ඉල්ලුවේ නැත්තේ ඇයි? ණය ගෙවීම සඳහා මීට වඩා කාලපරිච්ඡේදයක් සහ සැහැල්ලු ක්‍රමයක් ඇති කරන්න කියලා ඉල්ලුවේ නැත්තේ ඇයි? මේවා මොකුත් කෙරිලා නැහැ නේ. එතුමිය කියපු එක දෙයක් තමයි, මේ රටේ තිබෙන විදේශ සංචිත ප්‍රමාණය තව වැඩි කරන්න ඕනෑය කියන එක.

ගරු කථානායකතුමනි, මම ඉතාම ඕනෑකමින් අහන්නේ මේ කාරණයයි. පාර්ලිමේන්තුවේදී මේ ගැන ඇහුවාම ඒක හාස්‍යයට ලක් කරන්න එපා. පාර්ලිමේන්තුවේ අවසර නැතුව මේ debt standstill එක කරන්න බැහැ. මහ බැංකු අධිපති කිව්වත් එය වැරදි දෙයක් නම් නිවැරැදි කරන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුවේ කටයුත්තකට නිකරුණේ ඇඟිලි ගහන්න අපි ඉඩ දෙන්නේ ඇයි? මට පුදුම හිතෙනවා, දැනුමක් තිබෙන ඇමතිවරයෙක් ඒ සම්බන්ධයෙන් එවැනි උත්තරයක් ලබා දීම ගැන. පාර්ලිමේන්තුවේ අවසර නැතිව මේ රට බංකොලොත් වුණා කියලා ප්‍රකාශ කරපු එක ගැන අපි වෙනම විවාදයක් ඉල්ලන්න අවශ්‍යයි. මම ඇමතිතුමාගෙන් අහනවා, ඔබතුමාගේ පිළිතුරට අනුව, මේ පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ව්‍යවස්ථා උල්ලංඝනය කරන්න ඉඩ දෙනවාද කියලා?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මගේ පිළිතුරේදී මම ඉතා පැහැදිලිව කිව්වා, පාර්ලිමේන්තුව අවසර දුන්නේ නැති නිසා මේවා කළේ නැහැ කියලා. ඉතාම නිවැරැදිව ඒ ක්‍රමය අනුගමනය කරලා තිබෙනවා. ඒ තොරතුරු පසු කාලීනව කැබිනට් අනුමැතිය යටතේ දැනුවත් කරලා තිබෙනවා. කිසිම අවස්ථාවකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙලා නැහැ. ඒ වාගේම IMF එකේ කළමනාකාර අධ්‍යක්ෂ ලංකාවට ආපු වෙලාවේදී ඇත්තවශයෙන්ම ප්‍රධාන වශයෙන් මතු කළේ ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය නොවෙයි. අපි ස්ථාවරත්වය අත්පත් කරගැනීමේ විශේෂත්වය, මෙවැනි හොඳ ආණ්ඩුවක් තිබෙනවා, මේ රටට මේ අර්බුදයෙන් ගොඩ යන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා කියන විශ්වාසය ගොඩනැඟීම මිසක් සංචිත වැඩි කරන්න ඕනෑ කියන කතන්දරයක් කිව්වේ නැහැ. මම හිතනවා, මේ වනකොට සියලු ස්ථාවර ගොඩ නැඟිලා ආයෝජන කැඳවීමට අවශ්‍ය වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා කියලා, ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් අහලා උත්තරයක් බලාපොරොත්තු වන්නේ ඒ උත්තරයෙන් සෑහීමකට පත් වෙන්න මිසක් නිකරුණේ කියන දෙයක් අහගෙන ඉන්න නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ කාරණය ඉටු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් අහන කොට අනුගමනය කළ යුතු guidelines අනුමත කරලා තිබෙන්නේ, නොවැම්බර් 18වැනි දා. අද අනිල් ජයන්ත ඇමතිතුමා උත්තර දුන්නේ නොවැම්බර් 11වැනි දා අහපු ප්‍රශ්නයකට.

මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ඇමතිවරයාට විනාඩි 5කදී පිළිතුර ලබා දිය හැකි විධියට පිළිතුර සකස් කරලා එවන්න කියලා අමාත්‍ය කාර්ය මණ්ඩලයට වාගේම සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දෙන්න කියලා. අද නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රශ්නයට පිළිතුර දීමට ගත් කාලයත් ගොඩක් වැඩියි. එම නිසා කරුණාකර ලේකම්වරුන්ට ඒ guidelines යවන්න උපදෙස් ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! *[இடையீடு]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේක සංකීර්ණ ප්‍රශ්නයක්. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට මේක අහන්නේ. මම ඔබතුමාට හැම වෙලාවේම disturb කරන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේක මුදල් සම්බන්ධ ප්‍රශ්නයක් නිසා පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක වෙනම කාරණයක් හැටියට අහන්න පුළුවන්.

ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය.

## වරප්‍රසාද: සභා ගර්භය තුළ විපක්ෂ නායකවරයා සමඟ කළ සංවාදය වීඩියෝගත කර ප්‍රසිද්ධ කිරීම
## சிறப்புரிமை: சபையில் எதிர்க்கட்சித் தலைவருடன் நிகழ்ந்த உரையாடலின் காணொளிப் பதிவை வெளியிட்டமை
## PRIVILEGE: RELEASE OF VIDEO RECORDING OF CONVERSATION WITH LEADER OF THE OPPOSITION IN CHAMBER

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
எனது சிறப்புரிமை தொடர்பான வினா பாராளுமன்ற நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர் ஒழுக்கக்கோவை சம்பந்தமானது. கௌரவ சபாநாயகர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் நடைபெறுகின்ற பாராளுமன்ற அலுவல்கள் மற்றும் பாராளுமன்ற அவைக்குள் நடக்கும் விடயங்கள் தொடர்பாக, பாராளுமன்ற உத்தியோகபூர்வ ஊடகப் பிரிவு தவிர்ந்த, வேறெந்த முறையிலும் காணொளிகளைப் பகிர்வது பாராளுமன்ற நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற (தத்துவங் களும் சிறப்புரிமைகளும்) சட்டம் ஆகியவற்றை மீறுகின்ற ஒரு செயற்பாடாகப் பார்க்கப்பட வேண்டும்.

நேற்றைய தினம், 2026.02.18ஆம் திகதியன்று பாராளு மன்ற அவைக்குள் கௌரவ எதிர்க்கட்சித் தலைவருடன் எதிர்க்கட்சி உறுப்பினராகிய நான் சாதாரணமாகக் கதைத்துக்கொண்டிருந்ததை அரசாங்கத் தரப்பில் இருந்து தொலைபேசிமூலம் காணொளியாக எடுக்கப்பட்டு, அது பிழையாகச் சித்தரிக்கப்பட்டு Capital TV என்று சொல்லப்படுகின்ற தனியார் ஊடகமொன்றில் காண்பிக்கப் பட்டுள்ளது. இது தொடர்பாக பாராளுமன்ற சிறப்புரிமைப் பிரச்சினை ஒன்றை இந்த உயரிய சபையில் முன்வைக்க விரும்புகிறேன்.

இந்தக் காணொளியானது, அரசாங்கத் தரப்புப் பாராளுமன்ற உறுப்பினர் ஒருவரால் மாத்திரமே எடுக்கப் பட்டிருக்க வேண்டும். இவ்வாறு ஆளும் தரப்புப் பாராளுமன்ற உறுப்பினரால் எடுக்கப்பட்ட காணொளியானது, கீழ்த்தரமான முறையில் சமூக ஊடகங்களில் பகிரப்பட்டிருக்கின்றது. எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினராகவும் எதிர்க்கட்சியில் இருக்கும் கட்சித் தலைவர்களில் ஒருவராகவும் இருக்கும் நான், கௌரவ எதிர்க்கட்சித் தலைவருடன் உரையாடுவதைக் காணொளியாக எடுத்து, அரசியல் இலாபத்துக்காக அதை வெளியிடுமளவுக்கு அரசாங்கத் தரப்பு மிகக் கேவலமான நிலைக்குச் சென்றிருக்கின்றது என்பதை இந்த உயரிய சபையில் தெரிவிக்க விரும்புகிறேன். இவ்வாறான செயற் பாடுகள் பாராளுமன்றச் சபாநாயகராக ஆளும் தரப்பைப் பிரதிநிதித்துவப்படுத்தும் தங்களுக்கும் இந்த உயரிய சபைக்கும் மாபெரும் இழுக்காகும். எனவே, இது தொடர்பாக சபைக்குள் இருக்கும் cameras மூலம் ஆராய்ந்து, இந்த விடயத்தை ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தும்படி தாழ்மையுடன் கேட்டுக் கொள்கிறேன். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, you are here to protect the interests of the Members of Parliament. We ask Questions on behalf of the people, not on behalf of any government or the Opposition. Kindly ensure that there is decorum maintained in Parliament. When I ask a Question here, I do expect a satisfactory answer and not a statement read out, which lacks any fundamental truth. This Parliament mainly runs on the Constitution. It is an infringement of Articles 148, 149 and 150.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට ගරු අමාත්‍යතුමා පිළිතුරු දුන්නා. ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවා. ඒකටත් අමාත්‍යතුමා පිළිතුරු දුන්නා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම Standing Ordersවලට අනුවයි වරප්‍රසාදයක් ඉල්ලන්නේ. ඒක උල්ලංඝනය වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම point of Order එක raise කරන්න ඉස්සෙල්ලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, බිමල් රත්නායක සභානායකතුමාට ලබා දුන් කාලයම මටත් ලබා දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක අහන්න. කාලය පිළිබඳ කථාව නොවේ, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. එතුමාගේ ප්‍රකාශයේදී එතුමා කියනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවාම ඒකට දෙන පිළිතුර විනාඩි 5කට සීමා කරන්න කියලා අමාත්‍යාංශවල ලේකම්වරුන්ට උපදෙස් දෙන්න කියලා. එතකොට කොහොමද රටේ මූල්‍ය පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, රට බංකොලොත් කිරීම ගැන ඒ, ඒ කරුණු කාරණා පිළිබඳව කථා කරන්නේ.

මුදල් බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට. එතුමා කොහොමද එහෙම කියන්නේ? *[බාධා කිරීමක්]* මට තව විනාඩියක් දෙන්න. අපට පුදුමසහගත තත්ත්වයක් නේ ඇති වෙලා තිබෙන්නේ. අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය එන්න එන්නම හැකිළෙනවා නේ. උත්තරයත් විනාඩි 5කට සීමා කරන්න ඕනෑ ලු. උත්තරය දෙන එක කාල වේලාවකට සීමා කරන්න බැහැ. ඇත්ත කථා කරන්න නම් ඒ උත්තරය ඇත්තවශයෙන්ම ඉදිරිපත් වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඉදිරිපත් කරන උපරිම වේලාව විනාඩි 5කට සීමා කරන්න කියලා එකඟතාවට පත් වුණා. වැඩිපුර තිබෙන කරුණු සභාගත කිරීමට පුළුවන්. *[බාධා කිරීමක්]* ඔබතුමා ඔය කාරණය කියා අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට මේ කාරණය කියා අවසන් කරන්න අවස්ථාව දෙන්න. ගරු කථානායකතුමනි, මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව, ආර්ථිකය පිළිබඳව, ඒ සංකීර්ණ ප්‍රශ්න පිළිබඳව සංකීර්ණ උත්තර දෙන්න ඉඩ ප්‍රස්ථාව තිබෙන්න ඕනෑ. ඒක විනාඩි 5කට සීමා කරන්න බැහැ. එහෙම කොහොමද කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

## උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත
### கண்டிய திருமண, மணநீக்க (திருத்தம்) சட்டமூலம்
### KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"(113 වන අධිකාරය වූ) උඩරට විවාහ සහ දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Public Administration, Provincial Councils and Local Government for report.*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, උඩරට විවාහ සහ දික්කසාද පනතේ අංක 32. (අ), (ආ) යන උපවගන්ති තුළ කාන්තාවෝ වෙනස් කොට සැලකීමකට ලක් වන බැවින් එම තත්ත්වය අහෝසි කරනු වස් උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත මම ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 යටතේ තමයි මම මේ කාරණය අහන්නේ. මම පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා. දැන් රවී කරුණානායක මන්ත්‍රීතුමා ඇහුවේ සංකීර්ණ ප්‍රශ්නයක්. ඒකේ කොටස් 10ක් තිබුණා. අපේ කමිටුවට තමයි අදාළ වෙන්නේ මේ රටේ ණය සම්බන්ධව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න. ගරු ඇමතිතුමාට ඒ කාලය දෙන්න ඕනෑ, ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න. සභානායකවරයාට හැකියාවක් නැහැ, Standing Orders යටතේ දෙන පිළිතුර සීමා කරන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්නයක් විනාඩි පහක් ඇතුළත ඉදිරිපත් කිරීමටත්, විනාඩි පහක් ඇතුළත එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමටත් Parliamentary Business Committee එකේදී අපි එකඟතාවකට පත් වුණා.

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, the Hon. Harshana Nanayakkara. You have 14 minutes.

## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
## நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
## JUDICATURE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.33]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2- විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ද දෙවන වර කියවීම සඳහා මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත් දෙක ගැන කථා කරන්න කලින් එහි පසුබිම ගරු සභාවට මා ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා අප රජයට,- *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට දැන් මම නැවත නැවතත් කියන්නේ ඕනෑ නම් වෙනත් දිනයක ඒ කාරණය ප්‍රශ්නයක් විධියට අහන්න කියන එකයි. ඒ වෙනුවෙන් විනාඩි පහක් ලබා දෙන්නම්. පිළිතුරු ලබා දීමට,- *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ව්‍යවස්ථාවල තිබෙන්නේ මූල්‍ය පිළිබඳ සම්පූර්ණ අයිතිය පාර්ලිමේන්තුවට තිබෙනවාය කියායි. ඒ මූල්‍ය අයිතිය තියාගෙන අපට උත්තරයක් දෙනවා, පාර්ලිමේන්තුවේ අවසර නැතුව මේ රට බංකොලොත් කියලා ප්‍රකාශ කළා කියලා. ඉතින්, කොහොමද අපි ඒක පිළිගන්නේ? මෙහෙම හාස්‍යයට ලක් කරන්න එපා, මේ පාර්ලිමේන්තුව. මේක නගර සභාවක් නොවෙයි. අපට මේ ගැන කැක්කුමක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 111. (7),-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Standing Ordersවලින් Constitution එක යටපත් කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මේ විවාදය සහ පාර්ලිමේන්තු කටයුතුයි පවත්වා ගෙන යන්නේ. ඊට පසුව නැවත වතාවක් ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්, ඒ සම්බන්ධයෙන් අභියෝගයට ලක් වෙලා තිබෙන කාරණා. *[බාධා කිරීමක්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අප රජය බලයට පැමිණීමෙන් පසු මෙම රටේ තිබෙන්නා වූ ප්‍රධාන ගැටලුවක් වන මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයට ඉතා තීව්‍ර ලෙස මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම Verité Research කියන ආයතනය විසින් මෑතකදී පවත්වන ලද සමීක්ෂණය අනුව ද අපේ ආණ්ඩුවේ ජනප්‍රියත්වය වැඩි වෙන්න ප්‍රධානම හේතුවක් වුණේ විෂ මත්ද්‍රව්‍ය කෙරෙහි දක්වපු ආකල්පය සහ එය "ඉවත් වෙනු " කියන ව්‍යාපෘතිය හරහා අපි ක්‍රියා කරපු ආකාරයයි.

ගරු කථානායකතුමනි, මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් වන මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයේදී වෙනත් රජයන්ට වඩා අපි ඉතාම සක්‍රිය ලෙස මැදිහත් වෙමින් ඒ කටයුතු නවතා දමන්න කටයුතු කර තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගතහොත් අපේ ආනන්ද විජේපාල අමාත්‍යතුමා යටතේ තිබෙන මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය මඟින් පොලිසිය මෙහෙයවමින් පෙර වසරවලට වඩා ඉතාම සාර්ථක ලෙස මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
උදාහරණයක් වශයෙන් ගත්තොත්, 2025 ජනවාරි 01වැනි දා සිට මේ දක්වා හෙරොයින් කිලෝග්‍රෑම් 2,020ක්, අයිස් කිලෝග්‍රෑම් 4,013ක්, ගංජා කිලෝග්‍රෑම් 15,564ක්, කොකේන් ග්‍රෑම් 43ක්,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පරයක් ඉන්න, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, මේ අදාළ රීති ප්‍රශ්නය නොවේ. මේක වෙන එකක්. ස්ථාවර නියෝග 111. (7) යටතේ තිබෙන්නේ Sectoral Oversight Committee ගැන. ස්ථාවර නියෝග 92. (2) යටතේ රීති ප්‍රශ්නයක් අහන්නයි මම හදන්නේ. එහෙම නැතුව බාධා කරන්න නොවෙයි.

ස්ථාවර නියෝග 111. (7) යටතේ පැහැදිලිවම මෙසේ සඳහන් වනවා:

> "Each Sectoral Oversight Committee may examine the suitability of any person who has been either appointed to any post or nominated to hold office in any post to any institution within the jurisdiction of that Committee and make recommendations in regard to such persons to the appropriate Ministry."

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නේ මේකයි. Sectoral Oversight Committee on Health, Media and Women's Empowerment එකේ මම ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක Committee on High Posts එකෙන් කරනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ ගැන කලබල වෙන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා කථා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කරමින් සිටියේ 2025 ජනවාරි 01වැනි දා සිට මේ දක්වා අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍යවල කිලෝ ප්‍රමාණ. මත් පෙති සහ කරල් භාරලක්ෂ අසූහත්දහසක ප්‍රමාණයක් - ලක්ෂ පහකට ආසන්න ප්‍රමාණයක් - අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ සියල්ලෙන්ම පෙන්නුම් කරන්නේ අපේ රජය විසින් මත්ද්‍රව්‍ය භාවිතය නවත්වන්න "ඉවත් වෙනු" කියන ව්‍යාපාරය හරහා කටයුතු කළ ආකාරයයි. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන දෙලක්ෂ අසූඑක්දහස් තුන්සිය විස්සයි, ගරු කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් අපේ law enforcementහි තිබෙන සාර්ථකත්වය බලන්න නම් අවුරුදු දෙකක සන්සන්දනාත්මක වාර්තාවක් ගන්න ඕනෑ. 2024 වසරත්, අපි රජය භාරගෙන කටයුතු කරපු 2025 වසරත් බලනකොට හෙරොයින් කිලෝග්‍රෑම් 832ක් තමයි 2024දී අත්අඩංගුවට පත් වුණේ, ගරු කථානායකතුමනි. නමුත් 2025දී හෙරොයින් කිලෝග්‍රෑම් 1,821ක් අත්අඩංගුවට පත් වනවා. ඒ වාගේම 2024දී අයිස් කිලෝග්‍රෑම් 1,364ක් අත්අඩංගුවට පත් වෙනවා. හැබැයි, 2025 වසරේ අයිස් කිලෝග්‍රෑම් 3,865ක ප්‍රමාණයක් අත්අඩංගුවට පත් වුණා. ගංජා බැලුවත්, 2024දී කිලෝග්‍රෑම් 8,359ක් තමයි අහුවෙන්නේ. නමුත් 2025දී අපේ රජය යටතේ ගංජා කිලෝග්‍රෑම් 17,189ක් අත්අඩංගුවට පත් වෙනවා. සාපේක්ෂව බලනකොට මේ සියල්ලන්ගෙන්ම පෙන්නුම් කරන්නේ අපේ රජය කොච්චර ක්‍රියාශීලී ලෙස මැදිහත් වෙලා මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය නවත්වන්න කටයුතු කරනවාද කියන කාරණාවයි.

දැන් මේ කාර්යය කරගෙන යැමේදී අපි නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරනවා. මේ රටේ නීතිය අපි ක්‍රියාත්මක කරනවා.

විශේෂයෙන්ම අපි භාවිත කරන නීතිය තමයි විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග සඳහන් ආඥාපනත. අපි එය භාවිත කරමින් කටයුතු කළාට, අපට මතු වෙනවා, ගැටලුවක්. අපි ඔීනෑ කෙනෙක් දන්නවා, සාමාන්‍ය නීතිය තුළ රට තුළ සිදු වන අපරාධවලට මේ රටේ උසාවිවල නඩු අහන්න පුළුවන් බව. ඒ වාගේම අපේ මුහුදු සීමාව තුළ හෝ එහි තිබෙන යම් නෞකාවක ගැටලුවක් තිබෙනවා නම්, ඒවා පිළිබඳවත් මේ රටේ අධිකරණයක නඩු අහන්න පුළුවන්. නමුත් ඔබතුමන්ලා දන්නවා, අපි ඉන්නේ දූපතක. මෙතැනදී මත්ද්‍රව්‍ය සම්බන්ධව මහ මුහුදේ එහෙම නැත්නම් high seas වලදී අපේ නීතියේ බලය ක්‍රියාත්මක කළ හැකිද නැද්ද යන්න පිළිබඳව නීතියේ පොඩි අපැහැදිලිතාවක් තිබෙනවා. මහ මුහුදේදී අත්අඩංගුවට පත් වන narcotics, අත්අඩංගුවට පත් වුණු විදේශිකයන් හෝ දේශීය අය සම්බන්ධයෙන් මේ රටේ නඩු අහන්න පුළුවන්ද, බැරිද කියලා නීතියේ අපැහැදිලි තත්ත්වයක් ආවා.

අපි රටක් වශයෙන්, දූපතක් හැටියට ඉන්නකොට මේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉතා දැඩිව කටයුතු කරන්න ඕනෑ නම්, ඒ වුවමනාව පෙන්වන්නත් ඕනෑ. වැඩේ කරන්නත් ඕනෑ; උසාවියේ නඩු අහන්නත් ඕනෑ. ඒ නිසා අපි තීන්දු කළා, ඒ තිබෙන හිඩැස වසා ගැනීම සඳහා අද දින මෙන්න මේ සංශෝධනය ගෙනෙන්න - විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ගේන්න. ඒ වාගේම මහ මුහුදේ වන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ වැරදි පිළිබඳ නඩු ලංකාවේ අධිකරණවල අහන්නත් අවශ්‍ය නිසා, ඊට සමගාමීව අපි ගෙනැත් තිබෙනවා, අධිකරණ සංවිධාන පනතට සංශෝධනයක්. අන්න ඒ දෙක තමයි ගරු කථානායකතුමනි, අද විවාදයට භාජන වෙන්නේ. ඒ අනුව, මහ මුහුදේ අත්අඩංගුවට පත් වෙන ඒවා සම්බන්ධයෙන් පවා අපට මේ රටේ අධිකරණවල කටයුතු කරන්න පුළුවන්. ගොඩක් සිද්ධ වෙන තත්ත්වයක් තමයි අපේ නාවික හමුදා, Sri Lanka Coast Guard එක මත්ද්‍රව්‍ය ගෙනෙන බෝට්ටු අල්ලා ගන්න ලුහු බැඳ යද්දී අන්තර් ජාතික මුහුදට ගියාට පස්සේ අපට ඔවුන් අල්ලා ගන්න අධිකරණ බලයක් - jurisdiction එකක් - තිබුණේ නැහැ. මෙන්න මේ සංශෝධනයෙන් අපි ඒකත් කරලා තිබෙනවා. අපි පණිවුඩයක් යවනවා, ලෝකයේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට. "ඔබලා අපේ මුහුදට ආවොත් කොහොමත් අල්ලනවා. අපේ රටට මත්ද්‍රව්‍ය ගේන්න කටයුතු කරනවා නම් අන්තර් ජාතික මුහුදේදී හරි අපි ඔබ ලුහු බැඳ ගොස් හෝ අල්ලා මේ රටේ අධිකරණ ඉදිරියට ඉදිරිපත් කරනවා" කියන නීතිමය තත්ත්වය ඇති කරන්න තමයි ගරු කථානායකතුමනි, අද මේ සංශෝධන පනත් කෙටුම්පත් ගෙනාවේ.

අපි මේ කාර්යය කරන්නේ මහ මුහුදේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම්වල වර්ධනයක් තිබෙන නිසායි. ජාත්‍යන්තර ජාවාරම් ජාල විසින් නාවික මාර්ග භාවිත කරමින් විශාල පරිමාණයෙන් අන්තරායදායක ඖෂධ ප්‍රවාහනය කරනවා. පවතින ආඥාපනත යටතේ මම කලින් කියූ පරිදි මහ මුහුදේදී සිදුවන නිෂ්පාදන හා සන්තක පිළිබඳ පැහැදිලි විධිවිධාන නැහැ. ඒ වාගේම අපේ තිබෙනවා, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සම්මුති සහ සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියක්. ඒ සම්මුතිය අනුවත් අපට වගකීමක් පැවරෙනවා, අන්තර්ජාතිකව කෙරෙන විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධ වෙළෙඳාම තහනම් කරන්න දේශීය නීති යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට. මෙන්න මේ හේතුව නිසා තමයි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට 54අඅ කියන වගන්තියක් අපි ඇතුළත් කරලා, මහ මුහුදේදී අන්තරායදායක ඖෂධ නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීම තහනම් කරමින් අලුත් විධිවිධාන ගෙනෙන්න කටයුතු කර තිබෙන්නේ. එහෙම නම්, මේකෙන් සිදු වන බලපෑම කුමක්ද? මේ නිසා මහ මුහුදේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට එරෙහි නීති ක්‍රියාමාර්ග

ශක්තිමත් වනවා, නාවික හමුදාව සහ නීති ක්‍රියාත්මක කරන ආයතන සඳහා පැහැදිලි නීතිමය බලයක් හිමි වනවා, ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය මර්දනය කරන්න කරන කැපවීමත් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක් වෙනවා, දිගුකාලීනව මහජන සෞඛ්‍ය හා සමාජ ආරක්ෂාව තහවුරු කිරීමටත් දායක වනවා. මෙම සංශෝධන, සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ඒ කියන්නේ, United Nations Convention on the Law of the Sea යටතේ ඇති මහ මුහුදේ අපරාධ මර්දනය කිරීමේ ජාත්‍යන්තර මූලධර්මවලට ද අනුකූල වනවා. මම මේ පැහැදිලි කළේ අපි මේ නීතිය ගෙනෙන්න බලපාන්නා වූ පදනම, හේතුව සහ පසුබිමයි.

අපේ රජය ගෙනාවා "ඉවත් වෙනු" කියලා වැඩසටහනක්. මොකක්ද ඒකෙන් කියන්නේ? මත්ද්‍රව්‍ය විකුණන අය ඒකෙන් ඉවත් වෙන්න කියන එකයි. ඒ කියන්නේ, ඒවායේ සැපයුම. ඒ සැපයුම් අංශය නවත්වන්න අවශ්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම් පිළිබඳ දත්ත තමයි මම දුන්නේ. පොලිසියෙන් අත්අඩංගුවට ගැනීම, රිමාන්ඩ් කිරීම ආදියේ දත්ත. නමුත් ගරු කථානායකතුමනි, අපි සැපයුම විතරක් නවත්වලා බැහැ. ඉල්ලුමත් නවත්වන්නට ඕනෑ. ඉල්ලුම නවත්වන්නේ කොහොමද? ඒක ආණ්ඩුවට තනිවම කරන්න අමාරු තත්ත්වයක් තිබෙනවා. සටන් කරලා, අත්අඩංගුවට අරගෙන සැපයුම නවත්වන්න පුළුවන්. නමුත්, ඉල්ලුම නවත්වන්න අමාරුයි. මොකද, කිසිම කෙනෙක් බලෙන් හෝ නොමිලේ දරුවෙකුට හෝ වෙනත් කෙනෙකුට අයිස් මත්ද්‍රව්‍යය හෝ වෙනත් මත්ද්‍රව්‍යයක් දෙන්නේ නැහැ.

ඔවුන් මෙතැනට පෙලඹෙන්නේ ඇයි? මේක සමාජයීය ගැටලුවක්, සමාජයීය ප්‍රශ්නයක්. ඒ වාගේම අවුරුදු 20ක්, 30ක් තිස්සේ ඔඩු දුවපු ප්‍රශ්නයක්. මේවාට පෙලඹෙන්න ඔවුන්ට එන මානසික ආතතිය මොකක්ද? ඔවුන් මේකට යන එක නවත්වා ගන්නේ කොහොමද? ගෙදර ළමයෙකුට තිබෙන පීඩාකාරී මානසිකත්වය මොකක්ද? විවාහකයකුට අයිස් ගන්න තිබෙන මානසිකත්වය මොකක්ද? මේ සමහරු උගත්, උපාධි තිබෙන අය. හොඳ රස්සා කරන තැන්වල මහත්ම මහත්මීන්. ඒගොල්ලන් මේකට බැඳෙන එක නවත්වන්න නම්, මේ මත්ද්‍රව්‍යවලින් වන විනාශයෙන් ඔවුන් මුදා ගන්න නම්, මේ සමාජය මේ පිළිබඳ වගකීමක් ගන්න ඕනෑ.

මේ වනකොට ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථාන රාශියක් ආණ්ඩුව විසින් පිහිටුවා ගෙන යනවා. ඒ කියන්නේ, අධිකරණයට යන්නේ නැතිව ස්වේච්ඡාවෙන් ඒ තැනකට එන්න පුළුවන් තත්ත්වයකට ඔවුන් ගෙනෙන්න. ඒ වාගේම අපි තේරුම් ගන්නට ඕනෑ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන පුද්ගලයා කියන්නේ අපරාධකරුවෙක්ම නොවෙයි කියලා. සත්‍ය වශයෙන්ම බැලුවොත් ඔහු රෝගියෙක්. මත්ද්‍රව්‍ය කිලෝ ගණන් විකුණන කෙනා හිරේ දාලා අපි සන්තෝෂ වුණාට, කුඩු ටිකක් බොන එක, අයිස් ටිකක් බොන එක රෝගයක්. ඒගොල්ලන්ට උදවු ඕනෑ. සමාජය ඔවුන් දිහා අපරාධකරුවන් වශයෙන් බලන්නේ නැතිව අනුකම්පාවෙන් බලලා, ඔවුන් නැවත සමාජයට අන්තර්ග්‍රහණය කරන්න අවශ්‍ය පුනරුත්ථාපන වැඩ පිළිවෙළ අපේ රජය විසින් ක්‍රියාත්මක කරනවා. මොකද, සැපයුම නවත්වලා විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැති නිසා. ඉල්ලුම නැවැත්වීමේ කටයුත්තත් අපි කරන්න ඕනෑ. ඒක මානුෂීය මෙහෙවරක්, මානුෂීය කටයුත්තක්. මා දීර්ඝ වශයෙන් ඒ කරුණු පැහැදිලි කරන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මෙම තත්ත්වය යටතේ අපි ඉතා සාර්ථක ලෙස මත්ද්‍රව්‍ය නැවැත්වීම සඳහා කටයුතු කරනවා. අපි පාතාලය සමඟ ගැටුම් ඇති කර ගන්න යන්නේ නැහැ. හැබැයි, අපි ඔවුන්ට භයේ ඉන්නේත් නැහැ. මේ රටේ කුඩු -මත්ද්‍රව්‍ය- පාතාලයට එනවා. හැමෝම කියනවා, තවම රටේ කුඩු තිබෙනවා, ඔයගොල්ලන් නවත්වලා නැහැ නේ කියලා. ජනතාව එහෙම කියනවා. අපි කියනවා, නැහැ, නවත්වනවා කියලා. සඳුදාත් අල්ලනවා, අඟහරුවාදාත් අල්ලනවා, බැරි නම් බදාදාත් අල්ලනවා. අපි තරම් පාතාලය සමඟ ගැටෙමින් මේ ආකාරයට අත්අඩංගුවට ගත්ත වෙන කවුරුත් නැහැ.

ඒ වාගේම මේ වන විට පාතාල ක්‍රියාකාරුවන් 15කට, 20කට වැඩි ප්‍රමාණයක් ගෙනැල්ලා අපි සිරගත කර තිබෙනවා. තව ගෙනෙන්නත් තිබෙනවා. සමහරු අපෙන් අහනවා, "බලන්න කෝ බූස්ස රිමාන්ඩ් එකේ කොච්චර mobile phones තිබෙනවාද" කියලා. අපේ ආණ්ඩුව ආපු කාලයේ විතරද ඒ තැන්වල mobile phones තිබෙන්නේ? ඒකෙන් අදහස් වෙන්නේ දැන් උදේ හවස හම්බ වෙනවා, දැන් මේ රටේ අපරාධ වැඩියි කියන එකද? නැහැ. මම හිතන හැටියට ජංගම දුරකථන 2000න් පස්සේ සුලබ වෙනවා. එතකොට අවුරුදු 10ක්, අවුරුදු 15ක්, 20ක් තිස්සේ ඒක ඇතුළේ mobile phones තිබෙනවා, ගරු කථානායකතුමනි. නමුත්, දැන් ඒ ගැන මිනිස්සු කථා කරන්නේ ඇයි? දැන් අපි ඒවා අල්ලනවා. ඒවා නවත්වන්න උත්සාහ කරනවා. එතකොට මාධ්‍යයට ඒ තොරතුරු එනවා. එහෙම නම් මේ තොරතුරු එන එක මේ රටේ ජනතාව පිළිගන්න ඕනෑ. අපි අසමත් වෙලා තිබෙනවා කියන පණිවුඩය නොවෙයි අපි දෙන්නේ. අපි සමත් ලෙස telephone අත්අඩංගුවට ගන්නවා. ඒවා ඒ තැන්වලට එන එක නවත්වන්න හැම දාම උත්සාහ කරනවා. එකක් දෙකක් හරි නවත්වන්න උත්සාහ කරනවා. ඒ අනුව, මේ රජය ඉතාම සාර්ථක ලෙස මේ ගමන යන බව කියනවා.

ගරු කථානායකතුමනි, අද මෙම පනත් කෙටුම්පත් ඉදිරිපත් කරපු කාරණාත් මම පැහැදිලි කළා. විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය සැපයුම නැවැත්වීම සම්බන්ධයෙන් ගත්තොත්, මේ රටේ ජනතාවට ඉටු කරන්න විශාල වගකීමක් තිබෙනවා. දේශපාලකයන් වේවා, සමාජ ක්‍රියාකාරින් වේවා, හැමෝටම ඒ වගකීම තිබෙනවා. අපේ රටේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කියලා එකක් තිබෙනවා. ඒ වාගේම පුනරුත්ථාපන කාර්යාංශය තිබෙනවා. ඒ සියලු ආයතන සමඟ සාකච්ඡා කරලා තමන්ගේ ගම්වල, තමන්ගේ දිස්ත්‍රික්කවල ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරවලට යන්න. ඒකට පක්ෂයක් අවශ්‍ය නැහැ. අපට මේ රටයි බේරා ගන්න තිබෙන්නේ. අපට අපේ දරුවන් තමයි බේරා ගන්න තිබෙන්නේ. ඒකට උතුරද, දකුණද කියන එක අදාළ නැහැ. මා සියලු ක්‍රියාකාරින්ගෙන් ඉල්ලා සිටිනවා, මත් උවදුරට ගොදුරු වන එක නවත්වා ගන්න ජනතාව දැනුවත් කරන්න කියලා. පුද්ගලයන් ඒවාට ගොදුරු වුණොත් ඒ ගොල්ලන් රෝගීන් වශයෙන් සලකා ඒ ගොල්ලන්ට උදව් කරන්න අවශ්‍ය සමාජ මානසිකත්වය ආගමික ස්ථාන හරහා හෝ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන හරහා හෝ අපි හදා ගනිමු. මොකද, ආණ්ඩුව මත් ද්‍රව්‍ය සැපයුම නවත්වන්න කටයුතු කළාට, ඉල්ලුම නවත්වන්න නම් සමාජයේ සියලුදෙනා එකතු වෙලා, "මේ හැමෝම අපේ දරුවෝය, මේ හැමෝම අපේ සහෝදරයෝය" කියන සහකම්පන හැඟීමෙන් යුතුව කටයුතු කරන්න ඕනෑ. ඒවාට ගොදුරු වූ රෝගීන් බේරා ගන්න ඕනෑ. ඒ නිසා මත් ද්‍රව්‍යවලට ඇති ඉල්ලුම නවත්වා ගැනීම කියන කොටසට රටේ ජනතාවටත් මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
எழுந்தார்.
rose.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, let me read this. ස්ථාවර නියෝග 111හි තිබෙනවා, Sectoral Oversight Committees ගැන. Standing Order 111 (7) states, I quote;

> "Each Sectoral Oversight Committee may examine the suitability of any person who has been either appointed to any post or nominated to hold office in any post to any institution within the jurisdiction of that Committee and make recommendations in regard to such persons to the appropriate Ministry."

ගරු කථානායකතුමනි, Sectoral Oversight Committee එකේදී Teaching Hospital, Jaffna එක ගැන අපි review එකක් කළා. ඒ hospital එකට End Post appointment එකක් දීලා තිබෙනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් නොවෙයි, කලින් තිබුණු ආණ්ඩුවකින්. අපට Service Minutes ඇතුළත End Post appointment එකක් දෙන්න ඉඩක් නැහැ. ඒ නිසා අපි ඉල්ලුවා, ඒක Public Service Commission -PSC- එක හරහා යවා තිබෙනවා නම්, Sectoral Oversight Committee එකකින් ඒක අපට submit කරන්න කියලා. නමුත්, අද වනකල් ඒක submit කරලා තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, Standing Orders violate කරන හින්දායි මම මේක අහන්නේ. කරුණාකරලා Ministry of Health එකට අදාළ Sectoral Oversight Committee එකේ සභාපතිට කියන්න, මට මේකට උත්තර දෙන්න කියලා.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

The next speaker is the Hon. Ajith P. Perera. You have ten minutes.

[පූ.භා. 11.49]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අද විවාදයට ගැනෙන මෙම පනත් කෙටුම්පත් කාලීන වැදගත්කමක් ඇති ඒවායි. ඒ පිළිබඳව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපේ සහයෝගය පළ කළා; අපේ අදහස් එකතු කළා. ඒ අනුව සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සංශෝධන සමඟම මේ පනත් කෙටුම්පත් සඳහා අපගේ කැමැත්ත පිරිනමන අතර, මේ කාලීන පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මත් ද්‍රව්‍ය මර්දනය සඳහා රජයට උනන්දුවක් තිබෙන බව පෙනෙනවා. හැබැයි, ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අද මම මේ කථාවට සූදානම් වෙන්න කලින් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පොලිස් ස්ථාන ගණනාවකින්ම තොරතුරු හොයලා බැලුවා, මහෙස්ත්‍රාත් අධිකරණ ගණනාවකින්ම තොරතුරු හොයලා බැලුවා. මම කනගාටුවෙන් කියනවා, ඒ සෑම තැනකින්ම ලැබුණු තොරතුරු අනුව පෙර පරිදිම හෙරොයින් සහ අයිස් තිබෙන බව.

සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා දැන් මෙතැන ඉන්නවා; මතුගම තමයි ගම. අහන්න, මතුගම හෙරොයින් නැද්ද කියලා, මතුගම අයිස් නැද්ද කියලා. පෙර පරිදිම තිබෙනවා. ඒ වාගේම, මත් ද්‍රව්‍ය හිඟ කාල වකවානු අපි දැකලා තිබෙනවා. ඒ හිඟ කාලවලට කුඩුකාරයෝ පිස්සන් වාගෙයි. ඒ කාලයට ඒ මත් ද්‍රව්‍යවල මිල ඉහළ යනවා. නමුත් අද එහෙම අර්බුදයක් නැහැ, ගරු ඇමතිතුමා. මම කළුතර දිස්ත්‍රික්කය ගැනයි කියන්නේ. මේක සෞඛ්‍ය ප්‍රශ්නයක්. අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඒ බව දන්නවා. මත් ද්‍රව්‍ය කොච්චර ඇල්ලුවත් ඒවායේ හිඟයක් නැහැ. මම කියන්නේ නැහැ, මේ ඇල්ලීම බොරුවක් කියලා. ඔබතුමන්ලා කියනවා වාගේ ඒ මත් ද්‍රව්‍ය තොග ගණනින් අල්ලනවා, පාන් පිටි ගානට අල්ලනවා. හැබැයි, ගරු කථානායකතුමනි, කොච්චර ඇල්ලුවත් මහ පොළොවේ අයිස් තිබෙනවා, හෙරොයින් තිබෙනවා, පරණ මිල ගණන්වලටම තිබෙනවා. එක්කෝ ඔබතුමන්ලා නොදන්නා මූලාශ්‍ර හරහා මේ රටට ඒ මත් ද්‍රව්‍ය ගලාගෙන එනවා. එහෙම නැත්නම් ඒ අල්ලන මත් ද්‍රව්‍ය නැවත වෙන පාරකින් මහ පොළොවට යනවා.

ඒ නිසා ඔබතුමන්ලාගේ මත් ද්‍රව්‍ය මැඩලීම පිළිබඳව තිබෙන කැමැත්ත ගැන අභියෝග නොකරමින් මා කියන්නේ, මේ රජය මත් ද්‍රව්‍ය මර්දනය කිරීමේදී අද දක්වාම අසාර්ථක බවයි. මම ප්‍රාර්ථනා කරනවා, සාර්ථක වෙන්න කියලා. ඒ වාගේම, මේ ක්‍රියාදාමයේදී අනවශ්‍ය ලෙස සතුටු වෙන්න එපා. අද වනකල් මහ පොළොවේ මත් ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව, මත් ද්‍රව්‍ය මර්දනය පිළිබඳව ප්‍රායෝගිකව දැනෙන යමක් සිද්ධ වෙලා නැහැ.

ගරු ඇමතිතුමනි, හොඳම උදාහරණය ඔබතුමාම කිව්වා. අපේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නීතිය හා සාමය භාරව වගකීමක් දරනවා. බූස්ස බන්ධනාගාරයේ සවි කර තිබෙනවා, ජංගම දුරකථන ක්‍රියාකාරිත්වය නතර කරන්න jammer එකක්. බූස්ස බන්ධනාගාරයේ තිබෙන jammer එක ක්‍රියාත්මක කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි. කවුද එය ක්‍රියාත්මක නොකරන්නේ? බන්ධනාගාර බලධාරින්. ඒ කාගේ වුවමනාවටද? පාතාල ජාවාරම්කරුවන්ගේ වුවමනාවට. එහි සතියෙන් සතියට mobile phones අල්ලන එක හරි. හැබැයි ඒ තරමටම mobile phones ඇතුළටත් යනවා; ඒ තරමටම mobile phonesවලින් ගනුදෙනු කරනවා; ඒ තරමටම බූස්ස බන්ධනාගාරයේ සහ අනෙකුත් බන්ධනාගාර ඇතුළේ ඉඳලා පාතාල සහ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ මේ රට තුළ අපරාධ මෙහෙයවනවා. ජාත්‍යන්තර මත් ද්‍රව්‍ය වෙළෙඳාම ආරක්ෂිතව, ආණ්ඩුවේ ආරක්ෂාව තියාගෙන, ආණ්ඩුවේ ආරක්ෂාව සහිතව බූස්ස ඇතුළු බන්ධනාගාර ඇතුළේ ඉඳගෙන කරනවා. ඒක තමයි යථාර්ථය. Jammer එකක් ක්‍රියාත්මක කර ගන්න බැරි ආණ්ඩුව තවත් මොනවා කථා කරන්නද? ඒ වාගේම, අත් අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය ආරක්ෂා කර ගන්න බැරි ආණ්ඩුව තව මොනවා කථා කරන්නද? ඒ නිසා බොරුවට සතුටු වෙන්න එපා. ඔබතුමන්ලාගේ උනන්දුව ගැන ඔබතුමන්ලාට ස්තුතියි. හැබැයි, මේ කරගෙන යන ක්‍රියාදාමයේ ප්‍රශ්නයක් තිබෙනවා.

මම පොලිස් නිලධාරියකුගේ දරුවෙක්; ඉපදුණේ පොලීසියක. මම පොලිස් අභ්‍යාස විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, මම වෘත්තීය නීතිඥයෙක්. පොලීසිය ගැන මට ගෞරවයක් තිබෙනවා. හැබැයි මේ පොලීසියේ ඇත්ත තත්ත්වය අපි ඊයේ රූපවාහිනියෙන් දැක්කා. කොළඹ නගරයේ ප්‍රහාරයක් එල්ල වුණු වෙලාවේ තුවක්කුකාරයා වෙඩි තියලා පහළට එනකොට සහ තුවක්කුකාරයා වෙඩි තියන්න යනකොට ඒ ආසන්නයේ පොලිස්

නිලධාරින් කිහිපදෙනෙක් හිටියා, නිල රථයක් තිබුණා, අතේ ආයුධත් තිබුණා. හැබැයි ඒ නිලධාරින් පැනලා යනවා එතැනින්, පාතාලයට බයේ. මොන පොලීසියක්ද මේ? මම මේක ලජ්ජාවෙන් කියන්නේ, පොලිස් නිලධාරියකුගේ දරුවෙකු හැටියට, පොලීසිය ගැන ආදරයක් තිබෙන මිනිහෙකු හැටියට, පොලිස් නිලධාරින්ට උගන්වපු මිනිහෙකු හැටියට. ඔය උසස් නිලධාරින්ගේ තත්ත්වයත් ඒක තමයි. ඔබතුමන්ලා ඉස්සරහට ඇවිල්ලා, ජනාධිපතිතුමා ඉස්සරහට ඇවිල්ලා කාර්ය සාධක බලකායේ අරවායේ මේවායේ රැස්වීම්වල ලොකු කයිවාරු ගැහුවාට පාතාලයට බයයි, පාතාලයේ තුවක්කුවලට බයයි, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට බයයි. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒකතමයි යථාර්ථය. මේ නීතිය වැදගත්. ජාවාරම් මර්දනය කිරීමට මේ නීතිය වැදගත්. හැබැයි මහ පොළොවේ මත් ද්‍රව්‍ය මර්දනය කිරීමට සහ ඒ පිළිබඳ යුක්තිය පසිඳලීමට මීට වඩා ප්‍රායෝගිකව වැදගත්, ප්‍රායෝගිකව කෙරෙන වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, පොලීසිය සම්පූර්ණයෙන් ප්‍රතිසංවිධානය වෙන්න ඕනෑ. පොලීසියේ නායකත්වය, පරිපාලනය, මත් ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ගැඹුරු ප්‍රශ්නයක් තිබෙනවා. පොලීසියේ මත් ද්‍රව්‍ය නිවාරණ අංශයේ ස්ථානාධිපතිවරයා අත් අඩංගුවට ගත්තු මත් ද්‍රව්‍ය විකුණලා අහුවෙලා හිරේ ගියා. එහෙම ඉතිහාසයක් ඔය පොලිස් දෙපාර්තමේන්තුවට තිබෙන්නේ. ඒ නිසා ඒක ශුද්ධ කරන්න ඕනෑ. එහෙම ශුද්ධ කරන්න පුළුවන් මිනිස්සු වගකීම දරන්න ඕනෑ. එවායේ හිටපු කීර්තිමත් නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත අද වැඩ කරනවා. ඒ ඉතිහාසයට මොනවා වෙලාද කියලා අපි දන්නේ නැහැ. අද වනකොට දේශපාලනයේ අතකොලු බවට පත් වෙලා වැඩ කරනවා විතරයි. පොලීසියේ කාර්යක්ෂමතාව අද පහළටම බැහැලා; කයිවාරුව විතරයි.

ගරු කථානායකතුමනි, මේ රටේ මත් ද්‍රව්‍ය, අල්ලස සහ දූෂණය මැඩලීම සඳහා නඩු කටයුතු ඉතා වැදගත්. ගරු ඇමතිතුමා සඳහන් කළා, විශේෂ අධිකරණ පිහිටුවනවා කියලා. ඒ විශේෂ අධිකරණ පිහිටුවීම වැදගත්. 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යටතේ මේ රටේ දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ තුනක් පිහිටුවන්න මම මූලික වෙලා කටයුතු කළා. ඊට කලින් පාලනයේ හිටපු දූෂිතයන් ඒ නීතියට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම අපි -ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා, ඉරාන් වික්‍රමරත්න මැතිතුමා, මා ඇතුළු පිරිස- ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා පෞද්ගලිකව පෙත්සම්කරුවන් වෙලා, ජනාධිපති නීතිඥවරුන් පෞද්ගලිකව රඳවලා 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යටතේ දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවීම වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තර්ක කරලා ජයග්‍රහණය කරලා, නීති විද්‍යාලය ඉස්සරහා අධිකරණයක් පිහිටෙව්වා. මේ රජය බලයට පත් වෙලා දැන් වසරකටත් වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ දූෂණ විරෝධී ත්‍රිපුද්ගල මහාධිකරණයේ අලුතින් එකම නඩුවක්වත් පවරලා නැහැ. මම දන්නවා, ඔබතුමන්ලාට මේ සම්බන්ධයෙන් උනන්දුවක් තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා තේරුම් ගත යුතු වැදගත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, අර ඇමති නිවාසවල විශේෂ අධිකරණ පිහිටුවා කටයුතු කරන්න යන එක. ඇමතිවරුන්ගේ බංගලාවල උසාවි පිහිටුවනවා කිව්වාම, ඒක ගැම්මක් තිබෙන කථාවක්.

නමුත්, අද වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වනකොට තිබෙන පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ නඩුවේ වින්තිකරුවන්ට නීතිඥ නියෝජනය නැති වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ඉතා බරපතළ එකක්. ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 (1) අනුව්‍යවස්ථාව අනුව සෑම අධිකරණයකම නඩු විභාග විවෘත අධිකරණයේ පවත්වන්න ඕනෑ. සෑම අධිකරණයකම සිදු වන කාරණා විවෘතව සිදු වෙන්න ඕනෑ.

අද වනකොට පාස්කු ඉරුදින ප්‍රහාරය හා සම්බන්ධව පවත්වන ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු කටයුතු වින්දිතයන්ට විවෘත නැහැ. අද වනකොට වින්දිතයන්ට තමන්ගේ නඩු බලන්න පුළුවන්කමක් නැහැ; මාධ්‍යකරුවන්ට බලන්න පුළුවන්කමක් නැහැ. මාධ්‍යකරුවෝ මේ නඩු විභාගය ආවරණය කරන්න ගියාම ඔවුන්ට අධිකරණයට ඇතුළු වීමට ඉඩ නොදී ඔවුන් පිටමං කරලා තිබෙනවා. වින්දිතයන් කිහිප දෙනෙක්ම තමන්ගේ නඩුව බලන්න උත්සාහ කරනකොට ඇතුළු වීමට ඉඩ දෙන්න බැහැ කියලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106. (1) අනුව්‍යවස්ථාව යටතේ පුරවැසියන්ට තිබෙන අයිතිය අහිමි කරන්න එපා. එක පැත්තකින් විත්තිකාරයන්ට නීතිඥවරු නැහැ. අනෙක් පැත්තෙන් පුරවැසියන්ට, වින්දිතයන්ට, දුකට පත් වෙච්ච මිනිසුන්ට, මැරුණු මිනිසුන්ගේ දරුවන්ට, භාර්යාවන්ට, පවුල්වල සාමාජිකයන්ට නඩුව බලන්න යන්න විධියක් නැහැ. රටේ පුරවැසියන් වන අපට මේ නඩුවේ සිදු වෙන්නේ මොකක්ද කියලා දැනගන්න ඒවා මාධ්‍යයට විවෘත කරලා නැහැ. මොකක්ද, මේ? විවෘත අධිකරණය අහිමි කරන්නේ මොන හේතුවටද? මෙම කාරණය පිළිබඳව පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවේ කටයුතු විවෘතව සිදු වුණා. ඒක මාධ්‍යයට විවෘත කළා. මේ පිළිබඳව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සියලු සංවේදී කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කළා. එය මාධ්‍යයට විවෘත වුණා. සමහර සංවේදී සීමිත කාරණා, රහසේ කළා, හේතු කියලා. අද වෙනකොට වින්දිතයන්ට උසාවියේ කෙරෙන කටයුතු පෙනෙන්නේත් නැහැ, මාධ්‍යයට පෙනෙන්නේත් නැහැ. ඒ වාගේම ඒ විත්තිකරුවන්ට නීතිඥවරුත් නැහැ.

ගරු කථානායකතුමනි, තව වැදගත් දෙයක් තිබෙනවා. දූෂණ විරෝධී මහාධිකරණ පිහිටුවන්න රජය කටයුතු කරනවා කියනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය තාවකාලිකව පවත්වපු ඒ අධිකරණ මාවතේ පිහිටි ගොඩනැඟිල්ල කරුණාකර මේ අලුත් අධිකරණවලට යොදා ගන්න, එහෙම නැත්නම් වාණිජ මහාධිකරණවල අලුත් අධිකරණ පටන් අරගෙන වාණිජ මහාධිකරණ එතැනට අරගෙන යන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පොඩ්ඩක් ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි. ඒ වේලාව අපේ පක්ෂයෙන් ගන්න. මම මේ කියන්නේ වැදගත් කාරණයක්.

ගරු කථානායකතුමනි, මේ අධිකරණ හුදෙකලාව කිලෝමීටර් ගණනක් ඈත නීතිඥවරු නැති තැන්වල පිහිටෙව්වාම සිදු වන දෙයක් තිබෙනවා. එතකොට ඒ නීතිඥවරුන්ට අපහසුතාවක් ඇති වෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමාත් අධිකරණයේ කටයුතු කරපු නීතිඥවරයෙක් නිසා ඒ ගැන දන්නවා. එක දවසේ නඩු කිහිපයක් කරනවා. ඒවා කථා බහ කරගෙන සාධාරණ විධියට සංවිධානය කර ගන්නවා. නමුත්, අද වෙනකොට වෙලා තිබෙන ප්‍රශ්නය මෙයයි. අලුත්කඩේ උසාවි සංකීර්ණයෙන් පිටත පැය භාගයකින්, පැයකින් යන්න පුළුවන් දුරකින් මේ අධිකරණ පිහිටෙව්වාම ප්‍රායෝගිකව වින්දිතයන්ට ප්‍රශ්නයක් එනවා,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

චූදිතයන්ට ප්‍රශ්නයක් වෙනවා, අවසානයේ යුක්තිය පසිඳලීමට ගැටලුවක් වෙනවා. නීතිඥ වෘත්තියටත් ප්‍රශ්නයක් වෙනවා. ඒක නිසා දැන් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය මුල් ස්ථානයේ තිබෙන නිසා හිස් වෙච්ච ස්ථානවලට මේ අධිකරණ අරගෙන යන්න. එහෙම නැත්නම් වාණිජ මහාධිකරණ සහ ඒ ස්ථානය මාරු කර ගන්න. මම මේ කාරණා කියන්නේ හොයා බලලා මේ ප්‍රශ්නය පිළිබඳව බැරෑරුම් සාකච්ඡාවක් නීතිඥ වෘත්තිකයන් තුළ තිබෙන හින්දා.

ගරු කථානායකතුමනි, තව වැදගත් කාරණයක් මට කියන්න තිබෙනවා. ලොකු ගැටලුවක් තිබෙනවා, නඩත්තු නඩු සහ දරුවන්ගේ ප්‍රවේශ පිළිබඳ කාරණා සම්බන්ධයෙන්. DNA පරීක්ෂණයක් සඳහා බල කිරීමට හැකියාවක් නැහැ. නඩත්තු නඩුවකදී කුඩා දරුවෙකුගේ පීතෘත්වය පිළිබඳව ප්‍රශ්නයක් වුණාම ඒ සඳහා නිට්ටාවටම තිබෙන, සියයට සියයක් විශ්වාසවන්ත ක්‍රමය තමයි, DNA පරීක්ෂණයක් කරන එක. ඒ වාගේම දරුවෙකුගේ පීතෘත්වය පිළිබඳ දික්කසාද නඩුවකදී, ප්‍රවේශය පිළිබඳ නඩුවකදී ප්‍රශ්නයක් ඇති වුණාම දරුවාට, අම්මාට, තාත්තාට ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න තිබෙන හොඳම ක්‍රමය ජාන - DNA - පරීක්ෂණයක් කරන එක. ගරු කථානායකතුමා වෛද්‍යවරයකු හැටියට ඒ ගැන දන්නවා. නමුත් අපේ රටේ අද වනකොට තිබෙන නඩත්තු පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥාපනත අනුව එසේ සාම්පල් ලබා ගන්නට බල කරන්න බැහැ. මම කියන්නේ නැහැ, මේක හැම දෙයකටම විවෘත කරන්න කියලා. හැබැයි, දරුවෙකුගේ පීතෘත්වය පිළිබඳව ප්‍රශ්නයක් වුණාම දරුවාට, දරුවාගේ අම්මාට හෝ දරුවාගේ තාත්තා වශයෙන් මේ ප්‍රශ්නයට ලක් වෙන කෙනාට තමන්ගේ පීතෘත්වය තහවුරු කරන්න හෝ පීතෘත්වය ප්‍රතික්ෂේප කිරීමට DNA පරීක්ෂණයක් ලබා ගැනීමට හැකි වන පරිදි නීති සම්පාදනය කිරීමට සහ සංශෝධනය කිරීමට කටයුතු කරන්න කියලා මම රජයට යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද විවාදයට ඉදිරිපත් කර තිබෙන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතට අපේ සහාය පළ කරමින්, රජයට ඒ වෙනුවෙන් තිබෙන අවංක වුවමනාව අපි අගය කරනවා. නමුත්, මේ යන විදියට මේ වැඩේ ගියොත් කෙරෙන්නේ නැති බව කියමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Sir, I rise to a point of Order. මම ගන්නේ පොඩි වේලාවක්.

ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අධිකරණයේ ගෞරවයට අපහාස වන පරිදි යම් අසත්‍ය කරුණු කීපයක් කිව්වා. මම ඒ ටික නිවැරදි කරනවා විතරයි. විවාදයකට යන්න මට අවශ්‍ය නැහැ. මේක විවෘත අධිකරණයක් තමයි; මහජනතාවට ගිහිල්ලා බලන්න පුළුවන්. විවෘත අධිකරණයේ තමයි නඩු අහන්නේ. හැංගිලා නඩු අහන්නේ නැහැ. මාධ්‍යවලට වාර්තා කරන්නත් පුළුවන්. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙන්නේ නැතුව එතුමා කියපු දේවල් ටික එළියේ කිව්වා නම් එතුමාට අත්වන ඉරණම එතුමාත් දන්නවා. බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් දෙන්න.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේදී විතරක් නොවෙයි මම පාර්ලිමේන්තුවෙන් පිටතදීත් මේ ගැන කියනවා. ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා දැන් ගිහිල්ලා පාර්ලිමේන්තුවේ මාධ්‍යවේදීන්ගෙන් අහන්න. *[බාධා කිරීමක්]* අඩු ගණනේ ඔබතුමාට එතැනට යන්න පුළුවන්ද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. (Dr.) Rizvie Salih. You have nine minutes.

[12.03 p.m.]

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)

Hon. Speaker, I rise today to speak on the Poisons, Opium and Dangerous Drugs (Amendment) Bill and the related Amendment to the Judicature Act, legislation which seeks to prohibit and effectively prosecute the trafficking of dangerous drugs on the high seas. This is not merely a technical Amendment or simply a matter of jurisdiction. It is, in truth, a matter of national survival.

Before I entered Parliament, for nearly four decades, I have stood beside hospital beds, spoken to and consoled anxious mothers and helplessly trapped, addicted youth. I have seen young men whose future and features were brighter than the moon and then, whose very lives were dimmed and deteriorated before my eyes due to narcotic addiction. The use of narcotic drugs in our communities is no longer an isolated problem; it is rampant. It is devastating as it races to epidemic proportions. It is destroying not only individuals' well-being, but their families, livelihoods and the moral fabric of entire societies and communities.

As a physician, I have seen their physical consequences: pale, anaemic faces, collapsed veins, malnutrition, liver failure, psychological breakdown and immunocompromised infectious diseases. Then, as a citizen, I have seen the social consequences: school dropouts, crime, domestic violence and despair. And, as a Parliamentarian, I see the consequences of a generational aspect: an uncertain and frightening future for the very youth we have so passionately sworn to protect.

Sir, Sri Lanka's geographical location places us strategically at the crossroads of major maritime routes. This has blessed us with trade and business opportunity. But, it has also made us vulnerable. International drug syndicates exploit the vastness of our high seas. They operate beyond conventional territorial boundaries; they move across jurisdictions with precision and impunity and when intercepted, gaps in domestic law create procedural and prosecutorial challenges.

Sir, under our current legal framework, within our national laws, trafficking of dangerous drugs in the high

seas does not face adequate criminalization. This legislative void has posed difficulties for law enforcement authorities and prosecutors, especially in cases involving foreign nationals apprehended beyond our territorial waters. This proposed Amendment seeks to address that regulatory deficiency. It aligns Sri Lanka with our obligations under international conventions against illicit drug trafficking and strengthens our ability to act decisively when vessels engaged in narcotics trafficking are intercepted. It also provides clarity of jurisdiction.

This Amendment to the Judicature Act empowers our High Court with forum jurisdiction to hear and determine such offences. This is responsible governance; this is legislative maturity and this is closing the door before the tide overwhelms us. But, while we debate about the high seas, let us remember what is at stake on our own shores. Every shipment intercepted offshore represents thousands of doses of narcotics that would otherwise infiltrate our streets. Every successful prosecution should send a strong signal to international criminal networks that Sri Lanka is not a soft target and that our Island is not their hunting ground. So, every strengthened law is a shield and armour around our youth.

However, Sir, I wish to state with equal clarity that legislation alone is not the complete answer. Sir, as a medical practitioner, you yourself clearly know that drug addiction is both a criminal justice issue as well as a public health crisis. While we must be firm against traffickers, the ruthless and heartless architects of this destruction, we must also be compassionate towards the victims of drug addiction. The young man trapped in drug dependency is always not a hardened criminal; often, he or she is a helpless casualty. I have seen in my practice addicted and hooked-on young men and women who actually curse the day that they, out of curiosity or peer influence, took their first dose. The young and the not-so-young experimenting with narcotics is always not defiant. Therefore, as we strengthen law enforcement on drug trafficking at sea, let us also strengthen rehabilitation on land. As we empower courts, let us also empower families. As we close legal loopholes, let us open avenues for prevention, education and treatment. Our effort in this endeavour should and must be two-way: supplementary and simultaneous. A nation which only punishes without healing would not solve this problem. Likewise, a nation which only heals without deterring would not stop the supply of drugs. Therefore, we must do both with balance, wisdom, compassion and humanity.

Sir, these Amendments also carry diplomatic and international dimensions. By aligning with established international norms, Sri Lanka reaffirms its commitment to cooperative maritime security and the rule-based global order. It enhances our credibility among regional partners; it strengthens the intelligence-sharing framework and it also demonstrates that we are a responsible coastal State which would not allow our waters or the waters beyond to become corridors for destruction.

In supporting these Bills, we send a message beyond this Chamber, we send out a message to drug traffickers that Sri Lanka's seas are not their sanctuary, we send out a message to our law enforcement authorities that Parliament stands with them and most importantly, we send out a message to people of this nation that we are vigilant.

Sir, history will not judge us by the length of our debates, but by the strength of our decisions. When the health of our nation's youth is threatened, hesitation is not prudent; it would be negligence. These Bills are measured; they are necessary. So, let us pass them with unity. Let us demonstrate that on matters of national security and protection of our children, there are no partisan divides, but only a shared responsibility. In safeguarding our seas, we safeguard our shores; in protecting our youth, we protect our future and in strengthening our laws, we strengthen our nation. This House should, therefore, extend their fullest support and stand together in passing these Amendment Bills with the common stand of keeping our youth and the generations to come healthy, safe and free from narcotics and addictive substances.

Thank you for the time allotted, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Elayathamby Srinath. You have seven minutes.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[பி.ப. 12.11]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொண்டு, நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தச்) சட்டமூலம் தொடர்பாகச் சில கருத்துகளை முன்வைக்க எண்ணுகின்றேன். இன்று இந்த நாட்டில் மிகப் பெரிய பிரச்சினையாக இருக்கின்ற இந்த விடயத்தை, இவ்வாறான சட்டத் திருத்தங்களின்மூலம் கட்டுப்பாட்டுக்குள் கொண்டுவர நாம் முயற்சிக்கின்ற இந்த வேளையில், மிக முக்கியமாக ஒரு விடயத்தை முதலில் கூறி இந்த விவாதத்தைக் கொண்டுசெல்லலாம் என்று நினைக்கின்றேன்.

2009ஆம் ஆண்டு யுத்தம் மௌனிக்கப்பட்ட பின்பு, திட்டமிட்ட முறையிலே வட, கிழக்கு இளைஞர்களையும் யுவதிகளையும் இலக்குவைத்து ஆரம்பிக்கப்பட்ட இந்த போதைப்பொருள் பாவனை இன்று நாடு முழுவதும் மிக

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

அதிகளவிலே வியாபித்து, நாட்டையே சீரழிக்கின்ற ஒரு நிலைமையில் இருக்கின்றது. இந்தப் போதைப்பொருள் பாவனையானது இளம் தலைமுறையினரைப் பெரிதும் பாதித்துக் கொண்டிருக்கின்றது. மிக முக்கியமாக நகரங்களிலும், போதைப்பொருள் கடத்தல் நடவடிக்கைகள் இடம்பெறுகின்ற கடற்கரையை அண்டிய கிராமங்களிலும் இதன் பாவனை அதிகமாக இருக்கின்றது. குறிப்பாக, தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபையின் 2024ஆம் ஆண்டின் புள்ளிவிபர அறிக்கையின்படி, 228,450 பேர் போதைப்பொருள் பாவனை காரணமாக arrest பண்ணப்பட்டுள்ளனர். அதில் குறிப்பாக 68,000 பேர் 'ஐஸ்' போதைப்பொருள் பாவனையுடன் சம்பந்தப்பட்டதாகக் கைதுசெய்யப்பட்டு இருக்கின்றார்கள். இவர்களில் 37 சதவீதத்துக்கும் அதிகமானவர்கள் 20-29 வயதுக்குட்பட்ட இளைஞர்களாக இருக்கின்றார்கள். நாம் சற்றே சிந்தித்துப் பார்க்க வேண்டிய விடயமாக இருப்பது என்னவென்றால், இவ்வாறு இலட்சக்கணக்கானவர்கள் கைதுசெய்யப்பட்டிருந் தாலும், இன்னும் மிக அதிகளவானோர் கைது செய்யப் படாமல், இந்த சட்டதிட்டங்களுக்குள் அகப்படாமல், போதைப்பொருள் பாவனைக்கு அடிமையாகி இருக்கக்கூடிய சந்தர்ப்பங்கள் மிக அதிகமாக இருப்பதாகும். இந்த விடயம் நாட்டுக்கு மிகப் பாரதூரமான பிரச்சினையாகவும் சாபக் கேடாகவும் இருக்கின்றது. ஆகவே, இந்த திருத்தச் சட்டத்தைக் கொண்டுவருவதன்மூலம் இவ்விடயத்தைக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவருகின்ற நடவடிக்கையை நாம் வரவேற்கின்றோம்; ஆதரிக்கின்றோம்.

இந்த விடயத்துடன் தொடர்பானதாக நாம் இன்னு மொன்றைச் சிந்திக்க வேண்டியிருக்கின்றது. அதாவது, நகர்ப்புற இளைஞர்களையும் யுவதிகளையும் பாதிக்கின்ற இந்தப் போதைப்பொருளுக்குச் சமாந்தரமாக, கிராமங்களிலே சட்டவிரோத மது பாவனை என்ற விடயம் காணப்படுகிறது. அதனூடாகப் பொருள் அழிவுகள் ஏற்படுவதோடு, மக்கள் நோய்களுக்கும் ஆளாகிக் கொண்டிருக்கின்றனர். எனவே, நாம் தனியே போதைப்பொருள் ஒழிப்பு என்பதுடன் மட்டும் நின்றுவிடாது, சட்டவிரோத மது பாவனை என்ற விடயத்திலும் பாரிய நடவடிக்கைகளை எடுக்க வேண்டிய தேவை யிருக்கின்றது. உதாரணமாக, கிராமங்களில் போதைப் பொருளை விலை கொடுத்து வாங்க முடியாதவர்கள், சட்டவிரோத மது பாவனைக்குப் பழக்கப்படுகின்றனர். அங்கு இந்தச் சட்ட விரோத மதுவைத் தயாரிப்பதனூடாக அப்பாவிகள் மற்றும் ஏழைகளின் பணத்தை உறிஞ்சுகின்ற நடவடிக்கைகள் பாரியளவிலே இடம்பெற்றுக் கொண்டிருக் கின்றன. அந்த விடயங்களைக் கட்டுப்படுத்துவதற்குச் சட்டத்திலே போதியளவு ஏற்பாடுகள் இருப்பதாகத் தெரியவில்லை. மிக முக்கியமாக, சட்டவிரோத மதுப் பாவனை யாளர்களை அல்லது சட்டவிரோத மது உற்பத்தி செய்பவர் களைக் கட்டுப்படுத்துவதற்கு அல்லது சட்டத்தினூடாகத் தண்டிப்பதற்குப் போதியளவு சட்ட ஏற்பாடுகள் இல்லை. மிகக் குறைந்தளவான தண்டப் பணம் அறவிடப்படுவதன்மூலம் அவர்கள் மீண்டும் மீண்டும் அந்தத் தொழிலில் ஈடுபட்டுப் பல இலட்சங்களைச் சம்பாதிக்கின்றார்கள்.

இன்று இந்தப் போதைப்பொருள் நாட்டின் இளைஞர் களைச் சீரழித்துக் கொண்டிருக்கின்றது; பல குடும்பங்கள் நிம்மதியை இழந்து இருக்கின்றார்கள்; பல இடங்களில் தற்கொலைகள் நடைபெறுகின்றன; பல குடும்பங்கள் இந்த விடயத்தை வெளியே சொல்ல முடியாது அழுது கொண்டிருக் கின்றன. இதன்மூலம் பண விரயம் மட்டுமல்லாது, குடும்பக் கட்டமைப்பும் சிதைந்துபோகின்றது. அதற்கப்பால், நாங்கள் சொன்னதுபோன்று மருத்துவ ரீதியாக பல பாதிப்புகளை இளைஞர்களும் யுவதிகளும் சந்தித்துக் கொண்டிருக் கின்றார்கள். மிக முக்கியமாக, அவர்கள் கல்வி கற்க வேண்டிய காலப்பகுதியிலே இவ்வாறான செயற்பாடு களில் ஈடுபடுவதன்மூலம் அவர்களின் கல்வி பாதிக்கப்பட்டு, அவர்களின் குடும்பங்கள் வறுமை நிலைக்கு அல்லது சீரழிந்த நிலைக்கு மாற்றமடைகின்றது. ஆகவே, சட்டவிரோத மது, போதைப்பொருள் ஆகிய இந்த இரண்டு விடயங்களும் சமாந்தரமாகப் பார்க்கப்பட்டு, அதற்கான முழுமையான சட்ட ஏற்பாடுகள் கொண்டுவரப்பட வேண்டும். இவற்றைப் பயன்படுத்தியதன்மூலம் பாதிக்கப்பட்டவர்களுக்கு விழிப் புணர்வு மற்றும் ஆலோசனைகள் வழங்கப்பட்டு, அவர்களை அதிலிருந்து மீட்டெடுத்து சமூகத்திலே இணைப்பதற்கான செயற்பாடுகள் நாட்டில் பாரியளவில் இல்லை.

குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்திலே அதற்கான சிகிச்சை நிலையமொன்று அல்லது அவர்களைப் பாதுகாத்துப் பராமரிப்பதற்கான செயற்பாடுகள் பெரியளவில் இல்லை. இவ்வாறு பாதிக்கப்பட்டவர்களை வேறிடங்களுக்கு அனுப்புவதன்மூலம் அவர்களை எவ்வாறு மீட்டெடுப்பது? எமது மாவட்டத்திலே உள்ள ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் இத்தகைய நிலையங்களை அமைத்துக் கொடுப்பதன் மூலம் போதைப்பொருள் பாவிப்பவர்களை மீட்டெடுத்துச் சமூகத்துடன் இணைப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அதற்கப்பால், இந்தச் சட்டவிரோத மது உற்பத்தி செய்பவர்களாக இருந்தாலும் சரி, போதைப்பொருள் கடத்துபவர்களாக இருந்தாலும் சரி, அதிகபட்ச சட்ட நடவடிக்கைகளை எடுப்பதன்மூலம் அவற்றைக் கட்டுப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது.

மேலும், மட்டக்களப்பு மாவட்ட விவசாயிகள் சார்ந்த பிரச்சினையையும் நான் இங்கே சொல்லி வைக்க விரும்புகிறேன். கடந்த 'தித்வா' புயலால் பாதிக்கப்பட்டவர் களுக்குப் பல இடங்களில் நிவாரணங்கள் வழங்கப்பட்டாலும் தற்போது அந்தப் பிரதேசத்தில் பொழிகின்ற மழையினால் பாரியளவு நெல் வயல்கள் அழிவடைந்திருக்கின்றன. விவசாயிகள் மிக அதிகளவான இழப்புக்களைச் சந்தித்திருக்கின்றார்கள். எனவே, அதற்கான நட்ட ஈட்டைப் பெற்றுக்கொடுப்பதற்கு அரசாங்கம் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும். இவ்வாறு மட்டக்களப்பில் பாரிய நெருக்கடியான சூழ்நிலை நிலவுகின்ற வேளையிலே, அந்த மாவட்டத்தில் இன்னுமொரு பிரச்சினை பூதாகரமாக உருவெடுத்திருக்கின்றது. அந்தப் பகுதிகளில் யானைகளின் தொல்லை அதிகமாக இருக்கின்றது. அந்தப் பிரதேசத்தின் காடுகளில் இருக்கின்ற யானைகள் வயல் நிலங்களை அழிக்கின்றன. ஏற்கனவே இந்த இயற்கை அனர்த்தங்களால் மக்கள் விளைபொருட்களை இழந்துகொண்டு இருக்கின்ற நிலைமையைக் கருத்திற்கொண்டு அந்த விவசாயிகளுக்கு நட்ட ஈட்டைப் பெற்றுக்கொடுப்பதற்கான ஏற்பாட்டை இந்த அரசு செய்ய வேண்டுமென்று இந்த விவாதத்தினூடாக நான் கேட்டுக் கொள்கிறேன்.

அபின், நஞ்சுப் பொருட்கள் ஒழிப்பு விடயத்திலே இந்த அரசாங்கம் எடுக்கின்ற முயற்சியானது உண்மையிலே எல்லோருடைய ஒத்துழைப்போடும் வெற்றிபெற வேண்டும். இதனூடாக எமது இளைய சமுதாயத்தை மீட்டெடுப்பதன் மூலமாகவே நாம் ஒரு வளமான எதிர்காலத்தை உருவாக்கிக் கொள்ளக் கூடியதாக இருக்கும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Srinath, your time is up.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Please give me one more minute, Sir.

முக்கியமாக 2024ஆம் ஆண்டு போதைப்பொருளுடன் தொடர்புபட்ட 200,000க்கும் அதிகமானோர் கைது செய்யப் பட்டிருக்கின்றார்கள். இந்தப் போதைப்பொருள் பாவனை யாளர்களுக்கு உரிய உளநல ஆலோசனைகள் வழங்கப்பட்டு, அவர்களை அதிலிருந்து மீட்டெடுப்பதற்கான ஒரு செயற்றிட்டம் முன்மொழியப்பட வேண்டுமென்று கேட்டு, எனது உரையை முடித்துக் கொள்கிறேன். நன்றி!

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition, what is your concern?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Shall we make it very short because I have to accommodate one more speaker before we break up for lunch?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ අවධානයට යොමු කරන්න කැමැතියි, දින ගණනාවක් මුළුල්ලේ ගෑස් හිඟයක් තිබෙන බව. පාරිභෝගිකයා අසරණ වෙලා හැම තැනකම ගෑස් පෝලිම් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මම රජයේ අවධානය යොමු කරනවා, කරුණාකරලා මෙම ගෑස් හිඟයට විසඳුමක් ලබා දෙන්න කියලා. මොකද, අම්මලා, තාත්තලා, දූ දරුවන් ඇතුළු මේ හැමෝම පාරේ රස්තියාදු වෙනවා, පෝලිම්වල සිටිමින්. ගෑස් අහිමි වීම ඇත්තවශයෙන්ම මේ රටේ ජනතාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Leader of the Opposition, we got your message.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා විනාඩියක් ඉන්න, මම කියනකල්. ගෑස් හිඟයක් තිබෙනවා. ඒක නැහැයි කියන්න එපා. අද බරපතළ ගෑස් හිඟයක් තිබෙනවා. ඒකට විසඳුමක් ලබා දෙන්න කියලා මම මේ රටේ පාරිභෝගික ජනතාව වෙනුවෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister Wasantha Samarasinghe, would you like to respond to that?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා මතු කළ කාරණය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මොකද, එතුමා පැහැදිලි කළේත් මේ වෙලාවේ රටේ ගෑස් හිඟයක් තිබෙනවා, පෝලිම් තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෑස් සම්බන්ධයෙන් මතු වෙච්ච ප්‍රශ්නය විසඳන්න පසුගිය දින කිහිපයේදීම අපි උත්සාහ කළා. අපේ රටේ ප්‍රධාන ගෑස් සමාගම් දෙකක් තිබෙනවා. රජය සතු ගෑස් සමාගම ලිට්රෝ. අනෙක් එක, පෞද්ගලික අංශය සතු ලාෆ් ගෑස් සමාගම. ලාෆ් ගෑස් සමාගම වෙළෙඳ පොළ තුළ සියයට 15ක්, 18ක් වාගේ ආවරණය කරනවා. ලිට්රෝ ගෑස් සමාගම සියයට 80ක්, 82ක් ආවරණය කරනවා. සාමාන්‍යයෙන් දවසකට ලිට්රෝ ගෑස් සමාගම මෙට්‍රික්ටොන් 1,000ත් 1,200ත් අතර ප්‍රමාණයක් බෙදා හැරීම් කළා. ඊට අමතරව දිනකට මෙට්‍රික්ටොන් 300ත් 250ත් අතර ප්‍රමාණයක් තමයි ලාෆ් ගෑස් සමාගම බෙදා හැරීම් කළේ.

මේ ප්‍රශ්නය ඇති වුණේ පසුගිය සති දෙකක් තුනක් තිස්සේ ඉඳලා ලාෆ් ගෑස් සමාගම ගෑස් බෙදා හැරීම නවත්වා තිබෙන නිසායි. ඒ නිසා ගෑස් නැති වෙයි කියලා පාරිභෝගිකයා තුළ බියක් ඇති වෙලා තිබෙනවා. එම නිසා ඒ ලාෆ් ගෑස් සිලින්ඩරයට පාරිභෝගිකයෝ දැන් ලිට්රෝ ගෑස් ලබා ගන්න ගිහිල්ලා තිබෙනවා. වෙළෙඳ පොළ තුළ ඇති වෙච්ච හදිසි ගෑස් ඉල්ලුම නිසා දැනට ගෑස් හිඟයක් තිබෙනවා. සාමාන්‍යයෙන් අපි නිදහස් කළේ ගෑස් මෙට්‍රික්ටොන් 1,200යි. නමුත්, අද දවසේත්, හෙට දවසේත්, සෙනසුරාදා දවසේත් ගෑස් මෙට්‍රික්ටොන් 1,500ක් නිදහස් කරන්න සැලසුම් කර තිබෙනවා, විශේෂයෙන්ම වෙළෙඳ පොළ තුළ ඇති වී තිබෙන ගෑස් හිඟය අවම කිරීම සඳහා.

ඒ වාගේම ලිට්රෝ ගෑස් සමාගම කොයි වෙලාවකවත් ගෑස් හිඟයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මේ වනකොටත් දවස් තුනකට අවශ්‍ය ගෑස් තිබෙනවා. අපි ඒවා නිදහස් කරන්න සූදානම් කර තිබෙනවා, orders අනුව. ඒ වාගේම ඉරිදා එනවා, එක නැවක්. ආපහු අඟහරුවාදාත් එනවා, තව නැවක්. ඒ විධියට නැව් ටික schedule කර තිබෙනවා. හැබැයි, අපි ලාෆ් ගෑස් සමාගමට නිශ්චිතව දැනුම් දීලා තිබෙනවා, ගෑස් බෙදා හරින්න කියලා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පෙරේදාත් ඔවුන් ගෙන්වා මේ ගැන කථා කළා. අද දවසේ ඔවුන් ලිඛිතව ගෑස් ගෙනෙන බව දැනුම් දුන්නා. ලාෆ් ගෑස් සිලින්ඩර අරගෙන තිබෙන පාරිභෝගිකයන්ට ලාෆ් ගෑස් නැති වුණාම ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවනවා. ඒ නිසා වහාම ගෑස් ටික ගෙනැල්ලා බෙදා හැරීමේ කටයුතු කරන්න අවශ්‍යයි. අපට දැනගන්න ලැබුණු ආකාරයට 25වැනි දා තමයි ඔවුන්ගේ නැව එන්න තිබෙන්නේ. ඒ නිසා වෙළෙඳ පොළ තුළ පවතින මෙම ගෑස් හිඟය නිසා panic buying තත්ත්වයක් එහෙම නැත්නම්, demand එකක් ඇවිල්ලා තිබෙනවා ලාෆ් ගෑස් නැති වන නිසා පාරිභෝගිකයා ලිට්රෝ ගෑස් එකට මාරු වෙනවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ගරු විපක්ෂ නායකතුමනි, මේ වෙලාවේ ගෑස්වල කිසිදු හිඟයක් නැහැ. ගෑස් ප්‍රමාණවත් ලෙස ලබා දෙනවා. මේ වන විට ලිට්රෝ ගෑස් සමාගම ඒ පිළිබඳ කරුණු රටට කියා තිබෙනවා. අපි ලාෆ් ගෑස් සමාගමටත් දැනුම් දීලා තිබෙනවා, පරිභෝගිකයා රවටන වැඩේ කරන්න එපා, වහාම ගෑස් ගෙනැල්ලා බෙදා හැරීමේ කටයුත්ත කරන්න කියලා. කහ පාට ගෑස් එක ගත්ත පාරිභෝගිකයාට තමයි මේ ප්‍රශ්නය බරපතළ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ ප්‍රශ්නයට උත්තර හොයලා තිබෙනවා.

හදිසියේ ගෑස් හිඟයක් ඇති වේ යැයි news හදන පිරිසක් ඉන්නවා. ඒ විපක්ෂ නායකතුමා කියලා මම කියන්නේ නැහැ. මේ ඇති වෙච්ච තත්ත්වය ගැන සමාජ මාධ්‍යවල යන ප්‍රවෘත්ති දැකලා එතුමා එහෙම කියන්න ඇති. රට පුරා ගෑස් බෙදා හැරීමේ list එක ඕනෑ නම් මට කියන්න පුළුවන්, ගරු විපක්ෂ නායකතුමා. ගෑස් සමාගම් ගෑස් බෙදා හැරීමේ ලේඛන අද දවසේ අපි රටට ඉදිරිපත් කරනවා. ඒ අනුව ගෑස් හිඟයක් ඇති වෙන්න අපි කිසිසේත් ඉඩ තියන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I think the Hon. Minister gave an adequate explanation, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාජ මාධ්‍ය ඇතුළු නොයෙකුත් මාධ්‍ය හරහා තොරතුරු ලබා ගැනීම වරදක් නොවෙයි. ඔය පෝලිම් මම නිර්මාණය කළේත් නැහැ. ඔය ජනතාව අපි පාරට බැස්සුවේත් නැහැ. ගෑස් හිඟයක් තිබෙනවා. මම මේ ප්‍රශ්නය මතු කළේ විසඳුමක් උදෙසා. ගරු ඇමතිතුමා කලබල වෙන්න එපා. කෙසේ වුවත්, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We cannot go for a debate on this.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැව එන වෙලාව, නැවේ කාලසටහන, ඒවා හරි, ඒවා සත්‍ය වෙන්න පුළුවන්. නමුත් මොකක් හරි තත්ත්වයක් තුළ දැන් ගෑස් හිඟයක් නිර්මාණය වෙලා තිබෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ පාරිභෝගිකයා වෙනුවෙන් ඒ ප්‍රශ්නය විසඳන්න කියලායි. ඒකයි අපි ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you may take 30 seconds and respond.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I am not going to have a debate on this with the Hon. Leader of the Opposition. But, I have to answer him.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මතු කරන ආකාරයට පසුගිය දවස් කිහිපයේ ගෑස් හිඟයක් ඇති වෙලා තිබෙන්නේ ලාෆ් ගෑස් නැති නිසායි. අපි ලිට්රෝ ගෑස් ගෙනැල්ලා දිගටම බෙදුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලාෆ් ගෑස් නැති වෙනකොට ලිට්රෝ ගෑස් පාවිච්චි කරන අයත් ගෑස් හිඟයක් ද කියලා හිතලා වෙළෙඳ පොළට එනවා. එම නිසා තමයි ගරු විපක්ෂ නායකතුමනි, දවසකට නිදහස් කරන ටොන් 1,200 වෙනුවට ටොන් 1,500ක් නිදහස් කරන්නේ. අද, හෙට සහ අනිද්දා කියන දවස් තුනටම ටොන් 1,500ක් බැගින් නිදහස් කරන්න schedule කරලා තිබෙන්නේ. මීට කලින් අපි දවසකට ටොන් 1,500ක් නිදහස් කළේ නැහැ. එම නිසා තමයි අපි කියන්නේ ගෑස් හිඟයක් නොවෙයි ඇති වෙලා තිබෙන්නේ කියලා. අනෙක් ගෑස් සමාගම ගෑස් නොසැපයීම නිසා වෙළෙඳ පොළ තුළ ඇති වී තිබෙන හිඟය ආවරණය කරන්නත් අපි අවශ්‍ය ගෑස් නිදහස් කරනවා. අදාළ සමාගමට ඒ සඳහා අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. එහෙම ලබා දී තිබෙන උපදෙස් පිළිපදින්නේ නැත්නම් ඒ පිළිබඳව තීරණයක් ගන්නත් අපි කටයුතු කරනවාය කියලා දැනුම් දීලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chamara Sampath Dasanayake. You have two minutes.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මේ කථාව අහගන්න.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
*(இச்சந்தர்ப்பத்தில் ஒலிப்பதிவொன்று கேட்கச்செய்யப்பட்டது.)*
*(At this stage, an audio recording was played.)*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you know well that you are not supposed to play recordings in the Chamber.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ, මීට මාස දෙකකට කලින් මම පාර්ලිමේන්තුවේදී කියපු කථාවක්. මම තමයි මේ කථාව කිව්වේ.

අවුරුදු ගණනක් තිස්සේ ඕමාන් රජයේ සමාගම තමයි මේ රටට ගෑස් දුන්නේ. හැබැයි, ඔයගොල්ලන් ඒ ඕමාන් සමාගම අයින් කරලා, කවදාවත් ආසියාවේ කොහේටවත් ගෑස් බෙදපු නැති ස්විට්සර්ලන්තයේ ජියෝ ගෑස් සමාගමට මේ සැරේ ටෙන්ඩර් එක දුන්නා. මම දෙසැම්බර් මාසයේ මේ ගැන කිව්වා. ගෑස් හිඟයක් එනවා කියලා මම කිව්ව කථාව දෙසැම්බර් මාසයේ "හිරු" නාළිකාවේත්, අනෙක් හැම නාළිකාවකමත් ප්‍රවෘත්තිවල විකාශය වුණා. ජියෝ ගෑස් කොම්පැනියට ටෙන්ඩරය දුන්නාට පසු මම පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ කොම්පැනියට ලිට්රෝ ගෑස් ගෙනෙන්න තිබෙන්නේ නැව් දෙකයි, මේගොල්ලන්ට නැව් schedule කර ගන්න බැහැ කියලා. ඕමාන් සමාගමට ඇති වෙන්න ලිට්රෝ ගෑස් දෙන්න පුළුවන්කමක් තිබුණා. එහෙම තිබියදී තමයි ඩොලර් ශත 15ක් අඩු නිසා ඔයගොල්ලන් ජියෝ ගෑස් සමාගමට ටෙන්ඩර් එක දුන්නේ.

අපි පිළිගන්නවා, ඩොලර් ශත 15ක් අඩු නිසා ටෙන්ඩර් එක ඔයගොල්ලන් දුන් එක සාධාරණයි කියලා. හැබැයි, ඩොලර් ශත 15ද බලන්න ඕනෑ, ඇති වන ගෑස් හිඟයද බලන්න ඕනෑ? මේ කාරණයේ දෙපැත්තක් තිබෙනවා. ගෑස් නිසා තමයි පසුගිය වතාවේ ගෝඨාභයගේ ආණ්ඩුවත් වරද්දා ගත්තේ. මම එදා වරද්දා ගත්ත භාෂාවෙන්ම ඒ ගැන කිව්වා. මම මේක කිව්වේ දෙසැම්බර් 25වැනි දා. අද පෙබරවාරි 19වැනි දා. මම කිව්වා, ගෑස් හිඟයක් එනවා කියලා. ඒකට හේතුව තමයි ජියෝ ගෑස් කොම්පැනියට නැව් නැති එක. ඒගොල්ලන් නැව් දෙකකින් ගෑස් ගෙනෙන්න ගියොත් මේ ගෑස් හිඟය ඇති වන එක නවත්වන්න බැහැ. මේ වෙනකොට මේ රටේ මිනිසුන්ගෙන් සියයට 80ක් ලිට්රෝ ගෑස් තමයි පාවිච්චි කරන්නේ. විජිත හේරත් ඇමතිතුමා මීට කලින් දවසක මගේ කථාවෙන් පසුව පාර්ලිමේන්තුවේදී උත්තරයක් දුන්නා, කිසිම දිනයක ගෑස් හිඟයක් එන්නේ නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපේ රැවුල නැහැ නේ. ඔබතුමාගේත් රැවුල නැහැ, මගේත් රැවුල නැහැ. අපි කියන ඒවා ආණ්ඩුව පිළිගන්නේ නැති එක තමයි ගැටලුව වෙලා තිබෙන්නේ. අපි කියපු සමහර ඒවා පිළිගන්න. විපක්ෂ නායකතුමායි, මමයි ගිහිල්ලා ගෑස් පෝලිම් හදන්නේ නැහැ. අපි ආණ්ඩුවට විරුද්ධව කවදාවත් Facebook එකේ comment එකක්වත් දමන්නේ නැහැ. අපි මාධ්‍ය සන්දර්ශන පවත්වන මිනිස්සු නොවෙයි. එම නිසා ගෑස් හිඟයක් තිබෙනවා කියන එක පිළිගන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you can take only a minute. We have to suspend the Sitting for lunch.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය පිළිගන්නවා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටෙන්ඩර් පටිපාටිය අනුව මිල අඩු කෙනාට තමයි ටෙන්ඩර් එක දුන්නේ. එතකොට ඒක හරි නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක පිළිගන්නවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා ඒක පිළිගන්නවා නේ. අදාළ සමාගම ටෙන්ඩර් කොන්දේසි කඩ කරනවා නම් තමයි ඊළඟ ක්‍රියාමාර්ගය ගන්න වෙන්නේ. හැබැයි, එහෙම එකක් නැහැ. ඔබතුමා කිව්වා වාගේ සියයට 20ක් ගෑස් සපයන පෞද්ගලික සමාගම ගෑස් නොසැපයීම නිසා රට ඇතුළේ හිඟයක් ඇති වුණාම මිනිස්සු අනෙක් ගෑස් සමාගමෙන් ගෑස් මිලදී ගන්න පටන් ගන්නවා. ඒක නිසා තමයි මේ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය අපි විසඳනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let us not go into a debate on this, please.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පර 15ක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තත්පර 15ක් මම ගණන් කරගෙන ඉන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේකයි. ගරු ඇමතිතුමනි, මම ටෙන්ඩර් එක ගැන කිව්වා. මම එදාත් කිව්වා, ආණ්ඩුව ඩොලර් ශත 15ක් අඩුවෙන් තමයි ජියෝ ගෑස් කොම්පැනියට දුන්නේ කියන එක. හැබැයි, ඩොලර් ශත 15ක් අඩුවෙන් දුන්නාට, මේ රටේ මිනිස්සුන්ට ඕමාන් රජයෙන් ගෑස් දීපු විධියට දිගටම දෙන්න බැරි වුණොත්, ඒ ඩොලර් ශත 15ට වැඩිය පාඩුවක් අපේ රටේ මිනිස්සුන්ට වෙනවා. මොකද, එතකොට අපේ රටේ මිනිස්සුන්ට ගෑස් ගෙනෙන්න අරහෙට දුවන්නයි, මෙහෙට දුවන්නයි වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. **1.00**ට නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Wasantha Samarasinghe. You have five minutes.

[අ.භා. 1.00]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ විශේෂයෙන් කාරණයක් කියන්න ඕනෑ. මා මේ කාරණය ඉදිරිපත් කරන්න ඕනෑ කියලා හිතුවේ විපක්ෂ නායකතුමාත්, චාමර සම්පත් මන්ත්‍රීවරයාත් ගෑස් හිඟයක් පිළිබඳව අදහසක් ඉදිරිපත් කළ නිසායි. එතුමන්ලා ඒ අදහස් ඉදිරිපත් කිරීම පිටුපස තිබෙන්නේ ගෑස් පිළිබඳ තත්ත්වය දැන ගැනීමේ සැබෑ වුවමනාව නම්, ඒ ගැන කරුණු කියන්නත් ඕනෑ. ඒ වාගේම රටේ ජනතාවට මේ වෙලාවේ ගෑස් පිළිබඳ ඇත්ත තත්ත්වය කියන්න ඕනෑ කියලාත් ආණ්ඩුව හැටියට අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ටෙන්ඩර් පටිපාටිය පිළිබඳව විවිධ අවස්ථාවල සාකච්ඡාවට ලක් වුණා. ටෙන්ඩර් ක්‍රියාවලිය බැලුවොත්, අපි විනිවිදභාවයෙන් යුතුව ටෙන්ඩර් කැඳවීම සිදු කරලා තිබෙනවා. ඒ ටෙන්ඩර් පටිපාටියට අනුව තෝරාගත යුතු හොඳම සැපයුම්කරුවා තමයි තෝරාගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔහු තමයි අපට අඩුම මිලට ගෑස් සපයන්න එකඟ වෙලා තිබෙන කෙනා. ඒ නිසා ඔහු තෝරලා තිබෙනවා. මම ඒ අයගේ නම් කියන්න ඕනෑ නැහැ නේ. පරණ හිටපු කෙනාද, අලුත් කෙනාද කියන එක නොවෙයි අදාළ වන්නේ.

දැන් තත්ත්වය මොකක්ද? ජනවාරි මාසයේ අපේ ගෑස් අවශ්‍යතාව තිබුණා, මෙට්‍රික් ටොන් 23,000ක්. එතකොට අපි ගෑස් මෙට්‍රික් ටොන් 23,000ක් අපට සපයන්න කියලා සැපයුම්කරුවාගෙන් ඉල්ලුවා. ඔහු අපට සපයා තිබෙනවා, ගෑස් මෙට්‍රික් ටොන් 24,000ක්. මම මේ කියන්නේ ලිට්රෝ ගෑස් පිළිබඳව. පෙබරවාරි මාසයේ ඉල්ලුම අපි යම් ප්‍රමාණයකට වැඩි කරලා තිබෙනවා. ගෑස් මෙට්‍රික් ටොන් 28,000ක් අපි ඉල්ලා තිබෙනවා. අපි ඉල්ලපු මෙට්‍රික් ටොන් 28,000න් මේ වෙනකොට ගෑස් මෙට්‍රික් ටොන් 18,078ක් ලැබිලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට අමතරව නැව් තුනක් පෙබරවාරි මාසය ඇතුළේ -22, 26, 28 දිනවල- ඒමට නියමිතව තිබෙනවා. අපේ ඉල්ලුම අනුව ඔහු ඒ අදාළ සැපයුම කරමින් තිබෙනවා.

ලිට්රෝ ගෑස් සමාගම අපේ රටේ ගෑස් වෙළෙඳ පොළෙන් සියයට 80කට ආසන්න ප්‍රමාණයක් තමයි ආවරණය කරන්නේ. විශේෂයෙන් ලාෆ් ගෑස් සමාගමේ ගෑස් සැපයීම පිළිබඳ තිබෙන ගැටලුවට උත්තර හොයන්න, පාරිභෝගිකයාට ගෑස් ලබා දීම පිළිබඳව ඔවුන්ට මතුවෙලා තිබෙන ගැටලුවට ඔවුන්ගේ පැත්තෙන් දෙන පැහැදිලි කිරීම මොකක්ද සහ ඔවුන්ගේ මැදිහත්වීම මොකක්ද කියලා බලන්න පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අවස්ථා දෙකකදී ඔවුන් කැඳෙව්වා. ඔවුන් මගෙනුත් වෙලාවක් ඉල්ලා තිබෙනවා, මේ ගැන පැහැදිලි කරන්න. මම කිව්වා පැහැදිලි කිරීම තමයි, පාරිභෝගිකයාට ගෑස් ලබා දෙන එක කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පිළිබඳව විමසුවාම ඔවුන් කිව්වේ, ඒගොල්ලන්ගේ එක නැවක් ගෑස් මෙට්‍රික් ටොන් 3,000ක් රැගෙන පෙබරවාරි 25 දින පැමිණෙන බවයි. මෙට්‍රික් ටොන් 3,000කට ටිකක් වැඩි ගෑස් ප්‍රමාණයක් එන්නේ මේ හිඟ වෙලා තිබෙන ගෑස් ප්‍රමාණයත් එක්කයි. ඔවුන්ගේ ඊළඟ ගෑස් නැව මාර්තු මාසයේ 03වැනි දා එයි කියලා ඔවුන් අපේක්ෂා කරනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවේදී අදාළ සමාගම අපට දැනුම් දීලා තිබෙනවා, ලිට්රෝ ගෑස් සමාගමට ගෑස් සපයන සැපයුම්කරුවාගෙන් ඔවුනුත් ගෑස් මිලදී ගන්න තමයි දැන් උත්සාහ කරන්නේ කියලා. ගෑස් හිඟයක් ඇති වේ යැයි බිය හදා ගන්න අයටයි මම මේ කියන්නේ.

අපේ රටට ප්‍රධාන වශයෙන් ගෑස් සපයන සැපයුම්කරුවා - ලිට්රෝ ගෑස් සමාගම - ගෑස් අරගෙන පාරිභෝගිකයන්ගෙන් සියයට 85කට ගෑස් බෙදා හැරීම සිදු කරනවා. ඒ වාගේම පෞද්ගලික ගෑස් සමාගමක් තිබෙනවා. ඒ අය සියයට 20කට ටිකක් අඩු ප්‍රමාණයක් බෙදා හරිනවා. ඒ අයත් දැන් උත්සාහ කරනවා, රජයේ ගෑස් සමාගමට ගෑස් සපයන සමාගමෙන් ගෑස් අරගෙන බෙදන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලොකු ගෑස් නැවක් ඇවිල්ලා මුහුදේ නවත්වලා කුඩා නැව්වලින් තමයි බෙදා හැරීම සඳහා රටට නිකුත් කරන්නේ. මාලදිවයිනට ගෑස් සපයන්නේත් අපට ගෑස් සපයන සමාගම තමයි. ඒ සමාගම හරහා ගෑස් මිලදී ගෙන ලංකාවේ පාරිභෝගිකයාට ලබා දෙන්න මේ සමාගමේ අයත් උත්සාහ කරනවා.

අපි රජය හැටියට ඉතාම වගකීමෙන් කියන්න ඕනෑ, පසුගිය දින කිහිපය ඇතුළේ ඇති වුණු තත්ත්වය ගැන. ගෑස් වෙළෙඳ පොළේ ඉන්නේ තරගකරුවන් දෙදෙනායි. එක්කෙනෙක් රජයේ සමාගම. ඒ සමාගම ගෑස් ඉල්ලුමෙන් සියයට 80ක් සපයනවා. අනෙක් සමාගම පෞද්ගලික අංශයේ. ඒ සමාගම සියයට 20ක් ගෑස් සපයනවා. මේ සියයට 20ක සැපයුම නැති වුණාට පස්සේ ජනතාව සියයට 80 කෙනාගේ පැත්තට හැරෙනවා. එක දොස්තර මහත්මයෙක් නැති වුණාම අනෙක් දොස්තර මහත්මයා ළඟට යනවා නේ, කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමනි. එහෙම නේද? ඒ වාගේ සියයට 80ක් සපයන නිල් පාට ගෑස් සිලින්ඩරය - ලිට්රෝ ගෑස් සිලින්ඩරය - කහ පාට ගෑස් සිලින්ඩරය තිබෙන කෙනාත් ගන්නවා. අපි දන්නවා, ගෙවල්වල මේ වර්ග දෙකම තියාගෙන ඉන්නවා කියලා. පසුගිය කාලයේ ලබපු අත්දැකීම අනුව එකක් නැති වුණොත් අනෙක ගන්න ඕනෑ නිසා ගෑස් ඒ සිලින්ඩර් වර්ග දෙකම තියාගෙන ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මොකද වුණේ? ලිට්රෝ ගෑස් සමාගම සාමාන්‍ය විධියට සපයමින් තිබුණේ ගෑස් මෙට්‍රික් ටොන් 1,100ක්, 1,200ක් අතර ප්‍රමාණයක්. ඔවුන්ගේ ඉල්ලුම ක්ෂණිකව වැඩි වුණා. මොකද, ලාෆ් ගෑස් පාරිභෝගිකයන් දින කිහිපයක් බැලුවත් ඔවුන්ට ගෑස් නැති වුණා. එතකොට ඔවුන් මොකද කළේ? නිල් පාට ගෑස් සිලින්ඩරයක්වත් ගන්න ඕනෑ කියලා ගිහින් ගන්න පටන් ගත්තා. අන්න එහෙම ගෑස් ගන්න පටන් ගන්නකොට අපි කියන්නේ panic buying කියලා; ජනතාව ගෑස් හිඟයක් ඇති වේ යැයි බිය හදාගෙන, කලබලයට පත්වෙලා මිලදී ගැනීම්වලට යනවා. එහෙම මිලදී ගැනීම්වලට ගියාට පස්සේ ලිට්රෝ ගෑස් සමාගමේ මෙට්‍රික් ටොන් 1,200ක සැපයුම ප්‍රමාණවත් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට මොකද වෙන්නේ? ලිට්රෝ ගෑස් සමාගම සතුව තිබෙන ගෑස් ටික වැඩි කරන්න ඕනෑ. අන්න ඒ නිසා මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ අද සිට ඉදිරි දවස් තුන තුළ අපි මෙට්‍රික් ටොන් 1,500ක් වෙළෙඳ පොළට නිදහස් කරනවා. දවසකට 1,200ක් සැපයූ එක වෙනුවට 1,500ක් සපයනවා. ඒ කියන්නේ, වෙළෙඳ පොළට අපේ සැපයුම සියයට 25කින් වැඩි කරනවා. ඒ වැඩි කරන්නේ ඇයි? ඒ අනුව මුළු වෙළෙඳ පොළෙන් සියයට 20ක් අත්පත් කරගෙන හිටපු කෙනාගේ ප්‍රමාණයට සාපේක්ෂ ගෑස් ප්‍රමාණයක් අපි නිදහස් කරනවා අපේ ලිට්රෝ ගෑස් සමාගම හරහා.

ප්‍රශ්නයක් තිබෙනවා. කහ පාට ගෑස් සිලින්ඩරයක් විතරක් තිබෙන කෙනාට නිල් පාට එකක් එක පාර ගන්න බැහැ. ඒ අනුව ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිතුමා අද මට ලිපිය එව්වා. අපි අදාළ සමාගමට දැනුම් දුන්නා, ඔබ වහාම පාරිභෝගිකයන් නොමඟ නොයවා ඒ

සැපයුම කරන්න ඕනෑ කියලා. මොකද, පාරිභෝගිකයන් සමහර අවස්ථාවල ගෑස් සිලින්ඩරයට රුපියල් 10,000, 15,000, 20,000 ගෙවා තිබෙනවා. ඔවුන්ට ගෑස් සිලින්ඩර් දෙකක් තියාගෙන ඉන්න බැහැ. ඒ සමාගම කඩිනමින් ඒ සැපයුම නොකරනවා නම් ඒකට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්න පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පනත අනුව පුළුවන්කම තිබෙනවා. ඒ පිළිබඳවත් අපි කටයුතු කරනවා. මොකද, මේක හැම දාම වෙන්න දෙන්න බැහැනේ. පාරිභෝගිකයා ගෙවීමක් කරලා සිලින්ඩරයක් අරගෙන deposit එකක් හැටියට තියාගෙන ඉන්නකොට ඒ ගෑස් නැති වුණාම, ඔහුට ගිහින් නිල් පාට ගෑස් සිලින්ඩරයක් ගන්න පුළුවන්කමක් නැහැ. මොකද, regulatorsවල ප්‍රශ්න එන්න පුළුවන්, ගෑස් ලීප් සම්බන්ධ ප්‍රශ්න එන්න පුළුවන්. ඔහුට කහ පාට ගෑස් එක තමයි ගන්න පුළුවන්කම තිබෙන්නේ.

ගෑස් හිඟය පිළිබඳ මේ දවස් දෙක තුනක් ඇතුළත ඇති වෙච්ච ප්‍රශ්නයට නිශ්චිත උත්තරය අපි සොයලා තිබෙනවා. මා ඔබට සඳහන් කළා වාගේ ඉදිරි දින කිහිපයේම නැව් ටික එනවා. ලිට්රෝ ගෑස් සමාගම සතුව දැන් තිබෙන තොග ඉදිරියේදී දිනකට මෙට්‍රික් ටොන් 1,500 ගාණේ නිදහස් කරනවා. ඒ අනුව වෙළෙඳ පොළ තුළ ගෑස් හිඟයක් ඇති වේ යැයි ජනතාව බිය හදා ගන්න අවශ්‍ය නැහැ. ගෑස් හිඟයක් ඇති වේ යැයි බියක් හදන්න උත්සාහ කරන සමහර රූපවාහිනී නාළිකා ගෑස් පෝලිම් හදමින් ගෑස් හිඟයි කියන්න හදනවා. නැහැ, පෝලිමට ගෑස් එනවා, නැව් පෝලිමට එනවා. ඒ ගැන බිය වන්න එපා. හැබැයි පෞද්ගලික අංශයේ ගෑස් සමාගම මේ කටයුත්තට මැදිහත් නොවෙනවා නම් ඒ පාරිභෝගික ජනතාවට සාධාරණයක් ඉෂ්ට කිරීමට මැදිහත් වෙන්න රජයක් හැටියට අපි කටයුතු කළ යුතුයි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඒ පිළිබඳව මැදිහත් වෙනවා වාගේම රජයක් හැටියට අපට ඒ පිළිබඳව තීරණයක් ගන්න වෙනවා. අපි ඒ අයට දැනුම් දීලා තිබෙනවා වහාම තමන්ගේ පාරිභෝගිකයාට අවශ්‍ය ගෑස් ප්‍රමාණය ගෙනැල්ලා බෙදා හැරීමේ කටයුතු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda. You have eight minutes.

[අ.භා. 1.08]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අපේ ගරු ඇමතිතුමා කිව්වා, සමහර රූපවාහිනී නාළිකා පෝලිම් යුගයක් හදමින් ගෑස් හිඟය පිළිබඳව කථා කරනවා කියලා. ගාල්ල නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම දන්නවා, ඊයේ අපේ දිස්ත්‍රික්කයේත් ගෑස් පෝලිම් තිබුණු බව. හැබැයි රූපවාහිනී නාළිකා නම් නොවෙයි ඒ ගෑස් පෝලිම් හැදුවේ. ඒ ගෑස් පෝලිම් සැබෑ ගෑස් පෝලිම්. ඒ ගෑස් පෝලිම්වලට ගිහිල්ලා voice-cuts දිදී දේශපාලනය කරන පක්ෂයක් නොවෙයි අපි. අපට මතකයි, අපේ කාලයේ ගෑස් හිඟය තිබෙනකොට ගෑස් සිලින්ඩර් පිපිරුවා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ගෙදර යන්න වුණා. එතුමා ගෙදර ගිය ගමන් ගෑස් සිලින්ඩර් පුපුරන එකත් නැවතුණා. ඒවා අපට හොඳට මතකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද ඉතාම වැදගත් මාතෘකාවක් ගැන තමයි කථා කරන්නේ. විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන මේ වෙලාවේ ඒ සඳහා අපේ දැඩි එකඟත්වය, අපේ දැඩි කැමැත්ත එකතු කරන බව මම පළමුවෙන්ම කියන්න ඕනෑ. නමුත් මේකත් කියන්න අවශ්‍යයි. මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම, මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය, මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් රටේ මතයක් තිබුණා. ඒ මතය තමයි දේශපාලනඥයන් ඒ පිටුපස ඉන්නවාය කියන මතය. ඒ මතය ගොඩ නඟපු කණ්ඩායම තමයි අද ආණ්ඩු කරවන ඔබගේ දේශපාලන පක්ෂය. ඒක අපට මතකයි. ඒ මතය ගොඩ නඟපු ඔබතුමන්ලාට අද ඒ විධියටම චෝදනා එල්ල වෙමින් තිබෙනවා. අපි දන්නවා, බුද්ධි අංශ තොරතුරු ඉදිරිපත් වෙලා තිබියදීත් මේ රටට කුඩු කන්ටේනර් දෙකක් ඇතුළු වුණු බව. ඒ ඇතුළු වුණු කන්ටේනර් දෙක නිදහස් වුණේ කොහොමද කියන එක අදටත් මේ රටට අභිරහසක් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔබේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ප්‍රාදේශීය සභා අපේක්ෂකයන්ට, විදුහල්පතිවරුන්ට මත්ද්‍රව්‍ය පිළිබඳ චෝදනාවලට ලක් වෙන්න සිදු වුණා. ඒ නිසා මට කියන්න වුවමනා වුණේ, මේක දේශපාලන කණ්ඩායමකට, එහෙම නැත්නම් දේශපාලන පක්ෂයකට ලඝු වෙච්ච කාරණයක් නොවෙයි කියන එකයි. මත්ද්‍රව්‍ය උවදුර කියන්නේ දේශපාලකයන්, ව්‍යාපාරිකයන් ඇතුළුව අද මේ සමස්ත සමාජයම වෙළා ගත්තු උවදුරක්. ඒ නිසා අපි මීට එරෙහිව සටන් කළ යුත්තේ පොදුවේ, පොදු අරමුණක් වෙනුවෙන්, අප සියලුදෙනා ඒකාබද්ධව එක මතයක ඉඳගෙන. එහෙම නැතුව ඇඟිල්ල කාටද දිගු කරන්නේ කියන කාරණය හෝ, ඇඟිල්ල ආණ්ඩුවට දිගු කරනවාද, විපක්ෂයට දිගු කරනවාද කියන කාරණය හෝ, එසේ ඇඟිල්ල දිගු කරමින් අප එකිනෙකා ජයග්‍රහණය කරන්න හදනවාද කියන කාරණය වැදගත් වෙන්නේ නැහැ කියන එක මම මේ මොහොතේ සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත් ගෙනාවේ ඉහත කියපු කාරණා නිසාම නොවෙයි කියා අපි දන්නවා. මේ පනත් කෙටුම්පත් ගෙනාවේ ගෝලීය අවශ්‍යතාවක් විධියටයි. ඒ වාගේම, ජාත්‍යන්තර සංවිධාන හා පවතින ජාත්‍යන්තර බැඳීම් හා මේ රටේ මහජන ආරක්ෂාව, මහජන සෞඛ්‍යය කියන කාරණාත් එකතු කරගෙන තමයි මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නීති-රීති වෙනස් වුණාට, ඒවා සංශෝධනය වුණාට ඒ පමණකින්ම මේ ගැටලුව අපට විසඳන්න බැහැ. ඒ නීති-රීති මඟින් අප පනවන දඬුවම, දැඩි දඬුවමක් බවට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම දඬුවම් කිරීමෙන්ම පමණක් අපට මේ උවදුරෙන් මිදෙන්නත් බැහැ. අපි දන්නවා, පසුගිය කාලයේ සෑම ආගමික සංස්ථාවක් තුළින්ම, - බෞද්ධ ආගම වෙන්න පුළුවන්, හින්දු ආගම වෙන්න පුළුවන්, කතෝලික ආගම වෙන්න පුළුවන්, ඉස්ලාම් ආගම වෙන්නත් පුළුවන්- සෑම ආගමික පරිසරයක් තුළින්ම මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් දැඩි මැදිහත්වීමක් සිදු කළාය කියන එක. අද ඒ මැදිහත්වීම, ඒ දායකත්වය ඔබේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙනවා.

අද උදේ මේ පනත් කෙටුම්පත් දෙවන වර කියවීමේ විවාදය අරඹපු අවස්ථාවේ ගරු අධිකරණ ඇමතිතුමා කියනවා මම දැක්කා, ආගමික සංස්ථාවල සහයෝගය මීට අවශ්‍යයි කියන කාරණය. හැබැයි, ඔබේ ආණ්ඩුව ඒ ආගමික සංස්ථාවල සහයෝගය ගන්න පුළුවන් තැනක ඉඳගෙන නොවෙයි කටයුතු කරන්නේ. ඔබේ ආණ්ඩුව ආගමික සංස්ථා ප්‍රතික්ෂේප කරමින්, ඒ ආගමික සංස්ථාවලට සම්බන්ධ වෙන්න තිබෙන ඒ සියලු බැඳීම් අහුරමින් කටයුතු කරන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. ඉතාම කනගාටුදායක සිද්ධියක් අපි ඊයේ දැක්කා. ඒ තමයි මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් ප්‍රධාන රූපවාහිනී නාළිකාවක

[ගරු චානක මාදුගොඩ මහතා]

වැඩසටහනකට පැමිණ, ඒ වැඩසටහනේදී කථා කරපු ආකාරය. එතුමා කථා කරපු ආකාරය විශේෂයෙන්ම බෞද්ධයන් විධියට අපට කිසි ලෙසකින්වත් අනුමත කරන්න බැහැ. ත්‍රිකුණාමලයේ සිද්ධිය සම්බන්ධයෙන් කථා කරද්දී අපේ බලංගොඩ කස්සප නායක හාමුදුරුවන් වහන්සේට එතුමා ප්‍රසිද්ධියේම කිව්වා "කස්සප" කියලා. එතුමා "කස්සප" කියලා තමයි උන්වහන්සේට ආමන්ත්‍රණය කළේ. එතුමා අඩුම ගණනේ සදාචාර සම්පන්න මන්ත්‍රීවරයෙක් නම්, "ඒ වචනය වැරදුණා, මම ඒක ඉල්ලා අස් කර ගන්නවා, ඒ පිළිබඳව සමාවෙන්න" කියලා කියන්න ඕනෑ. හැබැයි, එතුමා එහෙම කළේ නැහැ. එතුමා අපේ බලංගොඩ කස්සප නායක හාමුදුරුවන් වහන්සේට "කස්සප" කියලා ආමන්ත්‍රණය කළා. කස්සප නායක හාමුදුරුවන් වහන්සේ පිළිබඳව ප්‍රශ්න තිබෙන්න පුළුවන්, මතවාද තිබෙන්න පුළුවන්. හැබැයි, එතුමා "කස්සප" කියලා ආමන්ත්‍රණය කළේ ඒ භික්ෂූන් වහන්සේට පමණක් නොවෙයි, සමස්ත බෞද්ධයාටයි, අපේ කසාවතටයි. ඒ නිසා අපි ඒ පිළිබඳව අපේ දැඩි විරෝධය පළ කරනවා. බෞද්ධ සංස්ථාව විතරක් නොවෙයි, මේ සමස්ත සමාජයේම ආගමික සංස්ථා බිඳ වැට්ටවීමට මේ ආණ්ඩුව දවසින් දවස කටයුතු කරනවා කියන එකට ඒක එක උදාහරණයක් කියන කාරණය මම මේ මොහොතේ සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 වර්ෂයේදී ත්‍රිවිධ හමුදාවට වියළි ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය පිළිබඳව මම මේ පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම කථා කළා. ඒ ටෙන්ඩරය නිසා මේ රටට රුපියල් මිලියන 180ක් පාඩු වුණා. හැබැයි, අද වනතුරු කිසිම මන්ත්‍රීවරයෙක්, කිසිම වග කිව යුතු ඇමතිවරයෙක් අඩුම ලංසුවට ඒ ටෙන්ඩරය ලබා නොදීම පිළිබඳව වචනයක්වත් කථා කළේ නැහැ. එයින් මේ රටට සිදු වුණු පාඩුව ගැන තවම උත්තරයක් දීලා නැහැ. මම මගේ කථාවේ ඉතිරි විනාඩි දෙක දෙනවා, පුළුවන් නම් ඒකට උත්තරයක් දෙන්න කියලා. අපි අභියෝගයක් කළා. හැබැයි, තවම කවුරුවත් ඒකට පිළිතුරක් දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. අපි මීට පෙර මේ පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින්, ලංකා ඛනිජ වැලි සමාගමේ සේවයට බඳවා ගත් අනියම් කම්කරු මහත්ම මහත්මීන් පිළිබඳව කළා. ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් දුන්නා, පසුගිය අවුරුද්දේ මාර්තු මාසයේදී, ඔවුන් ස්ථිර සේවයට බඳවා ගන්නවා කියලා. අවුරුදු එකහමාරක් වෙලාත් තවමත් ඔවුන්ගේ රැකියාව ස්ථිර කරලා නැහැ. ඔවුන් ගෙවල්වලින්, ණයට සල්ලි අරගෙන ගිහිල්ලා ඒ සල්ලිවලින් වියදම් කරගෙනයි -අතේ වියදමින් තමයි- ඒ සේවාව කරන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කම්කරු ජනතාව වෙනුවෙන් හඬ නඟපු, ඒ වෙනුවෙන් සටන් කරපු ආණ්ඩුවක්. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අවම වශයෙන් මානව ගරුත්වයක්වත්, ජනතාව කෙරෙහි අවම සහකම්පනයවත් ඔබතුමන්ලාට තිබෙනවා නම්, ඒ සේවක මහත්ම මහත්මීන්ගේ සේවයේ ස්ථිර කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවත් විනාඩියක කාලයක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි ඉතාම ගරු කරපු, අපේ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා ඊයේ ප්‍රකාශයක් කළා. මේ රටේ ඉතාම විශිෂ්ට හමුදා නිලධාරිවරයෙකු විධියට හමුදා සේවය තුළ කටයුතු කළ එතුමාට තිබෙන ගරුත්වය අදටත් ඒ විධියටම අප තුළ තිබෙනවා. අපි බෙහෙවින් ගරු කරපු එතුමා ඊයේ කළ කථාව ගැන කියන්න පෙර එතුමාම කියපු කාරණයක් මා කියන්න ඕනෑ. අපට මතකයි එතුමාම කිව්වා, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යුද්ධ හමුදාවේ 58වන සේනාංකයේ සේනාංකාධිපතිව සිටි බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වා මහතාට දුරකථන ඇමතුමක් දීලා, සුදු කොඩි රැගෙන එන එල්ටීටීඊ නායකයන් ඝාතනය කරන්න කිව්වා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඒ සුදු කොඩි සිද්ධියට අදාළ කාරණය ඉතාම දීර්ඝ ඉතිහාසයක් තිබෙන කාරණයක්; දීර්ඝව කථා බහ වෙච්ච කාරණයක්. "ද සන්ඩේ ලීඩර්" පුවත්පතේ ෆෙඩ්රිකා ජැන්ස් මාධ්‍යවේදිනියට තමයි එතුමා ඒ සුදු කොඩි කථාව කිව්වේ. අද එතුමා ඊට විරුද්ධ කථාවක් කියන්නේ. අද එතුමා කියනවා, එල්ටීටීඊ නායකයන් ආරක්ෂා කරන්න, ඔවුන් නිදහස් කරන්න මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කටයුතු කළාය කියන කථාවක්. එතුමා අද කථා කරන්නේ දේශපාලන වුවමනාවෙන්ද, එහෙම නැත්නම් එතුමාගේ වචනවලට මිලක්, ලංසුවක්, අගයක් තිබෙන නිසාද කියන ප්‍රශ්නය අපි අහන්න කැමැතියි. එතුමාට අපේ ගරුත්වයක් තිබෙනවා. හැබැයි, අද එතුමා කථා කරන වචනවලට මිලක්, ලංසුවක්, අගයක් තිබෙනවාද කියලා අපි අහන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය අවසන් කරන්න දේශපාලන නායකත්වය දෙනකොට සරත් ෆොන්සේකා මැතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාපතිවරුන් ප්‍රමුඛ සමස්ත හමුදාව ක්‍රියාත්මක වුණේ නැත්නම්, අදටත් අපට කථා කරන්න වෙන්නේ යුද්ධය ගැනයි. එදා එරික් සෝල්හයිම්ලා ඇවිත්, තානාපතිවරුන් ඇවිත් යුද්ධය නවත්වන්න කියලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට බලපෑම් කළා ඔබතුමන්ලාට මතක ඇති. ඒවා අමතක කරලා, ඉතිහාසය වළ දමලා කටයුතු කරන්න අපට බැහැ. සරත් ෆොන්සේකා මැතිතුමාට තිබෙන ගරුත්වය, එතුමාගේ හමුදා ජීවිතය සම්බන්ධයෙන් එතුමාට තිබෙන ගරුත්වය අප තුළ එලෙසම තිබෙනවා. හැබැයි, එතුමාගේ ඒ ප්‍රකාශය, හමුදා ජීවිතයෙන් පසුව එතුමා සිදු කරන මේ ක්‍රියා පිළිබඳව අපට තිබෙන්නේ කනගාටුවක් කියන කාරණයත් මා සඳහන් කරනවා.

ආණ්ඩුවේද, විපක්ෂයේද කියන කාරණයට වඩා අපි පොදුවේ එක තැනක ඉඳගෙන අද විවාදයට ගැනෙන මේ ඉතාම වැදගත් පනත් කෙටුම්පත් ජයග්‍රහණය කරවන්න කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහොම ස්තුතියි මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I now call upon the next speaker, the Hon. Mayilvaganam Jegatheeswaran. You have nine minutes.

[பி.ப. 1.18]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பாராளுமன்ற சிறப்புரிமையைப் பயன்படுத்துவதானது எமது பாராளு மன்றத்தில் எல்லை மீறிப் போகின்றது. அதாவது, மக்கள் எதற்காகத் தங்களைத் தெரிவுசெய்து இந்த உயரிய சபைக்கு அனுப்பியிருக்கிறார்கள் என்ற நோக்கத்தை முழுமையாகச் சீர்குலைக்கின்ற நடவடிக்கைகளையே எதிர்க்கட்சியில் இருப்பவர்கள் மேற்கொள்கின்றார்கள். இவர்கள் தனிமனித தாக்குதல்களை மேற்கொண்டு, மிகவும் கீழ்த்தரமான வகையில் பாராளுமன்ற சிறப்புரிமையைப் பயன்படுத்திக்கொண்டு இருக்கிறார்கள். எதிர்க்கட்சியினர் மக்களுடைய பிரச்சினைகள் பற்றி பேசாமல் வெவ்வேறு விடயங்களில் கவனம் செலுத்தி அரசாங்கத்தைச் செயலற்றதாக மாற்ற எத்தனிக்கிறார்கள்.

தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் வளர்ச்சி கண்டு பொறுக்க முடியாத எதிர்க்கட்சியினர், தாம் என்ன பேசுகின்றோம் என்று தெரியாமல் பாராளுமன்றத்தில் உளறுகின்றார்கள். மக்களுடைய எத்தனையோ பிரச்சினைகள் பற்றி பேச இருந்தும், தங்களுடைய சொந்தப் பிரச்சினை களையும் மற்றையவர்களைக் கேவலப்படுத்துகின்ற நக்கல், நையாண்டிப் பேச்சுகளையும் பேசிக்கொண்டு இருக்கிறார்கள். மக்களுடைய வரிப் பணத்தில் பல மில்லியன் ரூபாயைச் செலவழித்து, தங்களுடைய தேவைகளை நிறைவேற்றிக் கொண்டு, பொழுதைப் போக்கிக்கொள்ளும் இடமே பாராளுமன்றம் என்று நினைத்து வந்துபோகின்றார்கள்போல் தெரிகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற நீதித்துறை (திருத்தம்) சட்டமூலம், நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம் ஆகியவற்றின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு பெருமகிழ்ச்சி அடைகின்றேன். காலத்துக்கேற்ற வகையில் நீதித்துறைக் கட்டமைப்பில் மாற்றங்களை மேற்கொள்வது வளர்ந்துவரும் ஜனநாயக நாட்டின் ஓர் இயல்பாகக் காணப் படுகின்றது. நீதித்துறையில் காணப்படுகின்ற சட்டங்கள், போதைப்பொருள் பாவனை மற்றும் போதைப்பொருள் வியாபாரத்தை அழித்தொழிப்பதற்குப் போதுமானதாகக் காணப்படவில்லை. அதன் காரணமாகவே இன்றைய தினம் இந்தச் சட்டத் திருத்தம் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது.

இன்று நீதிமன்றங்களில் நீதி வழங்கும் விடயத்தில் தாமதம் ஏற்பட்டுக்கொண்டு இருக்கின்றது. தாமதிக்கப்பட்ட நீதி மறுக்கப்பட்ட நீதிக்குச் சமமாகும். இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற திருத்தத்தின் ஊடாக மேல் நீதிமன்றங்களின் எண்ணிக்கையை அதிகரிப்பதற்கும் வழக்குகளைக் கையாழ் வதற்குத் தேவையான மேலதிக நீதிபதிகளை நியமிப்பதற்கும் வழிவகைகள் செய்யப்பட்டு இருக்கின்றன. அத்தோடு, சிவில் வழக்கு விசாரணைகளை விரைவுபடுத்துவதன்மூலம் முதலீட்டாளர்களுக்குப் பாதுகாப்பான சூழலையும் எம்மால் உறுதிப்படுத்த முடியும். தூரப் பிரதேசங்களில் வாழுகின்ற மக்கள் நீதியைப் பெற்றுக்கொள்வதற்காக நீண்ட தூரம் பயணிக்கவேண்டி இருப்பதால், அவர்களின் சுமையைக் குறைக்கும் வகையில் நீதிமன்ற அதிகார வரம்புகளை மீளாய்வு செய்வதும் வரவேற்கத்தக்க விடயமாகும்.

போதைப்பொருள் தொடர்பான விடயத்தில் நாங்கள் கவனம் செலுத்துவோமேயானால், தற்பொழுது புதிய புதிய வகையான போதைப்பொருட்களும் அதன் வியாபாரமும் பாவனையும் மிகவும் அதிகரித்து இருப்பதைக் காணலாம். போதைப்பொருட்களைப் பயன்படுத்துகின்ற நபர்களைக் கண்டுபிடிக்கக்கூடிய அல்லது இனங்காணக்கூடிய வழிமுறைகள் அற்ற வகையிலே அவற்றின் தன்மை காணப்படுகின்றது. இதன் காரணமாக எமது எதிர்காலச் சந்ததியினர் தொடர்ச்சியாகப் பல்வேறுபட்ட அசௌகரியங்களுக்கு உட்பட வாய்ப்பிருக்கின்றது. எமது இளம் சந்ததியினர் முக்கியமாக பாடசாலை மாணவர்கள் மற்றும் பல்கலைக்கழகங்களில் அல்லது உயர் கல்வி நிறுவனங்களில் கல்வி கற்கின்ற மாணவர்கள் இதனால் அதிகளவில் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். இலங்கையில் திட்டமிட்ட வகையில் மேற்கொள்ளப்படுகின்ற போதைப் பொருள் வியாபாரம் மிக மோசமான நிலையில் காணப் படுகின்றது. இதனை முழுமையாக அழித்தொழிப்பதற்கு, கொண்டுவரப்பட்டுள்ள சட்டத்திருத்தம் மிகவும் முக்கியமான தாகக் காணப்படுகின்றது. இந்தச் சட்டத்திருத்தத்தின் ஊடாகப் போதைப்பொருள் கடத்தல்காரர்களுக்கான தண்டனைகளை அதிகரிப்பதன்மூலம் போதைப்பொருள் மாபியாக்களைக் கட்டுப்படுத்துவதற்கு வாய்ப்பு ஏற்படுகின்றது. போதைப் பொருள் பாவனைக்கு உட்பட்டிருக்கின்ற எமது நாட்டின் எதிர்காலப் பிரஜைகளை மீட்டெடுக்கவேண்டிய தேவை இருக்கின்றது. அவர்கள் சமூகத்தில் ஓரங்கட்டப் பட்டுக்கொண்டு இருக்கின்ற நிலைப்பாடு காணப்படுகின்றது. அவர்களை இனங்கண்டு, தகுந்த புனர்வாழ்வு நடவடிக்கைகளில் ஈடுபடுத்தி, சமூகத்துடன் இணைத்து, நாட்டின் எதிர்கால அபிவிருத்திக்குப் பங்களிக்கக்கூடியவர் களாக மாற்றுவதற்குரிய நடவடிக்கைகளை நாங்கள் எடுக்க வேண்டும்.

இன்று மூலைமுடுக்குகளில் எல்லாம் போதைப்பொருள் வியாபித்து இருப்பதுடன், ஆழ்கடலுக்கும் நகர்ந்துள்ளது. Mother ships என்று சொல்லப்படுகின்ற பிரமாண்டமான தாய்க் கப்பல்கள் நமது கடல் எல்லைக்கு வெளியே நங்கூரமிட்டு, போதைப்பொருள் வியாபாரத்தை ஒருங்கிணைப்புச் செய்வதில் ஈடுபடுகின்றன. எமது நாடு நான்கு பக்கமும் கடலால் சூழப்பட்டது. கடல் ஊடாகத்தான் போதைப்பொருட்கள் இலங்கைக்குள் கொண்டுவரப்படுகின்றன. இந்த நடவடிக்கை களைக் கட்டுப்படுத்துவதற்கு இந்தச் சட்டமூலம் மிகவும் பிரயோசனமானதாக இருக்கும். நடுக்கடலில் அல்லது சர்வதேச கடல் எல்லையில் நங்கூரம் இட்டிருக்கின்ற கப்பல்களில் போதைப்பொருள் வியாபாரத்தில் ஈடுபடுகின்ற வர்கள் இருந்தால் அவர்களைக் கைதுசெய்து நீதிமன்றத்தில் முன்னிலைப்படுத்துவதற்குரிய வாய்ப்புகள் எங்களுக்குக் குறைவாகவே இருந்தது. ஆனால், இந்தச் சட்டத் திருத்தத்தின் மூலம் அதனையும் மேற்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்பட்டு இருக்கின்றது. அந்த வகையில், இந்தச் சட்டத் திருத்தம் மிகவும் பிரயோசனமானதாகக் காணப்படுகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2009ஆம் ஆண்டு யுத்தம் நிறைவடைந்த பிற்பாடு, வடக்கு மாகாணத்தில் போதைப்பொருள் வியாபாரம் மற்றும் மக்கள் மத்தியில் அதன் பாவனையை அதிகரிப்பதற்கான செயற்பாடுகள் என்பன கூடியளவில் நடைபெற்று வந்திருக்கின்றன. 2023ஆம் ஆண்டிலிருந்து வட மாகாணத்தில் போதைப்பொருள் தொடர்பான கைதுகள் ஆண்டுக்கு 25 சதவீதம் என்ற அடிப் படையில் அதிகரித்து இருக்கின்றது. அதுமட்டுமல்ல, போதைப்பொருள் பாவனைக்கு உட்பட்டவர்களின் குடும்பங்கள் பல்வேறு சீரழிவுகளையும் பொருளாதார

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

ரீதியிலான வீழ்ச்சிகளையும் சந்தித்திருக்கின்றன. மேலும், கலாசார, பண்பாட்டு, விழுமியங்களும் சீர்குலைந் திருக்கின்றன. வட மாகாணத்தில் போதைப்பொருள் பாவனையில் ஈடுபடுகின்றவர்கள் குற்றங்களில் ஈடுபடும் அளவும் அதிகரித்து இருக்கின்றது. கிட்டத்தட்ட 65 சதவீதமான திருட்டுச் சம்பவங்கள் இந்தப் போதைப்பொருள் பாவனை யாளர்களாலே மேற்கொள்ளப்படுகின்றன.

உண்மையிலேயே இது மிகவும் மோசமான, துர்ப்பாக்கிய நிலைமையாகும். வைத்தியசாலைகளின் புள்ளிவிபரங்களை எடுத்துக் கொண்டால், குறிப்பாக வவுனியா மற்றும் யாழ்ப்பாண வைத்தியசாலைகளின் பதிவுகளின்படி, 30 வயதுக்குட்பட்ட ஆண்களிடையே திடீர் மாரடைப்பு ஏற்படுவது 35 சதவீதம் அதிகரித்துள்ளது. இது அதிகப்படியாக 'ஐஸ்' போதைப்பொருள் பாவனையாலே ஏற்படுகின்றது. வட மாகாணத்தில் மட்டுமல்ல, முழு இலங்கையிலும் போதைப் பொருள் பாவனையால் பாரியளவில் இளைஞர் - யுவதிகள் நோய்வாய்ப்பட்டுள்ளதுடன், இறப்புகளும் நிகழ்ந்துள்ளன. இந்த நிலைமை வட மாகாணத்தில் கடந்த காலங்களில் அதிகரித்திருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

வடக்கு மாகாணத்தில் அடையாளங்காணப்பட்ட போதைப் பொருளுக்கு அடிமையானவர்களுக்கு அரசால் நடாத்தப் படுகின்ற அங்கீகரிக்கப்பட்ட புனர்வாழ்வு நிலையங்களில் சிகிச்சையளிப்பதற்கு ஆயிரம் பேருக்கு 15 படுக்கைகள் வீதம்தான் உள்ளன. எனவே, அவற்றை அதிகரித்து புனர்வாழ்வு நடவடிக்கைகளை மேம்படுத்த வேண்டும். யாழ். போதனா வைத்தியசாலையின் மனநலப் பிரிவில் அனுமதிக்கப்படும் 4 புதிய நோயாளிகளில் ஒருவர் போதைப் பொருளுக்கு அடிமையானவராகக் காணப்படுகின்றார். இவ்வாறு எமது வடக்கு மாகாணமானது போதைப்பொருளால் மிக மோசமாகப் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது நாட்டை போதைப்பொருளிலிருந்து மீட்டெடுப்பதற்காக எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் "முழு நாடுமே ஒன்றாக" என்ற தேசிய வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்தி இருக்கிறார். இந்த வேலைத்திட்டத்தினூடாக கிராம மட்டத்திலிருந்து போதைப்பொருள் நடவடிக்கைகளை முற்றாக இல்லாமல் செய்ய இருக்கின்றோம். இந்தப் புனித பயணத்தில் இணைந்துகொள்ளுமாறு அனைவருக்கும் அழைப்பு விடுத்து, சந்தர்ப்பத்துக்கு வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have seven minutes.

[பி.ப. 1.28]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நீதி அமைச்சர் கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்களால் கொண்டுவரப்பட்டுள்ள நீதித்துறை (திருத்தம்) சட்ட மூலத்துக்கு எங்களுடைய முழு ஆதரவையும் தெரிவிக்கின்றோம். போதைப்பொருளுக்கு அடிமையாகுவது ஒரு குடும்பத்தின் அழிவுக்குக் காரணமாக அமைகின்றது என்பது நாங்கள் எல்லோரும் அறிந்த ஒரு விஷயமாக இருக்கின்றது. இந்தச் சட்டத் திருத்தத்தின்மூலம் அதிகப்படியான தண்டனையை வழங்க வேண்டுமென்ற நோக்கம் மிகவும் வரவேற்கத்தக்க ஒரு விடயமாகும்.

அண்மையில் நீதிமன்றத்துக்கு உள்ளே துப்பாக்கிச் சூடு நடைபெற்றதை நாங்கள் அறியக்கூடியதாக இருந்தது. அதற்கு என்ன காரணம்? போதைப்பொருள் கடத்துகின்ற நபர்கள்மூலம் மேற்கொள்ளப்பட்ட ஒரு கொலையாகவே இது இருக்கின்றது. அதேபோன்று, அண்மையில் சட்டத்தரணி ஒருவரும் அவருடைய மனைவியும் சுட்டுக் கொலை செய்யப் பட்டார்கள். இதற்குக் காரணம் என்ன? போதைப்பொருள் கடத்தல்காரர்கள் சார்பில் வழக்கில் முன்னிலை யாகியதால்தான் இந்தக் கொலை இடம்பெற்றதாக நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இவ்வாறு கடந்த காலங்களில் இந்த நாட்டில் பல கொலைச் சம்பவங்கள் நடைபெற்றிருக்கின்றன. இந்த நாட்டில் இவ்வாறான கொலைச் சம்பவங்கள் நடைபெறுவதற்குக் காரணம், போதைப்பொருள் பாவனைதான். அதாவது, அதற்கு யாராவது முட்டுக்கட்டையாக இருந்தால் அவர்களைப் போட்டுத் தள்ளுகிறார்கள். இதை நாங்கள் முற்றுமுழுதாக இல்லாமல் செய்ய வேண்டும். இதனை முற்றுமுழுதாக இல்லாமல் செய்வது மிகவும் கஷ்டமாக இருந்தாலும், உரியவர்களுக்கு அதிகபட்ச தண்டனையையாவது பெற்றுக்கொடுத்து, இதனை ஓரளவு கட்டுப்பாட்டுக்குள் கொண்டுவருவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். இன்று இலங்கையில் மட்டுமல்ல, உலகம் முழுவதும் வியாபித்திருக்கின்ற போதைப்பொருள் வியாபாரம் முற்றுமுழுதாக ஒழிக்கப்பட வேண்டும் என்பதே எங்களுடைய கருத்தாக இருக்கின்றது. ஒரு நாட்டின் பொருளாதார வளர்ச்சியைக் குன்றவைப்பதில் போதைப்பொருள் பாவனைக்கும் பங்குண்டு.

எனக்கு முன்னர் பேசிய உறுப்பினர் ஒருவர், வட, கிழக்கு பற்றி பேசினார். ஒரு காலத்தில் வட, கிழக்கில் இதெல்லாம் இல்லவே இல்லை. அதாவது, பிரபாகரன் இருந்த காலகட்டத்தில் அங்கு போதைப்பொருள் பாவனையோ, துஷ்பிரயோகம் செய்வதோ இல்லாமல் இருந்தது. ஆனால், இன்று அங்கு இவை அதிகமாக இருப்பதற்குக் காரணம், இந்த நாட்டில் சட்டமும் ஒழுங்கும் முறையாக நிலைநாட்டப் படாமைதான். இது வருத்தத்துக்குரிய செயலாகும். மலையகப் பகுதியிலும் இவ்வாறான நிகழ்வுகள் நடைபெறுகின்றன. இன்று பல பாடசாலைகளில் போதைப்பொருள் விற்பது சர்வசாதாரணமான ஒரு விஷயமாக மாறியிருக்கிறது. இவற்றை எல்லாம் ஒழிப்பதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் நடவடிக்கை எடுத்திருக்கிறார். இது பாராட்டக்கூடிய ஒரு விஷயம். ஆனாலும், இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தபிறகு தினந்தோறும் எங்கேயாவது ஒரு கொலை நடைபெற்று வருவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. ஆகவே, இந்தக் கொலை கலாசாரத்தை ஒழிக்க வேண்டும். ஒரு காலத்தில் கொலை அல்லது இரட்டைக்

கொலை நடந்தால், அதற்குக் காரணம் காணிப் பிரச்சினையென்று சொல்வார்கள். ஆனால், இன்று இடம்பெறுகின்ற கொலைகளுக்குக் காரணம் காணிப் பிரச்சினையல்ல. போதைப்பொருள் கடத்தல் மற்றும் அதன் விநியோகத்தில் ஏற்படுகின்ற முரண்பாடுகள்தான் அதற்குக் காரணமாக இருக்கின்றன. ஆகவே, இந்தக் கொலைக் கலாசாரத்தை முற்றுமுழுதாக ஒழிப்பதற்குத் தேவையான நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுக்க வேண்டும். அதற்காக இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற சட்டமூலத்துக்கு நிச்சயமாக நாங்கள் ஆதரவு தெரிவிக் கின்றோம் என்பதை இந்த வேளையில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

போதைப்பொருளை ஒழிப்பதில் ஒவ்வொருவரும் பின்பற்றுகின்ற சமயம் - அறநெறி - நிச்சயமாக தாக்கம் செலுத்தும். அதையும் நாங்கள் விருத்தி செய்ய வேண்டும். அதாவது, வளர்ந்துவரும் பிள்ளைகள் சமுதாயத்தின் அரவணைப்பு இல்லாமல், சமுதாயத்தின் நெறிமுறைகளைப் பின்பற்றாமல் இருப்பதன் காரணமாகத்தான் இவ்வாறான துன்பகரமான நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். ஒவ்வொரு சமயமும் என்ன சொல்கின்றது என்றால், நேர்மையாக வாழ வேண்டும், சமய நெறியைக் கடைப்பிடிக்க வேண்டும் என்றுதான். பௌத்த சமயமும் அதைத்தான் சொல்கின்றது. சமய நிகழ்ச்சிகளை அதிகமாகச் செய்ய வேண்டும் என்பது என்னுடைய கருத்தாகும். போதைப்பொருள் ஒழிப்பது ஒரு பக்கம் இருந்தாலும், அதை வளரவிடாமல் தடுப்பதற்கான ஏனைய விடயங்களையும் நாங்கள் மேற்கொள்ள வேண்டும். அத்துடன், பிள்ளைகளுக்குப் பெற்றோரின் அரவணைப்பும் கட்டாயம் இருக்க வேண்டுமென தெரிவித்துக்கொள்கின்றேன்.

எவரும் குடும்பத்துக்கும் நாட்டுக்கும் சுமையாக இருக்கக்கூடாது. அவர்களுக்குரிய வாழ்க்கை வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். பொருளாதாரப் பின்னடைவு காரணமாகவும் போதைப்பொருள் விநியோகத்தில் இன்று சிலர் ஈடுபடுகின்றார்கள். ஆகவே, எல்லோரும் சமம் என்ற அடிப்படையில், இந்தச் சமூகத்தை வளர்த்தெடுக்க வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது என்பதை மறக்கக்கூடாது. போதைப்பொருள் பாவனையை ஒழிப்பதற்கு அரசாங்கம் புதிய புதிய திட்டங்களை அறிமுகப்படுத்தினாலும், அவற்றுக்கு மக்களுடைய ஒத்தாசை நிச்சயமாகத் தேவை. மக்களுடைய ஒத்தாசை இல்லாமல் எதையுமே ஒழிக்க முடியாது. எனவே, அவர்களின் ஒத்தாசையைப் பெறுவதற்கு அரசாங்கம் முயற்சிக்க வேண்டும். அரசியல் காரணமாக இவ்வாறான பிரச்சினைகள் நடப்பது இன்று மிக மிகக் குறைவாகும். இருந்தாலும், இன்று நாட்டில் ஏற்படுத்தப்பட்டு இருக்கின்ற கொலை கலாசாரம் மாற வேண்டும். அதாவது, சட்டத்தரணிகளைக் கொலைசெய்கின்ற அல்லது சாதாரண மக்களைக் கொலைசெய்கின்ற நிலைமை முற்றுமுழுதாக மாற வேண்டும்.

வெளிநாடுகளில் குறிப்பாக, முஸ்லிம் நாடுகளில் போதைப்பொருள் பாவனை, துஷ்பிரயோகங்களில் ஈடுபடு பவர்களுக்கு அதிகபட்ச தண்டனை வழங்கப்படுகின்றது. அவ்வாறான தண்டனைகள் எமது நாட்டிலும் அறிமுகப் படுத்தப்பட வேண்டும். அவ்வாறான தண்டனைகள் கொடுக்கப்பட்டால் மட்டுமே இதை நாங்கள் கட்டுக்குள் கொண்டுவர முடியும். இல்லாவிட்டால், ஒவ்வொரு நாளும் கொலையும் கொள்ளையும் துஷ்பிரயோகமும் கற்பழிப்பும் நடைபெற்றுக்கொண்டே இருக்கும். இவ்வாறு நடைபெறும் போது, நாட்டின் பொருளாதாரம் நிச்சயமாகப் பாதிக்கப்படும். இந்த நாட்டின் பிரஜைகள் என்ற அடிப்படையில், எல்லோரும் போதைப்பொருளை ஒழிப்பதற்கு ஒத்தாசை புரிய வேண்டு மெனக் கேட்டு, எனது பேச்சை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. U.P. Abeywickrama. You have nine minutes.

[අ.භා. 1.36]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතත්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතත් විවාදයට ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ ජනතාව අපට ලබා දුන් ජන වරම අනුව, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කළ ආකාරයට නීතියේ ආධිපත්‍යය සුරකිමින්, මේ රටේ ජනතාවට සාමකාමී, නිදහස් ජීවිතයක් අත්පත් කර දීම සඳහා අවශ්‍ය කරන නීති ප්‍රතිසංස්කරණ මඟින් මේ රටේ යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය කරන ව්‍යුහය ශක්තිමත් කිරීම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අභියෝගය සරල කාරණාවක් හැටියට අපි සලකන්නේ නැහැ. විශේෂයෙන්ම 1978දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමයත් සමඟ අපේ රටේ කිසිම වග විභාගයක් නැතුව, පිළිවෙළක් නැතුව ආරම්භ කළ සමහර ක්‍රියාමාර්ග එක්ක මේ රට පුරාම දේශපාලන සංස්කෘතියත්, ඒ වාගේම පාතාලයත්, මත්ද්‍රව්‍යයත් සියල්ල එකට බැඳුණු සමාජ ක්‍රමයක් වර්ධනය වුණා. ඒ ගැන අපි කල්පනා කර බැලුවොත්, පරීක්ෂා කර බැලුවොත්, දිගින් දිගටම ඒවා හුදෙකලා සිද්ධීන් හැටියට වර්ධනය වුණේ නැහැ. එම දේශපාලන පක්ෂ, බලයට පත් වුණු ආණ්ඩුවල හිටපු මැති ඇමතිවරු, ඒ වාගේම ජනතාවගේ ආරක්ෂාව සඳහා නිර්මාණය කළ ආයතන ආදී සියල්ල ග්‍රහණයට ගනිමින් පාතාලයත්, මත්ද්‍රව්‍ය මාෆියාවත්, බල ව්‍යුහයත් මේ රටේ ජනතාව පීඩාවට පත් කරමින් වර්ධනය වුණා.

2024 සැප්තැම්බර් 21වැනි දා මේ රටේ ජනතාව අපට ආණ්ඩු බලය ලබා දෙන්නේ, වරම ලබා දෙන්නේ අපරාධ රාජ්‍යයෙන් මේ රට මුදා ගැනීම සඳහා අවශ්‍ය කරන කටයුතු කරන්නයි. ඒ මහජන අපේක්ෂා අනුව, අපි ලබා දුන් පොරොන්දු අනුව ගෙවී ගිය වසරකට වැඩි කාලය තුළ මේ රටේ සෑම ක්ෂේත්‍රයකම අවශ්‍ය කරන පරිවර්තන කරමින්, අවශ්‍ය කරන පදනම දමමින් අපි කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම දේශපාලන ක්ෂේත්‍රය ගත්තොත්, මේ රටේ ජනතාවගේ අපේක්ෂාවන් අනුව අපි පොරොන්දු වූ ආකාරයට දේශපාලන ක්ෂේත්‍රය නැවත හරවන්න බැරි ලෙසට අපි පරිවර්තනය කරමින් ඉන්නවා. මහජනයාට වඩා උඩින් සිටින දේශපාලනයක් වෙනුවට මහජනයාට හිතදායී, මහජනයාගේ සේවකයන් බවට පත් වුණු දේශපාලනයක් අපි නිර්මාණය කරලා තිබෙනවා. ඔබ දන්නවා, මේ රටේ නීතියේ පාලනය තහවුරු කරන්න, ආර්ථික ස්ථාවරභාවය ඇති කරන්න අපි සමත් වෙලා තිබෙන බව. ජාත්‍යන්තර ආයතන හා දේශීය විශ්ලේෂකයන් කරන විවිධ සමීක්ෂණ තුළින් අපේ රටේ මේ පරිවර්තනය පිළිබඳව ලබා දෙන තොරතුරු අනුව මේ රටේ ජනතාව තුළ දැන් සුබදායි බලාපොරොත්තු ඇති වෙමින් තිබෙනවා.

අපි නීති ක්ෂේත්‍රය ගත්තොත්, විශේෂයෙන්ම නීති ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන ක්ෂේත්‍රය ගත්තොත්, තිබුණු

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

තත්ත්වය අනුව පරිවර්තනය කිරීම පහසු කාර්යයක් වෙන්නේ නැහැ. එහි ඇති අභියෝගයේ තරම අපි දන්නවා. ඒ වාගේම එහි දිග පළල අපි දන්නවා. මොකද, අපේ රට අපරාධ රාජ්‍යයක් බවට පරිවර්තනය වෙලායි තිබුණේ. නීතිය ක්‍රියාත්මක කරන, යුක්තිය පසිඳලන ආයතන සහ ඒවාට සහාය වන සෑම ආයතනයක්ම එම අපරාධ වළල්ලේ ග්‍රහණයට ලක් වෙලා තිබුණා. එවන් තත්ත්වයක් යටතේ අප බලයට පත් වෙලා රජයක් හැටියට එක රැයකින්, මාසයකින්, අවුරුද්දකින් ඒ තත්ත්වය ආපසු හරවන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි ඉතාම සෙමෙන්, නමුත් ස්ථාවරව, ඉතාම කල්පනාකාරීව මේ හැම ක්ෂේත්‍රයක්ම නවීකරණය කරන්න, පරිවර්තන කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග තෝරා ගන්න අපට සිදු වෙලා තිබෙන්නේ. නීති ක්ෂේත්‍රය, නැත්නම් යුක්තිය පසිඳලීමේ ක්ෂේත්‍රය ගත්තොත්, අපට ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරන්න සිද්ධ වනවා.

විශේෂයෙන්ම අධිකරණ පද්ධතිය ගත්තොත්, අපි දන්නවා, අධිකරණ පද්ධතියට අවශ්‍ය පහසුකම් සලසා තිබුණේ නැති බව. අධිකරණවලට අවශ්‍ය විනිශ්චයකාරවරුන් බඳවා ගැනීම, එම විනිශ්චයකාරවරුන්ට අවශ්‍ය පුහුණුව, පහසුකම්, වැටුප් අවශ්‍ය පරිදි ලබා දීම සඳහා හිටපු පාලකයින් කටයුතු කරලා තිබුණේ නැහැ. ඒ වාගේම අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් ගත්තත්, සතුටුදායක මට්ටමක පැවතියේ නැහැ. ඒ නිසා අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා කටයුතු කරන්නත් ආණ්ඩුවක් හැටියට අපට සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ සිටම අපි ඒ සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් කරමින් ඉන්නවා. විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත ගැන කියනවා නම්, පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේම අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරලා තිබුණේ නැහැ. අපි ආණ්ඩුවක් හැටියට අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය අධිකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා දැන් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම අපි මේ වනකොට යුක්තිය පසිඳලීමට අවශ්‍ය විමර්ශන සිදු කිරීම සඳහා පොලීසියට අවශ්‍ය පහසුකම් සලසමින්, ඒ වාගේම ඒ විමර්ශන ආයතන ශක්තිමත් කරමින්, විමර්ශන ආයතන ඇති කරමින්, අවශ්‍ය කටයුතු සිදු කරමින් ඉන්නවා. ඒ විමර්ශන ආයතන ස්වාධීනව කටයුතු කරන මට්ටමට අපි දැන් ඒවා ගොඩනගමින් තිබෙනවා.

ඔබ දන්නවා, අධිකරණ ක්‍රියාවලිය තුළ බන්ධනාගාරවලට විශේෂ වගකීමක් තිබෙන බව. පසුගිය කාලයේ බන්ධනාගාර ක්ෂේත්‍රය විශාල කඩා වැටීමකට ලක් වී තිබෙනවා. රැඳවියන් 10,000ක් රඳවා තබා ගත හැකි ධාරිතාවක් තිබෙන බන්ධනාගාර තුළ රැඳවියන් 30,000ක්, 40,000ක් පමණ රඳවා තබන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. බන්ධනාගාර නවීකරණය කළ යුතුයි; පහසුකම් සහිත තැන් බවට පත් කළ යුතුයි. ඒ වාගේම පුනරුත්ථාපන ක්‍රියාවලියත් නිසි පරිදි සිදු කළ යුතුයි. මොකද, පසුගිය කාලයේ මත්ද්‍රව්‍යවල ගොදුරු බවට පත් වුණු තරුණ පිරිස් ගාල් කරන බන්ධනාගාර ක්‍රමයක් තමයි අවාසනාවට මේ රටේ පැවතුණේ. ඒ වෙනුවට ඔවුන් පුනරුත්ථාපනය කර, මේ සමාජයේ කොටස්කරුවන් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අප දැන් ගනිමින් ඉන්නවා. පසුගිය අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේදී ජනාධිපතිවරයා මේ ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර, ඒ සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී බන්ධනාගාර ක්ෂේත්‍රය නවීකරණය කිරීමටත්, අවශ්‍ය පහසුකම් සලසා දීමටත් අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා.

නීති ප්‍රතිසංස්කරණ හැටියට ගත්තොත්, අපි ලබන දෙසැම්බර් වනකොට සෑම ක්ෂේත්‍රයකටම අදාළ නව නීති ප්‍රතිසංස්කරණ ගණනාවක් ඉදිරිපත් කිරීමටත් කටයුතු කරනවා. ඒ හරහා අපි බලාපොරොත්තු වන්නේ යුක්තිය පසිඳලීමත්, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමත් සඳහා ජනතාව විසින් අපට ලබා දුන් වරමට අනුව මේ රටේ නීතියේ පාලනය තහවුරු කරන වටපිටාවක් නිර්මාණය කිරීමයි. රජයක් හැටියට අපේ අපේක්ෂාව වන්නේ එයයි.

පසුගිය කාලය තුළ මත්ද්‍රව්‍ය විරෝධී "රටම එකට" ජාතික මෙහෙයුම මඟින් අපි මේ රටේ මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා ග්‍රාම නිලධාරි වසම් 14,022 තුළම මහජන ආරක්ෂක කමිටු පිහිටුවා මහජනතාවත් සමඟ ඒකාබද්ධ වුණු, එහෙම නැත්නම් සාමූහික ප්‍රවේශයකින් යුතු වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවා. ඒ අනුව මේ රට මේ අපරාධ රාජ්‍යයෙන් එළියට ගෙන ශිෂ්ට සම්පන්න රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමේ දිශාවට ආණ්ඩුවක් හැටියට අපි රට මෙහෙයවමින් සිටින බව ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Mujibur Rahuman. You have nine minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.45]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ කියන කාරණය අධිකරණය එක්කත් සම්බන්ධයි; නීතිය එක්කත් සම්බන්ධයි. පසුගිය ජනාධිපතිවරණය පැවති කාල සීමාවේදී අනුර කුමාර දිසානායක වත්මන් ජනාධිපතිවරයා මේ රටේ සිදු වුණු ඝාතන කිහිපයක් ගැන හොයා බලන බවට පොරොන්දු වුණා. ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැලිගොඩ, තාජුඩීන්, සිවරාම්, පෝද්දල ජයන්ත; මේ නඩු සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ට කරනවා කිව්වා.

ජනාධිපතිතුමා 2026 පෙබරවාරි මාසයේ 9වැනි දා ගැසට් නිවේදනයක් නිකුත් කළා. එම ගැසට් නිවේදනයේ සඳහන් කර තිබෙනවා, "2019.08.02වැනි දිනට පෙර ලබා ගන්නා ලද සිම් කාඩ්පත්වලට අදාළ ග්‍රාහක තොරතුරු නැවත ලියාපදිංචි කිරීම" යනුවෙන්. මේ ගැසට් නිවේදනයේ තිබෙනවා, "2019.08.02වැනි දිනට පෙර ලියාපදිංචි වුණු ඇතැම් ග්‍රාහකයින් පිළිබඳ තොරතුරු

දුරකථන ක්‍රියාකාර සමාගම් සතුව නොමැති අතර, ඒ හේතුවෙන් ඇතැම් නීති විමර්ශන කටයුතුවලදී ගැටලුසහගත තත්ත්වයක් නිර්මාණය වී තිබේ" යනුවෙන්. ඒ කියන්නේ, මෙම තොරතුරු සමාගම්වල නැති බවයි. මම දන්නේ නැහැ හාන්ස් කිව්වාද කියලා, සමාගම්වල තොරතුරු නැහැ කියලා. මොකද, ඔහු එතුමාගේ උපදේශකයා නේ. එසේ නැති නිසා 2019 අගෝස්තු මාසයට කලින් ගත් සිම් කාඩ්පත් නැවත ලියාපදිංචි කරන්න කියලායි මේ කියන්නේ. මොකද, නීති කටයුතු කරගෙන යන්න බැහැ ලු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා, මේ දුරකථන සමාගම් TRCSL එකෙන් licences ගන්නකොට පැහැදිලිවම පනවා තිබෙන කොන්දේසියක් තමයි, දුරකථන සිම් කාඩ්පත් - ඒවා පෙර ගෙවීම් වෙන්න පුළුවන්, පසු ගෙවීම් වෙන්න පුළුවන් - පාරිභෝගිකයින්ට ලබා දෙනකොට ඒ පාරිභෝගිකයින්ගේ අනන්‍යතාව තහවුරු කරගන්නා සියලු විස්තර ලබා දෙන්න කියන එක. ඒ නිසා තමයි අපි, ඔබතුමියලා SIM cards ගන්නකොට National Identity Card එකේ copy එකක් දෙන්නේ; driving licence එකේ copy එකක් දෙන්නේ; නැත්නම් passport එකේ copy එකක් දෙන්නේ. එදා ඉඳලාම ඒක කරනවා. මොකක්ද, මේ ජනාධිපතිතුමා ගෙනැල්ලා තිබෙන ගැසට් එක? කාව බේරන්නද මේ? තමුන්නාන්සේලා දන්නවා, මේ රටේ 2019ට පෙර තමයි ජනාධිපතිතුමා හොයා බලනවා කියලා පොරොන්දු වෙච්ච ඝාතන ටිකක් වුණේ. මොනවාද ඒ ඝාතන? ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධ නඩුව හිරවෙලා තිබෙනවා. ඒ නඩුවේ කටයුතු ඉදිරියට යන්නේ නැහැ. ඇයි ඒ? අර ට්‍රිපෝලි කඳවුරේ ඒ සිම් කාඩ්පත පාවිච්චි කරපු අය තවම හොයා ගන්න බැහැ. ඒ විස්තර දෙන්නේ නැහැ. ඒ නිසා ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුව නැවතිලා තිබෙනවා.

දැන් තාජුඩීන් ඝාතන නඩුවට මොකද වෙලා තිබෙන්නේ? තාජුඩීන්ගේ නඩුව, දුරකථන ඇමතුම්වල විස්තර සම්බන්ධ ගැටලුව නිසා ඇනහිට තිබෙනවා. මොකද, තාජුඩීන්ව ඝාතනය කරපු දවසේ රෑ අරලියගහ මන්දිරයේ සිට නාරාහේන්පිට පොලීසියේ OIC මහත්මයාට දුරකථන ඇමතුම් හැට ගණනක් ගිහින් තිබුණා. ඒක හොයාගන්න විධියක් නැහැ. කවුද, එතකොට ඩයලොග් සමාගමේ CEO විධියට කටයුතු කළේ? හාන්ස් විජේසූරිය. ඔහු අද කොහේද ඉන්නේ? ඔහු අද ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ආර්ථික උපදේශක. ඉතින්, තාජුඩීන්ගේ ඝාතකයින් අල්ලන්න පුළුවන්ද? දැන් ඔයගොල්ලන් කියනවා නේ, ඒ ඝාතනයට වගකියන්න ඕනෑ අය පිළිබඳව; නම් පවා කියනවා නේ. එදා ඒගොල්ලන්ගේ හොඳ යාළුවෙක්, හාන්ස්; හොඳ කල්‍යාණ මිත්‍රයෙක්. ඒ නිසා තමයි හාන්ස් එදා දුරකථන දත්ත ලබා දුන්නේ නැත්තේ. දැන් ඔයගොල්ලන්ගේ යාළුවා වෙලා ඉන්නවා, හාන්ස්. එදා රාජපක්ෂලාගේ යාළුවා, අද ඔයගොල්ලන්ගේ යාළුවා වෙලා ඉන්නවා.

ඒ විතරක් නොවෙයි. තාජුඩීන්ගේ නඩුවේ “B” report එක වෙනස් කරපු, ඒ ඝාතනය accident එකක් කියලා ලියවපු CCD එකේ හිටපු ඒ SP මහත්මයා දැන් කොහේද ඉන්නේ? දැන් ඔයගොල්ලන්ගේ පොලීසිය භාර ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ උපදේශක රණවක. ඔහු තමයි “B” report එක වෙනස් කළේ. ඔහු කිව්වා, ඒක accident එකක් කියලා. ඉතින්, තාජුඩීන්ගේ ඝාතකයින් අල්ලනවාද? අල්ලයි, තාජුඩීන්ගේ ඝාතකයින්ගේ වලිගේ. පොඩ්ඩක් කල්පනා කර බලන්න. ඒවා තමයි දැන් අපට කියන්න තිබෙන්නේ.

ඊළඟට, ප්‍රගීත් එක්නැලිගොඩ නඩුව. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් කල්පනා කර බලන්න. මොකක්ද වෙලා තිබෙන්නේ දැන්? ඒක තමයි දැන් අපට කියන්න වෙලා තිබෙන්නේ. මේවා හොයනවා කියලා පොරොන්දු වෙලා නේ, ආවේ. පොඩ්ඩක් කල්පනා කර බලන්න, මේ ඝාතකයින්ට උදවු කරපු අය ඔක්කෝම දැන් ජනාධිපතිතුමාගේ වටේ ඉන්නේ. දැන් ප්‍රගීත් එක්නැලිගොඩ නඩුවට මොකද වෙලා තිබෙන්නේ? ඒ නඩුවේත් මේක තමයි ප්‍රශ්නය. ඒ නඩුවට අදාළව දුරකථන වාර්තා නැහැ; ඒවා ලබා දෙන්නේ නැහැ. ඊළඟට, සිවරාම් ඝාතන නඩුව. සිවරාම් ඝාතන නඩුවේත් ඕකම තමයි ප්‍රශ්නය. මේ නඩු ගැන තමයි පසුගිය කාලයේම කිව්වේ. ජනාධිපතිතුමා කිව්වේ, ආපු ගමන් මේවාට සම්බන්ධ අය අල්ලනවා කියලා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අපරාධමය නඩු විශාල ප්‍රමාණයක් දුරකථනත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ නඩු අතර දේශපාලන සම්බන්ධකම් තිබෙන ඝාතන නඩු තිබෙනවා. දැන් අපි කියපු නම් ටිකත් එහෙමයි. ඒවා දේශපාලන සම්බන්ධකම් මත සිද්ධ වෙච්ච දේවල්. එතකොට දැන් ඒ සියලුම නඩුවලට මොකද වෙන්නේ? දැන් මේ ගැසට් නිවේදනය තුළින් ඒ නඩුවලට මොකක්ද වෙන්නේ? මේ ගැසට් නිවේදනයෙන් කියන්නේ, 2019ට කලින් ගත්ත සිම් කාඩ්පත් තිබෙන අය ඇවිල්ලා register වෙන්න කියායි. අපරාධ කරපු අය ඇවිල්ලා දැන් නැවත register වෙයිද? ඒ telephones පාවිච්චි කරපු මිනිස්සු ඇවිල්ලා දැන් නැවත ලියාපදිංචි වෙයිද, මෙන්න අල්ලන්න කියලා? මොකක්ද මේ කරන විහිළුව? ඒක වෙන්නේ නැහැ. ඒක වෙන්නේ නැති වුණාම මොකක්ද වෙන්නේ? ඒක වෙන්නේ නැති වුණාම සිදු වන දේ මේකයි. මේ දුරකථන සමාගම්වලට මේ වගකීමෙන් ගැළවෙන්න පුළුවන් අවස්ථාව මේ ගැසට් නිවේදනයෙන් හදා දීලා තිබෙනවා. ඒකයි මම කථාව පටන් ගන්නකොටම ඇහුවේ, හාන්ස්ගේ වුවමනාවට ද ජනාධිපතිතුමා මේ ගැසට් එක ගැහුවේ කියලා. මොකද, දැන් මේ සමාගම්වලට කියන්න බැහැ, ඒගොල්ලන් ළඟ දත්ත නැහැ කියලා. TRCSL එකේ ලියාපදිංචි වෙනකොටම කොන්දේසියක් තිබෙනවා, ග්‍රාහකයන්ගේ, පාරිභෝගිකයන්ගේ අදාළ විස්තර අනිවාර්යයෙන්ම ඒ දුරකථන සමාගම් සතුව තිබෙන්න ඕනෑ කියලා. දුරකථන සමාගම්, "අපේ ළඟ මේ දත්ත නැහැ, අපේ ළඟ මේ විස්තර නැහැ" කියලා අද වනකොට කියනවා නම්, එවැනි දුරකථන සමාගම්වලට විරුද්ධව අපි නඩු දාන්න ඕනෑ. එහෙම නම්, අපි ඒගොල්ලන්ට විරුද්ධව නඩු දාන්න ඕනෑ. එතකොට ඒ දුරකථන සමාගම්වල licence එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ක්‍රියාමාර්ගවලට යන්න නොදී ගැසට් එකක් ගහලා, "ඔයගොල්ලන් ලියාපදිංචි වෙන්න" කියනවා. එහෙම ලියාපදිංචි වෙන්නේ නැත්නම් දැන් දුරකථන සමාගම් ඇවිල්ලා උසාවියට කියයි, "අපේ ළඟ දත්ත නැහැ" කියලා. අපේ ළඟ දත්ත නැහැ කිව්වාම නඩුවලට මොකක්ද වෙන්නේ? නඩු ටික එතැනින් ඉවරයි. ඒක ගැන තමයි මම මේ අහන්නේ. ජනාධිපතිතුමා දැනුවත්ව මේ නඩුවලින් හාන්ස්ලව බේරා ගන්න, මේ දුරකථන සමාගම් බේරා ගන්න, දැනුවත්ව මේ නඩු ටික අයින් කර ගන්න, මේ නඩු කටයුතු ඉදිරියට ගෙනියන්න බැරි වෙන්නද මේ වැඩේ කරන්නේ? බරපතළ වරදක් මේ කරලා තිබෙන්නේ. මේ සමාගම් පසුගිය කාලයේ මේ දත්ත දුන්නේ නැහැ කියලා අපි දන්නවා. හිටපු පාලකයන්ට භයේ හාන්ස්ලා එදා ඒවා හංගාගෙන හිටියා. අපි දන්නවා, මෛත්‍රීපාල සිරිසේනගේ යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ ඩයලොග් සමාගම ගෙන්වලා, විස්තර දුන්නේ නැත්නම් licence එක cancel කරනවාය කිව්ව බව. එහෙම කියලා විස්තර ටිකක් ගත්තා. ඒත් ඔක්කෝම දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියට මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමා මතක තියා ගන්න ඕනෑ, ජනාධිපතිතුමාට මේ ආණ්ඩුව හදන්න එදා සන්ධ්‍යා එක්නැලිගොඩත් සහයෝගය දුන්න බව. අද සන්ධ්‍යා එක්නැලිගොඩ නැවත පොල් ගහන්න පටන් අරගෙන තිබෙනවා. මොකද, කාලි තාත්තාගෙන් වැඩේ වෙන්නේ නැති හින්දා දැන් කාලි අම්මා ළඟට නැවත සන්ධ්‍යා එක්නැලිගොඩ ගිහිල්ලා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තිබෙනවා. ඒ නිසා අද එතුමියන්ලාගේ වේදනාව තේරුම් ගන්න. තමුන්නාන්සේලා මැතිවරණයේදී තාජුඩීන් ගැන කිව්වා; ලසන්ත වික්‍රමතුංග ගැන කිව්වා; ප්‍රගීත් එක්නැලිගොඩ ගැන කිව්වා; සිවරාම් ගැන කථා කළා. ඒ සියලු දේවල් තමුන්නාන්සේලා කිව්වා. කිසිම අපරාධකාරයෙකුට බේරිලා යන්න ඉඩ දෙන්නේ නැහැ කියාත් තමුන්නාන්සේලා එදා කිව්වා. නමුත්, මේ එක එක ගැසට් නිවේදන ගහලා, දූරකථන සමාගම් ආරක්ෂා කරලා, ඒකේ ඉන්න අයිතිකාරයෝ, එහෙම නැත්නම් කොටස්කාරයෝ ආරක්ෂා කරලා මේ නඩු ටික අර ජනාධිපතිතුමා කියන, කාලයේ වැලි තලාවෙන් යටපත් කරන්න කරන උත්සාහය ද මේ කියන ප්‍රශ්නය අපි ජනාධිපතිතුමාට ඉදිරිපත් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.56]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත වාගේම විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත තමයි අද දවසේ විවාදයට භාජන වෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ සාකච්ඡාවට ගැනෙන මේ සංශෝධන දෙකේම අභිප්‍රාය, මූලික අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ මහ මුහුදේ අන්තරායකර ඖෂධ ජාවාරම තහනම් කිරීමයි. ඒක තමයි ප්‍රධාන අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මහ මුහුදේදී අන්තරායකර ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීම තහනම් කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත අද දවසේදී සංශෝධනයට භාජන වෙනවා. ඒ වාගේම තමයි, මහ මුහුදේදී සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන සියලු අපරාධ නඩු හා අධිචෝදනා ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය විසින් විභාග කරනු ලැබීම, නඩු විභාග කරනු ලැබීම හා තීරණය කරනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම පරමාර්ථ කරගෙන අද දවසේ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජන වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපිට අයත් මුහුදු සීමාව කියන්නේ, ලෝක ආර්ථිකය ඇතුළේ ඉතාම කාර්ය බහුලත්වයක් තිබෙන, ලෝකයේ නෞකා මඟින් කරන නාවික බලශක්ති ප්‍රවාහන ජාලයේ සියයට 80ක විතර හුවමාරුවක් සිද්ධ වන කලාපයක් බව අපි දන්නවා. අපි ඉන්දියානු සාගර කලාපය ගත්තොත්, එය ලෝකයේ තෙවන විශාලම සාගර කලාපය බවට පත් වෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් 2024 අවුරුද්දේ නිකුත් කරන ලද වාර්තාවකට අනුව, නැඟෙනහිර ඉන්දියානු සාගර කලාපයේ මත්ද්‍රව්‍ය ජාවාරම ඉතා බහුල වශයෙන් සිදු වෙනවා. ඒ වාගේම එහි හුවමාරු මධ්‍යස්ථානය, කේන්ද්‍රස්ථානය සහ බෙදා හැරීමේ මධ්‍යස්ථාන බවට මාලදිවයින හා ශ්‍රී ලංකාව පත්ව තිබෙනවා. විශේෂයෙන්ම දකුණු වෙරළ තීරය වාගේම උතුරු වෙරළ තීරය අපේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම බහුල වශයෙන් සිදු වන වෙරළ තීර බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දශක ගණනාවක් තිස්සේ ක්‍රමිකව වර්ධනය වුණු, ක්‍රමිකව පෝෂණය වුණු මත්ද්‍රව්‍ය ව්‍යසනය මේ රටේ හැම අස්සක් මුල්ලක් නැරම ස්පර්ශ කරමින්, සමාජයේ හැම තරාතිරමක කණ්ඩායමක්ම ගිල ගනිමින් පැවති අවධියක් තිබුණාය කියන එක අපි දන්නවා. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් 2025දී නිකුත් කරන ලද වාර්තාවට අනුව ලෝක ජනගහනයෙන් මිලියන 316ක් විතර මත්ද්‍රව්‍ය ව්‍යසනයට ගොදුරු වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතයෙන් ආබාධ සහිත වූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය ගත්තොත්, එය 2025 අවුරුද්දේ සියයට 13කින් වර්ධනය වෙලා තිබෙනවා. 2020 අවුරුද්දේ අපේ රට ඇතුළත මත්ද්‍රව්‍ය භාවිතය, මත්ද්‍රව්‍ය ජාවාරම කියන මේ හැම අංශයකින්ම අත්අඩංගුවට පත් වුණු ප්‍රමාණය 97,416ක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2020-2024 කියන අවුරුදු 4 ඇතුළත අපිට අදහා ගත නොහැකි තැනක මේ සංඛ්‍යා දත්ත නතර වෙලා තිබෙනවා. 228,450ක් වාගේ පිරිසක් මේ මත්ද්‍රව්‍ය භාවිතය හා ජාවාරම සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. මේ අත්අඩංගුවට පත්වීම් ගත්තොත්, ඒවා හුදෙක් සංඛ්‍යා දත්ත නොවෙයි. මේ තිබෙන්නේ ජීවිත.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම බන්ධනාගාරගත වන්නන්ගෙන් සියයට 64කට වැඩි ප්‍රමාණයක් මේ විෂ මත්ද්‍රව්‍ය නිසා බන්ධනාගාරගත වුණු අය. වයස් කාණ්ඩ ගත්තොත්, අවුරුදු 18-24 අතර තරුණ පරම්පරාව තමයි මේකේ ප්‍රධාන ගොදුරක් බවට පත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම දරුවන්ට දෙමව්පියෝ අහිමි වුණු, දෙමව්පියන්ට දරුවෝ අහිමි වුණු සමස්ත සමාජය ඉතාම ඛේදනීය තැනක නතර කරපු ඛේදවාචකයක් බවට අද වනකොට මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය පත් වෙලා තිබෙනවා.

මත්ද්‍රව්‍ය නිසාවෙන් අත්අඩංගුවට පත් වුණු අවුරුදු 30ට වැඩි පුද්ගලයන් ප්‍රමාණය අපි ගනිමු. ඒ අනුව, හෙරොයින් සම්බන්ධයෙන් 13,621කුත්, ගංජා භාවිතය සම්බන්ධයෙන් 20,076කුත්, අයිස් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් 11,494කුත් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය ඛේදනීයයි.

මේ තත්ත්වය තුළ අත්අඩංගුවට පත් වෙන්නේ, එක්කෝ අධ්‍යාපනයක් ලබා හෙට දවසේ අපේ රටේ අනාගතය තීරණය කරන දරුවෙක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ගෙවල් ඇතුළේ කුටුම්භයක් ලෙස ලස්සනට ජීවත් වීමේ පරමාර්ථයෙන් ඉන්න ආදරණීය දරුවන් වෙන්න පුළුවන්. මේ තුළ පීඩාවට ලක් වෙන්නේ එවැනි අය. මේ මත්ද්‍රව්‍ය භාවිතයේදී තරාතිරමක් නැහැ, වයස් භේදයක් නැහැ, ස්ත්‍රී පුරුෂභාවයක් නැහැ, සමාජයේ හැම කණ්ඩායමක්ම එහි ගොදුරක් බවට පත්වෙලා තිබෙනවා. ඒකට හොඳම උදාහරණයක් කියන්නම්. ස්ත්‍රීන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම -ලොල්වීම- ගත්තොත්, 2020 අවුරුද්දේ ගංජා භාවිතය නිසා කාන්තාවන් 326ක් අත්අඩංගුවට පත්වෙලා තිබෙනවා. 2024 අවුරුද්ද වන විට ඒක දෙගුණ වෙලා 621ක ප්‍රමාණයක් අත්අඩංගුවට පත්වෙලා තිබෙනවා. හෙරොයින් භාවිතය නිසා 260දෙනෙක් 2020 අවුරුද්දේ අත්අඩංගුවට පත්වෙලා තිබෙනවා. 2024 අවුරුද්දේ 530ක් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ දත්ත ඉතාම ඛේදනීය තැනක තිබුණා. පැවැති පාලන අධිකාරිය, විශේෂයෙන්ම රටේ

මහජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිත කරන ආයතන ඒවා සමඟ දැවැන්ත විධියට සබඳතා ගොඩ නඟමින් ඒවා පෝෂණය කිරීම වෙනුවෙන් කටයුතු කිරීම නිසා මේ ව්‍යසනය රට තුළ තව තවත් පැලපදියම් වීම අපට දක්නට ලැබුණා.

විශේෂයෙන්ම අම්මා කෙනෙකු බලාපොරොත්තු වෙන්නේ තමන් ජීවිතය දුන්න දරුවාගේ ජීවිතය කවදා හරි දවසක ලස්සන තැනක බැබළෙනවා දකින්නයි. තමන්ට අත්පත් කරගන්න බැරි වෙච්ච ජීවිතය කවදා හරි දරුවන්ගේ ජීවිත තුළින් දකින එක තමයි අම්මා කෙනෙකුගේ බලාපොරොත්තුව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කැමැතියි මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය ඇතුළේ පීඩා විඳින මගේ ප්‍රදේශයේ අම්මා කෙනෙකුගේ අත්දැකීමක් ඔබත් එක්ක හුවමාරු කරගන්න. ආදරණීය අම්මා කෙනෙක් මගෙන් ඉල්ලීමක් කළා, පවුලේ එකම දරුවා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙන නිසා සිරගත කරලා හරි ඒ දරුවා බේරා දෙන්න කියලා. ඒ, අම්මා කෙනෙකු හෘදය සාක්ෂියට එකඟව කරන ඉල්ලීමක් නොවෙයි. මේ තත්ත්වය බරපතළයි.

අපි ආණ්ඩුවක් විධියට මේක දැක්කා. අපි දැක්කා, ඒ වේදනාවේ තරම. අපි දැක්කා, ඒ සුසුම්වල උණුසුම. අපි දැක්කා, ඒ කඳුළුවල වේදනාව. ඒ නිසා තමයි ගෙදරින්, ගමෙන්, නගරයෙන්, සමාජයෙන් හා රටින් මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය තුරන් කිරීම වෙනුවෙන් "රටම එකට" ජාතික මෙහෙයුම "ඉවත් වෙනු" කියන තේමාව පදනම් කරගෙන අපි මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් ඉන්නේ. විපක්ෂය කියන විධියට අපට මේකෙන් සියයට සියයක ප්‍රතිඵලයක් අත්පත් කරගන්න බැරි වෙන්න ඇති. හැබැයි, ඉතාම සාධනීය අඩිතාලමක් අපි දමා තිබෙනවා. අපි යන ගමන පැහැදිලියි. 2025 ඔක්තෝබර් 30වැනි දා "ඉවත් වෙනු" ජාතික ව්‍යාපාරය ආරම්භ කර මාස තුනක් වාගේ ඉතාම කෙටි කාලයක් ඇතුළත අපි අත්පත් කරගත්ත ප්‍රගතියෙන් ඒක සනාථ වෙනවා. විශේෂයෙන්ම හෙරොයින් කිලෝග්‍රෑම් 300කට වැඩි ප්‍රමාණයක්, අයිස් කිලෝග්‍රෑම් 1,280කට වැඩි ප්‍රමාණයක්, කොකේන් කිලෝග්‍රෑම් 6කට වැඩි ප්‍රමාණයක්, ගංජා කිලෝග්‍රෑම් 2,341කට වැඩි ප්‍රමාණයක්, හෂීස් කිලෝග්‍රෑම් 44කට වැඩි ප්‍රමාණයක් සහ මහා පරිමාණ වශයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම් කරන පුද්ගලයන් අද වෙනකොට අත්අඩංගුවට ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි ජාත්‍යන්තර පොලීසියේ සහාය ඇතිව ඉන්දුනීසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, නේපාලය වාගේ රටවල ඉන්න පාතාලයට සහ මත්ද්‍රව්‍ය ජාලයට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඉතාම සාධනීය තැනකට ගමන් කරමින්, බලාපොරොත්තු සහගතව මේ රටේ දරුවන්ට, පුරවැසියන්ට හෙට දවසේ ජීවත් වෙන්න ඉඩක්, වටපිටාවක් හැදෙනවා කියන එකට හොඳ සහතිකයක් මේකෙන් ගන්න පුළුවන්. ඒ එක්කම, පුනරුත්ථාපනය වෙමින් පවතිනවා 1,449ක වාගේ ප්‍රමාණයක්. එහෙම ජාතික මට්ටමේ වැඩ පිළිවෙළක් හදලා ඒක ක්‍රියාත්මක කරමින්, ඒකට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කරගනිමින්, අද මේ අණපනත් සම්මත කරගනිමින් මත්ද්‍රව්‍ය ව්‍යසනය මේ රටින් තුරන් කිරීම වෙනුවෙන් යන මේ සාධනීය ගමන තුළින් හෙට දවසේ මෙහි අවසානයක් දකින්න අපි හැමෝම බලාපොරොත්තු වෙනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම පළමුවෙන්ම කාරණයක් කියන්න කැමැතියි. විපක්ෂයේ අය කථා කළා, SIM card re-registration සම්බන්ධයෙන් අලුතින් ගෙනෙන රෙගුලාසිය ගැන. ඇත්තටම, ඒක අපි ගේන්නේ 2019දී හදපු රෙගුලාසියෙහි තිබෙන අඩුපාඩු මඟහැර ගෙන SIM card registration කියන එක හරියට ක්‍රියාත්මක කරන්නයි. මොකද, අද වෙනකොට එක් එක් පුද්ගලයන්ට දීපු සිම් කාඩ් 897,802ක් තිබෙනවා. හැබැයි, ඒ පුද්ගලයන්ගේ අනන්‍යතාව හරියාකාරව ඒ පද්ධතිවල නැහැ. ඒ වාගේම corporate accounts දීලා තිබෙනවා. සිම් කාඩ් දීලා තිබෙනවා, 245,811ක්. ඒවායේත් අනන්‍යතාව නැහැ. මේවා පාවිච්චි කරනවා මේ රටේ කෙරෙන දැවැන්ත මංකොල්ලකෑම්, අපරාධවලට. ඒ වැරදි වැඩවලට සම්බන්ධ වන පුද්ගලයන් අල්ලා ගන්න පොලීසියට මේ කියන දත්ත අත්‍යවශ්‍ය වෙනවා. එය අත්‍යවශ්‍ය සාධකයක්. මේ වාගේ දත්ත නැති සිම් කාඩ් පාවිච්චි කරලා තමයි ගොඩක් කට්ටිය මංකොල්ලකෑම් වාගේ දේවල් කරන්නේ. ඒක හින්දා මේ SIM card re-registration අත්‍යවශ්‍යයි. ඒ තොරතුරු අපේ ඒ ඒ ටෙලිකොම් සේවා සපයන ආයතනවල තිබීමත් අත්‍යවශ්‍යයි. ඒක බලාත්මක කරන්න තමයි මේ කියන රෙගුලාසිය ගේන්නේ. මේ රෙගුලාසිය ගෙන ඒම හරහා අපි බලාපොරොත්තු වෙනවා, මාස දෙකක් වාගේ කාලයක් ඇතුළත තොරතුරු නැති සිම් කාඩ් තිබෙනවා නම්, ඒවා ලබා ගත් පුද්ගලයන් ඇවිල්ලා ඒවායේ අයිතිය, ඒ සිම් කාඩ් එකට අදාළ තොරතුරු ඒ ඒ ආයතනයට ලබා දීම අනිවාර්ය කරන්න. ඒ අනුව ඉදිරි කාලයේදී පොලීසියට අවශ්‍ය නම් මොකක් හරි සිම් කාඩ් එකක තොරතුරු ලබා ගන්න, ඒ නිවැරදි තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. එහෙම නැති වුණොත් අපට අනිවාර්යයෙන් සිද්ධ වෙනවා මේ සිම් කාඩ් අක්‍රිය කරන්න. එහෙම නැතුව දැන් මේ සමාජයට සැඟෙන පිළිලයක් වෙලා තිබෙන අපරාධ රැල්ල මැඩ පවත්වන්න විධියක් නැහැ.

මේ සිම් කාඩ් හරියට register කරන්නේ නැතුව, මේ අපරාධවලට තියෙන අවකාශය නැති කරන්නේ නැතුව ඒ අපරාධ වළක්වන්න විධියක් නැහැ. ඒකට ගන්නා පියවරක් විධියට තමයි මේ SIM card re-registration කියන වැඩ පිළිවෙළ ගේන්නේ. ඒ පිළිබඳව විපක්ෂය වැරදි විධියට සමාජ මත හදන්න හැදුවාට, වැරදි විධියට ඒවා එළි දක්වන්න හැදුවාට, මම හිතන විධියට කිසිම කෙනෙක් ඒ ගැන බිය විය යුතු නැහැ. අපි දන්නවා, සිම් කාඩ් හරි විධියට අරගෙන තමයි ගොඩක් දෙනෙක් ඒවා පාවිච්චි කරන්නේ කියන එක. ඒවා ආපසු register කරන්න අවශ්‍ය වෙන්නේ හරියට ඒ දත්ත ලබා දීලා නැතුව ඒ සිම් කාඩ් register කරලා තිබෙනවා නම් විතරයි. ඒ වෙනුවෙන් අපි හරි වැඩ පිළිවෙළක් ගෙනැල්ලා ඒක ක්‍රියාත්මක කරන එක තමයි මේ කියන රෙගුලාසියෙන් සිද්ධ වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.08]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். முதலாவதாக, தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை சம்பந்தமாக நான் அரசாங்கத்திடம் சில குறைபாடுகளை முன்வைக்க எண்ணுகிறேன். குறிப்பாக, இங்கே இருக்கின்ற ஆளும் கட்சிக்கு ஒரு விஷயம் தெரிந்தாக வேண்டும்; அதேமாதிரி எங்களுடைய வாக்காளர்களுக்கும் புரிந்தாக வேண்டும். நாங்கள் தோட்டத் தொழிலாளர்களின் சம்பள அதிகரிப்புக்கு எதிரான நபர்கள் கிடையாது. ஆனால், மக்களுக்கு நியாயமான முறையிலே சம்பளம் போய்ச் சேரவேண்டும் என்பதுதான் தொழிற்சங்க ரீதியாக எங்களுடைய நோக்கம். அதன் அடிப்படையிலேதான் நாங்கள் வரவு செலவுத்திட்டத்திற்கு ஆதரவாக வாக்களித்தோம். வரவு செலவுத்திட்டத்தில் அரசாங்கத்தின் சார்பாக 5 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, மக்களுக்கு 1,750 ரூபாய் நாட் சம்பளம் வழங்குவதாக சொல்லப்பட்டது.

கடந்த 10ஆம் திகதியில் இருந்து பல்வேறு இடங்களில் இந்த 1,750 ரூபாய் நாட் சம்பளம் கிடைத்திருக்கிறது, நான் இல்லை என்று சொல்லவில்லை! அதேநேரத்தில், இது தொடர்பாக ஓர் ஒப்பந்தம் செய்யப்பட்டு, அதில் சம்பந்தப்பட்டவர்கள் கையெழுத்துப் போட்டிருக்கிறார்கள். அந்த ஒப்பந்தத்தில் இருக்கிற சரத்துக்கள் என்னவென்று நாங்கள் தொழிற்சங்க ரீதியாக ஆரம்பத்திலிருந்து கேட்டுக் கொண்டிருக்கிறோம். சம்பளத்தை வழங்கியிருக்கின்றீர்கள், சரி! ஆனால், தொழிலாளர்களுடைய பாதுகாப்புக் கவசத்தைக் கழற்றிவிட்டுச் சம்பளத்தை வழங்குவது மிகப் பெரிய ஒரு தவறு என்று நான் சொல்கின்றேன். சம்பளத்தை வழங்குகின்ற அடிப்படையில் இந்த ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டு இருக்கிறது. பெருந்தோட்ட நிறுவனங்களும் அதேமாதிரி பெருந்தோட்ட அமைச்சின் செயலாளரும் தொழில் அமைச்சின் செயலாளரும் இதற்கு ஆதாரமாகக் கையெழுத்துப் போட்டிருக்கின்றார்கள்.

இப்பொழுது பல்வேறு ஊடகவியலாளர்கள் இந்தச் சம்பளப் பிரச்சினை சம்பந்தமாகக் கைச்சாத்திடப்பட்டிருக்கின்ற ஒப்பந்தத்தைக் கேட்டிருக்கின்றார்கள். ஆனால், இன்றைக்கு வரைக்கும் அந்த ஒப்பந்தம் அவர்களுக்கு வழங்கப்பட்டவில்லை. தொழிற்சங்கங்கள் NLAC மூலமாகவும் சரி, பல்வேறு துறைகள் மூலமாகவும் சரி, இந்தச் சம்பளம் சம்பந்தமான ஒப்பந்தத்தை வெளிப்படுத்துமாறு அரசாங்கத்திடம் நாங்கள் பல்வேறு முறைகளில் கோரிக்கை விடுத்திருக்கின்றோம்; எங்களுக்கும் இதுவரை அந்த ஒப்பந்தம் கிடைக்கவில்லை. அதுமட்டுமல்லாமல், சிவில் அமைப்புக்களும் இதைக் கேட்டிருக்கின்றன; அவற்றுக்கும் இது வழங்கப்படவில்லை. இறுதியாக, நாட்டின் சட்டத்தின் அடிப்படையில் right to information மூலமாக இந்த ஒப்பந்தத்தை வெளிப்படுத்துமாறு கேட்டோம்; அதன் மூலமாகவும் எங்களுக்கு இந்த ஒப்பந்தம் வழங்கப்படவில்லை. எங்களிடம் இருக்கின்ற ஆவணத்தைத்தான் நாங்கள் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்க முடியுமே தவிர, இது தமது அரசாங்கத்தால் கையெழுத்துப் போட்ட ஒப்பந்தமா, இல்லையா என்பதை அரசாங்கம்தான் சொல்லியாக வேண்டும்.

இந்த ஒப்பந்தத்தைப் பொறுத்தவரைக்கும் இது முறையான ஓர் ஒப்பந்தமே கிடையாது! இது ஒரு புரிந்துணர்வு உடன்படிக்கை - Memorandum of Understanding - மாத்திரமே! இந்தப் புரிந்துணர்வு உடன்படிக்கையில் சில பிரச்சினைகள் இருக்கின்றன. இந்த உடன்படிக்கையை நான் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கிறேன். கௌரவ அமைச்சர் அவர்களே, நான் பேசி முடித்த பிறகு இது சம்பந்தமாக ஒரு பதிலை உங்களிடமிருந்து எதிர்பார்க்கிறேன். இந்த Memorandum of Understandingஇன் சரத்து 4.1இல் ஒரு விடயம் குறிப்பிடப்பட்டு இருக்கின்றது. அதாவது, ஒரு தொழிலாளி 180 நாட்கள் வேலை செய்தால் மட்டுமே சட்ட ரீதியாக service gratuity வழங்கப்படும் என்று குறிப்பிடப்பட்டு இருக்கின்றது. கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்கள் அமைச்சராவதற்கு முன்னர், தொழிற்சங்க ரீதியாக ஒன்றிணைந்து சம்பள நிர்ணய சபையில் பல்வேறு தடவை நாம் அனைவரும் தொழிலாளர்களுக்குச் சார்பாகப் பேசியிருந்தோம். கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்களிடம்கூட இது சம்பந்தமாக ஆலோசனையைப் பெற்றுக்கொள்ளலாம். இந்த 180 நாட்கள் வேலை செய்யவேண்டுமென்ற விடயத்தை நாங்கள் தொடர்ச்சியாக எதிர்த்திருக்கிறோம், இன்றைக்கு நேற்றல்ல! நான் இரண்டு முறை சம்பள உயர்வை வழங்கியிருக்கின்றேன். ஒன்று, 250 ரூபாய் சம்பள உயர்வு; இரண்டாவது, 350 ரூபாய் சம்பள உயர்வு. இந்த இரண்டு தருணங்களிலும் எங்களிடம் பெருந்தோட்ட நிறுவனங்கள் முன்வைத்த கோரிக்கை, service gratuityக்கு 180 நாட்கள் வேலை செய்ய வேண்டும் என்பதாகும். இந்த உடன்படிக்கையில் இந்த விடயம் இடம்பெற்றிருக்கின்றது. அந்த உடன்படிக்கையின் சரத்து 4.1ஐ நான் சபையில் ***சமர்ப்பிக்கிறேன்.**

தயவுசெய்து, இந்த நிபந்தனைக்கு இணக்கம் தெரிவிக்கக்கூடாதென்று நான் அரசாங்கத்திடம் ஒரு தாழ்மையான வேண்டுகோளை விடுக்கிறேன். அப்படி இணக்கம் தெரிவித்தால், அது தொழிலாளர்களுக்குப் பாரிய பின்னடைவாக மாறும். நான் இதை அரசியல் ரீதியாக அல்லாமல் தொழிற்சங்க ரீதியாக முன்வைக்கிறேன். ஏன் நான் தொழிற்சங்க ரீதியாக முன்வைக்கிறேன் என்றால், இன்றைக்கு இருக்கின்ற சூழ்நிலையில், ஒரு தொழிலாளி அந்தந்தத் தோட்டத்தின் முகாமையாளர்மூலம் 25 நாட்கள் வேலையைப் பெற்றுக்கொள்வது கஷ்டம்; அது சுலபம் கிடையாது. அதுமட்டுமன்றி, சில பெருந்தோட்ட நிறுவனங்கள் 180 நாட்கள் வேலை செய்ய வேண்டிய தொழிலாளர்களைத் தான்தோன்றித்தனமாக திட்டமிட்டு 175 நாட்களில் நிறுத்திவிட்டு, மீண்டும் முதலில் இருந்து ஆரம்பிக்கிறார்கள். இலங்கைத் தொழில் சட்டத்தின் பிரகாரம், 180 நாட்கள் தொடர்ச்சியாக வேலை செய்தால், அந்தத் தொழிலாளர்களைப் பதிவுசெய்ய வேண்டும் - registration செய்ய வேண்டும். ஆனால், இன்றைக்கு பெருந்தோட்ட நிறுவனங்களுக்கு அவ்வாறு register பண்ண, பதிவு செய்ய இஷ்டமில்லை. ஏனென்றால், பதிவு செய்தால் எதிர்காலத்தில் பெருந்தோட்ட நிறுவனங்கள் அவர்களுக்குரிய EPF, ETF, service gratuity, பிரசவக் கொடுப்பனவு, மரணக் கொடுப்பனவு எல்லாவற்றையும் அடிப்படைச் சம்பளத்திற்கு ஏற்ப அதிகரிக்க வேண்டும்.

பெருந்தோட்ட நிறுவனங்களில் உள்ள பல முகாமையாளர்கள் என்ன செய்கின்றார்கள் என்றால், தொழிலாளி

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ஒருவர் 180 நாட்கள் தொழில் செய்யக் கூடாது என்பதற்காக தான்தோன்றித்தனமாக வேண்டுமென்றே நாட்களைக் குறைக்கின்றார்கள். அப்படி இருக்கும்பொழுது, நாங்கள் இந்த ஒப்பந்தத்தில் 180 நாட்கள் வேலை செய்தால்தான் service gratuity கிடைக்கும் என்று சொன்னால், எந்தத் தொழிலாளருக்கும் அது கிடைக்காது. இவ்வளவு காலமும் அவர்களுக்குக் கிடைத்த தொகை கிடைக்காமற் போகும். இந்த 200 ரூபாய்க்காக அதனை ஏற்க முடியாது; இந்த 200 ரூபாய் அதற்கு ஈடாகாது. அது ஒரு முக்கியமான விஷயம்.

அதுமட்டுமல்லாமல், நேற்றைய தினம் கௌரவ ஹர்ஷ த சில்வா அவர்களின் தலைமையில் நடைபெற்ற Committee on Public Finance கலந்துரையாடலின்போது, சம்பளம் சம்பந்தமாக அதிகாரிகளிடம் கேள்வி கேட்டபொழுது, அதிகாரிகள் முன்வைத்த முக்கியமான ஒரு விடயம் என்னவென்றால், இது பெருந்தோட்டத் துறையைச் சார்ந்த தொழிலாளர்களுக்கு மட்டும்தான்; அதாவது, 78,000 தொழிலாளர்களுக்கு மட்டுமே இந்த சம்பளம் கிடைக்குமே தவிர, private estatesஇல் வேலை செய்யும் தொழிலாளர்கள், இல்லாவிட்டால் கைக்காசுக்கு வேலை செய்யும் தொழிலாளர்கள் அல்லது சிறுதோட்ட உரிமையாளர்களின் தோட்டங்களில் வேலை செய்யும் தொழிலாளர்களுக்கு இந்த சம்பளம் கிடைப்பது கேள்விக்குறி என்பது. இப்பொழுது, தனியார் நிறுவனத்தில் கைக்காசுக்கு வேலை செய்யும் அனைவரும் அது சம்பந்தமாகக் கேள்வி கேட்டால், தோட்ட முகாமையாளர் சொல்கிற பதில், “நீங்கள் பெருந்தோட்ட அமைச்சிடம் பேசிக் கொள்ளுங்கள்!" என்பதாக இருக்கிறது. அவ்வாறு இருக்கும்பொழுது, இன்றைக்கு தொழிலாளர்கள் வர்க்கத்தைப் பொறுத்தவரைக்கும் அனைவருக்கும் சம்பள உயர்வைப் பெற்றுக் கொடுக்க வேண்டுமே தவிர, பதிவு செய்யப்பட்ட தொழிலாளர்களுக்கு மட்டும் அதனைப் பெற்றுக்கொடுப்பது என்பது தவறான விஷயம் என்பதைத்தான் நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இது சம்பந்தமாக அரசாங்கம் கட்டாயம் நடவடிக்கை எடுக்க வேண்டும். இந்த விஷயத்தைப் பொறுத்தவரைக்கும், கட்டாயமாக இது சம்பந்தமாகத் தெளிவுபடுத்தியாக வேண்டும்.

இதே புரிந்துணர்வு உடன்படிக்கையில் 8ஆம் சரத்தில், இந்த ஆவணத்துக்குச் சட்ட ரீதியாக எந்தப் பலமும் கிடையாதெனத் தெளிவாக எழுதப்பட்டுள்ளது. அப்படி இருக்கும்பொழுது, இரண்டு தரப்பினருமே இது சம்பந்தமாகச் சட்டத்துக்கு முன்னால் வரமுடியாது. இதில் உள்ள எல்லா விஷயத்தையும் செய்ய வேண்டுமென்ற எந்தவிதமான legal obligationம் கிடையாது. ஒரு மாதம் அல்லது இரண்டு மாதம் அல்லது ஆறு மாதம் கொடுத்த பின்னர் நிறுத்திவிட்டால், நாளைக்குப் பிரச்சினை வரும். கிலோ கணக்கைக் கூட்டினால், பதிவு செய்யப்பட வேண்டிய தொழிலாளர்களைப் பதிவு செய்யாமல் அப்படியே அலைகழித்துக் கொண்டிருந்தால், எங்களால் Labour Tribunalக்குப் போக முடியாது. அந்த வகையில், இந்த ஒப்பந்தத்தின் ஊடாகத் தொழிலாளர்கள் சார்ந்த தொழில் உரிமைகளைப் பறித்திருக்கிறார்கள். இதனை அரசாங்கம் பறித்ததென்று நான் சொல்ல விரும்பவில்லை. ஆனால், பெருந்தோட்ட நிறுவனங்கள் இந்த விஷயத்தில் நன்றாக அரசியல் விளையாடி இருக்கிறார்கள். ஒரு வகையில் சம்பளத்தைக் கொடுக்கிற மாதிரிக் கொடுத்துவிட்டு, இன்னொரு வகையில் பல்வேறு பிரச்சினைகளை உருவாக்கி யிருக்கிறார்கள். இது சம்பந்தமாகத் தொழில் அமைச்சு கட்டாயம் பொறுப்பெடுத்தாக வேண்டும்.

அதுமட்டுமல்லாமல், நான் இந்த இடத்தில் ஒரு விஷயத்தை சொல்ல விரும்புகிறேன்; கௌரவ அமைச்சர் அவர்களுக்கும் அது நன்றாகத் தெரியும். இங்கே இருக்கின்ற சில உறுப்பினர்கள் - நான் பெயர் சொல்ல விரும்பவில்லை - அவர்கள் ஏற்கனவே தொழிற்சங்கத்தில் இருக்கும்பொழுது,

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
*ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Madam, please give me a few seconds.

நாங்கள் 1,700 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்க வேண்டுமென்று சம்பள நிர்ணய சபைக்குப் போனபொழுது, 1,700 ரூபாய் அடிப்படைச் சம்பளத்துக்கு எதிராக வாக்களித்து 1,550 ரூபாய் அடிப்படைச் சம்பளத்தை வழங்கியிருந்தார்கள். அன்றைக்கு 1,700 ரூபாய் சம்பளத்தை வழங்கியிருந்தால், இப்பொழுது பிரச்சினை வந்திருக்காது. அதேநேரத்தில், அரசியல் செய்வதற்காக தொழிற்சங்கத்தையும் அரசியலையும் ஒன்றாகக் குழப்பிப் பிரச்சினைகளைப் பெரிதாக்கிக் கொண்டு இருக்க முடியாது.

இறுதியாக, இந்த சபையில் நான் சொல்ல விரும்புகின்ற ஒரேயொரு விஷயம், மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு, 1,700 ரூபாய் அதிகரிக்க வேண்டுமென்ற என்னுடைய கோரிக்கையை நிறைவேற்றியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அவருக்கும் ஆளும் கட்சித் தரப்பினரிடம் இருந்து 1008 பிரச்சினை இருந்திருக்கும்! 2,138 ரூபாய் அடிப்படைச் சம்பளம் என்று சொல்லியிருந்தீர்கள். அதன் பின்னர் 1,750 ரூபாய் அடிப்படைச் சம்பளமாக மாறியிருந்தது. தயவுசெய்து, இந்தப் பிரச்சினைகளை நீங்கள் கண்காணிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.17]

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දිනයේ සංශෝධනය වනවා විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනත සහ අධිකරණ සංවිධාන පනත. එම සංශෝධන පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් වන විවාදයට එකතු වීමට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා මේ ගැන වචනයක් හෝ කියයි කියලා මම බලාපොරොත්තු වුණා. නමුත් එහෙම වුණේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව විපක්ෂයේ ස්ථාවරය ගැන දැනුවත් කරමින්, මුලින්ම කථා කළ මන්ත්‍රීතුමාගේ ස්ථාවරය පිළිබඳවත් මේ ගරු සභාවේ අවධානය යොමු කරවමින්, මගේ කථාව ආරම්භ කරන්නම්. ඒ අනුව බැලුවාම, විපක්ෂයේ ස්ථාවරය වුණේ, "මේ සංශෝධන

[ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා]

සිද්ධ වෙන්න ඕනෑ. මේ සංශෝධන හොඳයි. ඒ නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත්වලට එකඟයි" කියන එකයි. ඒ නිසා මේ සංශෝධන හොඳද, නරකද කියන එක ගැන ආයෙත් සාකච්ඡා කරන්න වුවමනා නැහැ. මේ සංශෝධන හොඳයි කියා පිළිගන්නා ගමන්ම අපට අහන්න වෙනවා, මෙහෙම හොඳ සංශෝධනයක් මෙච්චර කාලයක් නොවුණේ මොකද කියලා. මෙච්චර කාලයක් මෙවැනි සංශෝධන කරන්නේ නැතිව ඉඳලා තිබෙනවා. නමුත්, අපි ඒ සංශෝධන කරලා තිබෙනවා.

මේ සංශෝධන මඟින් සිද්ධ වෙන්නේ මොකක්ද? කාලයක් තිස්සේ අපේ රට විවිධ ජාවාරම්කරුවන් අතේයි තිබුණේ. ඒත් එක්කම බැඳුණු මත්ද්‍රව්‍ය ජාවාරමත් දේශපාලනය සහ අනෙක් සියලු ආයතන එක්ක බද්ධ වෙලා, සම්බන්ධ වෙලා කාලයක් තිස්සේ අපේ රට තිබුණා. ඒ නිසා අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට නිරන්තරයෙන් කියපු කථාව තමයි, උඩින් ඉන්න දේශපාලකයා විතරක් නොවෙයි, ඊට යටින් අපරාධ රාජ්‍යයක් තිබෙනවා, ඒ හා බැඳුණු විවිධ විධියේ මත්ද්‍රව්‍ය ජාවාරම්, වෙනත් විවිධ ජාවාරම්, ආයතන සහ පුද්ගලයන් සිටිනවාය කියන එක. ඒ නිසා තමයි අපි විශේෂයෙන් සඳහන් කළේ, මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ උඩින්ම තිබෙන දේශපාලන සම්බන්ධතා ටික අවසන් කරන්න ඕනෑ කියලා. ඒකට තමයි මේ රටේ මහජනතාව අපට බලය දුන්නේ. අපේ රටේ ඉතිහාසය ගැන සොයා බැලුවාම පැහැදිලි වෙනවා, මත්ද්‍රව්‍ය සම්බන්ධ සැකයක් සහිතව අත්අඩංගුවට ගැනීමට, නැත්නම් පරීක්ෂා කිරීමට පුද්ගලයෙකුගේ ගෙදරට ගියාම, රාජ්‍ය නායකයා එතැනට ගිහින් බඳා වැලඳ ගනිමින් එම පුද්ගලයන් ආරක්ෂා කළ බව. ඒ වාගේම තමයි, මෙය විවිධ පුද්ගලයන්ගේ නිවාසවලින් මත්ද්‍රව්‍ය කන්ටේනර් පිටින් හසු වෙච්ච රටක්. එහෙම තිබුණු රාජ්‍යයක බලය තමයි අපට දුන්නේ. ඒ වාගේම මෙය ජාත්‍යන්තර වශයෙනුත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ තිප්පළක් බවට පරිවර්තනය වෙමින් තිබුණු රටක්. ඒ අනුව මේ රට ඇතුළේ විතරක් නොවෙයි, මේ රටට අයිති මහ මුහුදටත් එහා ගිහින් අත්අඩංගුවට ගැනීම් කරන්න, ඒවා සම්බන්ධයෙන් නඩු පවරන්න, නඩු විභාග කරන්න බලය ලබා ගැනීමට තමයි මේ අධිකරණ සංවිධාන පනත වාගේම විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනතත් සංශෝධනය වන්නේ. ඒ නිසා මේ සංශෝධනවලට විපක්ෂය එකඟ වීම ගැන අපි සතුටු වෙනවා.

ඊට අමතරව, මේ සාකච්ඡාව අතරතුර, "මේ පනත් කෙටුම්පත් හොඳයි. නමුත් මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා" කියලා විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමා විසින් නඩත්තු පනත පිළිබඳ පැහැදිලි කිරීමක් කරනු ලැබුවා. නඩත්තු පනත අනුව යම් තැනැත්තියක විසින් තමන්ගේ දරුවා නඩත්තු කිරීම සඳහා නඩත්තු ඉල්ලීමක් කරන අවස්ථාවක, පිතෘත්වය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා නම් DNA පරීක්ෂාවකට යන්න හැකියාවක් නැහැ, එහෙම වුණොත් ඒ තැනැත්තිය අසරණභාවයට පත් වෙනවා කියලා එතුමා සඳහන් කළා. රටේ මිනිස්සු ඒක අහගෙන ඉඳලා කලබල වෙන්න වුවමනා නැහැ. මොකද, එහෙම ප්‍රශ්නයක් නැහැ. තමන්ට දරුවෙක් ඉන්නවා නම්, ඒ දරුවාගේ පියා ඒ පිතෘත්වය ප්‍රතික්ෂේප කරනවා නම් අධිකරණයට යන්න පුළුවන්. ඒකට කිසිම බාධාවක් නැහැ. අධිකරණයට ගිහින් DNA පරීක්ෂාවක් ඉල්ලන්න පුළුවන්. පියා එයට එකඟ නොවන්නේ නම් ඒකට අදාළව සාක්ෂි ආඥාපනතේ 114 වගන්තියේ විධිවිධාන තිබෙනවා. ඒ අනුව යම් තැනැත්තෙකු තමාගේ පිතෘත්වය පිළිනොගන්නා අතරම, DNA පරීක්ෂාවටත් එකඟ වන්නේ නැත්නම්, ඒ අනුව පූර්ව නිගමනයක් තිබෙනවා තමන්ට අවාසි වන නිසා තමයි ඒ පරීක්ෂාවට යන්නේ නැත්තේ කියලා. ඒ අනුව නඩත්තු ඉල්ලීම් කරගෙන යන්න පුළුවන්. ඒ නිසා හොඳ, දක්ෂ නීතිඥ මහත්මයෙකු හමු වෙන්න. එහෙම කළාම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. නීතිඥවරයෙකු ඒ කාරණය කියපු නිසා තමයි මම මේ පැහැදිලි කිරීම කළේ.

අපේ රටේ මේ පනත් සංශෝධනය වුණාට වැඩක් නැහැ, පොලීසිය අපරාධකරුවන්ට බයයි, ජාවාරම්කරුවන්ට බයයි වාගේ අදහසක්ද ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ පනත් කෙටුම්පත් පිළිබඳ විපක්ෂයේ ස්ථාවරය දක්වපු අවස්ථාවේ. අපි කියන්න ඕනෑ, අපේ රටේ පොලීසිය බය වෙලා හිටපු කාලයක් තිබුණු බව. කාටද බය වෙලා හිටියේ? මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට නොවෙයි, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් එක්ක බැඳිලා හිටපු දේශපාලන අධිකාරියටයි බය වෙලා හිටියේ. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගන්න යද්දී පොලීසියට පීඩනය ආවේ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් නොවෙයි. දේශපාලන අධිකාරියෙන් තමයි පීඩනය ආවේ. ඒ නිසා අපේ රටේ කාලයක් තිස්සේ බයක් තිබුණා තමයි. ඒ බය ගැන තමයි ඒ කියන්න ඇත්තේ කියලා අපි විශ්වාස කරනවා. දැන් ඒ බය අවසන්. අපි දන්නවා, අපේ රටේ කාලයක් තිස්සේ කටයුතු කරන හොඳ නිලධාරින් ඉන්න බව; දක්ෂ නිලධාරින් ඉන්න බව; ගෞරවනීය නිලධාරින් ඉන්න බව. ඔවුන්ට වුවමනාව තිබුණා ඔවුන්ගේ රාජකාරිය කරන්න. ඒ නිසා තමයි ඔවුන් සැකයක් ඇති වුණාම ප්‍රබල දේශපාලකයන්ගේ ගෙවල්වලටත් ගියේ. එහෙම හයියක්, කොන්දක් තිබෙන නිලධාරින් ඉන්න රටක් මේක. හැබැයි, එහෙම ගියාට අවසානයේදී මොකක්ද වුණේ? අවසානයේදී වුණේ, දේශපාලන අධිකාරිය නිසා ඒ කටයුතු වෙනත් පැත්තකට හැරුණු එකයි. ඒ නිසා ඒ කාලයේ දේශපාලන අධිකාරිය ගැන නම් හයක් තිබුණා. හැබැයි දැන් ඒ හය නැහැ. දැන් නිලධාරින්, සාමාන්‍ය ජනතාව වාගේම මේ රට පාලනය කරන පාලකයන්, මේ ආණ්ඩුව ඇතුළු අප ඔක්කෝම ඉන්නේ එක පැත්තක. ඒ නිසා දැන් මේ රටේ ඉන්න නිලධාරින් කොන්ද කෙළින් තියාගෙන වැඩ කරනවා. ඒ අතරතුර එහෙම නොවන සමහර නිලධාරින් ඉන්න පුළුවන්. මොකද, කාලයක් තිස්සේ ගොඩ නැඟුණු ප්‍රශ්නයක් මේක. එක රැයකින් ගොඩ නැඟුණු දූෂිත ව්‍යාපාර නොවෙයි අපේ රටේ තිබෙන්නේ. කාලයක් තිස්සේ දේශපාලන අධිකාරිය, වෙනත් ව්‍යාපාර, ආණ්ඩුවේ ආයතන ආදි සියලු අංශ එක්ක බද්ධ වුණු ව්‍යාපාර තිබිලා තියෙනවා; දූෂිතයින් ඉඳලා තියෙනවා. ඒ ඔක්කෝටම උඩින් තමයි දේශපාලකයන් ඉඳලා තිබෙන්නේ. එතැන ඉඳන් -උඩ ඉඳන්- පහළට ශුද්ධ කරගෙන එද්දී යම් යම් තැන්වල එවැනි පුද්ගලයන් තවමත් ඉන්න පුළුවන්. ඒ හැමෝටම මේ ආණ්ඩුව මේ අවස්ථාවේ පණිවුඩයක් දීලා තිබෙනවා දූෂිතයන්ට, අපරාධකාරයන්ට මේ රටේ ඉඩක් නැහැ කියලා. දැන් මේ රටේ නිලධාරින් සියලුදෙනා එකතු වෙලා මේ රට ගොඩනැඟීම සඳහා වැඩ කරමින් ඉන්නවා.

ජාත්‍යන්තර වශයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම නැවැත්වීම සඳහා, රට ඇතුළේ මත්ද්‍රව්‍ය ජාවාරම නැවැත්වීම සඳහා උත්සාහ ගත්තු පමණින්ම, නීති හැදූ පමණින්ම අපේ රටේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයන් ඒවායින් මිදෙන්නේ නැහැ. මුලදී විපක්ෂයෙන් අදහසක් මතු වුණා මත්ද්‍රව්‍යවලට එරෙහි නීති හැදුවාට වැඩක් නැහැ, හැම තැනම "බඩු" තිබෙනවා කියලා. අපි දන්නවා, කාලයක් තිස්සේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච මිනිස්සු, ජාවාරම් කරන මිනිස්සු වාගේම ඇබ්බැහිය සහ ජාවාරම් කිරීම කියන දෙකටම අයත් මිනිස්සු මේ රටේ ඉන්න බව. අපේ ආණ්ඩුවේ ස්ථාවරය වුණේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයෙකු, ජාවාරම්කරුවෙකු, අපරාධකරුවෙකු ලෙස නොව, ඊට එහා ගිහින් රෝගියෙකු ලෙස දකිමු කියලායි. හැබැයි විපක්ෂය පැත්තෙන් කිව්වේ, කුඩුකාරයන්ට "සික්" එක නැහැ, කුඩුකාරයින්ට දැන් "බඩු තිබෙනවා" වාගේ අදහසක්. අපි එහෙම කියන්නේ නැහැ. ඇබ්බැහිවීමකට ලක් වුණු පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය සොයන්න උත්සාහ කරන බව අපි දන්නවා. හැබැයි අපේ ස්ථාවරය වන්නේ මත්ද්‍රව්‍ය උවදුර නැති කිරීම සඳහා නීති සම්පාදනය කරලා

එතැනින්ම ඒක නවත්වන්න පුළුවන් කියන එක නොවෙයි. ඒ වෙනුවට කාලයක් තිස්සේ නොකළ බොහෝ දේවල් අපි කරමින් ඉන්නවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච කෙනෙක් ස්වේච්ඡාවෙන්ම ඒකෙන් මිදෙන්න වුවමනාවෙන් ඉන්නවා නම් ඔහුට හෝ ඇයට පුළුවන් අප මේ වන විටත් ගොඩනහලා තිබෙන rehabilitation centresවලට - පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට - එකතු වෙන්න. මොකද, අපි විශ්වාස කරනවා ඔවුන් එයින් මුදා ගැනීම සඳහා කළ යුත්තේ නීති හදන එක විතරක්ම නොවෙයි කියලා.

අපේ රටේ ක්‍රීඩාව ගොඩ නැංවීම සඳහා කාලයක් තිස්සේ විශේෂ වැඩසටහනක් තිබිලා නැහැ. ක්‍රීඩාව කියන්නේ තනි ඒකකයක් නොවෙයි. අපි මේ ගරු සභාව ඇතුළේ කථා කරන හැම මාතෘකාවක්ම එකිනෙකට බද්ධ වෙලායි තිබෙන්නේ. මත්ද්‍රව්‍ය නවත්වන්න කටයුතු කරනවා වාගේම තමයි ඊට ප්‍රතිවිරුද්ධව තවත් දේවල් ගොඩක් ගොඩ නඟන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියත් දන්නවා, පසු ගිය කාලය පුරාම අපි ක්‍රීඩාව දියුණු කිරීම සඳහා විශාල උත්සාහයක් ගනිමින් ඉන්නවා කියලා. පසුගිය දවස්වල ගරු ක්‍රීඩා ඇමතිතුමා මැදිහත් වෙලා විශේෂයෙන්ම අනුරාධපුරය දිස්ත්‍රික්කයේ අක්කර 200ක ප්‍රමාණයක ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් ඉදි කිරීම සඳහා කටයුතු කරමින් සිටිනවා අපි දැක්කා. ඒ වාගේම, ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය වීම සඳහා කැමැති ඕනෑම කෙනෙකුට එකතු වීම සඳහා මධ්‍යස්ථාන මිහින්තලේ ප්‍රදේශයේ ගොඩනහලා තිබෙනවා අපි දැක්කා. ඒ වාගේම, සතියකට එක දවසක් විවෘත වන පොළක් ක්‍රීඩාවක් සඳහා යොදා ගන්න අපි කටයුතු යොදමින් තිබෙනවා. මේවා එකිනෙකට බද්ධ වෙලායි තිබෙන්නේ.

එදා ඔක්කෝටම උඩින් තමයි දේශපාලන අධිකාරිය කියන එක තිබුණේ. රටක් විධියට අපේ රට මෙලෝ වශයෙන් අවීචියට ඇද දමලා පරලෝ වශයෙන් සුගතියක් දීම සඳහා තමයි දැන් විපක්ෂය උත්සාහ කරමින් ඉන්නේ. අපේ රට මෙලෝ වශයෙන් ඉතාම පහළට ඇද දමලා, අවීචියට ආසන්න තැනකට ඇද දමලා පරලෝ වශයෙන් සුගතියක් අත් පත් කර දෙන්න උත්සාහ කරන විපක්ෂයේ ජාතිවාදී, ආගම්වාදී විවිධ කල්ලි කණ්ඩායම්වලටත්, මේ රට ගොඩ නැඟීම සඳහා උත්සාහ නොකළ විපක්ෂයේ අනෙක් කණ්ඩායම්වලටත් අපි කියන්නේ මෙයයි. අපි මේ රට හදනවා. නීතියෙන් විතරක් නොවෙයි සදාචාරයෙන්, ආදර්ශයෙන්, ඒ සියල්ලෙන්ම මේ රට හදනවා. විපක්ෂයට අඩුම තරමින් ඒ සඳහා එකඟ වෙන්න බැරි නම් නිහඬව ඉන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.26]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**

(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)

(The Hon. G.G. Ponnambalam)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் நான் நீதி அமைச்சு - Ministry of Justice and National Integration - சம்பந்தமாக ஒருசில கருத்துகளை இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன். முதலாவதாக, சட்ட விரோதமாகத் தையிட்டியிலே கட்டப்பட்ட திஸ்ஸ ரஜமகா விகாரை சம்பந்தமாக நேற்றைய தினம் கொழும்பிலே நடைபெற்ற ஒரு கலந்துரையாடல் பற்றி குறிப்பிட வேண்டும். அந்தக் கலந்துரையாடலில் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சினுடைய உறுப்பினர்களும் வேறு அரசாங்க உத்தியோகத்தர்களும், சட்டவிரோதமாகக் கட்டப்பட்ட திஸ்ஸ ரஜமகா விகாரையின் விகாராதிபதியும் கலந்துகொண்டிருக்கிறார்கள். ஆனால், சட்டவிரோதமான முறையில் பறிக்கப்பட்ட காணிகளின் உரிமையாளர்கள் அழைக்கப்படவில்லை. அப்படியென்றால், இது சம்பந்தமான கலந்துரையாடல் எந்த அடிப்படையில் நீதியான ஒரு முயற்சியாக இருக்கும் என்று நான் கேட்க விரும்புகின்றேன்.

இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்பதாகவே இந்தத் திஸ்ஸ ரஜமகா விகாரை என்பது ஏற்கெனவே புத்தசாசன அமைச்சுக்கோ இல்லாவிட்டால் அரசாங்கத் தினுடைய வேறு எந்த அமைச்சுகளுக்கோ தெரியாமல் இராணுவத்தால் சட்டவிரோதமாகக் கட்டப்பட்டது என்பது எங்களுக்கு நன்றாகத் தெரியும்! அதாவது, எந்தவிதமான அனுமதியும் இல்லாமல் இராணுவத்தால் கட்டப்பட்டது; சவேந்திர சில்வாதான் அதற்குப் பிரதானமான ஒருவராக இருந்தார். இது இராணுவமயப்படுத்தலினுடைய முக்கியமான ஓர் அங்கமாக இருக்கிறது என்பதை நாங்கள் இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்பதாகவே சுட்டிக் காட்டியிருந்தோம். திஸ்ஸ விகாரை கட்டப்பட்ட காணி தனியாருடையவை; அவர்களிடம் அதற்கான தோம்பு உட்பட உறுதிகள் இருப்பதனால் குறித்த காணிகள் அவசரமாக விடுவிக்கப்பட வேண்டுமெனச் சொல்லப்படுகின்ற ஒரு நிலையில், இலங்கையின் அரச புலனாய்வுச் சேவையின் முன்னாள் இயக்குநரும் ஓய்வுபெற்ற பிரதிப் பொலிஸ்மா அதிபரும் தற்போது அகில இலங்கை பௌத்த மகா சம்மேளனத்தின் தலைவராகவும் இருக்கின்ற சந்திர நிமல் வாகிஸ்ட என்பவரால் இது தொடர்பில் யாழ்ப்பாணம் அரசாங்க அதிபரை அச்சுறுத்தும் வகையில் கடிதம் எழுதப்பட்டுள்ளது. இது எந்தளவு தூரத்துக்கு இராணுவ மயப்படுத்தலுடன் சம்பந்தப்பட்ட ஒரு விஷயமாக இருக்கின்றது என்பதை நாங்கள் இங்கு தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும்.

இது அரசாங்கதினுடையது விஷயம் அல்ல; இது deep state. Counter insurgency உடைய மிக மோசமான முகம்; அதனுடைய ஓர் அங்கம்! இதற்கும் பௌத்த மதத்துக்கும் எந்தவிதமான தொடர்பும் இல்லை. சரிதானே! இது முற்றுமுழுதாக இனவாத கோணத்தில், தமிழருக்கு எதிராக இனப்படு கொலையைச் செய்த அதே மனோநிலையிலிருந்துகொண்டு இராணுவம் செய்கின்ற அநியாயம்! இந்த விஷயத்தை இந்த அரசாங்கத்துக்குச் சுட்டிக் காட்டியும்கூட, இந்த அரசாங்கம் பாதிக்கப்பட்ட மக்களை அழைக்காமல், இரகசியமாக கொழும்பில் கூட்டத்தை நடாத்துவது என்பது எந்தவகையில் நியாயம் என்று நான் கேட்கின்றேன். இந்த அமைச்சு National Integrationக்குரிய ஓர் அமைச்சு. எந்த அடிப்படையில் அமைச்சர் அதற்கு அனுமதிக்கலாம் என்று நான் கேட்கின்றேன். தயவுசெய்து இந்த அநியாயத்தைச் செய்யாதீர்கள்! நீங்கள் ஆட்சிக்கு வந்தது தமிழர்களுக்கு எதிரான இனவாதத்தை முடிவுக்கு கொண்டுவருவதற்கு. இந்த திஸ்ஸ விகாரை விஷயத்தில் எந்தவிதமான தயக்கமுமின்றி நீங்கள் துணிந்து முடிவை எடுக்கலாம். நீங்கள் முடிவை எடுக்க வேண்டுமென்றுதான் நாங்கள் கேட்டுக் கொள்கின்றோம். தயவுசெய்து இவ்வாறான மோசமான செயலுக்கு விலைபோகாதீர்கள் என்று நான் வலியுறுத்த விரும்புகின்றேள்.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

இரண்டாவது விடயம், கடந்த 10ஆம் திகதி வட மாகாண ஆளுநருடைய தலைமையில் யாழ்ப்பாணத்தில் மாகாண சுகாதார அமைச்சினுடைய கூட்டம் நடைபெற்றிருக்கிறது. அந்தக் கூட்டத்துக்கு தேசிய மக்கள் சக்தியுடைய பாராளுமன்ற உறுப்பினர் ஸ்ரீ பவானந்தராஜா அவர்கள் அழைக்கப்பட்டுள்ளார். நான் பொறுப்போடு சொல்கின்றேன், கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் கடைசியாக யாழ்ப்பாணத்துக்கு வந்தபோது, மாகாண சபைக்கு நிழல் அமைச்சர்களை நியமித்து, அவர்கள் கூட்டங்களுக்கு அழைக்கப்பட வேண்டுமென்று ஆளுநருக்குக் கட்டளை யிடப்பட்டு இருக்கின்றது. சுகாதாரத்துக்கு கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஸ்ரீ பவானந்தராஜாவும், கல்விக்கு கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஜெகதீஸ்வரனும், மகளிர் மற்றும் சிறுவர் அலுவல்களுக்கு பாராளுமன்ற உறுப்பினர் கௌரவ றஜீவனும், உள்ளூராட்சிக்கு பாராளுமன்ற உறுப்பினர் கௌரவ இளங்குமரனும், கமத்தொழில், கால்நடை வளங்களுக்கு பாராளுமன்ற உறுப்பினர் கௌரவ திலகநாதனும் இவ்வாறு நியமிக்கப்பட்டுள்ளார்கள். இப்போது மாகாண சபைகள் இல்லாத நிலையில் வட மாகாணத்தில் ஒரு கூட்டம் நடைபெற வேண்டுமென்றால், வட மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களையும் அழைத்திருக்க வேண்டுமே! அது எப்படி பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஸ்ரீ பவானந்தராஜா அவர்களை மட்டும் அழைப்பது? இந்த அரசாங்கம் ஒருபுறம் மாகாண சபைத் தேர்தலை நடாத்தாமல் இருக்கிறது; மறுபுறம் எந்தவிதமான ஜனநாயகத்துக்கும் இடமில்லாத வகையில், 'பிரஜா சக்தி' போன்று ஜனநாயகத்துக்கு விரோதமாக தங்களுடைய உறுப்பினர்களை மாகாண சபைக்குள் நுழைக்கின்றது. இது முதுகெலும்பு இல்லாத கேவல மானதொரு செயல்! உலகத்துக்கு ஏதோ தாங்கள் மாகாண சபை முறைமைக்கு எதிர்ப்பு என்பது போன்று, மாகாண சபை முறைமைக்கு எதிராகப் போராடி உயிர்கொடுத்தவர்கள் போன்று காட்டிக்கொள்வது; ஆனால், அந்த மாகாண சபைக்குத் தங்களுடைய உறுப்பினர்களை முகவர்களாக நியமிப்பது. இதுதான் அங்கு நடைபெற்றுள்ளது.

கடைசியாக நான் ஒன்றைச் சொல்வதற்கு விரும்பு கின்றேன். பயங்கரவாத தடுப்புச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்ட நிமலன் என்ற ஒரு தமிழ் அரசியல் கைதி இன்றும் வெலிக்கடைச் சிறைச்சாலையில் தடுத்து வைக்கப் பட்டிருக்கின்றார். அவருக்கு உயிர் அச்சுறுத்தல் இருக்கின்றது; அவருக்குப் பல வழக்குகள் இருக்கின்றன. வழக்கு நடவடிக்கைகளுக்காக அவரை Badulla High Courtக்குக் கொண்டுபோக வேண்டியிருக்கிறது; மாத்தறை நீதிமன்றுக்குப் போக வேண்டியிருக்கிறது. சிறையதிகாரிகளே அவருக்கு உயிர் அச்சுறுத்தல் இருக்கின்றது என்பதை விளங்கிக்கொண்டு, வழக்குகளுக்காக அவரைக் கொழும்பிலிருந்து வெளி மாவட்டங்களுக்கு கொண்டுசெல்லும் ஒவ்வொரு முறையும் உடனடியாகக் கொழும்புக்குத் திருப்பிக் கொண்டுவருவார்கள்; அதுதான் வழக்கமாக கிட்டத்தட்ட 6 வருடங்களுக்கும் மேலாக நடைபெற்றுக் கொண்டிருந்தது. ஆனால், இப்போது புதிய அதிகாரி ஒருவர் நியமிக்கப்பட்டிருக்கின்ற சூழ்நிலையில், அவர் நிமலனை அவ்வாறெல்லாம் கொண்டுபோய் வரமுடியாது, அவருக்கு அந்த முக்கியத்துவம் கொடுக்க முடியாது என்று சொல்லி, கடந்த 6 வருடத்துக்கும் மேலாக நடைபெற்று வந்திருந்த அணுகுமுறையைக் கைவிட்டுவிட்டு, அவருக்கு உயிராபத்து இருக்கத்தக்கதாக வெளி மாவட்டச் சிறைகளில் அவரைத் தடுத்து வைத்திருந்து, கொழும்பில் வழக்கு நடவடிக்கைகள் வரும்போது மட்டும்தான் அவரைக் கொழும்புக்குக் கொண்டுவருகின்றார்கள். தயவுசெய்து இந்த அநியாயத்தைச் செய்யாதீர்கள்!

ஏற்கனவே பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டவர்கள் உண்மையிலே விடுவிக்கப்பட வேண்டும் என்று உங்களுடைய உத்தியோகபூர்வமான நிலைப்பாட்டை நீங்கள் தேர்தலின்போது சொல்லித்தான் தமிழர்களின் வாக்குகளையும் பெற்றீர்கள். ஆகவே, விடுவிக்கப்பட வேண்டிய ஒருவருக்கு உயிராபத்து இருக்கிறது என்று தெரிந்துகொண்டு இப்படி அனுமதிப்பதை நீங்கள் நிறுத்த வேண்டும்; நீங்கள் அதில் தலையிட வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் சபையில் இல்லாதபோதும் தேசிய மக்கள் சக்தியின் பொதுச் செயலாளர் நிஹால் அபேசிங்ஹ அவர்கள் இங்கே இருக்கின்றார். நல்லிணக்க நடவடிக்கைகளிலும் ஈடுபடுகின்றவர் வகையிலே அவரிடம் தயவுடன் கேட்டுக் கொள்வது என்னவென்றால், இப்படியான விஷயங்களில் தலையிட்டுத் தயவுசெய்து இதனை நிறுத்துங்கள் என்றுதான்.

அதுபோல், மொறிஸ் என்ற இன்னொருவர் இருக்கிறார். அவரிடம் சட்டவிரோதமாகக் குற்ற ஒப்புதல் வாக்கு மூலம் பெற்றுக்கொள்ளப்பட்டதைத் தெரிந்துகொண்டு, நீதிமன்றங்கள் அந்தக் குற்ற ஒப்புதல் வாக்குமூலத்தை நிராகரித்து ஒரு வழக்கிலிருந்து அவரை விடுவிக்க, உடனடியாக இன்னுமொரு புதிய வழக்கைத் தாக்கல் செய்கிறார்கள். இது ஓர் அநியாயம்! இவ்வாறு செய்யாதீர்கள்! பயங்கரவாதத் தடுப்புச் சட்டத்திற்கு எதிராக இப்போதைக்கு நீங்கள் செயற்பட இயலாதுவிட்டாலும் ஆகக்குறைந்தது இப்படிப்பட்ட அநியாயங்களையாவது நிறுத்துங்கள் என்று தயவுடன் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අද විවාද කරන්නේ විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමට අදාළ පනත් කෙටුම්පත් දෙකක් පිළිබඳවයි. ඒ තමයි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත. ඇත්තටම මේ සංශෝධන අපට වැදගත් වෙන්නේ මෙන්නමේ නිසා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දමන්නට ප්‍රතිඥාවක් දීලා තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය ඔක්තෝබර් මාසයේ අපි ආණ්ඩුවක් හැටියට විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා "රටම එකට" ජාතික මෙහෙයුම දියත් කළේ. ඒ ජාතික මෙහෙයුම "ඉවත් වෙනු" කියන පණිවුඩය සමඟ ක්‍රියාත්මක කිරීමේදී අපි අරමුණු කිහිපයක් ඒ මෙහෙයුම තුළින් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වුණා. පළමුවැනි එක තමයි, ජාවාරම්කරුවන් සහ බෙදා හරින්නන් නීතියේ රැහැනට හසු කර ගැනීම හා හුදකලා කිරීම. දෙවැනි එක තමයි, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොමු කිරීම. තුන්වැනි එක තමයි ජාතික, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. හතරවැනි එක තමයි, "ඉවත් වෙනු" කියන තේමාව ඔස්සේ පුළුල් ප්‍රචාරණ ක්‍රියාවලියක් මඟින් සමාජ දැනුවත්භාවය සඳහා අවශ්‍ය සංවිධාන යන්ත්‍රණය ශක්තිමත් කිරීම.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පසුගිය ඔක්තෝබර් මාසයේ සිටම එම කාර්යය ශක්තිමත්ව බිම් මට්ටමින් ක්‍රියාත්මක කරමින් සිටින විට තමයි, "දිට්වා" සුළි කුණාටුව ආවේ. ඒ නිසා ඒක ක්‍රියාත්මක කිරීමේ යම් කිසි ප්‍රමාදයක් සිදු වුණා. අපි නැවතත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නවා. ඇත්තටම ඒ සඳහාම තමයි අපි මේ පනත් කෙටුම්පත් දෙක ඉදිරිපත් කර, මේ සංශෝධන සිදු කරන්නේ. විශේෂයෙන්ම ඈත මහ මුහුදේ නෞකාවල - mother shipsවල - ඉඳලා කුඩා නෞකාවලට, කුඩා බෝට්ටුවලට මත්ද්‍රව්‍ය බෙදා හරිමින්, මහ මුහුදේ කරන ඒ ජාවාරම වළක්වා ගන්නට තමයි අපි කටයුතු කරන්නේ. ඇත්තටම ඔබට මතක ඇති, මේ සම්පූර්ණ ක්‍රියාදාමය අපි මැතිවරණ ව්‍යාපාරයේදී ඉදිරිපත් කළ බව. "A drug -free country - A healthier citizen life" ශීර්ෂය යටතේ ක්‍රියාකාරකම් ගණනාවක් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි යෝජනා කළා, මේ වැඩ පිළිවෙළට ඇතුළත් කරන්න. ඒවා පහත පරිදි දක්වන්න පුළුවන්. I quote:

" · Implement an integrated operation to prevent drugs and organized crime in the country
· Establish a separate Bureau for Narcotics Prevention
· Development of naval and air surveillance facilities and provide modern equipment and training to officials to prevent the entry of drugs into the country
· Regularize rehabilitation programmes for drug addicts to free them from drug use
· Strengthen penalties for drug offences and taking measures for the speedy resolution of cases
· Implement continuous programmes to educate school children
· Expand the functions of the Dangerous Drugs Control Board, and establish monitoring committees to involve people in the fight against drugs
· Educate the community about the adverse effects of drug use"

ඇත්තටම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් මේ සියලු කරුණු කාරණා අපි ඉදිරිපත් කළේ, මේ මත්ද්‍රව්‍ය උවදුර අපේ රට වෙළා ගෙන තිබෙන බරපතළ ඛේදවාචකයක් නිසායි. අපි මේ විධියට පනත්වලට සංශෝධන ගෙනෙමින් ක්‍රියාත්මක වෙන්නේ, මේ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දමන්නටයි. ඇත්තටම මේ සංශෝධන තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ, mother shipsවලින් මෑත මුහුදේ කුඩා යාත්‍රාවලට මත්ද්‍රව්‍ය හුවමාරු කරන, මත්ද්‍රව්‍ය ගෙනෙන ඒ ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමයි. ඒ කියන්නේ, මුහුදේ සිදු කරන අන්තරායදායක ඖෂධ ජාවාරම තහනම් කිරීමේ අවශ්‍යතාව නිසා තමයි මේ සංශෝධන ගෙන එන්නේ.

මේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන්නේ, 2025 ජූනි මාසයේ 23වැනි දා. ඉතින් යම් කිසි කාල සීමාවක් ගත වුණා, මේ සංශෝධන ගෙන එන්න. මේ අන්තරායදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීම තහනම් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සඳහා විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට සංශෝධනයක් ගෙන ඒම තමයි මෙතැනදි සිද්ධ වන්නේ. ඒ වාගේම මේ නව සංශෝධනය මඟින් මහ මුහුදේදී අන්තරායදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීමත් තහනම් කරනු ලබනවා. මහ මුහුදේ සිදු කරන වරදක් හෝ සියලු අපරාධ සම්බන්ධයෙන් වන නඩු, අධි චෝදනා ශ්‍රී ලංකා ජන රජයේ මහාධිකරණය විසින් විභාග කර තීරණ ගනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීමත් මේ සංශෝධනයෙන් සිදු වනවා. යම් තැනැත්තෙකු විසින් මහ මුහුදේදී සිදු කරනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා වරදකරුවකු බවට පත් කිරීම මෙතැනදි අපි නීතිගත කරලා තිබෙනවා. විශේෂයෙන්ම උතුරු මුහුදු තීරයේ මන්නාරම, කන්කසන්තුරේ, යාපනය සහ මුලතිව් මුහුදු තීරයෙන් බහුලව කේරළ ගංජා රැගෙන එන බවත්, අඩු වැඩි වශයෙන් අයිස්, හෙරොයින් වැනි විෂ මත්ද්‍රව්‍ය, මත් පෙති වර්ග ගොඩබාන බවත් වාර්තා වනවා. ඒ වාගේම කල්පිටිය සිට මීගමුව දක්වා වූ මුහුදු තීරය ඔස්සේත් විෂ මත්ද්‍රව්‍ය අඩු වැඩි වශයෙන් මෙරටට ප්‍රවාහනය කරන බවත් වාර්තා වනවා. ඒ විධියට සිදු වන අපරාධ මර්දනය කරන්න තමයි මේ සංශෝධන ගෙන එන්නේ. මේ සම්බන්ධයෙන් වන ලෝක දත්තවලට අනුව 2025 වසරේදී මිලියන 316ක් මත්ද්‍රව්‍ය භාවිත කරන බවත්, එය පෙර දශකයට වඩා සියයට 28ක වැඩිවීමක් බවත් වාර්තා වනවා. එවන් විශාල ව්‍යාපාරයක් මර්දනය කරන්නට අදාළ නීති ගෙන ඒම තමයි අවශ්‍ය වන්නේ.

අපේ රටේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වන දත්ත ගත්තොත්, විශේෂයෙන්ම අවුරුදු 14ට වැඩි සහ අවුරුදු 30ට වැඩි කණ්ඩායම් දක්වා මත්ද්‍රව්‍යවලට හුරු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අවුරුදු 30ට වැඩි කණ්ඩායම පසුගිය දශක කිහිපය තුළම මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම නිසා මේ වනකොට බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මහ මුහුදේ කෙරෙන මේ ක්‍රියාකාරකම් වළක්වන එක ඇත්තටම අපට වැදගත් වන්නේ ඇයි? ඉන්දියන් සාගරයේ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම ජාතික ආරක්ෂාවට පමණක් නොවෙයි, අන්තර්ජාතික ආරක්ෂාවටත් තර්ජනයක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව, ඉන්දියාව, මාලදිවයින, සීෂෙල්ස් සහ ඊසානදිග අප්‍රිකානු රටවලට ඉන්දියන් සාගරය හරහා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය වනවා. ඉන්දියන් සාගරයේ පිහිටීම අනුව Golden Crescent කියන ඇෆ්ඝනිස්තානය, ඉරානය සහ පාකිස්තානය වාගේ රටවල් නිපදවන හෙරොයින් ඉන්දියන් සාගරය හරහා ප්‍රවාහනය කරනවා. ඒ වාගේම Golden Triangle කියන මියන්මාරය, තායිලන්තය, ලාඕසය වාගේ රටවලුත් ඉන්දියන් සාගරය හරහා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරනවා. ඒගොල්ලන් තමයි කෘත්‍රිම මත්ද්‍රව්‍ය, අයිස් වැනි මත්ද්‍රව්‍යය නිෂ්පාදනය කරන්නේ. ඒ නිපදවන මත්ද්‍රව්‍ය යුරෝපයට, අප්‍රිකාවට, දකුණු ආසියාවට, ඕස්ට්‍රේලියාවට ඉන්දියන් සාගරය හරහා ප්‍රවාහනය කරනවා. මෙන්න මේ නිසා විශාල මුහුදු ප්‍රදේශයක් වන, දුර්වල ආවේක්ෂණ කලාපයක් වන ඉන්දියන් සාගරයේ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම වළක්වන්න තමයි ඇත්තටම අපට මේ වාගේ සංශෝධන අවශ්‍ය වන්නේ.

පසුගිය කාලයේ වාර්තා වුණා, ශ්‍රී ලංකාව, මාලදිවයින වාගේ රටවල් මත්ද්‍රව්‍ය සඳහා transit hub එකක්, එහෙම නැත්නම් storage point එකක්, එහෙමත් නැත්නම් redistribution centre එකක් හැටියට පාවිච්චි වනවා කියලා. අපට විශාල මුහුදු සීමාවක් තිබෙනවා. ඒ නිසා අපි ඒ අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම අපේ නාවික සහ වෙරළාරක්ෂක හමුදා ඉන්නේ සීමිත ප්‍රමාණයක්. ඒකත් අපට අභියෝගයක්. ඒ වාගේම මත්ද්‍රව්‍ය ගෙන යන යාත්‍රා, අපේ ධීවර යාත්‍රා පලිහක් හැටියටත් පාවිච්චි කරනවා. සමහර වෙලාවට ඔවුන් අපේ ධීවර යාත්‍රා භාවිත කරනවා, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නට. ඒ නිසා අප වාගේ රටවලට මත්ද්‍රව්‍ය පාලනය කිරීම බරපතළ අභියෝගයක්. ඒ නිසාම තමයි මේ සංශෝධන වැදගත් වන්නේ. ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ කල්ලි සමඟ සම්බන්ධකම් පවත්වනවා. ඒ නිසා මුදල් පාවිච්චි කරලා ඔවුන් විවිධ අපරාධ රටවල් තුළ සිද්ධ කරනවා. මෙන්න මේවා පාලනය කරන්නත්, ඈත මුහුදේ සිදු වන ඒ වාගේ ක්‍රියාකාරකම් පාලනය කරන්නත් තමයි මේ වාගේ සංශෝධන අපට අවශ්‍ය වන්නේ.

ඒ වාගේම අන්තර්ජාතික වශයෙන් අපේ රට සම්බන්ධව තිබෙන ප්‍රතිරූපයට නොයෙක් ආකාරයේ හානි සිදු වනවා, මේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට තවදුරටත් අපේ රට තුළ ක්‍රියාත්මක වන්න

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහමහතා]

ඉඩ දුන්නොත්. ජාතික මට්ටමේ සියලුම පාර්ශ්වයන්ගේ මැදිහත්වීමෙන් තමයි අපි මේ ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කරන්නේ. ඒ, මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීමට; ඉල්ලුම අවම කිරීමට; හානිය අවම කිරීමට සහ පාලනය සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒමට. සැපයුම අවම කිරීම සඳහා මේවා රටට ඇතුළු වන ගුවන් තොටුපොළවල්, වරායවල් සහ වෙරළ තීරය ආරක්ෂා කිරීමට අපි පියවර ගන්නවා. මත්ද්‍රව්‍ය පාලනයට අපි පොලිසිය සක්‍රියව මැදිහත් කර ගන්නවා. ඒ කියන්නේ මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වෙලා ඉන්න, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය යම් කිසි සුළු ප්‍රමාණයක් හෝ ළඟ තබාගෙන ඉන්න අය අත්අඩංගුවට අරගෙන සිරගත කිරීම නොවෙයි, ඒ අය පුනරුත්ථාපනය කරලා මේ උවදුරින් ගලවා ගැනීම තමයි මේ වැඩ පිළිවෙළ තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ අයගේ මුදල් ගනුදෙනු පරීක්ෂා කිරීම, දේපළ රාජ සන්තක කිරීම වාගේ ක්‍රියාමාර්ග මේ වනකොටත් සිද්ධ කරමින් තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට භාවිත කරන රසායනික මූලද්‍රව්‍ය භාවිතය, ඒවා ආනයනය අපි දැන් පාලනය කරමින් තිබෙනවා. ඒ සඳහා අපි INTERPOL සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය වාගේ ආයතනවලින් අන්තර්ජාතික සහයෝගය ලබා ගනිමින් ඉන්නවා. ඒ වාගේම යාබද රටවල සහයෝගයත් අපි ලබා ගනිමින් ඉන්නවා. ඊළඟට, සංවිධානාත්මක අපරාධ ජාල ඉලක්ක කරනු ලබන ක්‍රියාකාරකම් මේ වනකොට අපි පාලනය කරමින් ඉන්නවා, මේ ජාතික මෙහෙයුම හරහා.

පුද්ගලයින් මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම වැළැක්වීම, පාවිච්චි කරන්නන්ට එයින් ඈත්වීමට උදවු වීම, විශේෂයෙන්ම පාසල් දරුවන්ගේ විවිධ දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම, ජනතාවගේ දැනුම වැඩි කිරීම, දෙමව්පියන්ට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම, ප්‍රජාව සම්බන්ධ කර ගැනීම, රැකියා ස්ථානවල සිටින අයට මේ පිළිබඳව දැනුම ලබා දීම වාගේ විශාල මෙහෙයුමක් මේ වනකොට අපේ ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ සඳහා තිබෙන අපේ හැකියාව තව තවත් ශක්තිමත් කරලා ඈත මුහුදේ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම වළක්වා ගැනීමට තමයි අපි මේ සංශෝධන ගෙන එන්නේ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අදත් කියන්න තිබෙන්නේ රජය නැවතත් ලොකු විෂය පථයෙන් පොඩි කෑල්ලක් අල්ලාගෙන තමයි ඔය දහලන්නේ කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහ මුහුදේ යන මගීන්ගේ සහ නැව්වල සුරක්ෂිතභාවය පිළිබඳව international convention එකක් - International Convention for the Safety of Life at Sea, SOLAS කියලා එකක් - 1974 වසරේදී තිබුණා. මම හිතන විධියට, ජේ.ආර්. ජයවර්ධන මහතා තමයි ඒ වන විට ජනාධිපති වශයෙන් කටයුතු කළේ. විශේෂයෙන්ම මුහුදින් වට වුණු ශ්‍රී ලංකාව වාගේ රටකට ඕනෑ කරන්නේ ජල ශාස්ත්‍රීය නිලධාරියෙක්, chief hydrographic officer කෙනෙක්. මොකද, ඒ? එම නිලධාරියාට තමයි එම රටට අයත් මුහුදු සීමාවේ යන නැව් පාලනය කිරීමේ සම්පූර්ණ බලතල ලැබෙන්නේ.

ඔබතුමන්ලා දන්නවා, අපි highway එකේ වාහනයක් ධාවනය කරනකොට, toll එකක් ගෙවන්නේ නැතුව අපට highway එකේ යන්න බැරි බව. Road Development Authority එකට ඒ වාහනය පිළිබඳව පරීක්ෂා කිරීමේ සම්පූර්ණ බලතල ලැබෙනවා.

මම මේ කියන දේ හොඳට අහගන්න. මම හිතන විධියට, ලංකාව වාගේ හත් ගුණයක් විශාල මුහුදු සීමාවක් ලංකාවට ලැබී තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා අපේ රටට එම ප්‍රමාණය 27ගුණයකින් ලබා දීලා තිබුණා. නමුත් වෙනත් රජයන්ගෙන් එල්ල වුණු බාධා නිසා අපට ඒ අවස්ථාව ලබා ගන්න බැරි වුණා. දැනට දකුණු වෙරළ තීරයේ ඉඳලා කිලෝමීටර විශාල ගණනක ජල තීරුවක් ලංකාවේ ස්වෛරීත්වයට, පාලනයට යටත්ව තිබෙනවා.

මුහුදු සීමාවට එන හැම නැවක්ම පාලනය කරන්න අයිතිය ලැබෙන්නේ ජල ශාස්ත්‍රීය නිලධාරියාට. එතකොට අපට සිද්ධ වනවා, ඒ සම්බන්ධයෙන් පනතක් හදන්න. නමුත්, ජේ.ආර්. ජයවර්ධන මහතා එය හදන්න තාවකාලිකව NARA එකට භාර දුන්නා. NARA එක ඒ වැඩේ කරන්නේ නැතුව private companies දෙකකට භාර දුන්නා. ඒ private companies දෙකේ නම් කියන්න මම කැමති නැහැ. රාජ්‍ය දෙකක පෞද්ගලික සමාගම් දෙක ඒක තියාගෙන කෑවා. එය මේකට සම්බන්ධ වෙන්නේ කොහොමද කියන කාරණය මම කියන්නම්. ඒ විදේශීය සමාගම් දෙක 1975 ඉඳලා 2014 දක්වා අපේ ලංකාවේ මුහුදු සීමාවට ඇතුළු වන නැව්වලින් මුදල් ගත්තා. කොටු කරලා තිබෙනවා, charts. ඒවා 27ක් තිබෙනවා. ඒ හැම කොටුවකටම enter වුණාම ඩොලර් 25ක් credit card එකෙන් automatically ගෙවන්න ඕනෑ, expressway එකේ යනකොට ගෙවනවා වාගේ. එහෙම නොගෙවනවා නම් ඒගොල්ලන්ට යන්න අයිතියක් නැහැ. මොකද, ඒගොල්ලන්ගේ සුරක්ෂිතභාවය අපි සහතික කරන්න ඕනෑ, අපේ නාවික හමුදා හරහා. නමුත්, NARA එක ඒකට අවශ්‍ය සිතියම සකස් කළේ නැහැ. ඒ සිතියම සකස් කරන්න NARA එක විදේශීය සමාගම් දෙකකට භාර දුන්නා. අවුරුද්දකට නැව් දහස් ගණනක් අපේ මුහුදු සීමාවට ඇතුළු වනවා. ඒ සියලු මුදල් ගන්නේ මම කිව්ව විදේශීය පෞද්ගලික සමාගම් දෙක විසින්.

එවකට හිටපු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මැතිතුමා 2024දී මේ වෙනුවෙන් පනතක් ගෙනාවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා 2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත - National Hydrographic Act - ගෙනැල්ලා, National Hydrographer කෙනෙකුත් පත් කරලා, කවුන්සලයක් ඇති කළා. ඒකට නාවික හමුදාවේ රියර් අද්මිරාල්වරයෙක් පත් කරලා තිබෙනවා. නමුත්, අපට තවමත් ඒ සම්බන්ධයෙන් සිතියමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සිතියම හදන්න අපට echo sounder උපකරණයක් ඕනෑ. ඕස්ට්‍රේලියා ආණ්ඩුව අපට නොගැඹුරු මුහුදු තීරයට - shallow water සඳහා - යම්කිසි උපකරණයක් ලබා දුන්නා. ඒක මත නොගැඹුරු මුහුද සම්බන්ධයෙන් දැන් සිතියම හදලා ඉවරයි. නමුත්, ගැඹුරු මුහුද සම්බන්ධයෙන් සිතියම හදන්න උපකරණයක් ගන්න ඕනෑ. ඒකට ඩොලර් මිලියන 0.7ක් අවශ්‍යයි. දැන් අවුරුදු තුනක් ගත වෙලා තිබුණත් ඒ මුදල දෙන්නේ නැහැ. මොකද දෙන්නේ නැත්තේ? ඒ උපකරණය ගෙන්වා ගෙන අපේ මුහුදු සීමාවේ සම්පූර්ණ සිතියම හදා ගත්තාම, අපේ මුහුදු සීමාවට ඇතුළු වන හැම නැවකින්ම

අපට ඩොලර් 25 ගණනේ, අවුරුද්දකට ඩොලර් මිලියන 51ක් උපයා ගන්න පුළුවන්. මතක තබා ගන්න, අවුරුද්දකට ඩොලර් මිලියන 51ක් අපට ඒකෙන් උපයා ගන්න පුළුවන් බව. හැබැයි, අපි අවුරුදු 40ක් තිස්සේ ඒ මුදල උපයා ගත්තේ නැහැ. මම කියන්නේ ඒකයි. අපි දැන් ඒවායේ කැලි කැලි අල්ලා ගෙන කටයුතු කරනවා. අපි මුහුදේ piracy සහ drugs සම්බන්ධයෙන් පනත හදා ගත්තා. නමුත්, අපේ මුහුදු සීමාව පාලනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සිතියම හදා ගැනීම සඳහා උපකරණය ගත්තේ නැහැ. ඩොලර් මිලියන 0.7කට අපට ඕස්ට්‍රේලියාවෙන් ඒ උපකරණය ගන්න පුළුවන්. ඒ උපකරණය ගත්තොත් සිතියම හදලා අවුරුද්දකට ඩොලර් මිලියන 51ක් මේ රටට ලබා ගන්න පුළුවන්. අවුරුදු 40ක් එම මුදල අපට නොලැබුණා. හොඳට මතක තබා ගන්න, ඔය පනත ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා ගෙනාපු අවස්ථාවේදී අපේ NARA එකේ නිලධාරින් ඊට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. එහෙම නම්, බලා ගන්න කවුද ඒ ගේම් එක ගහලා තිබෙන්නේ සහ දූෂණය කොතැනින්ද පටන් අරගෙන තිබෙන්නේ කියලා. අවුරුද්දකට ලැබෙන ඩොලර් මිලියන 51 අපේ රජයට නොලැබ කුමන හෝ සමාගමකට යනකොට ඒකට අවශ්‍ය පනත් හැදීම block කළේ NARA එකේ නිලධාරින් පාවිච්චි කරලා.

මේ සිතියම හදන්න තවමත් National Hydrographic Council එකට සහ ජල ශාස්ත්‍රීය officerට අවශ්‍ය උපකරණ නැහැ. මේ අවස්ථාවේදී මම කියා සිටින්නේ, වහාම ඒ ඩොලර් මිලියන 0.7 - ඩොලර් ලක්ෂ හත - ලබා දීලා, අවුරුද්දකට අපට ලබා ගන්න පුළුවන් ඩොලර් මිලියන 51 ලබා ගැනීම සඳහා ඒ අවස්ථාව ලබා දෙන්න කියන එකයි. ඇත්තටම මෙම පනතට අපි සහයෝගය දක්වනවා. මේ පනත ගෙන ඒම ගැන අපි ප්‍රශංසා කරනවා. අනෙක් කටයුතු ටිකත් කරන්න කියලා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අපි පාසල් ගිය කාලයේ කියවපු පොතක් තිබුණා, "මනුතාපය" කියලා. ඒ පොතේ එක් තැනක තිබෙනවා, "අපරාධකරුවා විසින් කරන ලද අපරාධයට වඩා විනිශ්චයකරුවා විසින් දෙන ලද දඬුවම අපරාධයක් නම්" කියලා. ඇත්තටම එහෙම දඬුවම් ලැබුණා. මේ විපක්ෂයේ ඉන්න මහත්වරුන්ගේ වසර 76ක දේශපාලනය තුළ එහෙම දඬුවම් ලබපු පිරිසක් අපේ භූමියේ හිටියා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සාමාන්‍යයෙන් ගංජා අරගෙන කට්ටියක් motorbike එකේ ගියොත් එහි පිටුපස යන කෙනා නිවැරදි වුණත් අල්ලා ගන්නවා. ඔහු අල්ලා ගත්තාට පසු උසාවියේ නඩුවක් පවරනවා. ඔහුටත් අනික් අයට හිමි වන තීන්දුවම ලැබෙනවා. අද ගොඩක් තරුණයින්ට ඔවුන් විසින් සිදු කළ ඉතාම පුංචි වැරදි නිසා පොලීසියට බැඳෙන්න බැහැ; හමුදාවට බැඳෙන්න බැහැ; රාජ්‍ය සේවයට බැඳෙන්න බැහැ. මේ විපක්ෂයේ හිටපු අපරාධකරුවන් නිර්මාණය කරපු රටේ අපේ දරුවන්ට සිද්ධ වෙලා තිබෙන මහා විනාශය ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැම දාම කියනවා වාගේ අපි මේ රට භාර ගන්නකොට තිබුණේ හොඳ රටක් නොවෙයි. මෙතුමන්ලා හදපු රට විෂ මත්ද්‍රව්‍යවලින් පිරුණු රටක්; හොරකම, වංචාව සහ දූෂණයෙන් පිරුණු රටක්; මුළුමහත් සමාජ දේහයම කඩාගෙන වැටුණු රටක්; දේශපාලන සංස්කෘතිය විනාශ කරපු රටක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

හැබැයි, අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ පනත මදි නම් තවත් පනත් සංශෝධනය කර හෝ අනිවාර්යයෙන්ම මේ රටින් විෂ මත්ද්‍රව්‍ය තුරන් කරන බව. ඒ සඳහා අපේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, රාජ්‍ය සේවය සහ ඒකට වග කියන සුපිළිපන් දේශපාලන නායකත්වයක් මේ වෙලාවේ තිබෙනවා. සාමාන්‍යයෙන් මේ මත්ද්‍රව්‍ය කියන ඒවා විකුණන කෙනාට හෝ ගෙනෙන කෙනාට තනිවම කරන්න පුළුවන් දෙයක් නොවෙයි නේ. පසුගිය කාලයේ ඒ සඳහා ඇති පදමට දේශපාලන නායකයින් රැකවරණය දුන්නා; ඒකත් එක්ක ගැට ගැහුණු මහා පාතාලයක් තිබුණා; රජය විසින් මුදා හැරපු ආයුධ වාගේම ඔවුන් නිෂ්පාදනය කරපු ආයුධත් මේ තුළ තිබුණා. ඒ නිසා මේක ලොකු ජාලයක්. ඒ ජාලය තමයි මේ එකින් එක, එකින් එක බිඳගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලයට පත් වුණාට පසුව පසුගිය කාලය ඇතුළත හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය ටොන් 51ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් මේවා මුට්ට කරලා ගැහුවොත් එහෙම, සිමෙන්ති කොට්ට නම් බර ගණනක්. මේවා නිකම් නොවෙයි නේ අහු වුණේ. ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ අහු වුණේ නැති කුඩු, හෙරොයින්, ගංජා, අයිස් තොග පිටින් දැන් අහු වෙන්න පටන් ගන්නවා. ඇයි, ඒ? ඒ සඳහා දේශපාලන රැකවරණය නැති නිසා; අපි ඒකට රැකවරණය දෙන්නේ නැති නිසා.

උදේ බණ්ඩාරවෙල පැත්තේ මන්ත්‍රීවරයෙක් කථා කළා. එතුමා හැම දාම අපි ගැන ප්‍රශ්න කරන්න පටන් ගන්නවා. මම කියන්නේ මේකයි. අපි ගැන ප්‍රශ්න කරන්න ප්‍රශ්නයක්වත් හදා ගන්න බැරි තරමට එතුමන්ලා වැටිලා ඉන්නවා නේ. අපි ගැන ප්‍රශ්න කරන්න ප්‍රශ්නයක්වත් හදා ගන්න බැරි තරමට මෙතුමන්ලා වැටිලා ඉවරයි. ඔව්, ඇත්ත. ඔබතුමන්ලා හිතනවාට වඩා වෙනස් ආණ්ඩුවක් අපි මේ හදලා තිබෙන්නේ. මේ ආණ්ඩුවේ දේශපාලකයින් කිසිදු ගැටීමක් නැතුව මේ රට ඉතාම හොඳින් මෙහෙයවමින් යනවා. ඒ නිසා සමහර විට මේ වසර 5 අවසානයේදී ඔබට අපෙන් අහන්න ප්‍රශ්න නැති වෙයි. අපි ඒ ගාණට මේ රට හදනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අර සාටක දමා ගත්ත මහත්මයා හැම දාම අහනවා නේ, කෝ දැන් මේක කළාද, අරක කළාද කියලා. ඊයේත් අපි දැක්කා, "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් එතුමාට ප්‍රශ්න ගොඩක් තිබුණු බව. කෝ, ගෙවල් දුන්නාද, අරක දුන්නාද, මේක දුන්නාද කියලා එතුමා ඇහුවා. මට ඒ ගැනත් යම් කාරණයක් කියන්න ඕනෑ. මොකද, "දිට්වා" සුළි කුණාටුවෙන් පසු මම කථා කරන පළමු අවස්ථාව මේකයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ මහා සුළි කුණාටුව පැවති වෙලාවේදී අකාර්යක්ෂමයි කියපු රාජ්‍ය සේවය කොපමණ නම් කාර්යක්ෂමව වැඩ කළාද? මම නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් පැය 24 නොවෙයි, පැය 48, 72 ඇහැරලා සිටිමින් වැඩ කරන්න පටන් ගත්තා. අර බදුල්ලේ ඉන්න විජේසිරිලා එක ගමකටවත් යන්නේ නැති මොහොතක, ඒ රාජ්‍ය සේවය වැඩ කරන්න පටන් ගත්තා. ඒකට නිවැරදි දේශපාලන නායකත්වයක් දුන්නා. ඒ නිසා අපි ඔය මහත්වරුන්ට කියනවා, අවශ්‍ය නම් අහලා බලන්න, හොයලා බලන්න, සංඛ්‍යාලේඛන ගන්න කියලා. මගේ ආසනයේ ගෙවල් 3,143ක් යට වුණා. මහවැලි ගඟේ කිලෝමීටර 42ක් දෙගොඩතලා ගියා. අපි මාසයක් යන්න කලින් රුපියල් 25,000ක

[ගරු සුදත් බලගල්ල මහතා]

සහනාධාරය විපතට පත් පවුල් 3,143කට දුන්නා. රුපියල් 50,000ක සහනාධාර මුදල අපි විපතට පත් පවුල් 2,088කට දුන්නා. පාසල් දරුවන් 1,474කට අපි රුපියල් 25,000ක සහනාධාරය දුන්නා. සිද්ධ වෙච්ච අර්ධ හානි අපි මේ මොහොතේ තක්සේරු කරමින් සිටිනවා.

ඒ විතරක් නොවෙයි. එම ප්‍රදේශවල පශු සම්පත් ක්ෂේත්‍රයේ හානි වෙච්ච හැම කෙනාටම වන්දි දීලා තිබෙනවා. ගව මඩු විනාශ වුණා; කුකුළු කොටු විනාශ වුණා. ඒ සියල්ලටම ලක්ෂ 30කට වඩා මේ වන විටත් වන්දි ගෙවා අවසන්. කර්මාන්ත ක්ෂේත්‍රයටත් විශාල වන්දි ප්‍රමාණයක් අපි ගෙවා ඉවරයි. රුපියල් ලක්ෂ දෙක ගානේ හැම කර්මාන්තයකටම අවශ්‍ය මූලික ගෙවීම් ටික අපි කරලා ඉවරයි. ඒ විතරක් නොවෙයි, ව්‍යාපාරිකයන් වෙනුවෙන් සියයට 3, සියයට 4, සියයට 5 වැනි ඉතා අඩු පොලියට රුපියල් ලක්ෂ 250ක ණය පහසුකම් එක් ව්‍යාපාරයක් වෙනුවෙන් අපි ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. තවත් ලක්ෂ 250ක් අපි ව්‍යාපාරිකයන්ට අනුමත කරලා ඉවරයි. රුපියල් මිලියන එක බැගින් 17ක් මුදා හැර ඉවරයි. ගෙවල් 52ක් පූර්ණ හානි වුණා. අද මේ මොහොතේත් පාර්ලිමේන්තුවේ ඒ ගැන සාකච්ඡා කරනවා. අපි මේ 12වැනි දා බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනයේදී පළමුවැනි නිවාස 52 ඉදිකිරීමේ කටයුත්ත ආරම්භ කරනවා. ලක්ෂ 50ක් දෙනවා ද කියලා ඇහුවා නේ. ඔව් දුන්නා; දෙනවා. ඇවිල්ලා බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුව, කියපු දේ හරියටම කරගෙන යන ආණ්ඩුවක්.

අද මේ වෙලාවේ විශේෂයෙන්ම අපි කවුරුත් කථා කළේ මත්ද්‍රව්‍ය ගැන. ඇත්ත. මේ හින්දාම අපේ ප්‍රදේශවල ජනතාව, විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල තරුණයෝ මහත් උවදුරකට, කම්පනයකට ලක් වෙලා තිබෙනවා. ඇත ගම්දනව්වලටත් මේවා ගියා. 1980 දශකයේ අපි මේ මත්ද්‍රව්‍ය කියන එක දැක්කේ "පළිඟු මැණිකේ" නාට්‍යයෙන්. කුඩු කියන නම අපි ඇහුවේත් 80 දශකයේ. දැන් එහෙම නොවෙයි, බුදුන් වැඩිය බිමටත් ඒවා ගිහිල්ලා ඉවරයි. සුදු ඇඳගත්ත මහත්වරු ප්‍රාඩෝවලින් 18 වංගු කරකව කරකවා මේ දේවල් පල්ලෙහාට අරගෙන ආවා; දුන්හිඳෙන් පල්ලෙහාට අරගෙන ආවා. මේ මත්ද්‍රව්‍ය මුළු මහත් ලංකාව පුරාම අරගෙන ගියා. ඒ, මේ දේශපාලන සංස්කෘතිය බිහි කරපු අය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මේක අනිවාර්යයෙන්ම නැවැත්විය යුතුමයි. ඒක නවත්වන්න විශේෂයෙන්ම රජයක් විධියට අපි විවිධ ක්‍රියාමාර්ග ගත්තා. මත්ද්‍රව්‍ය අල්ලලා විතරක් නවත්වන්න බැහැ. මේවාට පුරුදු වුණු අපේ තරුණයෝ පුනරුත්ථාපනය කරන්න ඕනෑ. ඔවුන් හොඳ පුද්ගලයන් බවට පත් කරලා මේ සමාජයට නැවත මුදා හරින්න ඕනෑ. ඒ නිසා ලංකා ඉතිහාසයේ පළමු වතාවට අපේ ආණ්ඩුව පුනරුත්ථාපන කඳවුරු ප්‍රමාණය වැඩි කළා. අපි තරුණයන්ට ආරාධනා කළා, "ඔබ මේකෙන් මිදෙන්න අපේ ළඟට එන්න" කියලා. ඇතැම් අය ස්වේච්ඡාවෙන්ම ඒවාට බාර වුණා. අපේ මන්ත්‍රී සහෝදරියක් කිව්වා වාගේ, "වෙන මොකුත් ඕනෑ නැහැ, මේ දරුවා බේරා දෙන්න" කියලා අම්මලා විසින් දරුවෝ බාරදෙන රටක් බවට අපි මේ රට පත් කර තිබෙනවා. ඔවුන් එහෙම කරන්නේ ඇයි? ඔවුන්ට විශ්වාසයක් තිබෙනවා, මේ ආණ්ඩුව යටතේ ඒක කරයි කියලා. අපි ඒක කළ යුතුමයි. අපි ඒක කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පාසල දක්වා, දහම් පාසල දක්වා පතුරවපු ඒ -කුඩු- හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය ජාලය අනිවාර්යයෙන්ම ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අපි නතර කරනවා. අන්න ඒ සඳහා ඉතාම හොඳ දේශපාලන නායකත්වයක් දැන් ලබා දෙමින් ඉන්නවා. අන්න ඒ දේශපාලන නායකත්වය ගැන ඔබ හොඳින් අධ්‍යයනය කරන්න. එහෙම නැත්නම් හැමදාමත් විපක්ෂයේ ඔය පුටු ටික එකින් එක, එකින් එක අඩු වෙමින් ඔතැනම ඉඳීවි. ඒ නිසා මඩ අවලාද කියමින් දවස ගෙවා දමන්න එපා. අපේ ගම්වල තිබෙනවා, "එදාවේල ටුවර්ස්" කියලා කථාවක්. ඒ වාගේ එදා දවසට මොනවා හරි දෙයක් හොයාගෙන ඒ ගැන විතරක් කථා කරනවා. අපි දාපු බොත්තමක් වැරදියට දාපු එකක්, අපට වැරදිච්ච වචනයක්, ඒවා නේ අල්ලන්නේ. එහෙම නැතිව අපේ වැරදිච්ච තැන් හරියට හඳාගන්න හොඳ සාධනීය විවේචන තාර්කිකව අරගෙන එන්න. එහෙම නැතිව ලාභ ඒවායින් අපට ගහන්න හදන්න එපා. ඒවායින් අපි වැටෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ ජනතාව වෙනුවෙන් හොඳ රටක් හැදීමේ පරම පවිත්‍ර චේතනාව සහිතව ඉන්න අපි, මේ රටේ කුඩු, හෙරොයින්, අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය නැවැත්වීම සඳහා අවශ්‍ය අරගළය, සටන අනිවාර්යයෙන්ම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[ப.ப. 3.03]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இடம்பெறுகின்ற விவாதம் நீதி அமைச்சுடன் சம்பந்தப்பட்டதாக இருந்தாலும், தற்பொழுது இந்தச் சபையில் நீதி அமைச்சரைக் காணவில்லை. இது கவலையளிக்கின்றது.

இந்த விவாதத்தில் நான் சொல்லவேண்டிய முக்கியமான விஷயமொன்று இருக்கின்றது. அதாவது, தொழிலுக்காக கொழும்புக்கு வந்த, நான் சார்ந்த பிரதேசமான மன்னார், முசலி, வெள்ளிமலையைச் சேர்ந்த றியாத் சமீம், முஜாஹித் சஹ்ரான் எனும் இரண்டு இளைஞர்கள் சலூனுக்கு முடிவெட்டச் சென்றபோது துப்பாக்கியால் சுடப்பட்டு இருக்கிறார்கள். அவர்களில் ஒருவர் கொலைசெய்யப்பட்டு இருக்கிறார். மற்றையவர் ICUஇல் உயிருக்காகப் போராடிக்கொண்டு இருக்கிறார். இவர்கள் இருவரும் ஏழைகள்! வைத்தியசாலையில் இருக்கின்ற தன்னுடைய மகனைப் பார்க்க வருவதற்குக்கூட தந்தையான றியாத்துக்கு கையில் பணம் இல்லாத துர்ப்பாக்கிய நிலை காணப் படுகின்றது. நான் தொலைபேசிமூலம் தொடர்புகொண்டு சனாதிபதியிடம் இந்த விஷயத்தைச் சொன்னேன். தயவுசெய்து, இப்படியான கொலைகளை நிறுத்துங்கள்! இல்லையென்றால், நாட்டில் சுற்றுலாத்துறை பாதிக்கப்படும். எங்களுக்கு யுத்த காலத்தில் இருந்த பயம் மீண்டும் வர ஆரம்பித்துவிட்டது. இன்று சலூன் போன்ற சாதாரண இடங்களில்கூட பாதுகாப்பில்லாத நிலை காணப்படுகின்றது. எனவே, இது சம்பந்தமாக அரசாங்கம் அவசரமான நடவடிக்கை எடுக்க வேண்டும். வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு இருப்பவருக்குத் தேவையான வைத்திய உதவிகளைச் செய்து, அவரின் உயிரைக் காப்பாற்றித் தாருங்கள்! அதேபோல, பாதிக்கப்பட்டவரின் குடும்பத்துக்கு நஷ்டஈட்டை வழங்குங்கள்! இனிமேலும், இவ்வாறான கொலைகள் நடக்காமல் இருப்பதற்கு ஆக்கபூர்வமான நடவடிக்கைகளை எடுக்குமாறு அரசாங்கத்திடம் வேண்டுகோள் விடுக்கின்றோம்.

நான் இன்னுமொரு விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். மன்னாரிலிருந்து இடம்பெயர்ந்து புத்தளத்தில் வசித்த மக்களை வாக்களிப்பதற்காக புத்தளத்தி லிருந்து மன்னாருக்கு பஸ்ஸில் அழைத்துச் சென்றதற்காக கோட்டாபய அரசாங்கம் என்னை மூன்று மாதங்கள் சிறையில் அடைத்தது. ஆறு மாதங்களில் - *නිදොස්කොට නිදහස්* - நிரபராதியென நான் அந்த வழக்கிலிருந்து விடுவிக்கப் பட்டிருக்கிறேன். ஆனாலும், எனக்கு உதவி செய்தார்கள் என்ற காரணத்துக்காக 2-3 engineers, ஒரு consultant போன்றவர் களுக்கு எதிராகத் தொடுக்கப்பட்ட வழக்கு 4-5 வருடமாக இழுபட்டுக்கொண்டு செல்கின்றது. இங்குள்ள அரச அதிகாரி களுக்கான கூடத்தில் Attorney-General`s Departmentஇன் அதிகாரிகள் இருப்பார்கள். உண்மையிலே சந்தேக நபராக இருந்த என்னை விடுதலை செய்துவிட்டு, எனக்கு உதவி செய்தார்கள் என்ற பொய்க் குற்றச்சாட்டின் பேரில் மேற்குறித்தவர்களுக்கு எதிராகத் தொடுக்கப்பட்ட வழக்கை நீடித்துக்கொண்டு செல்கிறார்கள். Attorney-General`s Departmentஇலிருந்து Report வரவில்லையென்று நீதிமன்றத்தில் பொலிசார் சொல்கிறார்கள். தயவுசெய்து, இவ்வாறான செயற்பாடுகளை Attorney-General`s Department தவிர்ந்து கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, இந்த வழக்கை முடிவுக்குக் கொண்டுவருமாறும் வேண்டுகோள் விடுக்கின்றேன்.

யாழ்ப்பாணம், மன்னார், கற்பிட்டி போன்ற பகுதி களிலிருந்து போதைப்பொருள் வருவதாகச் சொல்கிறீர்கள். நீங்கள் நினைத்தால் அதைக் கட்டுப்படுத்த முடியும். அங்கு Navy அதிகாரிகளைத் தொடர்ந்து நீண்ட காலத்துக்கு வைக்காதீர்கள்! தற்பொழுது, இச்சபையில் கௌரவ பாதுகாப்புப் பிரதி அமைச்சர் இருக்கிறார். நான் அவரிடம் ஒரு முறை சொன்னேன், OIC ஒருவரின் 'குடு' கடத்தலோடு சம்பந்தப்பட்ட voice record ஒன்று வெளிவந்திருக்கின்றது என்று. அப்போது அவர், action எடுப்பதாகச் சொன்னார். நீங்கள் என்ன action எடுத்தீர்கள்? அந்த அதிகாரியை transfer பண்ணி இருக்கிறீர்கள். ஆனால், விசாரணை நடத்தவில்லை. அந்த voice recordஇல் கடத்தல், commission பற்றி எல்லாம் பேசப்படுகின்றது. ஆனால், இதுவரை எந்தவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை. உங்களுடைய NPP அரசாங்கத்தின் அமைச்சர்கள் மன்னாருக்குச் சென்றால், அவர்களுக்கு கடத்தல்காரர்கள் சாப்பாடு கொடுக்கிறார்கள். கடத்தல்காரர்கள்தான் அவர்களுக்கு பக்கபலமாக நிற்கிறார்கள். உங்களுடைய அமைச்சர்கள் தங்களது பணத்தில் சாப்பிடாமல் கடத்தல்காரர்களின் பணத்தில் சாப்பிட்டுவிட்டு வந்தால், எப்படி நீங்கள் நாட்டைக் காப்பாற்ற முடியும்? எனவே, அங்கு செல்கின்ற அமைச்சர்கள் புத்திசாலித்தனமாக நடந்துகொள்ள வேண்டுமென தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன்.

நேற்று நான் சம்மாங்கோட்டு பகுதிக்கு அல்-குர்ஆன் பிரதிகளை வாங்கச் சென்றபோது, அவற்றுக்குத் தட்டுப்பாடு இருப்பதை அவதானித்தேன். ஏன், இந்த நிலைமை? இதற்குக் காரணம், Sri Lanka Customsஆல் விதிக்கப்பட்டுள்ள கட்டுப்பாடுதான். பௌத்த, இந்து, கத்தோலிக்க மதப் புத்தகங்களை இலங்கைக்குக் கொண்டுவருவதற்குக் கட்டுப்பாடு இல்லை. இலங்கையில் மட்டுமல்ல, உலகிலுள்ள 2 பில்லியன் முஸ்லிம் மக்கள் பின்பற்றுகின்ற, அல்லாஹ்வால் இறக்கப்பட்ட அல்-குர்ஆனின் பிரதிகளையும் அதன் விளக்கவுரைகளையும் கொண்டுவருவதற்கு மாத்திரம் Sri Lanka Customsஇனால் கட்டுப்பாடு விதிக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, Ministry of Defenceஇன் அனுமதி இல்லாமல் இஸ்லாமிய புத்தகங்களையும் கொண்டுவர முடியாது. இது இந்த அரசாங்கம் இட்ட உத்தரவல்ல. இந்த நாட்டை ஆட்சி செய்த மிக மோசமான, கொடிய 'கோட்டா' என்ற அராஜகன் போட்ட உத்தரவு! அது இன்றுவரை தொடர்ந்துகொண்டு இருக்கின்றது. ஏன் இதனை அநுரவுடைய ஆட்சியில் இல்லாமல் செய்ய முடியாது? Harbourஇல் இருக்கின்ற அல்-குர்ஆன் பிரதிகளை விடுவிக்குமாறு 25 MPs sign இட்டு கோரிக்கையொன்றை முன்வைத்திருக்கிறார்கள். இன்று கொழும்பில் அல்-குர்ஆன் பிரதிகளை வாங்க முடியாத நிலை ஏற்பட்டிருக்கின்றது. நான் 40 அல்-குர்ஆன் பிரதிகளை வாங்கச் சென்றேன். அதன் விலை கூடியிருந்தது. ஏனென்று கேட்டால், Sri Lanka Customsஆல் ஏற்பட்டிருக்கின்ற பிரச்சினை என்று சொல்கின்றார்கள். தயவுசெய்து, இங்கிருக்கின்ற அமைச்சர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டுமென அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, மஹர பள்ளிவாசல் பற்றி சொல்ல வேண்டும். கோட்டாபயவுடைய அரசாங்கத்திலே இந்தப் பள்ளிவாசல் மூடப்பட்டது. அங்கிருக்கின்ற முஸ்லிம்களுக்கு தொழுவதற்கு இடமில்லை. நோன்பு காலம் வந்துவிட்டது. 'தராவீஹ்' தொழுகையை நிறைவேற்ற முடியவில்லை. இவ்வாறு அவர்களால் மார்க்கக் கடமைகளைச் செய்ய முடியாத நிலை காணப்படுகின்றது. சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சராக முஸ்லிம் ஒருவரை நியமித்து இருக்கிறீர்கள். நாங்கள் இங்கு வந்த நாளிலிருந்து கேட்டுக்கொண்டு இருக்கிறோம், இந்தப் பள்ளிவாசலை மீண்டும் திறந்து தாருங்கள் என்று. கோட்டாபயவுடைய அரசாங்கம் மூடிய இந்தப் பள்ளிவாசலை நீங்களாவது திறந்து தாருங்கள்! இப்போது நடப்பது கோட்டாபயவுடைய ஆட்சியல்ல, அநுரவுடைய ஆட்சி! இந்த ரமழான் மாதத்திலாவது இந்தப் பள்ளிவாசலை அவசரமாக அங்குள்ள மக்களுக்குத் திறந்து கொடுக்குமாறு கேட்கின்றோம்.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

அடுத்து, மன்னார் - புத்தளம் road சம்பந்தமாகச் சொல்லியிருந்தார்கள். இது ரமழான் மாதம் என்பதால், நான் கூடுதலாகப் பேச விரும்பவில்லை. நான் அமைச்சராக இருந்த காலத்தில்தான் இந்தப் பாதை திறக்கப்பட்டது. இது 100 வருடங்கள் பழைமைவாய்ந்த, RDAக்குச் சொந்தமான பாதை. இந்தப் பாதையைத் திறந்தபோது, அதற்கெதிராக ஓர் இனவாதக் கூட்டம் நீதிமன்றத்தில் வழக்குப் போட்டது. அந்த வழக்குக்கு எதிராக Department of Wildlife Conservation தொடர்ந்து போராடிக்கொண்டு இருந்தது. உங்களுடைய அரசாங்கத்தில்தான் Department of Wildlife Conservation அப்பாதையைத் திறப்பதில்லையெனக் கூறி, அந்த வழக்கை வாபஸ் பெற்று இருக்கிறது. பொய்யான கூற்றுகளை இந்தச் சபையில் சொல்லி அந்த மக்களை ஏமாற்றாமல், தயவுசெய்து அப்பாதையைத் திறந்து கொடுங்கள் அல்லது கடற்கரை யோரமாக மாற்றுப் பாதை ஒன்றை அமைத்துக் கொடுங்கள்! இல்லையென்றால், நாங்கள் ரமழானுக்குப் பிறகு மக்களை ஒன்றுதிரட்டி அதற்கெதிரான போராட்டங்களை முன்னெடுப்போம். இந்தப் பாதை தெற்கில் அமைந்திருந்தால், நீங்கள் என்ன செய்திருப்பீர்கள்! சற்று யோசித்துப் பாருங்கள்! இந்தப் பாதையைப் பயன்படுத்தினால் 80-90 கிலோமீற்றர் தூரம் மிச்சமாகும். ஒரிரு அமைச்சர்கள் இங்கு இருக்கிறார்கள். உதாரணத்துக்கு, அம்பாறையிலிருந்து கொழும்புக்கு வருவதற்கு 100 கிலோமீற்றர் குறைவாகவுள்ள ஒரு பாதை இருக்குமானால், நீங்கள் அந்தப் பாதையை மூடிவைப்பீர்களா? இவ்வாறானதொரு பாதை அம்பாந்தோட்டையில் இருந்தால் மூடிவைப்பீர்களா? கம்பஹாவில் இருந்தால் மூடிவைப் பீர்களா? மன்னாரில் தமிழர்களும் முஸ்லிம்களும் வாழ்கிறார்கள் என்பதால் உங்களுடைய கண் குருடாக இருக்கின்றது.

வீதி அபிவிருத்துக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் தற்போது இங்கு இல்லை. இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்றவர்களில் தான்தான் மிகவும் அறிவாளிபோல அவர் பேசுகிறார். அவர் பேசும்போது பிழையான கருத்துகளை முன்வைத்தார். வில்பத்து வனப் பகுதியின் ஓர் அங்குல நிலம்கூட அழிக்கப்படவில்லை. அதன் ஓர் அங்குல நிலத்தில்கூட முஸ்லிம்கள் குடியேற்றப் படவில்லை. அவர்கள் சொந்த மண்ணில்தான் குடியேற்றப் பட்டார்கள். அதாவது, புலிகள் அவர்களை எந்த மண்ணிலிருந்து விரட்டினார்களோ அதே மண்ணில்தான் அவர்கள் குடியேற்றப்பட்டார்கள். அவர்கள் 20 வருடங்களுக்குப் பிறகு அங்கு போகும்போது அப்பகுதி காடாக இருந்தது. அந்தக் காடுகளை வெட்டாமல் அவர்களைக் குடியேற்ற முடியாது. அதைக்கூட நான் சட்டரீதியாகத்தான் செய்திருக்கிறேன். நான் சவால் விடுகிறேன், நாங்கள் தவறு செய்திருந்தால் சட்ட ரீதியாக நிரூபியுங்கள் என்று. அதைவிடுத்து, மன்னார் - புத்தளம் பாதையை மூடுவதற்காக, மன்னாரில் மீள்குடியேறிய மக்களுடைய காணிகளை வெட்டி சுத்தப்படுத்தியதை வில்பத்தை அழித்ததாக இந்தச் சபையில் பொய் கூறாதீர்கள். உடனடியாக, நூறு வருடங்கள் பழைமைவாய்ந்த அந்தப் பாதையை அந்த மக்களுக்கு மீளத் திறந்து கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

போதைப்பொருள் ஒழிப்பு தொடர்பில் நீங்கள் எடுக்கின்ற நடவடிக்கைகளை நாங்கள் பாராட்டுகின்றோம். உங்களுடைய இனவாதமற்ற நடவடிக்கைகள் தொடர்கின்றன. அதில் மாண்புமிகு சனாதிபதி அவர்கள் உறுதியாக இருக்கிறார். ஆனால், உங்களுக்குள் இருக்கின்றவர்கள் அதில் உறுதியாக இருக்கின்றார்களா என்பது கேள்விக்குறியாக இருக்கின்றது. யாழ்ப்பாணத்துக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ சந்திரசேகர் அவர்கள் என்னுடைய நண்பர். அகதிகளாக வந்த முஸ்லிம்களில் மீள்குடியேறச் சென்றவர்களுக்கு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய அரசாங்கத்தில் ஒதுக்கிய 8 கோடி ரூபாய் திரும்பிச் சென்றது. அந்த நிதியை மீளப் பெற்றுத் தருமாறு அவரிடம் கேட்டபோது, 'தருகிறேன்' என்று கூறினாலும், இன்றுவரை தரவில்லை. அந்த மக்களின் பாதை அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட 4 கோடி ரூபாயும் திரும்பிச் சென்றது. அதையும் இன்னும் மீளப் பெற்றுத் தரவில்லை. ஒரு சில அமைச்சர்கள் இன ரீதியாகச் செயற்படுகின்றார்கள். அத்தகைய செயற்பாடுகளைத் தடுத்து நிறுத்துமாறு கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ රටේ දශක ගණනාවක් තිස්සේ විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ප්‍රමාණය විශාලයි. පාසල් දරුවන්, තරුණ තරුණියන්, වැඩිහිටියන්, කාන්තාවන් ඒවාට ගොදුරු වෙලා තිබෙනවා; ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය පියවරින් පියවර වැඩි වෙච්ච යුගයක් තමයි පසුගිය කාලය. ඒ වාගේම, ඊට අදාළ බෙදා හැරීම් ජාලය ශක්තිමත් වෙමින් ඉදිරියට ආවා; අලෙවිකරණ ජාලය ශක්තිමත් වෙමින් ඉදිරියට ආවා. අයිස් වැනි මත්ද්‍රව්‍ය රට තුළ නිෂ්පාදනය කරන තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබුණා; වර්ධනය වෙමින් තිබුණා. ඒ වාගේම, අපේ රට ලෝකයේ අනෙක් රටවලට විෂ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් බවටත් පත් වෙමින් ඉදිරියට ආවා. අපේ රට මෙන්න මේ කියන තත්ත්වයට පත් වීම සිද්ධ වුණේ කොහොමද? අපේ ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ ගමේ ඉන්න සිරිපාල අයියාට බැහැ, අපේ රටට මත්ද්‍රව්‍ය ගේන්න. ගමේ ඉන්න ඥානවතී

අක්කාට බැහැ, හෙරොයින්, අයිස්, කේරළ ගංජා ටොන් ගණන්, කිලෝ සිය ගණන් අපේ රටට ගේන්න. එහෙම නම් ඒවා ගේන්න පුළුවන් වන්නේ කොහොමද? ඒ සඳහා දේශපාලන හයියක් අනිවාර්යයෙන්ම අවශ්‍යයි, නීතියේ ආධිපත්‍යය වල් වැදීමත් අවශ්‍යයි. අපි දන්නවා පසුගිය කාලයේ සිද්ධ වෙච්ච දේවල්. ඒ කාලයේ පොලීසිය, ත්‍රිවිධ හමුදාව මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් කරන්න ගියාට පස්සේ රටේ ජනාධිපති ගිහිල්ලා ඒ ජාවාරම්කරුවන් බදා ගන්නවා. ඊට පස්සේ වැටලීම එතැනින් අවසානයි. එහෙම ආශීර්වාදයක් මැද තමයි ඉතා දරුණු ලෙස මේ රට විෂ මත් ද්‍රව්‍ය උවදුරට ගොදුරු වුණේ. ඒ මත් උවදුර මුලිනුපුටා දැමීම වෙනුවෙන් වත්මන් රජය කටයුතු කරමින් ඉන්නවා.

මේ අවස්ථාවේ අපේ ගරු අධිකරණ ඇමතිතුමා රජයේ අත්‍යවශ්‍ය අධිකරණ කටයුත්තකට සහභාගි වී සිටින නිසා පැය දෙකක කාලයක් මේ විවාදයට සහභාගි වෙන්න අපහසු බව දැනුම් දුන්නා. ඒ බව දන්වා තමයි එතුමා ගියේ. තව ස්වල්ප මොහොතකින් එතුමා නැවත පැමිණීමට නියමිතව තිබෙනවා. අපේ ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ඒ පිළිබඳව සඳහන් කළ නිසායි මා ඒ කාරණය කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් හැම ක්ෂේත්‍රයක් හරහාම රට ගොඩනැඟීමට මැදිහත් වුණා සේම විෂ මත්ද්‍රව්‍ය උවදුරින් මේ ලස්සන කුඩා දිවයින සහ දෙකෝටි විසිලක්ෂයක් වූ ජනතාව මුදා ගැනීමේ මෙහෙයුම අපි ආරම්භ කර තිබෙනවා. 2019දී මෙම වැරැදි සම්බන්ධව අත්අඩංගුවට ගත්තු පුද්ගලයන් ප්‍රමාණය 45,000ක් වනකොට 2025 මුල් මාස 6 විතරක් 36,814ක් ගංජා සම්බන්ධව පමණක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2019දී හෙරොයින් වැරැදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව 40,000ක් වනකොට, 2025 මුල් මාස 6ට පමණක් අත්අඩංගුවට ගත් ප්‍රමාණය 34,000ක් වෙලා තිබෙනවා. 2019දී අයිස් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත්තේ 2,073යි. 2025 මුල් මාස 6 තුළ විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් 41,000ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. අපේ මන්ත්‍රීවරු එවැනි දත්ත, සංඛ්‍යාලේඛන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළා. අපට දැන් ඒ පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙනවා. අත්අඩංගුවට ගැනීම් ආදි සියල්ලෙහි ඉතා වර්ධනීය තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම ඊට අදාළ සියලු මැදිහත් වීම්, හමුදා මෙහෙයුම්, පොලීසියේ මෙහෙයුම් සිය දහස් ගණනින් වර්ධනය වෙලා තිබෙනවා.

මේ රටම වෙළා ගත් මේ මත් උවදුර වහාම මර්දනය කළ යුතුව තිබෙනවා. දේශපාලන රැකවරණයක් තිබීම මත් උවදුර වර්ධනයට හේතුවක් වුණා. නීතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවීමත් එයට හේතුවක් වුණා. ඒ වාගේම මත් උවදුර මර්දනය කිරීමට නිසි වැඩ පිළිවෙළක් නොමැතිකමත් ඒ වර්ධනයට හේතු වුණා. අපිත්, මේ රටේ ජනතාවත් දන්නවා, සෑම ක්ෂේත්‍රයකින්ම බිඳ වැටුණු මේ රට ගොඩ නැඟීම සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ වන විට විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන බව.

අපි දන්නවා, මේ රට දුගී දුප්පත්කමින් පිරුණු රාජ්‍යයක් බව. "අස්වැසුම" ප්‍රතිලාභය ලබන පවුල් දහඅට ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. තවත් ප්‍රමාණයක් ඉන්නවා, "අපිත් සුදුසුයි" කියලා ඒ සඳහා ඉල්ලුම් කරන. ආසන්න වශයෙන් පවුල් විසිලක්ෂයක් කියලා හිතුවොත්, එක පවුලක පස්දෙනෙක් ඉන්නවා නම් කෝටියක් දුප්පතුන් සිටින රටක් තමයි අපට ගොඩ නඟන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක ගැඹුරින් තේරුම් අරගෙන මේ ආණ්ඩුව, ගරු ජනාධිපතිතුමා, ගරු ඇමතිතුමා ඇතුළු අපේ අමාත්‍යාංශය ඒ සඳහා ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් හැටියට දුප්පත්කම තුරන් කිරීම සඳහා වන "ප්‍රජා ශක්ති" ජාතික මෙහෙයුම සකස් කර තිබෙනවා. ජාතික ප්‍රශ්නයක් විධියට සලකා දුප්පත්කම මේ රටින් තුරන් කිරීම සඳහා අපි මැදිහත් වෙලා ඉන්නවා. ඒ අනුව දුප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් මහා වැඩ පිළිවෙළක් අද ක්‍රියාත්මක වෙනවා. මත්ද්‍රව්‍ය භාවිතය දුප්පත්කමටත් අදාළයි. ගම් මට්ටමේ ඉන්න තරුණ තරුණියන් සවිබලගන්වන්න ඕනෑ; ඒ පවුල් සවිබලගන්වන්න ඕනෑ. ඒ ආකාරයට තරුණ තරුණියන් සවිබලගැන්වීමේදී ඔවුන්ගේ පවුල්වල අය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්නවා නම් ඒ අය එයින් මුදා ගැනීමත් මේ වැඩසටහනට අදාළයි. අපි ජනප්‍රිය මාතෘකාවක් තෝරාගෙන "මත්ද්‍රව්‍ය මහා උවදුරක්, මේක මර්දනය කරන්න අලුතින් නීති රීති ගෙනෙන්න ඕනෑ" කියන පුංචි, පටු අරමුණක ඉඳලා නොවෙයි මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා තිබෙන්නේ. මත්ද්‍රව්‍ය උවදුර හේතුවෙනුත් මේ රට කඩා වැටිලා තිබෙනවා.

මේ රට සමාජයීය වශයෙන්, සංස්කෘතික වශයෙන්, දේශපාලනික වශයෙන් - බොහෝ පැතිවලින් - කඩා වැටිච්ච රටක්. රටේ පිරිසිදුකම නැත්නම්, හොරකම්වලින්, වංචාවලින්, දූෂණවලින් ආයතන පිරිලා තිබෙනවා නම්, මිනිසුන් තුළ දයාව, කරුණාව, මෛත්‍රිය, ආදරය නැත්නම් සැබෑ දියුණුවක් ඇති වන්නේ නැහැ. මේ රට ඒ පැත්තෙනුත් කඩා වැටිලා තිබෙනවා. Clean Sri Lanka කියන වැඩසටහන ක්‍රියාත්මක කරමින් ආදරයෙන්, දයාවෙන් බැඳිච්ච මානව සමාජයක් සහිත, හැම පැත්තකින්ම පිරිසිදු අදහස්, ආකල්පවලින් යුක්ත දියුණු සමාජයක් සහිත රටක් ගොඩ නැඟීම තමයි අපේ අරමුණ. අපි ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. මේ රටේ ආයතන පද්ධතියට, මේ රටේ අනෙකුත් සංවර්ධන කටයුතුවලට සාම්ප්‍රදායික විධියට ඉස්සරහට යන්න බැහැ. එම නිසා ඩිජිටල්කරණය හරහා මේ රට ගොඩ නැඟිය යුතුයි.

ඒ වාගේම විෂ මත්ද්‍රව්‍ය උවදුරෙන් මේ රට මුදා ගැනීම වෙනුවෙන් ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් "රටම එකට" ජාතික මෙහෙයුම් සභාව හදලා, දිස්ත්‍රික්ක මට්ටමින් මෙහෙයුම් සභා හදලා තිබෙනවා. දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, රාජ්‍ය අංශයේ සියලු නිලධාරින්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය, දේශපාලන අධිකාරිය ඇතුළු සියලුදෙනාගෙන් සමන්විතව ඒ සභා දැන් දිස්ත්‍රික්ක පුරා හදලා තිබෙනවා. ප්‍රාදේශීය කමිටු ද පිහිටුවා තිබෙනවා. මහජන ආරක්ෂක කමිටු පිහිටුවා තිබෙනවා. ඒක නිසා මේක යෝධ සැලැස්මක්. දැවැන්ත සංවිධාන සැලැස්මක් සහිතව තමයි විෂ මත්ද්‍රව්‍ය ජාලයට, මත් උවදුරට එරෙහිව සටන් කිරීම සඳහා මැදිහත් වෙන්න අපි සූදානම් වෙලා ඉන්නේ. ඒක නිසා එවැනි පැහැදිලි දැක්මක්, වැඩ පිළිවෙළක් ඇතුව මේ රටේ අනාගත දූ දරුවාට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" හදලා දෙන්න මැදිහත් වෙන ප්‍රධාන වැඩසටහනක් විධියට මේ වැඩසටහන අපි දියත් කරනවා. එය ශක්තිමත් කරන්න තමයි මේ පනත් සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. අපි එය ඉතා ශක්තිමත්ව ඉදිරියට ක්‍රියාත්මක කරමින්, මේ රට විෂ මත්ද්‍රව්‍යවලින් තොර රටක් බවට ඉතා ඉක්මනින් පත් කරනවා කියන සහතිකය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මීට ඉස්සෙල්ලා මේ විවාදයට එකතු වෙච්ච මැති ඇමතිවරු හැම කෙනාම ප්‍රකාශ කළා අපි දැක්කා, මේ මත්ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් දේවල් අත්අඩංගුවට ගැනීම් සිද්ධ කළේ මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව පමණයි කියලා. නමුත් මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ, මුහුද ආශ්‍රිතව නැව් මඟින් ප්‍රවාහනය කළ ඒවා අත්අඩංගුවට ගැනීම පසුගිය රජයන් කාල සීමාව තුළත් විශාල වශයෙන් සිදු වුණා කියලා. මේ පනත් කෙටුම්පත ගෙනෙන්න කටයුතු කරලා තිබෙන්නේ මත්ද්‍රව්‍ය උවදුර තුරන් කරන්න අවශ්‍ය නිසායි. මත්ද්‍රව්‍ය, එහෙම නැත්නම් විෂ මත්ද්‍රව්‍ය අපේ රටට ලැබෙන්නේ මහ මුහුද හරහා. ඒවා නැව්වලිනුත්, ඒ වාගේම බෝට්ටු මඟිනුත් ලැබෙනවා කියන එක පදනම් කරගෙන තමයි ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත ගෙන ඒම ගැන මම ඇත්ත වශයෙන්ම සතුටු වෙනවා. ඒ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම මට ඉස්සෙල්ලා කථා කරපු නිසාම් කාරියප්පර් මැතිතුමා ඉතා හොඳ අදහසක් ගෙනාවා. මේ වාගේ යෝජනා, ඒ වාගේම මේ සම්බන්ධ අණපනත්, සංශෝධන පනත් මීට ඉස්සෙල්ලා හිටපු ආණ්ඩුත් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම විජයදාස රාජපක්ෂ මැතිතුමා අධිකරණ ඇමතිවරයා හැටියට කටයුතු කළ අවස්ථාවේ මේ වාගේම පනත් කෙටුම්පතක් ගෙනෙන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් ඒක ක්‍රියාත්මක කරන්න යාමේදී විශේෂයෙන් මහ මුහුද සම්බන්ධයෙන් තිබෙන විවිධ ආයතන, ඒ වාගේම විවිධ නිලධාරින්ගේ ප්‍රශ්න මධ්‍යයේ ඒ යෝජනාවන් ක්‍රියාත්මක කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. අද මේ සංශෝධන අණපනත් ගෙනාවා වාගේම අනිවාර්යයෙන්ම එතුමන්ලාගේත් අදහස් අරගෙන මේවා ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටින්න කැමැතියි. ඒ සඳහා යම්කිසි බාධාවක් තිබෙනවා නම් ඒවා මහ හරවා, නීතිය නියම ආකාරයට ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මීට ඉස්සෙල්ලා කථා කරපු මැති ඇමතිවරු කිව්වා, මත්ද්‍රව්‍ය උවදුර නතර කරන්න, එහෙම නැත්නම් අඩු කරන්න දැන් විශාල වශයෙන් කටයුතු කරලා තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසුගිය කාල සීමාව තුළ හොයලා බලන කොටත්, ඒ වාගේම මත්ද්‍රව්‍ය වැටලීම් දිහා, භාවිතයට ගන්න අය දිහා බැලුවත් විශාල වශයෙන් අඩුවීමක් දකින්න පුළුවන්කමක් නැහැ. විශාල වශයෙන් අත්අඩංගුවට ගැනීම් කළා වුණත්, තවදුරටත් මත්ද්‍රව්‍ය උවදුරට අබ්බැහි වෙච්ච අය, ඒ වාගේම මත්ද්‍රව්‍ය පානය කරන අය විශාල වශයෙන් අද සමාජයේ අපට දකින්න පුළුවන්. ඔබතුමන්ලා නොයෙකුත් ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කළාට, ඔබතුමන්ලා අපේක්ෂා කරන දේ; ඔබතුමන්ලා අපේක්ෂා කරන මර්දනය, එහෙම නැත්නම් ඒකේ සාර්ථකත්වය අත්පත් කර ගන්න ලැබිලා නැහැ කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳව සඳහන් කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. බන්ධනාගාරවල තිබෙන තදබදය ගැන කථා කළා. මේ තදබදය අවම කරන්නට අධිකරණ ඇමතිතුමාත් යම් යෝජනා ගෙනැල්ලා තිබෙන බව මා දන්නවා. අපි විවිධ අවස්ථාවල බන්ධනාගාරවලට ගියා. ඒ බන්ධනාගාරවලට යන කොට අපි දැක්කා, එහි තිබෙන විශාල තදබදය. සිරකරුවන්ගේ තිබෙන මානුෂික ප්‍රශ්න පිළිබඳව නොයෙකුත් ආකාරයේ අදහස් අපට ඉදිරිපත් කරන්න කටයුතු කළා. මීට කලින් අධිකරණ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදීත් මම මේ සම්බන්ධව යෝජනා ඉදිරිපත් කළා, එහි තිබෙන තදබදය අඩු කරන්න මෙන්න මේ කටයුතු ටික කරන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්ධනාගාර සම්බන්ධව අපි දකින දෙයක් තිබෙනවා. බන්ධනාගාරයට ගියොත් බන්ධනාගාරවල වැඩි වශයෙන් ඉන්නේ රිමාන්ඩ් බන්ධනාගාරගත වෙච්ච අය. ඒකත් මත්ද්‍රව්‍ය ජාවාරම්වලට අහු වෙච්ච, එහෙම නැත්නම් විවිධාකාර මත්ද්‍රව්‍ය චෝදනාවලට ලක් වෙච්ච අය තමයි රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්නේ. මේ සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ තදබදය අඩු කරන්න අවශ්‍ය නම්, නීතිය ක්‍රියාත්මක කිරීමේදී තිබෙන අඩුපාඩුකම් සම්බන්ධව අපි සොයා බලා කටයුතු කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා සිටින මත්ද්‍රව්‍ය චෝදනා ලබපු අයට තිබෙන මූලික ප්‍රශ්නය මෙයයි. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධව ලැබෙන උපදෙස්, ඒ වාගේම පොලීසිවලින්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලන කොට ඒ උපදෙස් ලැබීමේදී සිදුවන ප්‍රමාදය නිසා මේ අයව දීර්ඝ කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා තියන්න සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දකින අනෙක් කාරණාව තමයි රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය. එතැනට ගියාම කියන්නේ මාස හය, හත, සමහර විට අවුරුද්ද, දෙක ඒ රස පරීක්ෂක වාර්තා එන්නේ නැහැ කියලා. කරුණාකරලා මේ සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා අපි අධිකරණ ඇමතිතුමාගෙනුත්, අමාත්‍යාංශයෙනුත් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය, ඒ වාගේම රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් වාර්තා ලබා ගැනීමේදී තිබෙන ප්‍රමාදය සම්බන්ධව යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා මේ නඩු කඩිනම් කරන්න කටයුතු කළොත්, විශාල පිරිසක් බන්ධනාගාරයෙන් නිදහස් කරන්න, එහෙම නැත්නම් නඩු පවරලා ඒ සම්බන්ධව චෝදනා ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කාරණයක් කියන්න ඕනෑ. ඒක කියලා මම අවසන් කරන්නම්. විශේෂයෙන් අභියාචනා ඉදිරිපත් කර තිබෙන, දැනට දඬුවම් විඳින සිරකරුවන් සම්බන්ධයෙන් 2024දී විජයදාස රාජපක්ෂ මැතිතුමා යෝජනාවක් ගෙනාපු බව අපි දන්නවා. අභියාචනා ඉදිරිපත් කරපු කාල සීමාව තුළ රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා, එහෙම නැත්නම් සිරගත වෙලා සිටි අවස්ථාවේදී ඒ දඬුවම් කාල සීමාව අඩුවෙන්නේ නැහැ. අභියාචන තීන්දුව ඒ ආකාරයටම ලැබුණොත්, ඒ අභියාචනාධිකරණයේ නඩුව පවත්වපු කාල සීමාව අවුරුදු දෙකක් විතර ගත වෙලා තිබුණා නම් ඒ සීමාව අඩු වෙන්නේ නැහැ. නමුත් එතුමා පසුගිය වසරේදී ගෙනාපු යෝජනාවත් එක්ක, ඒ සිරකරුවන්ට ඉදිරියට බලපැවැත්වෙන පරිදි ඒ කාලය අඩුවෙන විධියට සහනයක් ලබා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන්, අතීතයට බලපාන ආකාරයෙන් බැලුවොත්, ඒ කියන්නේ මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කලින් සිරගත වූ අයට ඒ අභියාචනය ඉදිරිපත් කළ කාලයට අදාළව එම පහසුකම ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධව අපි විවිධ අවස්ථාවල අමාත්‍යාංශ නිලධාරින් එක්ක කථා කර තිබෙනවා. ඒ අය කියන්නේ අතීතයට බලපැවැත්වෙන පරිදි මේ යෝජනාව ගෙනෙන්න බැහැ කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව තමයි උත්තරීතර. පාර්ලිමේන්තුවට ඕනෑම පනත් කෙටුම්පතක් ගෙනෙන්න පුළුවන්. මම අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා එම පිරිස ගැනත් සානුකම්පිතව කල්පනා කරලා කටයුතු කරන්න කියලා. මොකද, මේක එක කොටසකට හම්බ වෙනවා. මේ යෝජනාව ගෙනෙන අවස්ථාවේ දී, මේ පනත් කෙටුම්පත සම්මත වෙන අවස්ථාවේ දී, හිටපු කට්ටියට මේකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳව කැබිනට් තීරණයක් අරගෙන මේ පනත සම්පූර්ණයෙන් සංශෝධනය කර ඉදිරිපත් කරන්න පුළුවන් නම් විශාල පිරිසකට එයින් සහනයක් ලැබෙයි කියලා මම හිතනවා. ඒ වාගේම තදබදය අඩු කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දිනයේ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත් පිළිබඳව තමයි සාකච්ඡා කරන්නේ. මෙම පනත් සංශෝධන ගෙන එන්නේ මහ මුහුදේ අන්තරායදායක ඖෂධ ජාවාරම් තහනම් කිරීමේ අරමුණ ඇතිවයි.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම, ප්‍රවාහනය, පරිහරණය, නිෂ්පාදනය මහ මුහුදේ සහ ඒ අවට රටවල් සම්බන්ධ වෙලා කරන ලද කටයුතු අපේ රටට ඇතුළු වීම සම්බන්ධව විශේෂයෙන් අදහස් පළ කළා. මොහොතකට කලින් ඒ සම්බන්ධව අපේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා සඳහන් කළා, අපේ ජාතික ජන බලවේගයේ පුත්තලම දිස්ත්‍රික්කයේ සිටින මන්ත්‍රීවරුනුත් ඒවාට සම්බන්ධ අයවලුන් සමඟ සම්බන්ධතා පවත්වනවා කියලා. එහෙම කොහෙත්ම නැහැ කියලා අපි ඉතාම කෙළින් කියනවා. එහෙම තිබෙනවා නම් ඒ තොරතුරු අපිට ලබා දෙන්න. OIC කෙනෙක් සම්බන්ධවවත් මීට කලින් දැන්වුවා. ඒ සම්බන්ධව අපි මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් කටයුතු කළා. ඒ නිසා නිවැරදි තොරතුරු ලබා දෙන්න. ඒ වාගේම තමයි මහ මුහුදේ - සමුද්‍රයේ - සුවිශේෂී ආර්ථික කලාපයෙන් එහා, මහ මුහුදේ - high seasවල - තමයි මේ අකටයුතුකම් සිද්ධ වෙන්නේ; මේ මත්ද්‍රව්‍ය ජාවාරම, ඒවා හුවමාරු වීම් සිදු වෙන්නේ. සමුද්‍රයේ ආරක්ෂාවේ වගකීම අධිකරණ බලය අප රජය සතුව තිබෙනවා. ඒ නිසා අපේ රටේ ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව, ස්වෛරීත්වය පවත්වාගෙන යන්න මේ සමුද්‍රයේ -මහ මුහුදේ- තිබෙන ආරක්ෂිතභාවය බෙහෙවින් ඉවහල් වෙනවා. ඒ නිසා මේ මහ මුහුදේ විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ප්‍රවාහනය, බෙදා හැරීම, ජාවාරම් කිරීම, ආනයනය කරලා අපනයනය කිරීම විශාල වශයෙන් සිද්ධ වෙන බවට අපට තොරතුරු ලැබිලා තිබෙනවා; වාර්තා වෙනවා.

ඒ අනුව අපේ නාවික හමුදාව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයත් සමඟ එකතුවෙලා පසුගිය කාලයේ මෙහෙයුම් කටයුතු රාශියක් කළා. නාවික හමුදාවට ඒ බලය ලැබෙන්නේ, ධීවර හා ජලජ සම්පත් පනතින්. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට බලය ලැබෙන්නේ, වෙරළ සංරක්ෂණ පනතින්. නාවික හමුදාව, නාවික විශේෂ දිගු දුර මෙහෙයුම්වලින් අපේ සුවිශේෂී ආර්ථික කලාපය ඇතුළත - මහ මුහුදේ නොවෙයි - මත්ද්‍රව්‍ය නාශක කටයුතු කරන අනෙකුත් රටවල් සමඟ එකතු වෙලා තොරතුරු හුවමාරු කරගෙන මෙහෙයුම් රාශියක් මේ වෙනකොට කර තිබෙනවා. ඒ වාගේම අත්අඩංගුවට ගැනීම් කර තිබෙනවා. ඒ සම්බන්ධව අපි මාධ්‍යයට තොරතුරු නිකුත් කර තිබෙනවා.

ඒ අත්අඩංගුවට ගන්නා පුද්ගලයන් ගැන කිව්වොත්, විශේෂයෙන් ධීවර කටයුතු සඳහා බෝට්ටු, ට්‍රෝලර්, බහුදින යාත්‍රා ඇත මහ මුහුදේ යනවා. නමුත් ධීවර කටයුතුවලට කියලා ඈත මහ මුහුදට ගියත් ඔවුන් සම්බන්ධ වෙන්නේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට, හුවමාරු කරගැනීමට, එහෙම නැත්නම් ඒවා මේ රට තුළට ගෙන ඒමට. ඒ තුළින් අපට මහා විශාල ව්‍යසනයක් සිද්ධ වෙනවා. ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඉන්නවා. අපේ ධීවරයාත් මේ රටේ සිටින සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ කිට්ටු සම්බන්ධතා පවත්වා ඒ කණ්ඩායම් සමඟ කටයුතු කරනවා. නාවික හමුදාව ජාත්‍යන්තර ආයතන හා එක්ව මනා සම්බන්ධීකරණයෙන් සහ අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කර ඉතාම සාර්ථකව මෙහෙයුම් කටයුතු කර තිබෙනවා. පසුගිය අවුරුද්ද තුළ නාවික හමුදාව, පොලීසිය සහ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් 2025/2026 වර්ෂයට අදාළව මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; මත්පෙති, හෂීස්, හෙරොයින්, කේරළ ගංජා ආදී වශයෙන් විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒවා ප්‍රවාහනය කරපු බහුදින යාත්‍රාත් අත්අඩංගුවට ගෙන තිබෙනවා. අත්අඩංගුවට ගත් බහුදින යාත්‍රා ප්‍රමාණයක් තිබෙනවා. 2019 ඉඳලා 2025 දක්වා ගත්තාම බහුදින යාත්‍රා 29ක් හා කුඩා යාත්‍රා 450කටත් වඩා වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. විශේෂයෙන්ම දැනට පවතින අපේ නීතිවල තිබෙන අඩුපාඩුකම් නිසා ඔවුන්ට ඉක්මනින් දඬුවම් දීමේ අපහසුතාවක් තිබෙනවා. වෙනත් රටවල් එක්ක සම්බන්ධ වෙලා මහ මුහුදේ විෂ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම, ඒවා නිෂ්පාදනය කිරීම වැනි කටයුතු කිරීමේදී ඔවුන් අත්අඩංගුවට ගත්තාට පසු ඔවුන්ට විරුද්ධව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා තමයි අපි මේ පනත් කෙටුම්පත් සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියානු සාගරයේ මුහුදු මාර්ගවල පවතින ඒ කාර්ය බහුලත්වය හමුවේ අපේ සමුද්‍රයේ ආරක්ෂාව කෙරෙහි අපි ප්‍රමුඛත්වයක් ලබා දීලා තිබෙනවා, විශේෂයෙන්ම සමුද්‍රීය ආරක්ෂාව වෙනුවෙන්, අපේ ජාතික ආර්ථිකය වෙනුවෙන් සහ ජාතික ආරක්ෂාව වෙනුවෙන්. සමුද්‍රීය ආරක්ෂාවයි, කලාපීය ආරක්ෂාවයි එකට බද්ධ වෙච්ච දෙයක්. ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් විසින් නැගෙනහිර ඉන්දියානු සාගර කලාපය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම් බහුල වශයෙන් සිද්ධ කරනවා කියලා අපි දන්නවා. අපට ලැබෙන තොරතුරු අනුව, විශේෂයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ මෙහෙයුම් හා බුද්ධි අංශ වාර්තා අනුව අපට දැනගන්න ලැබී තිබෙන්නේ, බටහිර ආසියාවේ රටවල නිෂ්පාදනය කරන අබිං -

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

opium - ආශ්‍රිත මත්ද්‍රව්‍ය ඒ රටවලින් ලෝකයට බෙදා හැරීම වැඩි වශයෙන් සිද්ධ වෙන බවයි. ඒ නිසා බටහිර ආසියාවේ සමහර වෙරළ තීරවලින් ප්‍රවාහනය කරන මත්ද්‍රව්‍ය අපේ දකුණු මුහුදු තීරයට එනවා. ඒවා සාක්ෂි සමඟ පසුගිය කාල වකවානුවල අපි අත්අඩංගුවට ගත්තා. දකුණු මුහුදු තීරයේ සිටින අපේ ධීවරයන් ඒ මත්ද්‍රව්‍ය රටට රැගෙන එද්දී නාවික හමුදාවෙන් අත්අඩංගුවට ගත් සිද්ධි රාශියක් අපි පසුගිය කාලයේ දැක්කා. උතුරු මුහුදු තීරයේත් එහෙමයි. මන්නාරම, කන්කසන්තුරේ, යාපනය, මුලතිව් මුහුදු තීරයේත් කේරළ ගංජා, අයිස්, හෙරොයින් වැනි විෂ මත්ද්‍රව්‍ය පෙති වර්ග බහුලව ගොඩබාන බව අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම කල්පිටිය, මීගමු මුහුදු තීරයේත් මේ කටයුතු සිද්ධ වෙනවා. මේ ඔක්කෝම සිද්ධ වෙන්නේ ලංකා මුහුදු තීරයේ. මහ මුහුදේ අර ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් එක්ක ඒ රටවලට සම්බන්ධ වෙලා අපේ ජාවාරම්කරුවන් විසින් ඒ කටයුතු කරනවා. විශේෂයෙන්ම මේ ගෙන එන නීති ප්‍රතිපාදන තවත් තීව්‍ර කිරීමෙන්, විධිමත් කිරීමෙන්, දැඩි කිරීමෙන් මත්ද්‍රව්‍ය උවදුර නිසා අපේ රටට ඇතිව තිබෙන ව්‍යසනවලින් අපට නිදහස් වෙන්න පුළුවන් කියන ලොකු විශ්වාසයක් අපට තිබෙනවා. ඒ නිසා තමයි මේ නීති ප්‍රතිපාදන ගෙනෙන්නේ. ධීවර රැකියාව කරන මුවාවෙන් තමයි මේ මත්ද්‍රව්‍ය ජාවාරම් ගොඩක් සිද්ධ වෙන්නේ. මේ අත්අඩංගුවට ගන්න බහු දින ධීවර යාත්‍රා බොහොමයක හිමිකාරිත්වය ඒ යාත්‍රාවේ නියමුවන් වෙත දීලා තිබෙන්නේ ඇටෝර්නි බලයෙන්. ඒ යාත්‍රා හිමිකරු විසින් ඒ බලය පැවරුවාම, ඒ යාත්‍රා හිමිකරුට එරෙහිව දැඩි නීති ක්‍රියාත්මක කරන්න, එහෙම නැත්නම් දඬුවම් කරන්න, නීති මාර්ගයට යන්න ලොකු ගැටලු පවතිනවා කියලා අපට නාවික හමුදාවෙනුත් වාර්තා කරනවා. එතකොට, ඒකත් ලොකු ප්‍රශ්නයක්.

ඒ වාගේම තව විශේෂ දෙයක් තිබෙනවා. මේ බහුදින යාත්‍රාවල තිබෙනවා, Vessel Monitoring System එකක්, එහෙම නැත්නම් යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක්. ඒක හැම බහු දින ධීවර යාත්‍රාවක්ම මහ මුහුදට යද්දී සවි කරගෙන යා යුතුයි. නමුත් මහ මුහුදට ගියාට පස්සේ, අපේ සුවිශේෂී ආර්ථික කලාපයෙන් පිටට ගියාට පස්සේ ඔවුන් ඒක off කරනවා. එතකොට අපේ රේඩාර් පද්ධතියෙන් ඒවා ඉවත් වෙනවා. ඉතින් මහ මුහුදට ගියාට පස්සේ, වෙනත් රටවල සුවිශේෂී ආර්ථික කලාපවලට ගිහිල්ලා වෙනත් රටවල ජාවාරම්කරුවන් එක්ක හරි පහසුවෙන් මේ කටයුතු කරන්න පුළුවන් වනවා. ඒ නිසා මේ නීති ප්‍රතිපාදන ඇති කිරීම හරහා, මත්ද්‍රව්‍ය අරගෙන අපේ මුහුදු සීමාවට පැමිණෙන කොට ඒවා අත්අඩංගුවට ගන්න අපේ නාවික හමුදාවට පහසු වෙනවා. අපි එම නීති ක්‍රියාදාමය තවත් දැඩි කරමින්, ඔවුන් නීතියේ රැහැනට හසු කර ගනිමින් දඬුවම් දීම නිසා, එහෙම දේවල් කරන්න තවත් කවුරු හරි උත්සාහ කරනවා නම් ඔවුන්ට ඒ සඳහා භීතියක් ඇති වෙනවා. ඒ තුළින් එවැනි කටයුතුවලින් වැළකී සිටීමට අපි ඔවුන්ට හොඳ පණිවුඩයකුත් දෙනවා.

ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධ වෙලා සිටින බහු දින ධීවර යාත්‍රා නාවික හමුදාවෙන් අත්අඩංගුවට ගන්න අවස්ථාවල ඒ සමහර යාත්‍රාවල ධීවර ආම්පන්න නැහැ. ඔවුන් ධීවර කටයුතුවලට කියලා තමයි යන්නේ. නමුත් ධීවර ආම්පන්න නැහැ. ඒ වාගේම "ඔව්, අපි මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ වෙලා තමයි මේ එන්නේ" කියලා ඔවුනුත් පිළිගන්නවා. නමුත් ඒවාට ක්‍රියාත්මක වෙන්න අපට තිබෙන නීති ප්‍රතිපාදන මදි. පසුගිය කාලයේ මමත් දැක්කා, මත්ද්‍රව්‍ය ජාවාරම්වල නිරත වෙලා අහුවෙච්ච අය ඒ මත්ද්‍රව්‍යත් සමඟ දික්ඕවිට වරායට, තංගල්ල වරායට ගෙනාවාට පසුව, රස පරීක්ෂක කටයුතු කරලා ඒ බව සහතික කළාට පසුව වුණත් ඔවුන්ට ඒ ගැන කිසිම ගාණක් තිබුණේ නැති බව. මොකද, සමහර වෙලාවට තුන් හතර සැරේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට අහුවෙච්ච අය එතැන ඉන්නවා. එහෙම අහුවෙලා උසාවියට දැම්මත් ඔවුන්ට නිදහස ලැබෙනවා. ඒ නිසා නැවතත් ඒ විධියටම කටයුතු කරන්න ඔවුන් පෙලඹෙනවා. ඒ නිසා අපට මේ තිබෙන නීති ප්‍රතිපාදන ඉතාම මදි. ඒ නිසා තමයි මේ විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙවරක් හැටියට ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි සහ සංකල්පයක් හැටියට, අපේ ජාතික ප්‍රතිපත්තිය හැටියට, අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය හැටියට "රටම එකට" කියන ඒ වැඩසටහන යටතේ විශේෂයෙන් ඒ කටයුතු තීව්‍ර කරන්න කටයුතු කර තිබෙන්නේ.

මේ රටින්, මේ නිජ බිමෙන් මත්ද්‍රව්‍ය තුරන් කරන්නත් අපි මූලික වෙලා වගකීමෙන් කටයුතු කරනවා. ඒක නිසා මේ මාර්තු මාසය වෙනකොට අත්අඩංගුවට ගන්නා විෂ මත්ද්‍රව්‍ය ඒ අවස්ථාවේම විනාශ කරන්න හැකි වන පරිදි නීති ගේන්න නැවතත් කටයුතු කරනවා. එතකොට මේ නීති ප්‍රතිපාදනත්, මේ සංශෝධනත් ඒකට විශේෂ පිටුවහලක් වෙනවා. මොකද, විෂ මත්ද්‍රව්‍ය තොගයක් අත්අඩංගුවට ගත්තාට පස්සේ ඒවා උසාවියට ඉදිරිපත් කරලා ඒවා විනාශ කරන්න සෑහෙන කාලයක් ඉන්න ඕනෑ. ඒ නිසා එතැනට මහෙස්ත්‍රාත්වරයෙක් කැඳවලා පරීක්ෂණ පවත්වලා, රස පරීක්ෂකවරයා ගෙනැල්ලා ඒ සාම්පලයක් අරගෙන ඉතිරි මත්ද්‍රව්‍ය විනාශ කරන්න පුළුවන් වන විධියේ ප්‍රතිපාදන ඉස්සරහට ගේනවා. ඒ වාගේම මේ නීති ප්‍රතිපාදන නැවතත් සංශෝධනය කිරීම අපේ ජාතික ආරක්ෂාවටත්, අපේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනටත් විශේෂ පිටුවහලක් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.40]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. දැන් ආණ්ඩුවට වසරක් ගිහිල්ලා. Clean Sri Lanka වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය උවදුර මේ රටින් තුරන් කරනවා කියපු ආණ්ඩුව දැන් තමයි අවශ්‍ය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. දැන් හරි මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙන ඒම ගැන අපි සතුටු වෙනවා. අපේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, ලබන අවුරුද්ද වෙනකොට අපට ආයේ ඔබතුමන්ලාගේ උත්තර ඕනෑ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් අමතරව ලැබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

2026 වසරේදී මෙය තුරන් කරන්න ඔබතුමන්ලාට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරනවා. හැබැයි, අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, 2027 වසරේදී බංකුවක් අරගෙන ඇවිල්ලා ඔබතුමාගේ දේශන අහන්න.

අධිකරණ සංවිධාන(සංශෝධන) පනත් කෙටුම්පත අධිකරණයට සම්බන්ධ නිසා මම අධිකරණය ගැනත් පොඩ්ඩක් කියන්න ඕනෑ. අපි දන්නවා, අපේ බන්ධනාගාරවල තිබෙන විශාල තදබදය ගැන. බන්ධනාගාරවල තිබෙන විශාල තදබදයට හේතු වුණු අපේ බන්ධනාගාරවල සිටින රැඳවියන් යම් යම් දින පිළිබඳව බලාපොරොත්තු සහගතව ඉන්නවා. බන්ධනාගාරගත වූවන්ගෙන් විශාල පිරිසක් එළියට යන එක දිනයක් තමයි, නත්තල් දිනය. පසුගිය නත්තල් දිනයේ ඒ එක පුද්ගලයෙකුටවත් නිදහස ලැබුණේ නැහැ. නිදහස ලැබෙන අය විතරක් නොවෙයි, ඇතුළේ තදබදයට ලක් වී සිටින අනෙක් සිරකරුවෝත් බලාගෙන ඉන්නවා, අනේ 50ක්, 60, 100ක් විතර, සාමාන්‍යයෙන් රටේම සිර ගෙවල්වලින් 1,000ක් විතර එළියට යනවා, එතකොට ඔවුන්ට යම් කිසි හෝ පහසුවක් ලැබෙයි කියලා. අඩුම ගණනේ නත්තල් දවසේ නිශ්චිත පිරිසකටවත් නිදහස දෙන්න ඔබතුමන්ලාට බැරි වුණා. නමුත් සාමාන්‍යයෙන් ඒක සාම්ප්‍රදායිකව සිදු වන දෙයක්. අපි දන්නවා, නිදහස් දවසේත් බොහොම සුළු පිරිසකට නිදහස දෙන්න තමයි මේ ආණ්ඩුවට පුළුවන් වුණේ කියලා. ඒකට හේතුව වෙන කිසිවක් නොවෙයි, අකාර්යක්ෂමතාව. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න නිලධාරින්ට තිබුණු හයියත් පසුගිය කාලයේ නැති කරලා දැම්මා. ඒ අකාර්යක්ෂමතාව තමයි ඒකට හේතු වුණේ.

ඒ වාගේම මේ දවස්වල රටේ තවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, ගෑස් ප්‍රශ්නය. ගෑස් ප්‍රශ්නය තමයි ආණ්ඩු පෙරළෙන්නත් හේතු වුණේ. අපට මතකයි, කොවිඩ් කාලයේ හරියට ගෑස් supply කර ගන්න බැරි වුණු එක විශාල ප්‍රශ්නයක් බවට පත් වුණා. ඩොලර් නැති හින්දා හෝ වෙනත් මොකක් හෝ හින්දා එදා gas supply කර ගන්න බැරි වුණා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අදත් ගෑස්වල ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි වර්තමාන රජය තෝරා ගනු ලැබූ සැපයුම්කරුට ප්‍රමාණවත් supply එකක් ලබා දීමට නොහැකි වීම. ඔවුන්ට තිබෙන නැව් පහසුකම් ඇතුළු logistics පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා දෛනිකව සහ මාසිකව අපට අවශ්‍ය ගෑස් ප්‍රමාණය supply කරන්න ඔවුන්ට නොහැකි වෙලා තිබෙනවා. මොකද, 90 දශකයේ Shell Company එකෙන් හදපු storage tanks ටික තමයි තවම අපට තිබෙන්නේ. ඒ බෝයාවේ සහ ඒ ටැංකිවල තිබෙන capacity එකත් එක්ක අපට එක මාසයකට අඩුම ගණනේ මෙට්‍රික් ටොන් 10,000ක් 12,000ක් සහිත නැව් 4ක්, 5ක් ගේන්න ඕනෑ. ඉතින්, ඒ supply එකවත් දෙන්න බැරි supplier කෙනෙකුට මේ ටෙන්ඩරය ලබා දුන් නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. මොකද, අපේ රටට විශාල නැව්වලට එන්න බැහැ, විශාල gas tankersවලට එන්න බැහැ. එන්න පුළුවන් ධාරිතාවක් සහිත - capacity එකක් සහිත - නැව් ගේන්න පුළුවන් සමාගමකට මේ ටෙන්ඩරය දෙන්නේ නැතුව තමන්ට හිතවත් නිසා හෝ මොකක් හරි හේතුවක් නිසා හෝ වෙනත් සමාගමකට ටෙන්ඩරය ලබා දුන් නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ඔවුන්ගේ මිල පිළිබඳවත් හොයලා බලන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මිලේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ, මහත්තයෝ. මිලේ වෙනස ඩොලර් ශත 15යි. හැබැයි, ඩොලර් ශත 15 ගැන බලලා, සුදුසුකමක් නැති සමාගමකට ටෙන්ඩර් දුන්නාම ඔහොම වෙනවා. මිල ගණන් ගැන කියලා තමයි ඔබතුමන්ලා බාල ගල්අඟුරු ගෙනැල්ලා නොරොච්චෝලේත් ප්‍රශ්නයක් ඇති කරගෙන තිබෙන්නේ. ඒ නිසා ගණන විතරක් නොවෙයි බලන්න ඕනෑ, වටගල මහත්තයා. තාක්ෂණික කාරණා සහ ඒ සමාගමට ඒ supply එක කරන්න පුළුවන්ද කියලා ඔවුන්ගේ අතීත සුදුසුකම් බලන්නත් ඕනෑ. ගණන විතරක් බලලා හරියන්නේ නැහැ. පුවක් ගන්නවා, බුලත් ගන්නවා වාගේ කරන්න බැහැ, gas supply කරන එක. ගණනත් බලන්න ඕනෑ තමයි. හැබැයි, ඩොලර් ශත 15ක වෙනසට ඒ capacity එක නැති සමාගමකට මේ ටෙන්ඩරය ලබා දුන් නිසා තමයි දැන් මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* බලන්නකෝ, දැන් ගෑස් supply එක තිබෙනවාද කියලා. ඒ supply එක නැති නිසා තමයි අද ගෑස් පෝලිම් ඇතිවෙලා තිබෙන්නේ. දවසකට අපේ රටේ අවශ්‍යතාව සඳහා කිලෝග්‍රෑම් 12.5 ගෑස් ටැංකි ලක්ෂයක් ඕනෑ. අපේ රටේ ජනතාවගෙන් සියයට 65ක් අද ගෑස් පාවිච්චි කරනවා. මේකට කෑ ගහලා හරියන්නේ නැහැ. ගිහිල්ලා හොයලා බලන්න, මොකක්ද වෙන්නේ කියලා. ඔය විධියට කෑ ගහලා තමයි අන්තිමට පොහොට්ටුවේ අයටත් ගුටි කාලා ගෙදර යන්න වුණේ. මේක බරපතළ අර්බුදයක් කරා යන්න ඉස්සෙල්ලා විසඳන්න පුළුවන් විධියක් පිළිබඳව සොයා බලන්න. ඒ සමාගමේ ප්‍රශ්නයක් නිසා තමයි අවශ්‍ය supply එක නැත්තේ. ඒ නිසා තමයි ඔබතුමන්ලාත් supply එක ටික ටික අඩු කරලා වෙළෙඳ පොළට අඩුවෙන් ගෑස් නිදහස් කරන්නේ.

මහ ලොකුවට කෑ ගහන්න ඕනෑ නැහැ, Litro Gas Lanka Limited එක රජයට ගන්නකෝ. ඔබතුමන්ලාගේ දේශපාලන ව්‍යාපාරයේ ප්‍රතිපත්තිවල ඒවා නේ තිබුණේ. රජය සතු සමාගම් ගැන නේ කථා කළේ. කරුණාකරලා ගිහිල්ලා Litro එක රජයට ගන්නකෝ. ඒකේ කොටස් අරගෙන රජයෙන් operate කරන්නකෝ. ධම්මික පෙරේරා මහත්මයා Laugfs Holdings Limited එක ගත්තා වාගේ ඔබතුමන්ලා Litro එක රජයට ගන්නකෝ. ඒවා නේ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිවල තිබුණේ. ඒකයි කරන්න ඕනෑ. එහෙම නැතුව මෙතැනට ඇවිල්ලා කෑ ගහලා වැඩක් නැහැ. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. වහාම ඒ ප්‍රශ්නයට උත්තර සොයන්න. එහෙම නැතුව මෙතැනට ඇවිල්ලා කෑ ගහලා වැඩක් නැහැ. ඔබතුමන්ලා නුසුදුසු සමාගමක් තෝරාගෙන, ඒ අයට නිසි supply එක දෙන්න බැරි වීම තමයි අද තිබෙන ගෑස් හිඟයට හේතුව වෙලා තිබෙන්නේ. තව ටික දවසක් යනකොට මේ ප්‍රශ්නය වැඩි වෙන්න පුළුවන්. අපි දන්නවානේ, අපේ රටේ ජනතාවත් panic වෙනවා. Panic වුණාම ගිහිල්ලා ගෑස් ටැංකි දෙකක්ම අරගෙන එනවා. එහෙම වුණාම තමයි මේ අර්බුදය තවත් ඔඩුදුවන්නේ. අදට අවශ්‍ය ගෑස් ටැංකි ලක්ෂය වෙළෙඳ පොළට අදම යවාගන්න බැරි වුණොත්, හෙට වනකොට ලක්ෂ දෙකක් වෙළෙඳ පොළට යවන්න වනවා. එතැනින් තමයි අර්බුදය ගොඩනැඟෙන්නේ. මිනිස්සුන්ට ඒ අර්බුදය දැනෙනකොට ඔවුන්ගේ ගෑස් stock එක තව වැඩි කරනවා. එතකොට මේ ප්‍රශ්නය තවත් ඔඩුදුවනවා. එම නිසා මේකට කෑ ගහලා, හිනාවෙලා වැඩක් නැහැ. මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න. නැවත වතාවක් 2022දී ඇති වුණා වාගේ ප්‍රශ්නයක් ඇති වෙන්න කියලා මා කියනවා නොවෙයි. නමුත්, ප්‍රශ්නය හඳුනා ගත් ගමන් ඒකට උත්තරයක් හොයන්න කටයුතු කරනවා වෙනුවට, නිකම් පැලැස්තර දාලා, සිල්ලර විසඳුම් දීලා, එහෙම නැත්නම් මොකක් හෝ කථා කරලා හරියන්නේ නැහැ. එම නිසා බරපතළ ප්‍රශ්නයක් වෙන්න ඉස්සෙල්ලා මේක විසඳන්න. මොකද, අද අපේ රටේ ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩයක් තමයි ගෑස්. 90 දශකයේ ලංකාවේ ගෑස් කොම්පැනිය හදනකොට, Shell Gas Lanka Limited එක එනකොට සියයට 4යි, 5යි ගෑස් පාවිච්චි කළේ. හැබැයි, අද ඒක සියයට 65කට වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන් නාගරික ප්‍රදේශවල ජනතාව සහ ව්‍යාපාර කරන ජනතාව වැඩි වශයෙන් ගෑස් පාවිච්චි කරනවා. මම ගෑස් ටැංකි ලක්ෂයක් ගැන කිව්වේ industrial gas හැර.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගැස් නැහැ, පෝලිම් තිබෙනවා, බෝඩ් එල්ලාගෙන ඉන්නවා කියලා රූපවාහිනී නාළිකාවල ප්‍රචාරය කරන එක වැරදියි කිය කියා රූපවාහිනී නාළිකාවලට බණින එක නොවෙයි වෙන්න ඕනෑ. රූපවාහිනී නාළිකා කරන්නේ ජනතාවට පුළුවන් තරම් ප්‍රවෘත්ති පෙන්වන එකයි. ඒක නොවෙයි, වැරැද්ද. ප්‍රශ්නය හඳුනාගෙන ඒකට විසඳුමක් හොයන්න පුළුවන් වුණොත් හොඳයි.

අවසාන වශයෙන් මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා සහකාර ප්‍රදේශීය ලේකම්වරුන්ගේ සංගමයෙන් ගරු ලාල් කාන්ත ඇමතිතුමාට ලියුමක් යවා තිබෙනවා, "ඉඩම් රාජකාරි දේශපාලන මැදිහත්වීමෙන් තොරව ඉටු කිරීම සම්බන්ධයෙනි" යන මාතෘකාව යටතේ. ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු වන රුක්මල් ජයවීර බලපෑම් කරනවා කියලා එහි කියා තිබෙනවා. ඒ ගැන ටිකක් හොයා බලන්න කියමින් මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි, මට අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද සාකච්ඡා කරන්නේ අධිකරණ සංවිධාන පනතට සහ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනතට ඉදිරිපත් කර තිබෙන සංශෝධන දෙක පිළිබඳවයි. ශ්‍රී ලංකාවට අයිති මුහුදු ප්‍රදේශයේත්, ඒ වාගේම ජාත්‍යන්තර මුහුදේත් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් -නිෂ්පාදනය කිරීම්, බෙදා හැරීම් සම්බන්ධ වැටලීම්- සඳහා අවශ්‍ය නව නීති මේ සංශෝධන මඟින් ඉදිරිපත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක් විධියට "රටම එකට" වැඩ පිළිවෙළත් එක්ක මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන් දීර්ඝ කාලීන ස්ථිර විසඳුමක් කරා යනකොට ලෝකයේ මත්ද්‍රව්‍ය පිළිබඳ ඉතිහාසය -මත්වීමේ ආශාවේ ඉතිහාසය පිළිබඳව- අධ්‍යයනය කිරීම වැදගත් කියලා මම හිතනවා. ඇත්තවශයෙන්ම මත්ද්‍රව්‍ය සහ මත්වීමේ ආශාව වසර 5,000කිනුත් එහාට යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ සහ දකුණු ඇමෙරිකාවේ opium, coca leaves ඖෂධයක් වශයෙන් භාවිත වීම දීර්ඝ කාලීනව සිද්ධ වෙලා තිබෙනවා. නමුත් විසිවැනි සියවසේ තමයි මේ මත්ද්‍රව්‍ය ජාලය ව්‍යාපාරයක් විධියට ව්‍යාප්ත වෙන්න පටන් ගන්නේ. විසිවන සියවසට කලින් 1839, 1860 කාලයේ බ්‍රිතාන්‍යය විසින් චීනයට අබිං යැවීම හරහා යුදමය තත්ත්වයක් - Opium War එක - නිර්මාණය වුණා. මීට පෙර කථා කළ අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා, Golden Triangle, Golden Crescent වැනි මත්ද්‍රව්‍ය ජාල නිර්මාණය වීම ගැන. දැන් මම අහගෙන හිටියා විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, 2027 වර්ෂය වනකොට මේක සහමුලින්ම නැති කරාවි කියලා බලාපොරොත්තු වන බව. මේක සංකීර්ණ ප්‍රශ්නයක්. ඇයි, අපි මේක සංකීර්ණ ප්‍රශ්නයක් කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙලාවේ මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ වැඩ පිළිවෙළක් ගෙනැත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රාජ්‍යයක් විධියට අපි මැදිහත් වන ප්‍රමාණයක් සහ ඊට මැදිහත් වන ප්‍රාග්ධනයක් තිබෙනවා. අපි තේරුම් ගන්න ඕනෑ, මත්ද්‍රව්‍ය නිවාරණය, එහෙම නැත්නම් මත්ද්‍රව්‍යවලින් මිදීම සඳහා අපි වැය කරන ප්‍රාග්ධනයට සාපේක්ෂව කොයි තරම් දුරට මේකට මැදිහත් වෙලා තිබෙනවාද කියලා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, කොලොම්බියාවේ Medellin Cartel එක නිර්මාණය කළේ Pablo Escobar විසින්. ඔහු කොහොමද ඔහුගේ Medellin Cartel එක පවත්වාගෙන ගියේ? ඒ වාගේම දැනට ඇමෙරිකාවේ සිර දඬුවම් විඳින Joaquin Archivaldo Guzman Loera, “El Chapo”, විසින් මෙක්සිකෝවේ Sinaloa Cartel එක කොහොමද පවත්වා ගෙන ගියේ? ඔවුන්ගේ මත්ද්‍රව්‍ය ආර්ථිකය, මත්ද්‍රව්‍ය තුළ තිබුණු අපරාධ සංස්කෘතිය කොහොමද දේශපාලනයට බලපෑවේ, මත්ද්‍රව්‍යවලට අදාළ මුදල් දේශපාලනයට ආයෝජනය වුණේ කොහොමද, විමර්ශන ආයතනවලට මැදිහත් වුණේ කොහොමද, කොටින්ම අධිකරණවලට පවා මැදිහත් වුණේ කොහොමද කියන එක ලෝකය හදාරන්න අවශ්‍යයි, මේ සම්බන්ධයෙන් ස්ථිර විසඳුමක් කරා යනකොට. අපි දන්නවා, Pablo Escobar වරෙක ඒ රටේ අධිකරණ අමාත්‍යවරයා ඝාතනය කළ බව. ඒ වාගේම ජනාධිපති අපේක්ෂක Luis Carlos Galan Sarmiento ඝාතනය කළා. එවැනි තත්ත්වයක් තුළ අපේ රටේ භූගෝලීය පිහිටීම ගත්තාම - ඉන්දියන් සාගරය, බෙංගාල බොක්ක, මන්නාරම් බොක්ක, පෝක් සමුද්‍ර සන්ධිය යන සියල්ල එක්ක - අපේ රට ඉතාම වැදගත්, කේන්ද්‍රීය ස්ථානයක තමයි පිහිටා තිබෙන්නේ. අපේ සමුද්‍ර කලාපය ආසන්නයෙන් දෛනිකව විශාල නෞකා 200 -300 අතර ප්‍රමාණයකුත්, වාණිජ සහ ධීවර යාත්‍රා 30-60 අතර ප්‍රමාණයකුත්, ලෝක වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහන නෞකාවලින් සියයට 60ක පමණ ප්‍රමාණයකුත්, තෙල් ප්‍රවාහනයට සම්බන්ධ නෞකාවලින් සියයට 40ක ප්‍රමාණයකුත් ගමන් කරනවා. ලෝක වෙළෙඳ කලාපය එක්ක අපේ රට බැඳිලා තිබෙන ප්‍රමාණය අනුව මේ ප්‍රශ්නය හුදකලාව විසඳන්න පුළුවන් තැනක නොවෙයි මේ රට තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ ගෙනෙන සංශෝධන පනත තුළින් තමයි සමුද්‍ර කලාපය තුළ මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකරණ බලය ස්ථාපිත කිරීම හරහා ස්වෛරීත්වය නැවත පිහිටුවා ගන්නේ, අපි දීර්ඝ කාලයක සිට නිදහස ලබා ගත්තාය කිව්වාට. අපේ මුහුදු කලාපයේවත්, අපට ආසන්නව තිබෙන ජාත්‍යන්තර මුහුදු කලාපයේවත් වැටලීම් කරන්න, ඒ නිෂ්පාදන සම්බන්ධ වැටලීම් කරන්න නෛතික හැකියාවක් අපේ රටට තිබුණේ නැහැ. ඒ නිසා මේ සංශෝධනය ඒ අර්ථයෙන් ගත්තාම ඉතාම වැදගත් සංශෝධනයක් කියන එක මේ මොහොතේදී මම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක මත්ද්‍රව්‍ය පිටුදැකීම කියන කාරණය යථාර්ථයක් කර ගන්න යනකොට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන්න තිබෙනවා. එයින් එක

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ක්‍රියාමාර්ගයක් තමයි, විශේෂයෙන්ම පුනරුත්ථාපන ක්‍රියාවලිය. මනෝ උපදේශනය පාවිච්චි කරලා වඩාත් විද්‍යාත්මක පුනරුත්ථාපන ක්‍රියාවලියකට අපි යා යුතුව තිබෙනවා. ජාතික ජන බලවේගය රජය ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. ඒ වාගේම, මහජනතාව මේ පිළිබඳව දැනුවත් කරන්නේ, public awareness ඇති කරන්නේ කොහොමද? මත්ද්‍රව්‍යවලින් සිදු වන බලපෑම මොකක්ද කියලා මේ රටේ සමස්ත ජනතාව දැනුවත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන්වල අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වාගේම දැඩි නීති පැනවීමත් අවශ්‍යයි.

අපේ රටේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රමාණවත් නීති තිබෙනවා. නමුත්, ඒ නීති ක්‍රියාත්මක කිරීම සඳහා පරීක්ෂණ කරන ආයතන පසුගිය කාලයේදී කොයි තරම් ස්වාධීන වුණාද? අද නිරන්තරයෙන් කියනවා අපි දැක්කා, ගිහිල්ලා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බදා ගත්තේ කොහොමද කියලා. ඒක තමයි, මත්ද්‍රව්‍ය ධනය මේ රටේ දේශපාලනයට, මේ රටේ විමර්ශන ආයතනවලට මැදිහත් වුණු විධිය. ඒවා අවසන් කරන්න තමයි ජනතාව අපට ජන වරම ලබා දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ලෝකයේ මත්ද්‍රව්‍ය පිටුදැකීම සම්බන්ධ කාරණයේදී සාපරාධී බව අඩු කිරීම - decriminalization - සලකා බලන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. මොකද, ඇතැම් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සාපරාධී බව අඩු කිරීමේ සංකල්පය හඳුන්වා දී තිබෙන ඇතැම් රටවල් තිබෙනවා. විශේෂයෙන් පෘතුගාලය, ස්විට්සර්ලන්තය, ඇමෙරිකාව වාගේ රටවල් decriminalization කියන සංකල්පය හඳුන්වා දීලා තිබෙනවා, මත්ද්‍රව්‍ය භාවිතාව අඩු කිරීම සඳහා. ජාතික ජන බලවේගය රජය මේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම වෙළා ගත්ත, අපට මතු පිටින් පෙනෙනවාට වඩා ඉතාම සංකීර්ණ මත්ද්‍රව්‍ය කියන ගැටලුව විද්‍යාත්මකව, නෛතිකව විසඳා ගැනීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නවාය කියන එක මම අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා.

මට කථා කරන්න වේලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ அப்துல் வாசித் அவர்கள். உங்களுக்கு 6 நிமிடங்கள் உள்ளது.

[பி.ப. 3.56]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தில் பல்வேறு துறைகளில் தங்களது திறமைகளைக் காட்டியவர்கள் இருக்கின்றார்கள். அந்த வகையில், விளையாட்டுத் துறையில் பொத்துவில் பிரதேசத்தில் SSP Majeed அவர்கள் ரகர் விளையாட்டிலும், A.L.M. Ashraff அவர்கள் குறுந்தூர ஓட்டத்திலும் தமது திறமைகளைக் காட்டி வந்துள்ளார்கள். நாடளாவிய ரீதியில் மட்டுமன்றி, சர்வதேச ரீதியிலும் தமது திறமைகளை அவர்கள் நிரூபித்துள்ளார்கள். எமது ஊரில் உள்ள 40 விளையாட்டுக் கழகங்கள், 40 இளைஞர் கழகங்கள் ஆகியவற்றில் ஆயிரத்துக்கும் மேற்பட்ட இளைஞர், யுவதிகள் அங்கத்துவம் பெற்று, தமது திறமைகளைப் பிரதேச, மாவட்ட, மாகாண, தேசிய ரீதியில் நிரூபித்து வந்திருக்கின்றார்கள். ஆனால், அங்கு ஒரு தரமான விளையாட்டு மைதானம் இல்லாத குறை எமக்கு உள்ளது. எமது வீரர்கள் சிறிய சிறிய, பூரணத்துவம் இல்லாத மைதானங்களில் பயிற்சி பெற்று விளையாடி வருகின்றார்கள். வட்டிவெளி, களப்புக்கட்டு, சர்வோதயபுரம் போன்ற ஏதாவது ஒரு பிரிவில் நவீனரக விளையாட்டு மைதானம் ஒன்றினை அமைத்துத் தர கௌரவ அமைச்சர் அவர்கள் விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், இதுவரை பாவிக்கப்பட்டு வருகின்ற ஜலால்தீன் சதுக்கம், பசறிச்சேனை, கோமாரி போன்ற மைதானங்களைப் பூரணப்படுத்தித் தருவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும்.

மேலும், ஊரணி சரஸ்வதி வித்தியாலயம், கோமாரி MMTMV, செங்காமம் அல்-மினா வித்தியாலயம், முனவ்வரா வித்தியாலயம், நூரானியா வித்தியாலயம், அக்ஸா வித்தியாலயம், அல்-இஷ்ராக் வித்தியாலயம், அல்-அப்சான் வித்தியாலயம் ஆகியவற்றுக்கு மைதானங்களை அமைத்துத் தருவதுடன், இருக்கின்ற மைதானங்களைப் புனர்நிர்மாணம் செய்து தரவேண்டும். அத்துடன், பொத்துவிலில் ஒரு sports complexஐ அமைத்துத் தரவேண்டும். அவ்வாறு ஏற்படுத்துவதால் அப்பகுதியிலுள்ள இளைஞர், யுவதிகள் விளையாட்டுத் துறையில் பல முன்னேற்றங்களைக் காண முடியும் என்று நம்புகிறோம்.

மேலும், பொத்துவில் அல்-பஹ்ரியா வித்தியாலயத்தின் பழைய மாணவரும் தேசிய பாடசாலையான பொத்துவில் மத்திய கல்லூரியின் மாணவருமான எம்.ஏ. முன்சிப் இலங்கை தேசிய உதைபந்தாட்ட அணியின் under 20 பிரிவில் தெரிவு செய்யப்பட்டுள்ளதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன். இந்தச் சாதனை வீரரது எதிர்காலம் சிறந்து விளங்க வேண்டுமெனப் பிரார்த்திப்பதோடு, பயிற்சிகளை வழங்கிய PIL அவர்களுக்கும் இந்த வேளையில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

பொத்துவிலில் நாற்பதுக்கும் மேற்பட்ட இளைஞர் கழகங்களும் ஆயிரத்திற்கும் மேற்பட்ட இளைஞர், யுவதிகளும் இருப்பதனால், ஏனைய சுற்றுப்புற பிரதேசத்தை அடிப்படையாகக் கொண்டு அப்பகுதியில் Youth Vocational Training Centre ஒன்று அமைக்கப்படுதல் வேண்டும். இதனால் பல நூற்றுக்காணக்கான இளைஞர், யுவதிகள் நன்மை பெற முடியும். இளைஞர் கழக சம்மேளன தலைவர்களான பசீர்கான், இல்முடீன், இம்தியாஸ், நஃப்ராஸ், நௌபல், முஸ்தகீம், YSO பாருக், DYSO காதர், தாஜஹான் போன்றோருக்கும் இந்தச் சபையிலே நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். மேலும், சாய்ந்தமருது இளைஞர் பயிற்சி நிலையத்துக்குத் தேவையான laptop, photocopy machine, projector போன்றவற்றினை வழங்குவதன்மூலம் அப்பிராந்திய இளைஞர், யுவதிகள் சிறந்த பயிற்சிகளைப் பெற்று எதிர்காலத்தில் தொழில்வாய்ப்பைப் பெற முடியும்.

பொத்துவில் பிரதேச செயலகத்துக்கு ஒரு sports officer நியமிக்கப்பட வேண்டுமென பலமுறை இந்தச் சபையில் பேசியிருக்கிறோம். நிரந்தரமான ஓர் உத்தியோகத்தர் இல்லாமல் இருப்பதனால் அங்கு வீரர்களது திறமைகள் மழுங்கடிக்கப்படுகின்றது. இதனைத் தடுக்கும் வகையில் விரைவில் ஒரு sports officerஐ நியமிக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும்.

அண்மைக் காலமாகப் பொத்துவில் பிரதேச எல்லைக்குள் ஆயுர்வேத வைத்தியர்களால் நடமாடும் சுகாதார வைத்திய

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

சேவைகள் நடைபெறுகின்றன. அந்த வகையில், P16, P17 பிரிவுகளில் பேர்ள், அல்ராஜ், சனசமூக நிலையங்களின் உதவியுடன் நடைபெற்ற நடமாடும் சேவையில் கலந்து கொண்ட வைத்தியர்களான எம்.எச்.எப். பஸ்மியா, ஏ.எம்.எம். ஹம்சாத், எம்.எம். அமீர் அலி மற்றும் ஊழியர்களான மக்பூல், விஜயகுமாரன் ஆகியோருக்கும், ஐயூப்கான், நியாஸ், ரஹ்மதுல்லாஹ், நௌபீஸ் அஸ்மி ஆகியோருக்கும் இந்தச் சபையில் நன்றி தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

பொத்துவிலில் பெயர் பெற்று விளங்குகின்ற Al-Khaleej Ladies Arabic College, Al-Fatthah Jumma Mosque என்பவற்றை நடாத்த நிலத்தையும் கட்டிடங்களையும் வழங்கிய தனவந்தர் அல்ஹாஜ் ஏ.எல்.எம். காசீம் மௌலவி அவர்களுக்கு என்னுடைய பிரதேச மக்கள் சார்பாக இந்தச் சபையில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேபோன்று, பொத்துவில் முனீரா பள்ளிவாசலின் பெரும்பாலான கட்டிடப் பகுதிகளைப் பொதுமக்களது நிதி உதவியுடன் கட்டி முடிக்க உதவிய ஏ.பி. உதுமாலெப்பை, அப்துல் முனாப், ஹலீம் இஷாக், சுலைமான் லெப்பை போன்றோருக்கும் இந்தச் சபையிலே நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கரையோரப் பிரதேசங்களிலே தற்போது அறுவடை ஆரம்பிக்கப்பட்டுள்ளது. நெல்லை அரசானது PMB மூலம் கொள்வனவு செய்து வருகின்றது. காயவைத்த நெல்லை மாத்திரமே கொள்வனவு செய்கின்றார்கள். ஆனால், அண்மையில் பெய்த தொடர் மழை காரணமாக நெல்லைக் காயவைத்து உத்தரவாத விலைக்கு விற்க முடியாது விவசாயிகள் திண்டாடுகின்றனர். இந்தச் சூழலில் வெளி வியாபாரிகள் ஈரமான நெல்லை மிகக் குறைந்த விலைக்குக் கொள்வனவு செய்து, விவசாயிகளது பணத்தைச் சூறையாடுகின்றனர். எனவே, அரசானது இந்த நிலைமையிலுள்ள ஈர நெல்லை ஓர் உத்தரவாத விலைக்குக் கொள்வனவு செய்து விவசாயிகள் நட்டமடையாதவாறு பாதுகாக்க நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன். எமது பொத்துவில் பிரதேச விவசாயிகள் உட்பட பல்லாயிரக்கணக்கான எமது மாவட்ட, மாகாண விவசாயிகள் பாதிக்கப்பட்டுள்ளனர்.

2024.03.30ஆம் திகதியன்று கிழக்கு மாகாண சபையின் பொதுச்சேவை ஆணைக்குழுவினால் நடாத்தப்பட்ட Open Competitive Examination - Graduate Teachers SLTS-GR-III Provincial Schools - 2023 (2024) பரீட்சையில் சித்தியடைந்த 30 பேருக்கு 21.05.2024இல் நேர்முகப்பரீட்சைகள் நடந்த போதும், வெற்றிடங்கள் இல்லை என்றுகூறி இன்றுவரைக்கும் நியமனம் வழங்கப்படவில்லை. 2017/2018 ஆண்டுகளில் BSc - IT, Management முடித்த பொத்துவில் Fathima Ruztha, Nihma Banoo ஆகியோர் இதில் பாதிக்கப்பட்டுள்ளார்கள். இவர்களுக்கான வயதும் சென்றுகொண்டிருக்கும் நிலையில் கிழக்கு மாகாண பொதுச்சேவை ஆணைக்குழுமூலம் இந்த விடயத்தை விரைவாகச் செயற்படுத்த இந்த சபை நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, இது தொடர்பான ஆவணங்களைச் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2001.11.21 இல் திறந்து வைக்கப்பட்ட பொத்துவில் பிரதேச செயலக பஸ் 'டிப்போ' பல்வேறுபட்ட குறைபாடுகளுடன் காணப்பட்டாலும் மூவின மக்களுக்கும் சிறப்பான போக்குவரத்து வசதியை வழங்கி வந்தது. இந்தக் குறைபாடுகளைத் தீர்ப்பதற்காக 2023.11.19ஆம் திகதி சுமார் 60 மில்லியன் நிதி ஒதுக்கப்பட்டு, SDCC நிறுவனத்தின்மூலம் மேற்கொள்ளப்பட்ட கொந்தராத்து வேலைகள் அரைகுறையாக நிறுத்தப்பட்டுள்ளது. இவ்வேலைகளைத் தொடர்ந்து மேற்கொண்டு, பின்வரும் விடயங்களைச் செய்ய நடவடிக்கை எடுக்கப்பட வேண்டும்: சுற்றுமதில் அமைத்தல், தளம் அமைத்தல், நிரந்தரமான கட்டிடம் மற்றும் எரிபொருள் சேமிப்பகம் அமைத்தல், மேலும் 5 சாரதிகளை நியமித்தல், பொறியியல் ஊழியர்களை நியமித்தல். அத்துடன் அங்குள்ள காரியாலய உத்தியோகத்தர்களது குறைபாடுகளையும் தீர்த்துவைப்பதுடன், சுற்றுலாத் துறைக்குப் பெயர்போன அறுகம்பே பிரதேசத்திலிருந்து கண்டி, எல்லே போன்ற தூர இடங்களுக்குச் சேவைகளை வழங்கக்கூடிய வகையில் நவீன ரக பஸ் வண்டிகளைப் பெற்றுக்கொடுக்கவும் நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கான நேரம் முடிவடைகின்றது.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
30 செக்கன் தாருங்கள்!

பொத்துவில் பிரதேசத்தில் i-Road Project இல் அனுமதிக்கப்பட்ட 7 வீதிகளில், 3 வீதிகளின் வேலைகள் மட்டுமே தற்போது நடைபெறுகின்றது. ஏனைய 4 வீதிகள் உட்பட, I -Project இன்கீழ் உள்ள எல்லா வீதிகளையும், கடந்த அரசாங்கம் புனரமைக்க ஏற்பாடு செய்த P/7 - நூராணியா பள்ளி வீதி, P/9 - குண்டுமடு வீதி, P/18 - குடாகள்ளி வீதி, அப்சான் பாடசாலை வீதி, அல்-மினா பாடசாலை வீதி, P/26- JICA T-sunami வீதி ஆகியவற்றையும் செப்பனிட்டுத் தரவேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**(ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය නව ආණ්ඩුව බලයට පත්වීමත් සමඟ අපි ආර්ථික, දේශපාලන, සංස්කෘතික යන සෑම අංශයක්ම ශිෂ්ට සම්පන්න කිරීමේ සහ යහපත් කිරීමේ අරමුණින් පසුගිය කාලය පුරාම නොයෙකුත් අණ පනත් සම්මත කළා. අදත් අපි සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ, ඒ වාගේම වැදගත් පනත් කෙටුම්පත් දෙකක්. ඒ තමයි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි දන්නා විධියට මීට පෙර ඔය අයිස්, කොකේන්, හෙරොයින් වැනි විෂ මත්ද්‍රව්‍ය ප්‍රචලිත වෙලා තිබුණේ නගරාශ්‍රිත ප්‍රදේශවල. නමුත් පැවැති දේශපාලන අධිකාරිවල ආශීර්වාදය, රැකවරණය මැද්දේ ඒක ක්‍රම ක්‍රමයෙන් ඈත එපිට ගම්මානවලත්, පන්සල්, පල්ලි, රාජ්‍ය ආයතන වාගේ සෑම ස්ථානයකමත් ප්‍රචලිත වුණා. ඉතින් ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා පැවැති දේශපාලන අධිකාරිය අතර නොබිඳෙන සබඳතාවක් තිබුණු බව අප කාටත් නොරහසක්. ඒකට හොඳම උදාහරණයක් මම කියන්නම්. මේ මත්ද්‍රව්‍ය වැටලීම් කරන්න අදාළ අංශවලින් එවකට හිටපු දේශපාලන අධිකාරියේ මැති ඇමතිවරුන්ගේ නිවෙස්වලට ගිය අවස්ථාවලදී මේ රටේ ප්‍රධාන පුරවැසියා වොපර් එකෙන් ඔවුන්ගේ නිවෙස්වලට ගියා. එහෙම ගිහිල්ලා තමයි ඔවුන් ආරක්ෂා කළේ. මේ මත්ද්‍රව්‍ය හා දේශපාලන අධිකාරිය අතර තිබුණු බැඳීම කොච්චරක්ද කියලා ඒ තුළින් අපට හිතා ගන්න පුළුවන්.

කුඩා ගසක්ව තිබුණු මේ මත්ද්‍රව්‍ය ජාවාරම දැන් මහා රුක්ස ගසක් බවට පත් වෙලා අවසානයි. ඉතින් මේ මහා රුක්ස ගස කපලා ඉවත් කරන්න නම්, එය මුලිනුපුටා දමන්න නම්, අපි අනිවාර්යයෙන්ම මේ පවතින නීති රීති සංශෝධනය කළ යුතුයි, නව අණ පනත් සම්පාදනය කළ යුතුයි. ඒ සඳහා අපට වගකීමක් තිබෙනවා. අපි මහජනතාවට වුණු පොරොන්දුවක් තිබෙනවා. මේ මත් උවදුරෙන් ඔබේ දරුවා, ඔබේ ස්වාමියා රැක දෙනවාය කියලා අපි ඔවුන්ට වුණු පොරොන්දුවක් තිබෙනවා. ගෙදර ඉන්න තමන්ගේ දුව, පුතා, ස්වාමියා මේ මත්ද්‍රව්‍ය උවදුරට ලක් වුණාට පස්සේ ගෙදර ඉන්න කාන්තාව තමයි ඒකෙන් දැඩි ලෙස පීඩාවට පත් වෙන්නේ. ඉතින් ආණ්ඩුවක් විධියට අපි මේ මත්ද්‍රව්‍ය උවදුර දුරු කිරීමේ වගකීම භාර අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි "ඉවත් වෙනු" යන තේමාව යටතේ "රටම එකට" ජාතික ව්‍යාපාරය පසුගිය ඔක්තෝබර් 30වන දින අපි ආරම්භ කළේ. "මතින් තොර රටක් - සතුටින් පිරි හෙටක්" නිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන යටතේ, "ඉවත් වෙනු" තේමාව යටතේ "රටම එකට" ජාතික මෙහෙයුම පසුගිය ඔක්තෝබර් 30වැනි දා අපි ආරම්භ කළේ, අන්න ඒ පොරොන්දුව ඉෂ්ට කිරීම වෙනුවෙන්. එම වැඩසටහන තුළින් අපි අපේක්ෂා කරන කරුණු හතරක් තිබෙනවා. ඒ තමයි ජාවාරම්කරුවන් මර්දනය කිරීම හෝ හුදෙකලා කිරීම, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීම හා සමාජානුයෝජනය කිරීම, ජාතික දිස්ත්‍රික් හා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කිරීම හා "ඉවත් වෙනු" යන තේමාව ඔස්සේ පුළුල් ප්‍රචාරක ක්‍රියාවලියක් මඟින් සමාජයේ දැනුවත්භාවය ඇති කිරීම හා නීතිමය රාමුව ශක්තිමත් කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ "ඉවත් වෙනු" තේමාව යටතේ කරන ජාතික මෙහෙයුමට සමගාමීව දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන 1818 ක්ෂණික දුරකථන අංකයත් අපි හඳුන්වා දීලා තිබෙනවා. එමඟින් දිවයින පුරා මත්ද්‍රව්‍ය ජාවාරම්, බෙදා හැරීම් හෝ ඒ ආශ්‍රිතව සිදු වන ක්‍රියාකාරකම් පිළිබඳව නිවැරදි දත්ත, තොරතුරු ලබා දීමට මහජනතාවට හැකියාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "රටම එකට" ජාතික ව්‍යාපාරය ආරම්භ කර ඉතා කෙටි කාලයක් තුළ, එනම් 2025.10.30 දින සිට 2026.01.22 දින දක්වා කාලය තුළදී ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා එක්ව කරන ලද වැටලීම්වලින් අපි හෙරොයින් කිලෝ 320යි ග්‍රෑම් 741ක්, අයිස් කිලෝ 1,280යි ග්‍රෑම් 956ක්, කොකේන් කිලෝ 6යි ග්‍රෑම් 816ක්, ගංජා කිලෝ 2,341යි ග්‍රෑම් 523ක්, ගංජා පැළ 5,568,583ක්, කුෂ් කිලෝ 155ක් සහ හෂීස් කිලෝ 44ක් මේ වෙනකොට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසිය වැටලීම් 77,824ක් සිදු කරලා සැකකරුවන් 77,105ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න කැමැතියි. "දිට්වා" සුළි කුණාටුවෙන් මම ජීවත් වෙන දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය කලාපයේ ගම්මාන 5ක් ආපදාවට පත් වුණා. මහවැලි ගඟ පිටාර ගැලීමෙන් ගම්මාන 5ක් යට වුණා. ඇත්තටම ඒ අවස්ථාවේදී රජයේ නිලධාරීන්, දේශපාලන අධිකාරිය සහ ප්‍රදේශයේ මහ ජනතාව හැමෝම එකතු වෙලා දැඩි කැපවීමෙන් කටයුතු කරලා ඒ ජනතාව ජීවිත හානියක් නොවී බේරා ගැනීමට හැකියාව ලැබුණා. "දිට්වා" සුළි කුණාටුව අවසන් වෙලා සති දෙකකට ආසන්න කාලයකදී රුපියල් 25,000ක මුදල ගෙවල් 435කටත්, පාසල් ළමුන් වෙනුවෙන් ලබා දෙන රුපියල් 15,000ක මුදල ළමුන් 351දෙනෙකුටත් ලබා දීමට අපට හැකියාව ලැබුණා. රුපියල් 50,000ක මුදල ද පවුල් 382ක් වෙනුවෙන් ලබා දීමේ හැකියාව අපට ලැබුණා. ඒ වාගේම, ලක්ෂ 50 නිවාස ආධාර ලබා දීමට අදාළව පවුල් 104ක් අපි මේ වනකොට හඳුනාගෙන තිබෙනවා. අපි දැනටමත් හඳුනාගත්තු ඒ පවුල් 104න්, පවුල් 2ක් වෙනුවෙන් නිවාස ඉදි කර දීමට මුල් ගල් තබා අවසන්. ඒ වාගේම, තමන් හිටපු භූමියේම නිවාස ඉදි කර ගන්න බැරි අපේ ජනතාව වෙනුවෙන් ඒ කලාපයේ වෙනම ස්ථාන හඳුනාගෙන, එවන් ස්ථානවල මැනීම් කටයුතු සිදු කර, නිවාස ඉදි කර දීමේ වැඩසටහන අපි දැනටමත් ක්‍රියාත්මක කරනවා. ඒ වෙනුවෙන් අප සමඟ එක්ව කටයුතු කරපු අපේ රාජ්‍ය නිලධාරීන්, දේශපාලන අධිකාරිය සහ ඒ සියලු ප්‍රදේශවාසීන්ට මගේ ස්තුතිය පුද කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදේ මට විනාඩි 10ක කාලයක් තිබුණා. මම ඒකෙන් විනාඩි 2ක කාලයක් වෙනත් කෙනෙකුට දුන්නා. ඒ අනුව මට විනාඩි 8ක කාලයක් ලබා දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

වෙලාව අඩු කරලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[4.10 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Presiding Member, I say that these Amendments to the Judicature Act and the Poisons, Opium and Dangerous Drugs Act are a very positive step, for the reason that, we know, the drug cartel, today, operates from the high seas; මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මහ මුහුදේ නැව්වල තමයි තමන්ගේ ව්‍යාපාරය කරගෙන යන්නේ. Also, there are a lot of stateless vessels. Therefore, bringing them within our jurisdiction is a very positive step.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මත්ද්‍රව්‍ය උවදුර අද සමාජයේ ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ වාගේම අද එය අපරාධවලටත් හේතු වන ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, බොහෝ අපරාධවලට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධයි. අපි දන්නවා, ළඟදී අපේ නීතිඥ සහෝදරයෙකුත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හේතුවෙන් මරණයට ලක් වුණු බව.

Hon. Minister, I would like to bring to your attention a very important issue. මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවන ප්‍රබලයන් - තෝරු, මෝරු - පිටරටවල ඉඳන් ඔබතුමන්ලා ලංකාවට රැගෙන ආවා. ඒක ලොකු දෙයක්. But, until you have a decoy system, under which we could create a separate unit which could pretend to deal with this drug cartel, you cannot bring the big-timers to book. අද අප මෙම මත්ද්‍රව්‍ය ප්‍රශ්නයට විසඳුමක් සොයනවා නම්, මේ ජාවාරමේ ඉන්න තෝරු මෝරු තමයි අල්ලන්න ඕනෑ. හාල්මැස්සෝ අල්ලලා වැඩක් නැහැ. ඒ සඳහා අපේ නීති පද්ධතිය වෙනස් කරන්න ඕනෑ. අපේ පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව, as a decoy, ඔවුන් එක්ක ගනුදෙනු කරගෙන, we need to bring them to book. ඒක තමයි ලතින් ඇමෙරිකාවේ කළේ. They destroyed the drug cartel through a mechanism of that nature. Therefore, Hon. Minister of Justice, I appeal to you to create such a mechanism. In fact, the law enforcement agencies spoke to me at some committees and said that until you bring in a system where they could act as decoy, it cannot be destroyed. උපාය දූතයන් වශයෙන් අපේ පොලිස් නිලධාරින් කටයුතු කරලා, ජාවාරම්කරුවන් සමඟ ගනුදෙනු කරනවා වාගේ කටයුතු කරලා, ඒ ජාවාරම්කරුවන් අපේ නීතියේ රැහැනට ඇතුළත් කිරීමට යම් ක්‍රමවේදයක් හදන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපි දැකලා තිබෙනවා, වැලිකඩ බන්ධනාගාරයේ ලියා තිබෙනවා, "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා. හැබැයි, මේ රටේ සිරකරුවන්ගේ තදබදය, සිරකරුවන්ගේ වැසිකිළි කැසිකිළි පහසුකම් ආදිය දිහා බලන කොට පෙනෙනවා, සෑම රජයක්ම සිරකරුවන්ට දැක්වූයේ කුඩම්මාගේ සැලකිල්ලක් බව. ඒ නිසා, ගරු අධිකරණ ඇමතිතුමනි, they should be given the basic necessities - sanitation, water and proper nutrition.

අද අපි හිර ගෙවල්වල පවතින තදබදය ගැන කථා කරනවා. එය ඉතාම අමානුෂික ක්‍රියාදාමයක්, inhuman act එකක් හැටියට තමයි මම දකින්නේ. As a lawyer, Hon. Minister, you know that all remand prisoners are innocent until they are proven guilty. When it comes to remand prisoners, other than the fact that they should be remanded for the reason that there are inquiries pending against them, they are not convicts. ඒ නිසා රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්න සිරකරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා ඒ උදවියට අවශ්‍ය පහසුකම් ලබා දීම අප කළ යුතුයි. මොකද, අද රිමාන්ඩ් බන්ධනාගාරවල ඉන්න සිරකරුවන්ටත් නිසි පහසුකම් නැහැ. මම මේ අවස්ථාවේදී ඒ කාරණයත් මේ සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි.

හුඟක් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හිර ගෙවල්වල තවම බිස්නස් කරනවා. අපි දන්නවා, හිර ගෙවල්වල scramblers fix කරලා තිබෙන බව. හැබැයි, scramblers fix කළාම, අසල්වැසියන්ගේ phones පවා jam වන නිසා ඒ scramblers අයින් කර තිබෙනවා. ඒ නිසා අද හුඟක් අය හිර ගෙවල් ඇතුළේ ඒගොල්ලන්ගේ ජාවාරම් කරගෙන යනවා. ඒක ලොකුම ලොකු ප්‍රශ්නයක් හැටියට මම දකිනවා.

ඒ වාගේම, මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නිසා අද සමාජයට, අධිකරණයට සහ නීතිඥ වෘත්තියේ නියැළෙන්නන්ට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒගොල්ලන්ගේ ආරක්ෂාව වැඩි කරන්න කියාත් මම මේ අවස්ථාවේදී ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

තව පනතක් තිබෙනවා. ඒ තමයි, Assistance to and Protection of Victims of Crime and Witnesses Act එක. We should create a mechanism where witnesses could be relocated, especially if they are witnesses of drug-related offences. In other countries, when witnesses cannot stay in that country because of various issues, they are sent abroad. I know that we have limited resources, but if we are to get witnesses to testify, primarily, we have to secure their interests. Therefore, even though we have the Assistance to and Protection of Victims of Crime and Witnesses Act, we need to bring in amendments to ensure their safety after they give evidence. Unfortunately, at most times, we only ensure their safety while a trial goes on. The Hon. Deputy Minister is also present here. So, I urge you to look into mechanisms used in other countries. ඒ කියන්නේ, සාක්ෂිකරුවන් සාක්ෂි දුන්නේ නැත්නම් නඩුවක් ඉදිරියට ගෙන යන්න බැහැ. ඒ නිසා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි, ඔබතුමන්ලා කවුරුත් දන්නවා, අපේ රටට විෂ මත්ද්‍රව්‍ය එන්නේ එක්කෝ මහ මුහුදින් බව, එහෙම නැත්නම් ගුවනින් බව. මේ වන විට අපි කවුරුත් පිළිගන්නා දෙයක් තිබෙනවා. ඒ තමයි විපක්ෂය මොන විධියට තර්ක විතර්ක කළත්, අද අපේ රටේ ගම් නියම්ගම් සිසාරා මුළු සමාජයම මේ විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් වෙළා ගෙන තිබෙන බව. ලයිට් කණුව දක්වාම විෂ මත්ද්‍රව්‍ය ගෙනිහින් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය ජාවාරම දේශපාලනයත් එක්ක සම්බන්ධවයි පැවතුණේ. ඒ දෙක වෙන් කරන්න බැරිවයි තිබුණේ. එයින් මේ රටේ සමස්ත සමාජයම දැවැන්ත ව්‍යසනයකට ඇද දමා තිබුණා. ඒ නිසා එම ව්‍යසනයෙන් අපේ රට ගොඩ ගෙන, දේශපාලන, ආර්ථික සහ සමාජයීය පරිවර්තනයකට ගෙන යන්න ජනතාව අපට - ජාතික ජන බලවේගයට - මේ ජන වරම, පාලන බලය ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමා විශ්‍රාම ගිය වෙලාවේ කිව්වා, ඩොලර් නැතුව, රුපියල් නැතුව මේ රට කඩා වැටුණා කියලා. ඒ අභියෝගය තමයි අප භාර ගත්තේ. ඔබතුමන්ලා දන්නවා, ආර්ථික වශයෙන් වූ කඩා වැටීමේ බලපෑම තිබෙන්නේ මිනිසුන්ට විතරක් නොවන බව. ඇළ-දොළ, ගහ-කොළ සහ සතා-සිව්පාවාටත් එම තත්ත්වය බලපෑවා. කුරුඳු ගහට පොහොර ටික නැති වුණා; තේ ගහට පොහොර ටික නැති වුණා; කුඹුරට පොහොර ටික නැති වුණා. ආර්ථිකය විනාශ වෙමින් ඒ තැනට මේ රට වැටුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුද්දයි මාස දෙක තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත අපි ආර්ථිකය ගොඩ ගත්තා; වෙනස් කළා. ඒ වාගේම මේ රටේ පැවති දේශපාලන සංස්කෘතියත් අපි සහමුලින්ම වෙනස් කළා. "සර්" කියන්න ඕනෑ, "මැඩම්" කියන්න ඕනෑ, "සර්" කිව්වේ නැත්නම්, "මැඩම්" කිව්වේ නැත්නම් රාජ්‍ය සේවකයන්ට ස්ථාන මාරු දුන් තත්ත්වයක් තමයි එදා මේ රටේ තිබුණේ. ඒ තත්ත්වය සහමුලින්ම අපි වෙනස් කළා.

මෙම ජන වරම තුළින් ජනතාව අපෙන් අපේක්ෂා කළ ප්‍රධාන දෙයක් තමයි, විෂ මත්ද්‍රව්‍ය උවදුරෙන් අපේ මව්බිම බේරාගන්න කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ අපේ රට ප්‍රචලිත වුණේ, ආසියාවේ tea hub එක කියලා. අපේ රට ප්‍රචලිත වුණේ තේවලට. අපි ඉස්කෝලේ ගිය කාලයේ සිදත් වෙත්තමුණි ලෝඩ්ස් පිටියේදී ලකුණු 190ක් රැස් කළාම ඔහුට කිව්වේ, තේ තිබෙන රටේ ක්‍රීඩකයා කියලා. හැබැයි, මෙතුමන්ලා කයිවාරු ගැහුවාට අපට තිබුණු ඒ tea hub එකට මොකක්ද වුණේ? මෙතුමන්ලා ඒක "කුඩු හබ්" එක කළා; "අයිස් හබ්" එක කළා. එහෙම කරලා, දැන් විවිධ තර්ක ගෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977න් පසුව මේ රට උඩු යටිකුරු වුණා. බල්ලෝ මරලා හරි සල්ලි හොයන සංස්කෘතියක් මේ රටේ හැදුවා. රටේ ජනාධිපතිගේ ආරක්ෂාවට, රාජ කුමාරයන්ගේ ආරක්ෂාවට කවුද හිටියේ? ප්‍රසිද්ධ පාතාලකාරයෝ හා කුඩු ව්‍යාපාරිකයෝ තමයි රාජ කුමාරයන්ගේ පිටුපස හිටගෙන හිටියේ. ගෝනවල සුනිල්ලා, සොත්ති උපාලිලා, කෙහෙල්බද්දර පද්මෙලා, ජුලම්පිටියේ අමරෙලා, වණ්ඩි මල්ලිලා, සම්පත් මනම්පේරිලා, මනෝජ් මෙන්ඩිස්ලා තමයි ආරක්ෂාවට හිටියේ. ඔවුන් රාජ්‍ය පාලනයටත් ආවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කුඩු මුදලාලිලාත් හිටියාය කියනවා. රන්ජන් රාමනායක හිටපු මන්ත්‍රීතුමා ඒ කාලයේ කිව්වා, එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, ඊට පසුව අපි දැක්කා නගර සභාවලත් එවැනි අය සිටින බව. විශේෂයෙන් ගාල්ලේ, හික්කඩුව වැනි නගර සභාවල එවැනි අය හිටියා. ඔවුන් නගරාධිපතිලාත් වුණා. මනෝජ් මෙන්ඩිස්ලා වැනි අය රත්ගම ප්‍රාදේශීය සභාවට පත් වුණා. ප්‍රාදේශීය සභාවේ සභාපතිලා වුණා. එවැනි අය අදටත් ඉන්නවා, සමහර ප්‍රාදේශීය සභාවල නියෝජිතයෝ විධියට, විශේෂයෙන් ගාල්ලේ. එතැනට තමයි ඒ කාලයේ මේ රට පත් වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා. ජනාධිපතිවරුන්ගේ පුතුන්ගේ ඔඩොක්කුවේ ඉඳලා ගමේ ලයිට් කණුව පාමුල දක්වා ගිය මේ ව්‍යසනය අපි නතර කරන්න ඕනෑ. මඟුල, මරණය, දානය හා පිරිත කියන සියල්ල අද ඒ ව්‍යසනය වෙළාගෙන තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි "ඉවත් වෙනු" යනුවෙන් දැවැන්ත ජාතික ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මත්ද්‍රව්‍ය ව්‍යසනය තුරන් කරන්න කමිටු හදනකොට කිව්වා, එහි නමට තව කෑල්ලක් එකතු කරලා "වහා ඉවත් වෙනු" කියලා නම වෙනස් කරන්න කියලා. විෂ මත්ද්‍රව්‍ය ඒ තරමට සමාජයට දැවැන්ත ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක දැවැන්ත සංවිධාන ජාලයක් බවට දැන් පත් වෙලා තිබෙන්නේ. විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වය යටතේ අපි ජාතික වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය ඇතුළේ, දේශපාලනය ඇතුළේ, සංස්කෘතිය ඇතුළේ, කලාව ඇතුළේ මේ ගැන දැවැන්ත මතවාදී අරගළයක් කරලා හෝ අපේ ආදර මව්බිම මේ ව්‍යසනයෙන් අපි බේරා ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දැවැන්ත ව්‍යසනයට ඇද දමපු අපේ මව්බිම බේරා ගැනීමේ සටනට තමයි අපි අද නායකත්වය දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අනිවාර්යයෙන්ම ඒක කරනවාය කියන එක අපි සහතික වෙනවා. අද මත්ද්‍රව්‍යවලට අදාළව මේ (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව අධිකරණ ඇමතිතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. මහ මුහුදෙන් තමයි මත්ද්‍රව්‍ය රට තුළට එන්නේ. ඒක ප්‍රධාන පැත්තක්. එය වැළැක්වීම වෙනුවෙන් ගෙනෙන නීති, අණ පනත් සම්මත කර ජාතික ජන බලවේගයේ ආණ්ඩුව තුළින් මේ කටයුත්ත අනිවාර්යයෙන්ම කරනවා කියන සහතිකය අපි ලබා දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මට මේ වෙලාව ලබා දීම පිළිබඳව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ ஞானமுத்து ஸ்ரீநேசன் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருக்கின்றது.

[பி.ப. 4.24]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் சட்டத் திருத்தம் பற்றிய ஒரு முக்கியமான விடயம் பேசப்பட்டுக் கொண்டிருக்கின்றது. உண்மையில், இந்த நாட்டையும் எதிர்கால சமூகத்தையும் சீரழிக்கக்கூடிய அல்லது நாட்டை ஒரு நாசகாரப் பாதையில் கொண்டு செல்லக்கூடிய விடயமாக இந்தப் போதைவஸ்துப் பயன்பாடு காணப்படுகின்றது. போதைவஸ்துகளின் மூலமாக யார் யார் பயன் பெறுகின்றார்களோ அல்லது இலாபம் பெறுகின்றார்களோ தெரியாது. ஆனால், போதைவஸ்துகள் இந்த நாட்டையும் எதிர்காலச் சமூகத்தையும் அழித்துக் கொண்டிருக்கின்றது என்பது மட்டும் உண்மையான விடயம்!

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

Clean Sri Lanka மற்றும் 'போதையற்ற தேசம்' என்ற எண்ணக்கருக்கள் அல்லது அது தொடர்பான சிந்தனைகளின் ஊடாக போதைவஸ்துப் பயன்பாடு இல்லாத, ஒரு சுத்தமான தேசத்தை உருவாக்க வேண்டும் என்கின்ற எண்ணம் அரசிடம் காணப்படுகின்றது. அதற்கு ஏற்ற விதத்தில் இந்தத் திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கான செயற்பாடுகள் அமைய வேண்டும் என்பதை நான் இந்த இடத்தில் சுட்டிக் காட்ட விரும்புகின்றேன்.

இன்னுமொரு விடயத்தைச் சொல்லியாக வேண்டும். இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களை எடுத்துக் கொண்டால், அவர் குஜராத் மாநிலத்தில் 4 தடவை முதலமைச்சராக இருந்திருக்கின்றார். அவர் முதலமைச்சராக இருந்த காலத்தில் அந்த மாநிலத்தைப் போதைவஸ்துப் பயன்பாடு இல்லாத ஒரு மாநிலமாக மாற்றினார். அதன்மூலமாக அவர் பெயர் பெற்றிருக்கின்றார். அந்த உயர்ச்சி அல்லது அந்தப் பெருமை காரணமாக, இப்போது இரண்டாவது தடவையாகப் பிரதம மந்திரியாக இருக்கின்ற அவர், அடுத்த தடவையும் பிரதமராக வரக்கூடிய வாய்ப்புகள் இருப்பதாகத் தெரிகின்றது. அதேபோன்றுதான் இந்த நாடும் போதைவஸ்துப் பயன்பாடு இல்லாத, கடத்தல் அல்லது மக்களை நாசமாக்குகின்ற செயற்பாடுகள் இல்லாத ஒரு தேசமாக மாற வேண்டும் என நான் எதிர்பார்க்கின்றேன். அவ்வாறு மாறுகின்றபோது அனைவரும் பெரும் பயனடையக்கூடிய மாதிரி இருக்கும்.

ஒரு தகவல் எனக்குப் பத்திரிகை மூலமாகத் தெரியவந்தது. அதாவது, கொழும்பிலுள்ள 230,000க்கு மேற்பட்ட மாணவர்கள் போதைப் பொருட்களின் பாவனைக்குப் பழக்கப் பட்டிருக்கிறார்கள் என்று ஒரு சிரேஷ்ட பொலிஸ் அதிகாரி குறிப்பிட்டிருக்கின்றார். பாடசாலைச் சமூகத்தை அழிக்கக்கூடிய விதத்தில் இந்தப் போதைப் பொருள் பரிவர்த்தனை உயர்ந்திருக்கின்றது என்றால், இதற்குக் கடந்தகால அரசாங்கங்கள் கட்டாயமாகப் பொறுப்புக் கூறவேண்டும். ஏனென்றால், இப்போது இந்தப் போதைவஸ்துப் பயன்பாட்டுடன் தொடர்புடைய ஒருவர் என்ற அடிப்படையில் சம்பத் மனம்பேரியினுடைய பெயர் அடிபட்டுக்கொண்டு இருக்கின்றது. அவரைப் பொறுத்த மட்டில், இந்தப் போதைவஸ்து விடயத்தில் ஒரு ஜாம்பவானாக இருந்திருக்கின்றார். அதுமட்டுமல்ல, அவர் பாதாள உலகக் கோஷ்டியோடு இணைந்த ஒருவராக இருக்கின்றார்; முன்னாள் சனாதிபதியின் பாதுகாப்புப் பிரிவில் இருந்திருக்கின்றார்; புலனாய்வுத் துறையில் இருந்திருக்கின்றார்; ரவிராஜ் கொலையிலும்கூட அவர் சம்பந்தப்பட்டு இருக்கின்றார். இப்படிப்பட்ட ஒருவர் அரசியல்வாதிகளோடும் நெருக்கமான தொடர்பை ஏற்படுத்தி இருக்கின்றார் என்றால், இந்தப் போதைவஸ்து எந்தளவுக்கு அரசியலுக்குள்ளும் ஊடுருவி யிருக்கின்றது என்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது.

இச்சந்தர்ப்பத்தில் நாங்கள் இன்னுமொரு விடயத்தைச் சொல்லியாக வேண்டும். ஒரு காலத்தில் விடுதலைப் புலிகளைப் 'பயங்கரவாதிகள்' என்றுதான் ஆளுந்தரப்பினர் கூறிக்கொண்டு இருந்தார்கள். மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு எழுவான்கரை, படுவான்கரை என்று இரண்டு பகுதிகள் காணப்படுகின்றன. படுவான்கரைப் பகுதி ஒரு காலத்தில் விடுதலைப் புலிகளுடைய கட்டுப்பாட்டில் இருந்தது. அவ்வாறு விடுதலைப் புலிகள் படுவான்கரைப் பகுதியைக் கட்டுப்பாட்டில் வைத்திருந்த காலத்தில், அந்தப் பிரதேசத்தில் எவரும் போதைவஸ்துகளைப் பாவிக்க முடியாத வகையில் அங்கு போதையற்ற ஒரு சூழல் உருவாக்கப் பட்டிருந்தது. 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்த பின்னர் அந்தப் பிரதேசம் சட்டவாட்சிக்கு உட்படுத்தப்பட்டது; அரசின் கட்டுப்பாட்டுக்குள் வந்தது. அதன் பின்னர் பார்த்தால், அங்கு போதைவஸ்து பிரயோகம் அதிகமாகக் காணப்பட்டது.

அரசு காவல் துறை, மதுவரித் திணைக்களம், STF - அதிரடிப்படை, இராணுவம் எனப் பல அங்கங்களைக் கொண்டிருக்கின்றது. இவற்றின் மூலமாக போதைவஸ்து களைக் கட்டுப்படுத்த வேண்டும். அதுமட்டுமல்லாமல், இப்பொழுது சட்டவிரோதமான முறையில் கசிப்பு மற்றும் வடிசாராய உற்பத்திச் செயற்பாடு நடைபெறுகின்றது. சில இடங்களை எடுத்துக்கொண்டால், அங்குள்ள குக்கிராமங்கள் அல்லது தொலைவில் காணப்படுகின்ற கிராமங்களில் இப்படியான செயற்பாடுகள் அதிகமாக நடைபெறுகின்றது. இதனால் குற்றச்செயல்கள், குடும்ப வன்முறைகள், தற் கொலைகள் அதிகரித்திருக்கின்றன. சிறுவர் துஷ்பிரயோகம் செய்யப்படுகின்றனர். எனவே, இவற்றையெல்லாம் இல்லாதொழிப்பதற்குக் கட்டாயமாகப் போதைப் பொருளைக் கட்டுப்படுத்தக்கூடிய விதத்தில் சட்டம் வலுவாக இருக்க வேண்டும். காவல் துறையினர் அதனைக் கடுமையாகப் பின்பற்ற வேண்டும். ஒரு system - முறைமை அடிப்படையில், நாங்கள் இத்தனை வழக்குகளைத் தாக்கல் செய்திருக்கிறோம் என்று கணக்குச் சொல்லக்கூடிய அளவில் மட்டும் இருக்கக் கூடாது. அதனையும் தாண்டி போதைவஸ்துகளைத் தடை செய்வதில் இந்தச் சட்டம் வலுவாகச் செயற்படுத்தப்பட்டு, எதிர்காலச் சமூகத்தையும் எங்களது நாட்டையும் பாதுகாக்க வேண்டும்.

அத்துடன், இன்னுமொரு விடயத்தையும் சொல்ல விரும்புகின்றேன். இப்பொழுது கடல் மீன்பிடிக்குப் பயன்படுத்தப்படும் மடி வலையை - 'விங்ஸ்' வலை என்று சொல்லுவார்கள் - இழுக்கின்ற செயற்பாட்டுக்கு மனித வலுவைவிட இயந்திர வலுவைப் பயன்படுத்துகின்றார்கள். சில இடங்களில் மனிதவலு தட்டுப்பாடாக இருக்கின்றபடியால் அவர்கள் உழவு இயந்திரத்தைப் பயன்படுத்தி அந்தக் கரைவலைகளை இழுப்பதாகச் சொல்கின்றார்கள். ஆகவே, மனிதவலு தட்டுப்பாடாக இருக்கின்ற இடங்களில் இயந்திர வலுவைப் பயன்படுத்த வேண்டுமென்று அவர்கள் கருதுகின் றார்கள். கடற்றொழில் அமைச்சர் இந்த விடயத்தினை நன்கு ஆராய்ந்து, அவர்களுடைய கோரிக்கை நியாயமானதாக இருந்தால், அதனை அனுமதிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு ஒதுக்கப் பட்ட நேரம் நிறைவடைகின்றது.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Sir, give me one more minute please.

அடுத்ததாக, யானைகளின் தொல்லை பற்றி குறிப்பிட வேண்டும். இப்பொழுது வவுணதீவுப் பிரதேசத்தில் மட்டு மல்ல, கொத்தியாபுலை, மங்கிகட்டு, மாந்தீவு, தும்பங்கேணி, சந்திவெளி போன்ற பகுதிகளில் காட்டு யானைகளால் தொல்லை ஏற்பட்டுள்ளது. அண்மையில் வாழைச்சேனையில் நகர்ப்பகுதிக்குள் யானைகள் புகுந்து அங்கு இரண்டு பேரை

அடித்துக் கொன்றிருக்கின்றது. மகிழவெட்டுவானில் தாய் ஒருவர் கொல்லப்பட்டிருக்கின்றார். இதேபோன்று, சென்ற ஆண்டு சித்தாண்டியில் யானை புகுந்து குழந்தைகளைத் தாக்கியிருக்கின்றது. ஆகவே, நான் வன ஜீவராசிகள் திணைக்களத்திடம் கேட்டுக்கொள்வது, மட்டக்களப்பில் தற்போது காணப்படுகின்ற வன ஜீவராசிகள் திணைக்கள அலுவலகங்கள் மூன்றுக்கு மேலதிகமாக இன்னும் மூன்று அலுவலகங்களுக்கு அனுமதி வழங்கப்பட்டுள்ள நிலையில், அவற்றையும் நிறுவி, போதிய ஆளணியையும் நியமித்து, தயவுசெய்து அங்கு யானைத் தொல்லைகள் ஏற்படாமல் பாதுகாக்க வேண்டுமென்பதைத்தான்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துள்ளது.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

இன்னுமொரு விடயத்தையும் சொல்லி முடிக்கின்றேன்.

தற்பொழுது நெல் விற்பனை நடைபெற்றுக் கொண்டிருக் கின்றது. உத்தரவாத விலை நிர்ணயிக்கப்பட்டும், நெல்லை அந்த விலைக்குக் கொடுக்க முடியாமல் விவசாயிகள் திண்டாடுகின்றார்கள். எனவே, இந்த விடயத்தையும் கருத்திற்கொண்டு செயற்படுமாறு கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත් උවදුර රටින් මුලිනුපුටා දැමීම ඉලක්ක කර ගනිමින්, "විෂ මතින් තොර රටක් - සතුට පිරි හෙටක්" කියන තේමාව යටතේ රට පුරා "රටම එකට" ජාතික මෙහෙයුම ක්‍රියාත්මක වන අවස්ථාවේදී අද දින අප විසින් සාකච්ඡාවට භාජන කරනු ලබන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනතට ගෙන එනු ලබන සංශෝධනය සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතට ගෙන එනු ලබන සංශෝධනය අතිශයින්ම කාලෝචිත බව මුලින්ම සඳහන් කරන්නට ඕනෑ.

ඇත්තටම මේ පනත් කෙටුම්පත් දෙක මඟින් අපි අපේක්ෂා කරන්නේ මෙච්චර කාලයක් මේ රටේ නීතියේ තිබුණු හිඩැසක් පියවීමයි. අපේ රට දූපතක්. ඒ වාගේම සතුටුදායක කාරණයක් තමයි තවමත් අපේ රටේ මේ බොහොමයක් විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය වෙන්නේ නැහැ කියන එක. අපි දන්නවා, ගංජා කියන මත්ද්‍රව්‍ය අපේ රටේ නිෂ්පාදනය වෙන බව. පසුගිය කාලයේ අපි දැක්කා, අයිස්; එහෙම නැත්නම් මෙතැම්ෆෙටමින් කියන මත්ද්‍රව්‍යය නිෂ්පාදනය කරන්න උත්සාහ කරන අවස්ථාවක්. තංගල්ල ප්‍රදේශයේ පොහොට්ටුවේ ප්‍රබල ක්‍රියාකාරිකයෙක් අදාළ රසායනික ද්‍රව්‍ය කන්ටේනරයක් ගෙනැල්ලා අයිස් නැමැති මත්ද්‍රව්‍යය නිෂ්පාදන කර්මාන්තශාලාවක් ආරම්භ කරන්න උත්සාහ ගත්තා. රටේ වාසනාවකට, අපේ විමර්ශන කණ්ඩායම්වල දක්ෂතාවට මේ මත්ද්‍රව්‍ය කර්මාන්තශාලාව පටන්ගන්න බැරි වුණා. ඒ නිසා තවමත් අයිස් කියන මත්ද්‍රව්‍යය අපේ රට තුළ නිෂ්පාදනය වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. ඊළඟට, හෙරොයින්, කොකේන්, අබිං, මත් පෙති, මත් කරල් ගත්තොත්, මේ බොහොමයක් මත්ද්‍රව්‍ය තවමත් අපේ රටේ නිෂ්පාදනය වෙන්නේ නැහැ. අපේ රටේ මේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය වෙන්නේ නැත්නම් දූපත් රාජ්‍යයක් වන අපේ රටට මත්ද්‍රව්‍ය එන්න පුළුවන් ක්‍රම දෙකයි තිබෙන්නේ. එකක් තමයි, ගුවනින් අපේ රටට මත්ද්‍රව්‍ය එන්න පුළුවන්. අනෙක් ක්‍රමය තමයි, මුහුදු මාර්ග ඔස්සේ අපේ රටට මත්ද්‍රව්‍ය එන්න පුළුවන්. ඇත්තටම ගුවන් මාර්ග ඔස්සේ මත්ද්‍රව්‍ය ගෙන එනකොට Airport එක හරහා එන්න ඕනෑ නිසා යම් බාධා කිරීමක් තිබෙනවා. ඒ නිසා ගුවනින් මෙම මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සිදු වන්නේ අඩු වශයෙන්. හැබැයි, මුහුදු මාර්ග ඔස්සේ අපේ රටට විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ගෙන එනවා. පසුගිය වසර තුළ ඒ බව පැහැදිලි වුණා. මුහුදින් ගෙන එන අවස්ථාවලදී කිලෝ ගණන් අත්අඩංගුවට ගැනීම් කළා.

2025.01.01වැනි දා සිට 2026.01.05වැනි දා දක්වා කාලය වෙනකොට හෙරොයින් කිලෝග්‍රෑම් 1,821.174ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ වාගේම, අයිස් නැමැති මත්ද්‍රව්‍යය කිලෝග්‍රෑම් 3,865.710ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ගංජා කිලෝග්‍රෑම් 17,189.377ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. කොකේන් කිලෝග්‍රෑම් 38.958ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ වාගේම මත්පෙති, මත් කරල් 4,049,569ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ මත්ද්‍රව්‍ය විශාල වශයෙන් අත්අඩංගුවට ගැනීම සිද්ධ වුණේ මුහුදු මාර්ග ඔස්සේ අපේ රටට මත්ද්‍රව්‍ය රැගෙන එන අවස්ථාවේදී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙච්චර කාලයක් අපේ රටේ නීතියේ ලොකු හිඩැසක් තිබුණා. අපේ රටේ භූමිය තුළ මත් ද්‍රව්‍ය මෙහෙයුම් කරන්න, අත්අඩංගුවට ගැනීම් කරන්න, නඩු පවරන්න, වූදිතයන්ට දඬුවම් දෙන්න නෛතික බලය ලැබිලා තිබුණා. ඊළඟට, අපේ රටේ දේශීය ජල තීරය තුළ, අනන්‍ය ආර්ථික කලාපය තුළ මේ ක්‍රියාවන් කරන්න නෛතික බලය ලැබිලා තිබුණා. හැබැයි, යම් තැනැත්තෙක් මහ මුහුදේදී මත්ද්‍රව්‍ය ජාවාරම් කළොත්, නැවක් තුළ මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත වුණොත්, ඒ තැනැත්තාව පරීක්ෂා කරන්න, අත්අඩංගුවට ගන්න, අදාළ පුද්ගලයාට එරෙහිව අපේ රටේ අධිකරණයක නඩු අහන්න අධිකරණ බලයක් තිබුණේ නැහැ. එහෙම වරදක් හඳුන්වා දීලා තිබුණේ නැහැ. අද දින ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ මේ පනත් කෙටුම්පත් දෙක මඟින් මෙන්න මේ හිඩැස තමයි අපි විසින් පුරවනු ලබන්නේ. මේ පනත් කෙටුම්පත් දෙක අද සවස් වෙනකොට සම්මත වෙනවා. ඒ අනුව කථානායකවරයාගේ සහතිකයත් එක්ක මේක නීතියක් බවට පත් වෙනවා. ඊට පස්සේ මහ මුහුදේ නැවක් තුළ සිද්ධ වෙන මත්ද්‍රව්‍ය ජාවාරම්, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්න; වැටලීම් කරන්න අපේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හැකියාව ලැබෙනවා. එහෙම අත්අඩංගුවට ගත්ත පුද්ගලයන් ලංකාවට රැගෙන ඇවිල්ලා ඔවුන්ට එරෙහිව නඩු පවරන්නත් පුළුවන්. ඒ සඳහා අපේ රටේ මහාධිකරණයට බලය ලබා දෙන්න තමයි 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතට අද දින මෙම සංශෝධනය අරගෙන එන්නේ. එතකොට මේ හිඩැස පිරවීම තුළ යම් ආකාරයකින් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන "මතින් තොර රටක්" ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්න එය රුකුලක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ මත්ද්‍රව්‍ය විරෝධී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් ඉන්නේ එක ක්ෂේත්‍රයක් ඔස්සේ නොවෙයි. ඒ යටතේ රට පුරාම මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පාලනය කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන්

[ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා]

පුනරුත්ථාපනය කරන්න අවශ්‍ය අදාළ ක්‍රියාමාර්ගත් අරගෙන තිබෙනවා. ඊළඟට, මත්ද්‍රව්‍යවලට අලුතින් පුද්ගලයන් යොමුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය නිවාරණ ක්‍රියාමාර්ග ගන්නත් කටයුතු කර තිබෙනවා. වැදගත්ම කාරණය තමයි ප්‍රජාව ශක්තිමත් කරලා, මත්ද්‍රව්‍යවලට එරෙහිව නැඟී සිටින්න අදාළ ශක්තිය බිම් මට්ටමින් හදලා තිබෙනවා. දැන් එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙනවා. ඒ යටතේ "රටම එකට" ජාතික මෙහෙයුම් කමිටුව පිහිටුවා තිබෙනවා. දිස්ත්‍රික් කමිටු පිහිටුවමින් යනවා. ඒ යටතේ ඊට යටින් තිබෙන ප්‍රාදේශීය කමිටු පිහිටුවමින් යනවා. ඊට අමතරව ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ කමිටු පිහිටුවා, ඒ හරහා ප්‍රජාව සවිබලගැන්වීම තුළින් මේ මත්ද්‍රව්‍යවලට එරෙහිව ජනතාවගේ නැඟී සිටීමත් අපි බලාපොරොත්තු වෙනවා. අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ හැම තැනම මත්ද්‍රව්‍ය කියන කාරණය වසංගතයක් වාගේ පැතිරිලා තිබෙනවා. ලෝකයේ රටවලින් සියයට 13ක විතර මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවෙලා තිබෙනවා. අපේ රටේත් එන්න එන්නම මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම තරුණ කණ්ඩායම් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ තරුණ පරපුර තමයි මේ මත්ද්‍රව්‍යවලට වැඩියෙන්ම ගොදුරු වන්නේ. ඒ නිසා අපේ රට මතින් තොර රටක් බවට පත්කිරීමේ අපේ ජාතික ව්‍යාපාරයට උරදෙමින් අද දින අප විසින් සම්මත කරනු ලබන මේ පනත් කෙටුම්පත් ඉදිරියේදී නීතියක් බවට පත් වෙනවා. මතින් තොර රටක් ඇති කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අපේ රට තුළ ස්ථාපිත කරන්න එය රුකුලක් වන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතටත්, අධිකරණ සංවිධාන පනතටත් සංශෝධන ගෙන එන පනත් කෙටුම්පත් දෙකක් සම්බන්ධව මේ මොහොතේ කෙරෙන මේ විවාදයේදී සාකච්ඡා වන කාරණා ඉතාම කාලීන වැදගත්කමක් තිබෙන කාරණා හැටියට අපි සලකනවා. ඇයි අපි එහෙම කියන්නේ? අපි දන්නවා, මේ වනකොට මත්ද්‍රව්‍ය උවදුර අපේ රටට මහා ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන බව. ඇයි අපි එහෙම කියන්නේ? අපි දන්නවා, විශේෂයෙන් ගත්තාම මේ වනකොට මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව විශාල වශයෙන් රට පුරාම ජනතාවගේ පෙළ ගැස්මක් ඇති වෙලා තිබෙන බව.

මේ සම්බන්ධයෙන් ඊයේ දවසේ පුවත් පත්වල පළ වෙලා තිබුණු සිරස්තල කිහිපයක් සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කළොත් හොඳයි කියා මා හිතනවා. ඒ අතර තිබෙනවා, "කොකේන් තියා ගත්තැයි ටෙලිනාට්‍ය නළුවෙක් එක්ක තුනක් අත්අඩංගුවට", "බීමත්ව මහ මඟ රිය පදවා පදිකයෙකුට තුවාල කළැයි භික්ෂුවක් අත්අඩංගුවට", "බීමත්ව රිය පැද වූ සිවිල් ආරක්ෂක නිලධාරියාට රුපියල් 75,000ක් දඩ; පෙර වැරදි හතරකුත්", "අකුරේගොඩ ඝාතන සිද්ධියේදී වෙඩික්කරුවෝ හෝටලයක නැවතී දින තුනක් මාන බලලා දවස් තුනේම කුඩුත් ගහලා", "වැල්ලම්පිටියේ තිදෙනෙක් කෝටි 16ක කුෂ් ගෙනැත්", "ගංජා මිශ්‍ර මත්ගුලි සිසුන්ට විකුණුවේ යැයි සැකකරුවෙකු අත්අඩංගුවට", "රටම එකට ජාතික මෙහෙයුමේදී පැය 24ක් තුළ 838දෙනෙක් අත්අඩංගුවට" කියලා. මේවායෙන් තහවුරු වන කාරණාව තමයි, මත්ද්‍රව්‍ය උවදුර කියන එක මේ වන විට අපේ සමස්ත සමාජ දේහයම ගිලගත් ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා කියන එක. ඒ නිසා මම හිතන විධියට, විවාදයකින් තොරව ආණ්ඩු පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් මේ පිළිබඳව අද මේ ගරු සභාවේ අදහස් දැක්වූයේ මේ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම අපේ ජාතික අවශ්‍යතාවක් කියන එක පදනම් කරගෙනයි.

විශේෂයෙන් අද බන්ධනාගාරගත වෙලා ඉන්න පිරිස දිහා බැලුවාම, ඉන් සියයට 74ක පමණ පිරිසක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් තමයි බන්ධනාගාරගත වෙලා තිබෙන්නේ. ඇයි එහෙම වෙලා තිබෙන්නේ? ඒ වාගේම තමයි, ඒ සියයට 74ක අයගේ වයස විශ්ලේෂණය කරලා බැලුවොත්, ඒ අය වයස අවුරුදු 18ත්, 24ත් අතර වයස් කාණ්ඩයට ගැනෙන පිරිස බව පෙනී යනවා. ඒ කියන්නේ, අපේ රටේ අනාගතය ගොඩනඟන්න පුළුවන්, මේ රට ගොඩනඟන්න පුළුවන් පිරිස තමයි අද බන්ධනාගාරගත කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේක ඛේදවාචකයක්. මේ ඛේදවාචකය, මේ අභියෝගය ජයග්‍රහණය කිරීමේ වගකීම තිබෙන්නේ අපට. ඒ නිසා ජාතික ජන බලවේග ආණ්ඩුව මේ වගකීම, මේ අභියෝගය ජයග්‍රහණය කිරීමේ අරමුණින් තමයි මේ කටයුතු කරමින් ඉන්නේ. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, මේ නීති සංශෝධනය කරමින් මේ කෙටුම්පත් අද දින මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන්න යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මදක් සලකා බලන්න ඕනෑ, මේ ව්‍යසනය අපේ රටේ පැලපදියම් වෙන්න බලපෑ හේතු මොනවාද කියලා. විශේෂයෙන් අපි දන්නවා, අද පක්ෂ, විපක්ෂ කවුරුත් මේ සම්බන්ධයෙන් අපිත් එක්ක එකඟයි කියලා. එතුමන්ලා මේ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දමන්න අපිත් එක්ක අත්වැල් බැඳගෙන ඉන්නවා. ඒ ගැන අපට හරිම සතුටුයි. හැබැයි ගෙවී ගිය වකවානුවේ අපේ රටේ දේශපාලනයේ නිරත වෙලා හිටපු පිරිස් විසින්ම තමයි මේ මත්ද්‍රව්‍ය ජාලයේ නිරත වෙලා ඉන්න පිරිස බෞතීස්ම කළේ. ඔවුන් තමයි ඒගොල්ලන්ට ආවරණය, රැකවරණය ලබා දුන්නේ. ඒ නිසා අපේ රට පාලනය කළ පූර්වගාමී දේශපාලන පක්ෂවල ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පිරිස් හිටියා. ඔවුන් නිසා තමයි මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට පෝෂණය වන්න අවස්ථාව ලැබුණේ. ඒ නිසා තමයි මේක අපේ රටේ මහා ව්‍යසනයක් බවට පත් වුණේ. දේශපාලනය වාගේම අපේ රටේ නිල රාජ්‍ය යන්ත්‍රණයට යටින් දිවෙන කළු රාජ්‍ය යන්ත්‍රණයකුත් ක්‍රියාත්මක වුණා. අපි කවුරුත් දන්නවා, මේ මත්ද්‍රව්‍ය ජාලය හරහා විශාල මුදලක් උත්පාදනය

වන බව. ඒ උත්පාදනය වන මුදල් භාවිත කරමින් රාජ්‍ය සේවයේ ඇතැම් පිරිස්, ආරක්ෂක අංශවල ඇතැම් පිරිස් ඒ ජාවාරම්කරුවන් උපයෝගී කර ගත්තා, මේ මත්ද්‍රව්‍ය ජාවාරම වෙනුවෙන්. ඇතැම් දේශපාලකයින්ගේ අනුග්‍රහයෙන්, ආශිර්වාදයෙන් අපේ රටේ නිල රාජ්‍ය යන්ත්‍රණයට යටින් කළු රාජ්‍ය යන්ත්‍රණයකුත් ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. මේ කළු රාජ්‍ය යන්ත්‍රණයේ අනුග්‍රහයෙන්, ආශිර්වාදයෙන් තමයි අපේ රට මේ තරම් ව්‍යසනයක්, අර්බුදයක් දක්වා අරගෙන ආවේ කියන එක මම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරනවා. අපි මේ අර්බුදයේ බරපතළකම තේරුම් අරගෙන තිබෙන්නේ. එම නිසා අපි බලයට පත් වෙලා කෙටි කාලයක් ඇතුළත අපට අවශ්‍යතාවක් ඇති වුණා, මේ අර්බුදය, මේ උවදුර වළක්වන්න, ඒකට එරෙහි පියවරක් ගන්න. ඒ නිසාම අපි 2025 අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා දත්ත විශ්ලේෂණය කළා. ඒ දත්ත විශ්ලේෂණය කරලා ගත්ත තොරතුරුවලින් මදක් මම ඉදිරිපත් කරන්න කැමැතියි.

අපි වැටලීම් 191,320ක් කළා. සැකකරුවන් 190,888ක් අත්අඩංගුවට ගත්තා. ඒ වාගේම හෙරොයින් කිලෝග්‍රෑම් 1,482ක්, අයිස් කිලෝග්‍රෑම් 2,542ක්, කොකේන් කිලෝග්‍රෑම් 32ක්, ගංජා කිලෝග්‍රෑම් 14,434ක්, හෂීස් කිලෝග්‍රෑම් 582ක් අත්අඩංගුවට ගත්තා. ඒ මාස 10ක කාලය පරාසය ඇතුළේ අපි මත් පෙති 3,961,790කුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මෙන්න මේ දත්ත ටික විශ්ලේෂණය කරනකොට අපි අවබෝධ කර ගත්තා, මෙතැනින් එහාට මේ වෙනුවෙන් ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. මේ දක්වා රට ඇතුළේ මේ සම්බන්ධව ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණේ නැහැ. මොකද, එවැනි ජාතික වැඩ පිළිවෙළකට දේශපාලන නායකත්වයක් ලබා දීලා තිබුණේ නැහැ. එම නිසා මෙතෙක් ඒ වෙනුවෙන් කාර්යක්ෂම යන්ත්‍රණයක් පිහිටුවන්න සමත් වෙලා තිබුණේ නැහැ. එම නිසා අපි 2025.10.30වැනි දා අපේ ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් "රටම එකට" ජාතික මෙහෙයුම ආරම්භ කළා. එහි ප්‍රතිඵලයක් හැටියට මත්ද්‍රව්‍ය උවදුරට එරෙහි මෙහෙයුමට දේශපාලන නායකත්වයක් ලැබුණා, කාර්යක්ෂමව තීන්දු ගැනීමේ යන්ත්‍රණයක් අපට හදාගන්න පුළුවන් වුණා. ඒ වාගේම මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා දිවෙන ව්‍යුහයක් ගොඩ නඟන්නත් අපට පුළුවන් වුණා. නව පනත් කෙටුම්පත් හරහා නව නීති සම්පාදනයට අපි පියවර ගත්තා. එහි එක පියවරක් හැටියට තමයි අද මේ අලුත් සංශෝධන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ විවාද කරලා සම්මත කරන්න යන්නේ. ඒ අනුව අපට පැවරුණු වගකීම උපරිමයෙන් ඉටු කිරීමේ කටයුත්ත මේ වනකොටත් අපි ආරම්භ කරලා තිබෙනවා.

මේ, "රටම එකට" ජාතික මෙහෙයුම ආරම්භ කරලා මාස තුනක් තුළ අපි අත්පත් කරගත් ප්‍රගතිය සම්බන්ධයෙනුත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. අපි මේ කාල සීමාව ඇතුළේ වැටලීම් 77,824ක් කරලා තිබෙනවා. සැකකරුවන් 77,105ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම හෙරොයින් කිලෝග්‍රෑම් 320ක්, අයිස් කිලෝග්‍රෑම් 1,280ක්, කොකේන් කිලෝග්‍රෑම් 8ක්, ගංජා කිලෝග්‍රෑම් 2,341ක්, කුෂ් කිලෝග්‍රෑම් 155ක්, හෂීස් කිලෝග්‍රෑම් 44ක් සහ මත් පෙති 13,258ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ දත්ත ටික ඉදිරිපත් කිරීමෙන් පමණක් අපි සෑහීමකට පත් වන්නේ නැහැ කියන එක. ඒ තුළ පුනරුත්ථාපනයට ලක් කළ යුතු පිරිස විධියට 1,449දෙනෙක් අපි හඳුනාගෙන තිබෙනවා.

අපේ රටේ තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය උවදුරෙන් ගලවා ගැනීම අපේ වගකීමක් හැටියට අපි භාර අරගෙන තිබෙනවා. එම නිසා අපි ඒ වෙනුවෙන් විශේෂයෙන් කැප වන බව සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, අද විවාද කරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත හරහා අපේ සාගර කලාපයන් තුළ සිදු වන මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීමට එරෙහිව අපි නිර්භීත පියවරක් අරගෙන තිබෙන බව. එම නිසා ඉදිරි කාල සීමාව තුළ අප හමුවේ තිබෙන අභියෝගය දිනන්න අපට අවස්ථාවක් තිබෙනවා කියන විශ්වාසයෙන් අපි වැඩකටයුතු කරගෙන යනවා.

තව කාරණයක් මතක් කරලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නීතිය මත ගොඩ නැඟෙන සමාජයක් පිළිබඳ වූ ෆැන්ටසිය අපි ප්‍රතික්ෂේප කරන අතර සමාජ අවශ්‍යතාව මත පදනම් වූ නීතියක් පිළිබඳ යථාර්ථය තමයි අපි පිළිගන්නේ. අන්න ඒ පදනමේ සිට මේ රටේ සමාජ ප්‍රගමනය වෙනුවෙන් අවශ්‍ය වන නීති සම්පාදනයට අපි උපරිමයෙන් කැප වනවා කියන පණිවුඩය ලබා දෙමින්, ඒ සඳහා අත්වැල් බැඳ ගැනීමට ඔබ සියලුදෙනාට ආරාධනා කරමින්, මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අධිකරණ සංවිධාන පනතට සහ විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට සංශෝධන ඉදිරිපත් කරනවා. මේ, ඒ වෙනුවෙන් පවත්වනු ලබන විවාදයයි. ඒ විවාදයේ දී විශේෂයෙන් අධිකරණ ඇමතිතුමාගෙන්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් වාගේම විපක්ෂය නියෝජනය කරමින් මේ විවාදයට සම්බන්ධ වුණු සමහර මන්ත්‍රීවරුන්ගෙන් මේ පනත් කෙටුම්පත් දෙක පිළිබඳව සාධනීය කරුණු ඉදිරිපත් වුණා. ඒ වාගේම සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා විසින් මේ විවාදය අවසානයේ දී මේ සම්බන්ධයෙන් summary එකකුත් ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙනවා.

ඒ අතරතුර මගේ පැත්තෙන් මේ පනත් කෙටුම්පත් දෙක පිළිබඳව කරුණු සඳහන් කළ යුතු වුවත්, පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් තුළදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳව යම් කථා බහක් කළොත් හොඳයි කියලා මට හිතුණා. සමහර විටෙක දේශපාලනිකව අසරණ වුණු, අනාථ වුණු, තැනින් තැන නතර වුණු විපක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් දිගින් දිගටම පෙර වරු 9.30-11.30 දක්වා වූ පළමු පැය දෙක තුළදී, පාර්ලිමේන්තුවේ ප්‍රධාන කටයුතුවලට අමතරව තිබෙන ව්‍යතිරේක අවස්ථාවලදී එම අවස්ථා අවභාවිත කරමින් තමන්ගේ පටු, පෞද්ගලික දේශපාලන අරමුණු ඉටු කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව අවභාවිත කරමින් තිබෙනවා. ඒක ඉතාම අශිෂ්ටයි. මම අපේ රටේ ජනතාවට ආරාධනා කරනවා, පාර්ලිමේන්තුවේ ගැලරියට එන්න කියලා. ආණ්ඩු පක්ෂය පැත්තේ ගැලරියේ ඉඳගෙන බලන්න, විපක්ෂය නටන නාඩගම. ඒක ඉතා කැත, නින්දිත නාඩගමක්.

විශේෂයෙන් ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වුණාට පසුව දිගින් දිගටම ජනතා අපේක්ෂා ජයග්‍රහණය කරමින් ජනතාව

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

අතර තවදුරටත් තහවුරු වෙමින් ඉදිරියට යද්දී ඒක දරා ගත නොහැකි දේශපාලන වශයෙන් අනාථ වුණු කණ්ඩායමක් තමයි මේ ක්‍රියාවේ නිරත වෙමින් සිටින්නේ. විපක්ෂ නායකතුමාට, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අවම වශයෙන්වත් මේ තත්ත්වය පාලනය කර ගත නොහැකි තත්ත්වයක් තිබෙනවා. එහෙම නැත්නම් විපක්ෂ නායකතුමා මේකට අනුබල දෙනවා. පාර්ලිමේන්තුව තුළ වසර ගණනාවක අත්දැකීම් තිබෙන, පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව අත්දැකීම් තිබෙන, විශේෂයෙන් ලෝකයේ ප්‍රධාන පාර්ලිමේන්තු පිළිබඳව උදාහරණ අරගෙන කථා කරන විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුව විනයානුකූලව පවත්වාගෙන යාම සඳහා තමන්ගේ කණ්ඩායම මෙහෙයවන්න අසමත් වෙලා තිබෙනවා, නැත්නම් කුමන්ත්‍රණකාරී ලෙස මේ කණ්ඩායම මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙන යාමට එරෙහිව මෙහෙයවමින් තිබෙනවා.

විශේෂයෙන් පාර්ලිමේන්තුවක ප්‍රධානම වැඩකටයුතු තීරණය වෙන්නේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන්. ආණ්ඩුවේ වැඩකටයුතු තමයි ප්‍රධාන වෙන්නේ. පාර්ලිමේන්තුවක් පවතින්නේ ජනතාව වෙනුවෙන් නීති අණපනත් හදන්න, ඒවා සංශෝධනය කරන්න සහ තිබෙන නීති අණපනත් වෙනස් කරන්න සහ අහෝසි කරන්නයි. ඒ වෙනුවෙන් තමයි පාර්ලිමේන්තුවේ විවාද පැවැත්වෙන්නේ. පාර්ලිමේන්තුවේ ප්‍රධාන කටයුත්ත බවට පත් වෙන්නේ ඒකයි. එහිදී ආණ්ඩුවේ කටයුතු ප්‍රධාන වෙනවා. ඊට අමතරව ව්‍යතිරේක ගණනාවක් තිබෙනවා. ඒ, කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන, ලිපිලේඛනාදිය පිළිගැන්වීම, කාරක සභා වාර්තා පිළිගැන්වීම, මහජන පෙත්සම් පිළිගැන්වීම යනාදියයි. මම මේ ටික කියන්නේ මේ විකාර කරන මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම පිණිසයි. මම මේ කියන ටිකෙන්වත් එතුමන්ලා ඉගෙන ගනීවි කියලා අපි හිතනවා. ඊට අමතරව වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න තිබෙනවා.

මෙන්න මේ අවස්ථා දෙක තමයි එතුමන්ලා අවභාවිත කරන්නේ. පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පාවිච්චි කරලා විවාදයක් හදා ගන්නවා. මේ පෙළගැස්ම තමයි තිබෙන්නේ. පෙර වරු 11.30ට ප්‍රධාන කටයුතු පටන් ගන්නවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා කාල කළමනාකරණයක් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුව පවත්වා ගෙන යාම පිළිබඳව ස්ථාවර නියෝග තුළ නීති සහ රීති සකස් කරලා තිබෙනවා. එතකොට පාර්ලිමේන්තුව පවත්වා ගෙන යන්න ඕනෑ ස්ථාවර නියෝගවලට අනුවයි. හැබැයි, කාලාන්තරයක් තිස්සේ අත්දැකීම් තිබෙනවාය කියන, පරිණතයි කියන විපක්ෂයේ ඉන්න පැරදුණු, ආණ්ඩු බලය අහිමි වුණු මන්ත්‍රීවරු විසින් මේ තිබෙන වෙලාවන් අවභාවිත කරමින් වෙන වෙන තර්ක ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තුවේ කටයුතු දිගින් දිගටම අඩාළ කරනවා. එහෙම නැත්නම් ඒ කටයුතුවලට බාධා කරමින් ජනතාව අපේක්ෂා කරන තැනට රට ගෙන යෑම සඳහා පාර්ලිමේන්තුව මෙහෙය වීම අඩාළ කරන්න කටයුතු කරමින් සිටිනවා. ජෝගි නටනවා, පාර්ලිමේන්තුව විකාර මඩුවක් බවට පත් කරගෙන තිබෙනවා, විශේෂයෙන් කථානායකවරයාගේ වම් අත පැත්තේ ළඟම ඉන්න මන්ත්‍රීවරු ටික.

කථානායකවරයා තමයි පාර්ලිමේන්තුවේ ප්‍රධානියා. කථානායකවරයාගේ අණට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කීකරු වෙන්න ඕනෑ. හැබැයි, මේ මන්ත්‍රීවරු මොකක්ද කරන්නේ? කථානායකවරයාට උගන්වනවා, එහෙම නැත්නම් කථානායකවරයාගේ අණට පිටින් වැඩ කරනවා. ඒ විධියේ බාල් නටන තැනක් බවට මේ පාර්ලිමේන්තුව පත් කරගෙන තිබෙනවා.

අපි වසරකට වැඩි කාලයක් මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙන ආවා. ආණ්ඩු පක්ෂයේ 159දෙනෙක් ඉන්නවා. මේ, තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩුවක්. තුනෙන් දෙකක බලය තියාගෙනත් අපි සංවරව, ඉවසාගෙන, මේවා අද නතර වෙයි, හෙට නතර වෙයි කියලා බලාගෙන ඉන්නවා. හැබැයි, විපක්ෂයේ ඉන්න මේ මන්ත්‍රීවරු ටික දිගින් දිගටම මේ බාධාව කරමින් සිටිනවා. විශේෂයෙන් සභානායකතුමා ඉලක්ක කරගෙන බරපතළ විධියට විවේචන එල්ල කරනවා. විවේචන ඉදිරිපත් කළාට කමක් නැහැ. හැබැයි, සභාව පවත්වා ගෙන යාම සඳහාත් එතුමන්ලා බාධා කරනවා. ඊට අමතරව කථානායකතුමාට තමන්ගේ කටයුතු පවත්වා ගෙන යාමට ඉඩ නොදී බාධා කරනවා. මන්ත්‍රීවරයෙක් කථා කරන්න පටන් ගත්තාම ඒ මන්ත්‍රීවරයාට කථා කරන්න ඉඩ නොදී විශාල වශයෙන් බාධා කරමින් මේ පාර්ලිමේන්තුවේ කටයුතුවලට අඩ තියන්න ඒ කණ්ඩායම සූදානම් වෙලා ඉන්නවා. ඒ කටයුතු පළමුවැනි පැය දෙකේදී තමයි සිද්ධ වෙන්නේ.

දැන් බලන්නකෝ, මේ විපක්ෂය දිහා. දැන් විපක්ෂය හරියට හෙණ ගහපු සොහොන් පිට්ටනියක් වාගේයි. කිසි කෙනෙක් නැහැ. කථාවක් තිබුණොත් විතරක් සභාවේ ඉන්නවා. දැනුත් සභාවේ එක මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඒ, එතුමාට ඊළඟට කථාව තිබෙන නිසා. නැත්නම් එතුමාත් සභාවේ නැහැ. මේක දිගින් දිගටම ආණ්ඩුව විධියට අපි ඉවසාගෙන ඉන්නවා. හැබැයි, ඒ මන්ත්‍රීවරු දැනගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ කාරණය තමයි, සෑම ක්‍රියාවකටම සමාන වූ ද ප්‍රතිවිරුද්ධ වූ ද ක්‍රියාවක් ඇත කියන එක. හැමදාම මෙහෙම පවතින්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව ඉතාම සාමකාමීව පවත්වා ගෙන යා යුතුයි. ජනතා අපේක්ෂා ඉෂ්ට කළ යුතුයි. ජනතාව වෙනුවෙන් නීතිරීති සකස් කළ යුතුයි. අණපනත් සකස් කළ යුතුයි. ජනතාව සිටින තැනින් ඉහළට රැගෙන යා යුතුයි. අන්න ඒ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව මෙහෙයවීම සඳහා මැදිහත් වෙන්න, අදින් පසුවවත් මේ කාරණා ඉගෙන ගන්න කියන ආරාධනයත් ඒ මන්ත්‍රීවරුන්ට කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.58]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)

(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත් ගැන මම කථා කරන්නම්, අවුරුද්දක් ගත වෙලා අපට උගන්වන්න හදන කට්ටියට උත්තර දීලා වැඩක් නැති නිසා. විශේෂයෙන්ම විවාද කිරීම සඳහා මේ පනත් කෙටුම්පත් ගෙන ඒම සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

විශේෂයෙන් මත්ද්‍රව්‍ය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, දැන් ආණ්ඩුව විසින් "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ "ඉවත් වෙනු" කියලා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කර ගෙන යන බව. හැබැයි අපි දකිනවා, ආණ්ඩුව ඇතුළේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, නගර සභා මන්ත්‍රීවරු දවස ගණනේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ වුණු අය විධියට මේ මෙහෙයුම්වලට අහු වන බව. උණාකුරුවේ ශාන්තගේ ඉඳලා පහළට ගත්තාම මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, නගර සභා මන්ත්‍රීවරු විශාල පිරිසක් මත්ද්‍රව්‍ය ජාවාරමේ ඉන්නවා කියන එක දැන් බොහොම පැහැදිලි කාරණයක් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ ගරු සභාවේ අධිකරණ ඇමතිතුමා ඉන්න නිසා මම මේ කාරණයත් කියන්න කැමතියි. ගරු ඇමතිතුමනි, දැන් කොළඹ දිසා අධිකරණය හදාගෙන යනවා. ඊයේ මම ගියා, කොළඹ දිසා අධිකරණයට. ඔබතුමාත් දන්නවා, එහි සේවකයන් දහස් ගණනක් වැඩ කරන බව. ඒගොල්ලන්ට යන්න කොළඹ දිසා අධිකරණ පරිශ්‍රයේ ටොයිලට් එකක් නැහැ. ඒගොල්ලන්ට ඒ කටයුත්තට යන්න වෙලා තිබෙන්නේ මහාධිකරණය පැත්තට. මම ඒ ස්ථානයට යනකොට සේවකයන් ඒ සඳහා පෝලිමේ ඉන්නවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, විශේෂයෙන් මේ සම්බන්ධයෙන් සලකා බලා ඒ කටයුත්ත ඉටු කර දෙන්න කියලා. ඇත්තටම ඔවුන්ට විශාල අර්බුදයක් තිබෙනවා. එතැන ඉන්න කට්ටියත් මට කිව්වා, ඔබතුමා මේ ගැන පාර්ලිමේන්තුවේදී කියන්න, අපට ඒ කටයුත්ත සඳහා යන්න තැනක්වත් නැති තැනට පත් වෙලා ඉන්නවාය කියලා.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න කැමතියි. බිමල් රත්නායක ඇමතිතුමා ඊයේ ප්‍රකාශයක් කළා, වකුෆ් සභාව ගැන. රාජ්‍ය බුද්ධි සේවයේ වාර්තාවක් - SIS වාර්තාවක් - ලබා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ කිව්වා.

නමුත්, වකුෆ් සභාවට පත් කරන ඒ යෝජනා මාලාවේ 8වැනි එකේ තිබෙනවා, අනිවාර්යයෙන් SIS වාර්තාවක් ලබා ගත යුතුයි කියලා. ඒ ලේඛනයත්, ඒකට අවශ්‍ය කරන affidavit එකත් මම **සභාගත*** කරනවා බලා ගැනීම සඳහා.

මොකද හේතුව, මේවා කියනවා වාගේ නොවෙයි කරන එකයි ආණ්ඩුවේ වැඩේ. දැන් මේ SIS වාර්තාවක් ලබා ගන්න වුවමනා නැත්නම් ආණ්ඩුවට කරන්න තිබෙන්නේ යෝජනාවක් ගෙනැල්ලා වකුෆ් සභාවට පත් වෙන අය සම්බන්ධව එහෙම අවශ්‍යතාවක් නැහැ කියලා කියන එකයි. නමුත් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව භාරකරුවන් පත් කරනකොට, මේ වකුෆ් සභාවේ මණ්ඩලයට නියෝගයක් කරනකොට මේ දිවුරුම් ප්‍රකාශය, අනිවාර්යයෙන්ම SIS වාර්තාවක් ඉල්ලනවා. ඉතින් ඔබතුමන්ලා නීතියක් ගෙනැල්ලා, මේක අහෝසි කරලා දාන්න. ඒක කරන්නේ නැතුව මෙතැන ඇවිල්ලා වෙනත් කථා කියලා හරියන්නේ නැහැ. මොකද, අපි දන්නවා, මේ රටේ මුස්ලිම් ජනතාව සහරාන්ගේ මේ ප්‍රහාරයත් එක්ක අතිවිශාල භීෂණයකට ලක් වුණු බව. ග්‍රාමීය මට්ටමේ ඉන්න මධ්‍යස්ථ මතධාරී මුස්ලිම් සහෝදරවරු හා සහෝදරියන් විශාල අර්බුදයකට ලක් වුණා. ඉතින් ඒ නිසා මේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් මම ඉල්ලන්නේ කරුණාකරලා මේ SIS වාර්තාව අවශ්‍ය නැහැයි කියලා ඔබතුමන්ලා ආරක්ෂක අමාත්‍යාංශයට ලිඛිතව දාලා මේක ඉවත් කරන්න කියලායි. එතකොට මේ ප්‍රශ්නය ඉවර වෙනවා. නමුත් මේක ඕනෑ නැහැ කියලා මෙතැන ඇවිල්ලා කියලා හරියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පල්ලි 2,500ක් විතර තිබෙනවා, මේ රටේ මුස්ලිම් ජනතාව වන්දනාමාන කරන. එතකොට මේ වකුෆ් සභාවේ මේ නියෝගය අවලංගු කරන්න පුළුවන්. එතකොට මේ මුස්ලිම් දේවස්ථාන 2,500ම අයට මේක ගන්න වුවමනාවක් නැහැ. ඊළඟට මම කියන්න කැමැතියි, විශේෂයෙන්ම සහරාන්ගේ මැදිහත්වීම හේතුවෙන්- *[බාධා කිරීමක්]* කාත්තන්කුඩි මුස්ලිම් පල්ලිය ගැන මම විශේෂයෙන් කියන්න කැමැතියි. ඒකේ වකුෆ් සභාවට පත්වීම් ලිපියක් නිකුත් කරලා තිබෙනවා. ඒකට දැන් අමාත්‍යාංශයේ අවසර ලබා දීලා නැහැ. අපි කියන්නේ, වකුෆ් සභාව පත් කරලා තිබෙනවා නම්, එහෙම නම් ඒකට අවසර දෙන්න කියලා. ඇයි, ඒක දෙන්නේ නැත්තේ? ඒක දෙන්නේ නැත්තේ, විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයෙන් කියලා තිබෙනවා, මේක දෙන්න විධියක් නැහැයි කියලා.

ඒ වාගේම තමයි, කුරාන් 15,000ක් තිබෙනවා, අද වරායේ හිර වෙලා. ඒ වරායේ හිරවෙලා තිබෙන කුරාන් පොත්පත් ටික, විශේෂයෙන්ම ආගමික පොත්පත් ටික ඉස්ලාමීය පොත් සමාලෝචන කමිටුවේ වාර්තාව මත දෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඒගොල්ලෝ කියනවා, ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම මත ඒක දෙන්නේ නැහැ කියලා. ඔය කරුණු තුන ඉෂ්ට කරන්න. *[බාධා කිරීමක්]* මේ රටේ මුස්ලිම් ජනතාව ගැන ආදරයක් තිබෙනවා නම්, ගෞරවයක් තිබෙනවා නම්, කරුණාකරලා ඒක ඉෂ්ට කරන්න. *[බාධා කිරීමක්]* නිකම් කඩේ යන්නේ නැතුව ඉන්න මහත්තයෝ. *[බාධා කිරීමක්]* කරන්න තිබෙන ටික හරියට කරන්න. එච්චරයි අපි කියන්නේ. මෙතැන ඇවිල්ලා උදේ කෑ ගැහුවාට වැඩක් නැහැ, වැඩේ කරන්න. ඒ ක්‍රියාදාමය ඉෂ්ට කරන්න කියා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු අධිකරණ ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම කියන්න කැමැතියි, විශේෂ මහාධිකරණ පත් කිරීම සම්බන්ධයෙනුත්. විශේෂ මහාධිකරණ පත් කිරීම ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේ තව එකක් පත් කරන්න ඔබතුමන්ලා ළඟදී කටයුතු කරනවා කියලා කියනවා. හැබැයි, අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, විශේෂ මහාධිකරණවල පෙනී සිටින නීතිඥයන්ට අද විශාල අර්බුදයක් තිබෙන බව. අද මේවාට හොඳ නීතිඥයන්ට ඉදිරිපත් වෙන්න බැහැ. මොකද, හේතුව, දිනපතා මේ නඩු අහගෙන යනවා. මේ නඩු දිනපතා අහගෙන යනකොට අර උසස් නීතිඥයන්ට, නැත්නම් දක්ෂ නීතිඥයන්ට මේවාට පෙනී සිටින්න බැහැ. මොකද, හේතුව, දවසකට ඒ අයට courts ගණනාවක නඩු තිබෙනවා. මේක වෙනම isolated තැනක තිබෙන්නේ. මේ විශේෂ මහාධිකරණ තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය ළඟ හෝ වෙනත් තැනක නම්, ඒ අයට එන්න පුළුවන්. හැබැයි, දැන් වෙලා තිබෙන දේ මේකයි. දවස ගාණේ මේ නඩු අහන්න පටන් ගත්තාට පස්සේ ඒ අයට දැන් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා දැන් ඒ අය ඉවත් වෙමින් යනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලනවා, මෙය ක්‍රියාත්මක කරන්න කියලා. හැබැයි දින ගණනක් දාලා ඒ දින ගණන තුළ මේක ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් හදන්න. එතකොට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මේක ඉක්මනින් ක්‍රියාත්මක කරන්නත් පුළුවන්; නීතිඥයන්ට ඉදිරිපත් වෙන්නත් පුළුවන්. නැත්නම් වෙන්නේ නිවැරදිව මේක ක්‍රියාත්මක වෙන්නේ නැති වීමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම සවන් දුන්නා, අපේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගිහාන් කුලතුංග මැතිතුමාගේ කථාවකට. එතුමා කිව්වා, එතුමා කොයිතරම් වේදනාවට පත් වුණාද කියලා. ඉතාම හැඟීම්බර කථාවක් එතුමා කළා. 2020දී එතුමාව පැත්තකට විසි කරලා එතුමාට පහළින් හිටපු හතර දෙනෙකුට උසස්වීම් දුන්නා කියන කාරණය කිව්වා. එතුමා කිව්වා, "අද මට මේ විනිශ්චයකාර ධුරය ලැබිලා තිබෙන්නේ ඇත්ත වශයෙන්ම පද්මන් සූරසේන මැතිතුමා මාව නිර්දේශ කළ නිසා" කියලා. ඒක තමයි අපි දිගටම ඔබතුමන්ලාටත් කියන්නේ, මේ රටේ විනිශ්චයකාරවරු සම්බන්ධව සාධාරණ උසස්වීම් දෙන පටිපාටියක් හදන්න කියලා. නැත්නම් විශාල අර්බුදයක් මේ රටේ ඇති වෙනවා. ඒක අපි දිගින් දිගටම කියන කාරණයක්. ඒකත් මතු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මූලිකවම ඉල්ලීම් කිහිපයක් කළා. අපි දිනපතා නඩු අහන්න ඕනෑ. අපරාධ නඩු විධාන සංග්‍රහය අනුව ගත්තත්, නඩු දිනපතා අහන එක තමයි ක්‍රමය. කල් ඉල්ලන එක තමයි ව්‍යතිරේකය. නමුත්, වසර ගණනාවක් මම ඇතුළුව අපේ වෘත්තිය පුරුදු වුණා, දින ඉල්ලන්න. නමුත්, අපි දුන් ජනතා පොරොන්දුව අනුව අපට ඉක්මනට මේ නඩු අහන්න වෙනවා. ඔබතුමා දන්නවා, Easter attack එකේ චෝදනාම 23,000ක් තිබෙන බව. ඕක මාසයෙන් මාසයට දින දුන්නොත් අවුරුදු 8කටවත්, 10කටවත් අහලා ඉවර කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා දිගටම නඩු අහන්න ඕනෑ. ඒ වාගේම මම පිළිගන්නවා ඒක විවෘත අධිකරණයක් බව. ඒක ටිකක් අලුත්කඩේ උසාවි සංකීර්ණයෙන් බැහැරව තිබෙන්නේ. ඒ, අලුත්කඩේ උසාවි සංකීර්ණයේ ගොඩනැඟිලිවල අඩුපාඩුවක් තිබෙන නිසා. අපි ඒවා හදාගෙන පුළුවන් තරම් අලුත්කඩේ උසාවි සංකීර්ණයට ගෙනෙමු. නමුත්, හැම නඩුවම අලුත්කඩේ අහන්න වෙන්නේ නැහැ.

ඔබතුමා කියපු අනෙක් කරුණු කාරණා සම්බන්ධව මට පැහැදිලි කිරීමක් නැහැ. අවසාන කාරණාව, විනිශ්චයකාරතුමන්ලාගේ promotions සම්බන්ධවයි. මේවා සියල්ලම අධිකරණ සේවා කොමිෂන් සභාවේ වපසරිය තුළ තිබෙන දේවල්. ඒ නිසා මම ඒවා ගැන යෝජනා අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[අ.භා. 5.07]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සම්මත කර ගන්නේ මේ රටේ මත්ද්‍රව්‍ය ජාලයට අදාළ නීතියේ පැවති හිඩැසක් සම්පූර්ණ කරගැනීමේ කාරණාවක් බව මුලින්ම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම එය විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත කියලා තමයි අපි අද සම්මත කර ගන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත කියලා එකක් අපි 2008දී සම්මත කරගෙන තිබෙනවා. ඒකේ අයිස් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් ප්‍රතිපාදන ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, දඬුවම සම්බන්ධයෙන් බැලුවොත්, ලිහිල් දඬුවමක් ඒකේ තිබෙන්නේ. ඒ තත්ත්වය ද අපි ආවරණය කරලා, අයිස් මත්ද්‍රව්‍යයත් එක්ක දඬුවමත් වැඩි කරලා තමයි අලුත් සංශෝධන පනත අද දිනයේ සම්මත කර ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, පසුගිය ඔක්තෝබර් 30වැනි දා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් -මෙහෙය වීමෙන්- අපි "රටම එකට" ජාතික මෙහෙයුම, ඒ මත් විරෝධී ජාතික ව්‍යාපාරය ආරම්භ කළ බව. ආරම්භ කරලා සෑම දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් පාසා දිස්ත්‍රික් කමිටු හදලා, ප්‍රාදේශීය කමිටු හදලා, ගමේ මහජන ආරක්ෂක කමිටු හදලා, මේකට අදාළ දැවැන්ත යන්ත්‍රණයක් ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් සම්මත කර තිබෙනවා. ඒ වාගේම ඒ යන්ත්‍රණය අපි බලගන්වලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ මත්ද්‍රව්‍ය ජාලය සමන්විත වෙන්නේ කරුණු දෙකක් පදනම් කරගෙන. එක කාරණයක් තමයි, supply ජාලය. අනෙක් කාරණය තමයි, demand එක. ඉල්ලුම සහ සැපයුම අතර ප්‍රශ්නයක් මේකේ තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉල්ලුම සහ සැපයුම අතර ප්‍රශ්නයේදී විශේෂයෙන්ම මෙරටට එන මත්ද්‍රව්‍ය සැපයුම් ජාලය පිළිබඳව කල්පනා කරද්දී අපි ඒ සැපයුම් ජාලයට අදාළ මැදිහත්වීම් රාශියක් කර තිබෙනවා. එකක් තමයි, අපි අද දිනයේ සම්මත කර ගන්නෙත්; මේ සංශෝධන පනත ඇතුළේ තිබෙන්නෙත්. ඒ මොකක්ද? මේ සංශෝධන පනත ඇතුළේ තිබෙන්නේ සැපයුම් ජාලය අඩාළ කිරීමට අදාළ නීතියක් සම්මත කර ගැනීම. මේ හිඩැස සම්පූර්ණ වුණේ නැත්නම් අපට ගැඹුරු මුහුදේදී අල්ලා ගන්නා ලද මත්ද්‍රව්‍ය නීතියේ රැහැනට හසු කර ගැනීමට නෛතික ගැටලුවක් ඇති වෙනවා. ඒ අවශ්‍යතාවයි මේ සම්පූර්ණ කර ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ supply ජාලය අඩාළ කිරීම සම්බන්ධයෙන් ගත්තොත්, supply chain එකේ පුරුකෙන් පුරුක උඩට යනකොට මෙතෙක් පැවති ඉතිහාසය ඇතුළේ එක තැනකින් supply ජාලය මෙහෙයවන එක නතර කර තිබෙනවා, හිතාමතා. ඒ නිසා තමයි, මේ supply ජාලයේ උඩ කෙළවරට යනකොට අවසාන පුරුක නතර වුණේ ඉන්දියාවෙන්, නේපාලයෙන්, ඉන්දුනීසියාවෙන්, පාකිස්තානයෙන්. සතුටුයි කියන්න, වත්මන් ආණ්ඩුවේ අපි කරන දේ ගැන. දැන් මෙතැනදී කථා වුණේ, හාල්මැස්සෝ සහ මෝරු ගැන නේ. මෙතෙක් කාලයක් ඔය මෙහෙයුම් ඇතුළේ අරගෙන ඇවිල්ලා තිබෙන්නේ හාල්මැස්සෝ. මෝරු හිටියේ විදේශ රටවල; මෝරු හිටියේ විදේශගත වෙලා. ඒ අය එහේ ඉඳිමින් තමයි යන්ත්‍රණය මෙහෙයවූයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අන්න ඒ supply ජාලය හරියටම හඳුනාගෙන attack කරලා තිබෙනවා. 159වැනි පොලිස් දිනය සමරන වෙලාව වනකොට ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාලයේ සිටින ලොකුම සැපයුම්කරුවන් අත්අඩංගුවට අරගෙන මෙරටට ගේන්න අපි -වත්මන් ආණ්ඩුව- සමත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමයි අපි ඒ supply ජාලයට අවතීර්ණ වෙලා තිබෙන්නේ. මේ වනකොට මේ කියන supply ජාලයට සම්බන්ධ අය විදේශ රටවල අත්අඩංගුවේ පත් වෙමින් තිබෙනවා. ඒ ඒ රටවල නීතිවල තිබෙන වෙනස් තත්ත්වයන් පදනම් කරගෙන ඔවුන් මෙරටට ගෙන ඒම මඳක් ප්‍රමාද වෙලා තිබෙනවා. නමුත්, අත්අඩංගුවේ සිටින සියලුදෙනා මෙරටට රැගෙන ඒමට නියමිතව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් ද නොවෙයි. අපේ අමාත්‍යාංශයට ආරංචි මාර්ගවලින් දැනගන්න ලැබී තිබෙනවා, "මේ supply ජාලය ඇතුළේ අපි ටිකක් අමාරුවක වැටිලායි ඉන්නේ. තමුන්නාන්සේලා පංගු පේරුවකින් තොරව දැන් මේ රටේ හරියටම නීතිය ක්‍රියාත්මක කරනවා. ඒක නිසා භාර වෙන්න, අමාත්‍යාංශයට ඇවිල්ලා භාර වෙන්න අපට අවස්ථාවක් දෙන්න" කියා ඉල්ලන බවක්. අන්න එහෙමයි අපි මේ supply ජාලය නැති කරන්න අපේ මැදිහත් වීම කරලා තිබෙන්නේ.

ඊළඟ කාරණය වන්නේ demand එකයි. Demand එක අඩාළ කිරීම වෙනුවෙන් මෙතෙක් මේ රටේ තිබුණේ අධිකරණ මඟින් යොමු කරන පුනරුත්ථාපනයයි. දැන් අපට පුළුවන් වෙලා තිබෙනවා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හරහා සෑම දිස්ත්‍රික්කයකම දැවැන්ත ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවන්න. ජනාධිපතිවරයා කියලා තිබෙනවා, සෑම දිස්ත්‍රික්කයකම පුනරුත්ථාපන මධ්‍යස්ථාන 2ක් හෝ 3ක් පිහිටුවන්න කියලා. මම ගිය සතියේ අම්පාරට ගියා. අම්පාර සිවිල් ආරක්ෂක කඳවුරේ ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කඳවුර දැක්කාම පුදුම හිතෙනවා. එහි සිටින අයගේ වයස අවුරුදු 14යි, 15යි, 16යි, 17යි, 18යි, 19යි, 20යි, වැඩිම වයස 21යි. එවැනි ළමුන් 53දෙනෙක් ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ගෙනැල්ලා තිබෙනවා. මෙන්න මේ විධියට තමයි වත්මන් ආණ්ඩුව මේ supply ජාලය අඩාල කිරීමටත්, ඒ වාගේම demand එක අඩු කිරීමටත් අදාළව මැදිහත් වෙමින් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අප මෙවැනි ආකාරයේ මැදිහත් වීම් කරද්දී අපේ අවශ්‍යතාව පදනම් කරගෙන නීතියේ යම් යම් සංශෝධන අණ පනත් ගෙනැවිත් තිබෙනවා. මම ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යවරයාත් එක්ක නිතරම කථා කරන දෙයක් තමයි, අල්ලන මත්ද්‍රව්‍යවලට අදාළව කෙසේ කටයුතු කළ යුතුද, ඒවා ක්ෂණිකව විනාශ කර ගන්න පුළුවන් වෙයිද කියන එක. මේ කාරණය ගැන විපක්ෂය පැත්තෙනුත් කියැවුණා. ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාත් කැඳවා සාකච්ඡාවක් කරලා Cabinet Appointed Committee එකකින් දැන් ඒ පිළිබඳව අධ්‍යයනය කරමින් යනවා. අපේ ගරු අධිකරණ අමාත්‍යවරයා නොබෝ දිනකින්ම ඒක මේ සභාවට ගෙන එයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අල්ලා ගන්නා ජාවාරම්කරුවන්ට, විශේෂයෙන්ම එම ජාවාරමේ යෙදී සිටින උදවියට ඇප ලබා නොදීමට අදාළව පනත් කෙටුම්පතක් ගේන්න පුළුවන් නම් හොඳයි. මේ අය නඩු විභාගය අවසන් වන තුරු remand එකේ ඉන්න ඕනෑ. හැබැයි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අධිකරණ අමාත්‍යවරයාම තමයි අපට කියන්නේ, "අල්ලන්න එපා, අල්ලාගෙන ආවට දාන්න තැනක් නැහැ" කියලා. බන්ධනාගාර තදබදය ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේත් කථා වුණා. නමුත් මා හිතනවා, ඊට අදාළ නීති ප්‍රතිසංස්කරණයත් ගෙන ඒම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යවරයා මැදිහත් වෙලා සුදුසු ක්‍රියාමාර්ග ගනීවි කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ගිය මාසයේ අපි මේ සභා ගර්භයේදී සම්මත කර ගත්තා Proceeds of Crime Act එක. එම, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත කෙළින්ම මත්ද්‍රව්‍යවලට සම්බන්ධ පනතක්. ඒ පනතේ ක්‍රියාකාරිත්වය මත අපි දැනට රුපියල් මිලියන 3,089ක වත්කම් තහනම් කරලා තිබෙනවා. විශේෂ මෙහෙයුම් කරලා 1,295,409ක් අදාළ මෙහෙයුම්වලට යටත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව පැහැදිලි වෙනවා මත්ද්‍රව්‍යවලට එරෙහිව දැවැන්ත ව්‍යාපාරයක් වත්මන් ආණ්ඩුව විසින් අරගෙන යන බව. ආණ්ඩුව එහෙම කටයුතු කරගෙන යනකොට මේ වග කිව යුතු විපක්ෂය මොකක්ද කරන්නේ? අජිත් පෙරේරා මහත්මයා අද උදේ නැඟිට්ටා ලු. අද උදේ නැඟිටලා මතුගම පොලීසියට කෝල් එකක් දීලා "මත්ද්‍රව්‍ය අඩු වෙලාද, වැඩි වෙලාද OIC මහත්තයා?" කියලා ඇහුවා ලු. "වැඩි වෙලා" කියලා එයා කිව්වා ලු. ඒ ගමන කළුතර පොලීසියටත් දුරකථන ඇමතුමක් දුන්නා ලු. දීලා, "මත්ද්‍රව්‍ය අඩු වෙලාද, වැඩි වෙලාද?" කියලා ඇහුවා ලු. එතුමාට දීපු උත්තරය වුණේ "වැඩි වෙලා" කියන එක ලු. අපි දන්නේ

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

නැහැ. එහෙම කිව්වාය කියලා එතුමා නේ කියන්නේ. මෙච්චර මෙහෙයුමක් යන වෙලාවකත් අජිත් පෙරේරා වාගේ කෙනෙක් මෙතැනට ඇවිල්ලා මේ වාගේ දේවල් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ක්‍රියාකාරිත්වය ගත්තාම හරිම කනගාටුයි. අද උදේ මෙතැනට ඇවිල්ලා බිල්ලෙක් මැව්වා, විශේෂ මහාධිකරණය සාමාන්‍ය කෙනෙකුට ගිහිල්ලා නරඹන්න බැහැ, මාධ්‍යවේදියෙකුට එතැනට යන්න බැහැ කියලා. ඒක මොන තරම් අමූලික බොරුවක්ද? අධිකරණ අමාත්‍යවරයා ඒකට උත්තර දුන්නා. මම අහන්නේ, එහෙම පවයක් මෙතැන කියන්න පුළුවන්ද? ඒ මන්ත්‍රීතුමා නීතිඥවරයෙක් නේ. වෘත්තියෙන්ම නීතිඥවරයෙක් නම් මෙතැන ඒ තරම් පහළට වැටෙන්නේ ඇයි? මතුගම පොලිසියට කථා කරලා මත්ද්‍රව්‍ය අඩු වෙලාද, වැඩි වෙලාද කියන කාරණය එතුමා තීරණය කරනවා. පුදුම වැඩක්!

අපේ ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමාට විරුද්ධව බොරුවට set කරලා, ගංජා පැළයක් දාලා, ඒ ගමන්ම ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවලා අජිත් පෙරේරා මහත්මයා ඒ ගැන කිව්වා. වල් පැළ, මල් පැළ කථාව එතැනින් ආවේ. "මෙන්න ශාන්ත පද්ම කුමාර ගංජා විකුණනවා" කිව්වා. මම කියන්නේ, ඒක set කරපු එකක්. ඒක දැන් අධිකරණයට භාර දීලා තිබෙන කාරණයක්. දැන් ඔප්පු වෙලා තිබෙනවා, ඒ මන්ත්‍රීවරයා ඒවාට කිසිසේත් සම්බන්ධ නැහැ කියලා. එහෙම තිබියදී දුවගෙන ගිහින් ප්‍රවෘත්ති සාකච්ඡාවක් කරනවා. ඔන්න, වගකිව යුතු විපක්ෂය. මේවායි විපක්ෂයේ වැඩ. මේක පුදුම විපක්ෂයක්!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී වෙලා තිබෙන්නේ මොකක්ද? මෙතුමා කියපු උදාහරණයම තමයි කියන්න තිබෙන්නේ. මුහුදේ ඉන්න කැස්බෑවා ගොඩට අරගෙන ඇවිල්ලා ගේට්ටු කණුවක ගැහුවාම ඒ කැස්බෑවා පුළුවන් තරම් බඩට ගහ ගන්නවා; පපුවට ගහ ගන්නවා. අත පය දිගු කරන එක නේ කරන්නේ. ඉබ්බා අනෙක් පැත්ත හැරෙව්වත් එහෙමයි. ඉබ්බා කරන්නේත් ඒ වාගේ අත පය වන වනා ඉන්න එකයි. අන්න ඒ වාගෙයි විපක්ෂයත්. මෙතැනට ඇවිල්ලා කියන්න දෙයක් නැති වුණාම, මෙතැනට ඇවිල්ලා මොකක් හරි බෙගලයක් අත් හරිනවා. විපක්ෂ නායකතුමා අද උදේ මෙතැනට ඇවිල්ලා මොකක්ද කිව්වේ? රටේ ගෑස් පෝලිමක් තිබෙනවා කිව්වා. මම අහන්නේ, වගකිව යුතු විපක්ෂ නායකයෙකුට ගෑස් පෝලිමක් තිබෙනවා කියලා කියන්න පුළුවන්ද? මට හිතෙන විධියට මේකයි වෙන්න ඇත්තේ. හීනෙන් දැක්කා, පෝලිමක්. මොකද, ප්‍රාර්ථනා කරන්නේ පෝලිමක් හරි මොකක් හරි නිර්මාණය වෙලා මේ රටේ විපක්ෂයට භූමිකාවක් හැදේවා කියලා නේ. ඒ නිසා හීනෙන් දැක්කා, පෝලිමක්. ඒ හීනය දැකලා එනකොට ගේට්ටුව ළඟදී කෙනෙක් ඇහුවා, "විපක්ෂ නායකතුමා කොහේද යන්නේ?" කියලා. "මම පාර්ලිමේන්තු යනවා" කියලා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙලායි තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි කිහිපයක් දෙන්න. අවසන් කථාව නේ. පිළිතුරු කිහිපයක් දෙන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊට පස්සේ විපක්ෂ නායකතුමා මොකක්ද කිව්වේ? හීනෙන් දැකපු පෝලිම ගැන මෙතැනට ඇවිත් කිව්වා. යථා ලෝකයේ එහෙම පෝලිමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගෑස්වලට ටෙන්ඩර් දාලා නිසි ක්‍රියා පටිපාටියේ යන්න යනකොට ඒගොල්ලන්ම පිළිගන්නවා, ගණන අඩු එකටයි අපි එය දීලා තිබෙන්නේ කියලා. යම්කිසි ප්‍රමාදයක්, අතපසු වීමක් තිබෙන්න පුළුවන්. නමුත් එහෙම වුණා කියලා සම්පූර්ණ process එක අවසන් වෙන්නේ කොහොමද? ඒ නිසා, විපක්ෂය පැත්තෙන් ගත්තාම මේක හරිම කනගාටුදායක තත්ත්වයක්.

ඊයේ නාමල් රාජපක්ෂ මහත්මයා තව කථාවක් කිව්වා. සංවිධානාත්මක අපරාධ කල්ලි පිටුපස ආණ්ඩුව ඉන්නවා කිව්වා. මොකක්ද මේ කථාව? අප අද සම්මත කර ගන්නා නීතිය ඒගොල්ලන් දැක්කේ නැද්ද, ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ? ඒගොල්ලන් ගැඹුරු මුහුදේ ඒ වාගේ දේවල් කරන්න ඉඩ හැරියා. ගැඹුරු මුහුදේ ඒ වාගේ දේවල් කරන්න ඉඩ හැරලා දැන් අපි ඒවාට ආවරණය ගෙනෙනකොට අපට කියනවා, අප සංවිධානාත්මක අපරාධ කල්ලි පිටුපස ඉන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාතාලය හැදුවේ, වැඩුවේ, කිරි පෙව්වේ සේරම කළේ, - මේ සංවිධානාත්මක අපරාධ කල්ලි එක්ක තමයි රට නිදා ගන්නේත්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෙතැනට ඇවිත්, අපේ පැත්තට ඇඟිල්ල දික් කරනවා. මේ හදන්නේ වෙන මොකක්වත් නොවෙයි, ඒගොල්ලන්ගේ ඇඟේ තිබෙන ජරාව පොඩ්ඩක් අපේ පැත්තේ තවරලා, "අනේ, ඔයගොල්ලනුත් ගඳයි නේ" කියන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න, දැන් ගරු කථානායකතුමාට මොන තරම් ආරෝපිත වාක්‍ය කියනවාද කියලා. අපේ අග්‍රාමාත්‍යතුමියට, මේ සභාවේ ඉන්න අපේ මන්ත්‍රීවරියන්ට මොන තරම් ආරෝපිත කුණුහරුප මේ පාර්ලිමේන්තුවේදී කියනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා හරිම හිරිකිතයි. හිරිකිත විපක්ෂයට අද මොනවත් කියන්න දෙයක් නැති වනකොට මේ පැත්තට චෝදනා එල්ල කරනවා, "නැහැ, ඔයගොල්ලනුත් ගඳයි නේ" කියලා. දැන් ශාන්ත මන්ත්‍රීතුමාට දාන්න හැදුවේ එහෙම චෝදනාවක්. ගරු කථානායකතුමාට ආරෝපිත චෝදනාවක් ගෙනෙන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔක්කෝම පොදුයි, අපි ඔක්කෝම එකයි කියන්න ඒගොල්ලන් හදනවා.

අපි ජාතිවාදයක් ගැන හිතලාවත් නැහැ. ජාතිවාදය ගැන කථාවක් පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ පැත්තෙන් ආවා; තවත් මුස්ලිම් මන්ත්‍රීවරයෙකුගේ පැත්තෙන් ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිවාදයට ජාතික ජන බලවේගය ඉඩක් තියලා නැහැ. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ කියන අපි කවුරුත් ජාතික සමගිය පැත්තෙන් තමයි අද වනකොට කටයුතු කරගෙන යන්නේ; ඒකට රිදිලා. බිමල් රත්නායක සහෝදරයා කිව්වා වාගේ බඩගින්නේ ඉන්නේ. විපක්ෂය බඩගින්නේ ඉන්නේ; ජාතිවාදය නමැති බඩගින්න. අයියෝ, එහෙම එකක් ආවොත් තමයි අපට පැවැත්මක් තිබෙන්නේ කියායි ඒ අය හිතන්නේ. අපි දවසින් දවස ඒ තත්ත්වය අහෝසි කරමින් යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂ නායකතුමාට ආදරය කරන්න ඕනෑ. අපි හදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විපක්ෂ නායකතුමාට එම

තනතුරේම විරාත් කාලයක්, මැරෙනකම්ම ඉන්න දෙනවා. විපක්ෂ නායකකමේ යාවජීව සාමාජිකත්වය එතුමාට දෙනවා, අද දවසේ කියපු ටොන් පවය නිසා. බලන්නකෝ, විපක්ෂ නායකවරයෙක් මේ තරම් පල්ලම් බහිනවාද කියලා. මේ සභාවට ඇවිල්ලා සමහර වෙලාවට divisions ඉල්ලනවා; විවාදයට බෙදීම් ඉල්ලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙදීමක් ඉල්ලනකොට මේ පාර්ලිමේන්තුවේ කාලය කොච්චර ගත වෙනවාද? නමුත්, බෙදීම ඉල්ලන කෙනා විතරයි මේ සභාවේ වාඩි වෙලා ඉන්නේ. හරි ලජ්ජයි! මේ වෙලාවේදී විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් සභාවේ නැහැ. විවාදයක් අවසන් කරන වෙලාවේ විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් සභාවේ නැහැ. හැබැයි, පළමුවැනි පැයේ මාර විධියට මුහුණ පෙන්වලා, මුහුණත් තහඩුව දාලා ෆේස්බුක් එකට, කට් එක අරගෙන යනවා. අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ ස්ථාවර නියෝග 27(2) උල්ලංඝනය කළා. මේ සභාව තනිකර කෝළම් මඩුවක් කර ගන්න යනවා. එහෙම කරන්න දෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ශිෂ්ටසම්පන්න පාර්ලිමේන්තුවක් වෙන්න ඕනෑ. ආරෝපිත කුණුහරුප ගැන අපි Parliamentary Business Committee එකේදී කථා කළා. ආරෝපිත කුණුහරුප ගැන අපි පක්ෂ නායකයන්ට දැනුම් දීලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුව ආරෝපිත කුණුහරුප කියන අය සම්බන්ධයෙන් action එකක් ගන්න ඕනෑ. එහෙම දේවල් කියන්න දෙන්න බැහැ. මේ මන්ත්‍රීවරියන්ට කියන කුණුහරුප බලන්න. ඒගොල්ලන්ට කියන්න දෙයක් නැති වනකොට, සටන් පාඨයක් නැති වනකොට පට්ටපල් කුණුහරුප මේ සභාවේ කියනවා, ගැලරියේ ළමයි ඉන්නකොට පවා. කලින් පැවති පාර්ලිමේන්තුවල එහෙම දේවල් වෙන්න ඇති. නමුත්, මේ පාර්ලිමේන්තුව තුළ එහෙම දේවල් වෙන්න ඉඩ දෙන්න බැහැ. අපි Parliamentary Business Committee එකේදී ඒවා සම්බන්ධව තීන්දු තීරණ අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි කාරණයක් කියලා කථාව අවසන් කරන්නම්. මේ මත්ද්‍රව්‍ය ජාලය තුළ ඉතා අවාසනාවන්ත තත්ත්වයක් තිබෙන්නේ. ඒක මේ රටේ ආණ්ඩුවට යටින් තිබෙන කළු ආණ්ඩුවක්. දශක ගණනාවක් තිස්සේ මේ දේශපාලන අධිකාරිය විසින් පෝෂණය කළ කළු බිස්නස් එකක් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කළු බිස්නස් එක පිටුපස හිටියේම දේශපාලනඥයන්; මේ දියවන්නාව හිටියේ. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව ඇවිල්ලා තමයි දේශපාලනය නැමති ඒ සහයෝගය පැත්තකින් තැබුවේ.

දැන් මේ නිලධාරින්ට වගකීමක් තිබෙනවා. මේ රටේ පුරවැසියා සම්බන්ධ කර ගත්ත ගමනක් අපි මේ මත්ද්‍රව්‍ය ජාලය තුළ යනවා. දැන් අවාසනාවන්ත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ මත්ද්‍රව්‍ය ජාලයේ ඉන්න සියලුදෙනාට අපි කියනවා, අපේ රට අපි ආරක්ෂා කර ගනිමු කියලා. "ඉවත් වෙනු" කියන සටන් පාඨය ආවේ ඒකටයි. කොලොම්බියාවේ Pablo Escobar හැඳින්වූයේ "කොකේන් රජා" කියලා. ඒ කොකේන් රජාට මොකක්ද වුණේ? අන්තිමට මුළු රටම නැති කරලා, ළමයින්ට කුඩු විකුණලා, තමන්ගේ පුතා අසනීප වෙලා ඔහුව උණුසුම් කරන්න අවශ්‍ය වුණු වෙලාවේදී ඒ එකතු කර ගත්ත සල්ලි පුච්චලා තමයි කොකේන් රජාට ඒ කටයුත්ත කරන්න සිද්ධ වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සල්ලිවලින් වැඩක් නැහැ. ඒක නිසා මේ මත්ද්‍රව්‍ය ජාලයේ ඉන්න සියලුදෙනාට වාගේම supply chain එකේ ඉන්න සියලුදෙනාට අපි කියනවා, ඔබ විනාශ කරන්නේ අපේ රට, අපේ දරුවා කියන එක. ඒක නිසා රටක, ලෝකයක දරු පරපුරක් විනාශයට ඇද දමා එවැනි නීති විරෝධී ක්‍රියාවලින් අසාමාන්‍ය ධනයක් උත්පාදනය කරලා, තමන්ගේ දරුවන්ට සැප පහසුව හදන එක නොවෙයි විය යුත්තේ. මුළුමහත් ලෝකයේම දරුවන් ජීවත් විය යුතුයි. මේ රට විතරක් නොවෙයි, ලෝකයේම දරුවන්ගේ හෙට දවස වෙනුවෙන් තමයි, මෙවැනි පනත් නිර්මාණය කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි පනතක් තමයි, අද අපි මේ ගරු සභාවට ගෙනැල්ලා සම්මත කර ගන්නේ. ඒවා සම්මත කර ගන්නවා විතරක් නොවෙයි, ඒ පනත් ක්‍රියාත්මක කරනවා කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
## நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
## POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara.]*

***කාරක සභාවේහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (218 වන අධිකාරයට 54අඅ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
### வாசகம் 2.- (218ஆம் அத்தியாயத்தின் 54அஅ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 2.- (*Insertion of new section 54AA in Chapter 218)*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 13 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නොවන යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැවක හෝ අදේශික නැවක සිටින අතරතුර, මහ මුහුදේ දී, මතු දැක්වෙන අන්තරායදායක ඖෂධවලින් යමක්, එනම් හෙරොයින්, කොකේන්, මෝෆීන් හෝ අබිං නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට මරණීය දණ්ඩන නියමයට හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයට යටත් විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ නොවන යම් තැනැත්තකු විසින්-

(අ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැවක හෝ අදේශික නැවක සිටින' "

(2) "2 වන පිටුවේ, 4 වන සහ 5 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා සන්තකයේ තබා ගනු ලබන හෝ ජාවාරම්' "

(3) "2 වන පිටුවේ, 18 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' "මහ මුහුද" යන්නෙන්, ජාත්‍යන්තර නීතිය යටතේ වූ අනන්‍ය ආර්ථික කලාපයේ නෛතික තත්ත්වයට අගතියකින් තොරව, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රාජ්‍යයක දේශීය ජල තීරයෙන් ඔබ්බට වූ සියලු ජල තීර අදහස් වේ;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 3 to 10 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරමි.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල්තබන අවස්ථාවේ ප්‍රශ්න.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පළමුවන ප්‍රශ්නය, ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා.
- *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඉල්ලා තිබුණු තොරතුරු ලබා ගැනීම පිණිස මා අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කළා. නමුත් මේ දක්වා ඒ තොරතුරු ලැබුණේ නැහැ. ඒ නිසා අද මට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න හැකියාවක් නැහැ. ඒ සම්බන්ධයෙන් මා ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාව දැනුවත් කළා. ඒ නිසා තමයි එතුමා මේ සභාවේ නැත්තේ. ඒ නිසා එතුමාට අගතියක් නොවන්න මම මේ කාරණය කියන්න ඕනෑ. මොකද, එතුමා මේ සභාවේ නැත්තේ, මාගේ දැනුම් දීම මත. මොකද, මට ඒ තොරතුරු ලබා ගන්න බැරි වුණා. ඒ නිසා, එතුමාගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉදිරි කටයුතුවලදී අගති රහිත වන ලෙස මේ සම්බන්ධයෙන් සටහනක් තබන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ඊළඟ ප්‍රශ්නය, ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සභාව කල් තබන අවස්ථාවේදී, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් මා මෙම ප්‍රශ්නය අහනවා.

මාදැල් ධීවර කර්මාන්තය සම්ප්‍රදායික පන්න ක්‍රමයක් ලෙස මෙරට ධීවර ප්‍රජාව අනාදිමත් කාලයක පටන් පවත්වාගෙන එන, පරිසරය සමඟ සම්බන්ධව සිදු කරන මසුන් මැරීමේ ක්‍රමයකි.

01. මෙරට මාදැල් කර්මාන්තය බහුලව ක්‍රියාත්මක වන ප්‍රදේශ මොනවාද?

02. එලෙස ක්‍රියාත්මක මාදැල් කර්මාන්තයේ නිරතවීම සඳහා රජය විසින් බලපත්‍ර ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද? එසේ නම් ඒ සඳහා යම් කොන්දේසි පනවා තිබේද? තිබේ නම් ඒ මොනවාද?

03. මිනිස් ශ්‍රමය යොදා ගෙන කරන මෙම කර්මාන්තය සඳහා ට්‍රැක්ටර් හා වින්ච් යොදා ගැනීමට ඒ යටතේ අවසර තිබේද?

04. එසේ අවසර දී තිබේ නම් ඒ කවර කාල සීමාවකදී ද? එම අවසරය ලැබූ පිරිස කොපමණද?

05. මේ වනවිට මාදැල් කර්මාන්තය සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම තහනම් කර තිබේද? එසේ නම් ඒ මන්ද?

[ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා]

06. මේ වනවිට ධීවර කණ්ඩායමක් විසින් මතු කරන යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ ගැටලුව සඳහා රජය විසින් ගනු ලබන පියවර මොනවාද?

ඊට අමතරව වින්ච් සහ ට්‍රැක්ටර් පාවිච්චි කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදය කුමක්ද සහ මාදැල් සඳහා මුහුදේ දුර ප්‍රමාණයක් තිබෙනවාද, ඒ සම්බන්ධව අමාත්‍යාංශවලින් නියාමනයක් සිදු කරනවාද කියාත් මා දැනගන්න කැමතියි.

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

01. දිවයින වටා පිහිටි ධීවර දිස්ත්‍රික්කයන්ට අදාළව මාදැල් බලපත්‍ර ලබා දී ඇති ප්‍රමාණයන් පහත දැක්වේ.

- කොළඹ - 26
- හලාවත - 09
- පුත්තලම - 96
- මන්නාරම - 39
- යාපනය - 75
- මුලතිව් - 84
- ත්‍රිකුණාමලය - 111
- මඩකලපුව - 144
- කල්මුණේ - 133
- මාතර - 04
- ගාල්ල - 50
- කළුතර - 22
- තංගල්ල - 130

ඒ අනුව ලබා දී ඇති මුළු මාදැල් බලපත්‍ර සංඛ්‍යාව 935ක් වේ.

02. ඔව්.

මාදැල් ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

i. මාදැල් වරාය අවසර පත්‍රය
ii. මාදැල් ධීවර මෙහෙයුම් බලපත්‍රය
iii. මාදැල් ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ සහතිකය

එම බලපත්‍රවල සඳහන් කර ඇති කොන්දේසි පහත පරිදි වේ.

i. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ නියමයන් සහ විධිවිධාන සහ එම පනත යටතේ බලපවත්නා නියෝග යටතේ කටයුතු කිරීම.
ii. මාදැල් වට කිරීම සඳහා භාවිත කරනු ලබන ධීවර යාත්‍රාව සම්බන්ධ සියලු තොරතුරු.
iii. බලපත්‍රය යටතේ අවසර ලබා දී ඇති පන්න ක්‍රමය වර්ගය, ප්‍රමාණය, පිරිවිතරයන්.
iv. ධීවර මෙහෙයුම් සිදු කරන ප්‍රදේශය, ගොඩබාන ස්ථානය, මසුන් අල්ලන කාල පරිච්ඡේදය, මසුන් අල්ලන වේලාව, බලපත්‍රය යටතේ අල්ලා ගැනීමට අවසර දී ඇති මසුන් වර්ග.

03. නැත. මාදැල් සඳහා කිසිදු යාන්ත්‍රික යාත්‍රාවක්, යාන්ත්‍රික උපකරණයක් යොදා ගත නොහැකිය. 1984 මාදැල් ධීවර නියෝග මාලාවේ 29වන නියෝගය අනුව,

"(i) කිසිම තැනැත්තෙකු විසින් 4 වන නියෝගයේ සඳහන් කර ඇති කාල සීමාව තුළදී කිසියම් මාදැල් වරායක ජල ප්‍රදේශය ඇතුළත යම් යාන්ත්‍රික යාත්‍රාවක් භාවිත නොකළ යුතුය.

(ii) කිසිම තැනැත්තෙකු විසින් මාදැල් එළීමෙන් මසුන් ඇල්ලීමේ කාර්යය සඳහා කිසියම් මාදැල් වරායක් ඇතුළත කිසියම් යාන්ත්‍රික යාත්‍රාවක් භාවිත කිරීම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතුය."

මෙම නියෝගයට අතිරේකව 1984 මාදැල් නියෝග මාලාවේ 33 නියෝගයේ "මාදැල" යන්නට ලබා දී ඇති අර්ථ නිරූපණයට අනුව, "මාදැල කොහු කඹ දෙකක් ආධාරයෙන් වෙරළේ සිට මිනිසුන් කණ්ඩායම් දෙකක් මඟින් ක්‍රම ක්‍රමයෙන් කායිකව අදිනු ලැබිය යුතු බවට සඳහන් වේ."

04. 2015.06.29වන දින එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් විසින් ත්‍රිකුණාමලය, මුලතිව්, පුත්තලම හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි සහකාර අධ්‍යක්ෂවරුන්ට නිකුත් කර ඇති ලිපි අනුව මාදැල් ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර කාර්මිකයින් සඳහා වින්ච් යන්ත්‍ර යොදා ගනිමින් මාදැල් ධීවර කටයුතුවල නිරත වීමට සමස්ත ලංකා මාදැල් ධීවර හිමියන්ගේ සංගමය විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනිමින් සහ 2015.05.14 දින පැවැත් වූ එම සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ගන්නා ලද තීරණයන්ට අනුකූලව දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා තාවකාලික අවසර ලබා දීමක් පහත ආකාරයට ලබා දී ඇත.

<u>2015.06.29</u>

- පුත්තලම - 18
- මුලතිව් - 17
- මන්නාරම - 06
- ත්‍රිකුණාමලය - 09

<u>2015.09.30</u>

- පුත්තලම - 07
- ත්‍රිකුණාමලය - 04

<u>2016.02.10</u>

- පුත්තලම - 01
- මුලතිව් - 01
- මන්නාරම - 01
- මීගමුව - 04
- යාපනය - 02

නමුත්, එම තාවකාලික අවසරය ද 2016.02.29 දින එම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්ම මාස 8ක් වැනි කෙටි කාලයක් තුළින් මුහුදු වෙරළට සිදු වන හානිය හා අනෙකුත් අප්‍රතිකාරී හානි මත සමස්ත ලංකා මාදැල් සංගමය වෙත මාදැල් සඳහා වින්ච් යොදා ගැනීමට ලබා දී

තිබූ තාවකාලික අවසරය අත්හිටුවන බවට දන්වා ඇත. එම තාවකාලික අවසර ලබා දීම අත්හිටුවන බවට සියලු සහකාර අධ්‍යක්ෂවරුන් වෙත ද 2016 වර්ෂයේ මැයි මස දන්වා ඇත.

05. 1984 මාදැල් ධීවර නියෝග මාලාවට අනුව යාන්ත්‍රික උපකරණ භාවිත කිරීමට අවසර ලබා දී නොමැත. ඒ අනුව අලුතින් තහනම් කිරීමක් සිදු කිරීමට අවශ්‍යතාවක් නොතිබිණ. දැනට ක්‍රියාත්මක වන සියලුම මාදැල් ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම සිදු කර ඇත්තේ එම නියෝග මාලාවේ සඳහන් නියමයන්ට අනුවයි. ඉන් බැහැරව කිසිදු පුද්ගලයෙකුට මාදැල් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැත. කිසිදු පුද්ගලයෙකු එම නියෝග මාලාවට පරිබාහිරව කටයුතු කරන්නේ නම් එය නීත්‍යානුකූල නොවන ආකාරයට මැදැල් ධීවර මෙහෙයුම්වල නිරත වීමක් බව දැක්විය හැක.

06. 2026.02.13 වන දින සමස්ත ලංකා මාදැල් ධීවර සංගමය අතිගරු ජනාධිපතිතුමා හමු වී සිදු කරනු ලැබූ සාකච්ඡාවෙන් අනතුරුව තීරණය කර ඇත්තේ, මීට අදාළ වන රජයේ සියලු පාර්ශ්වකරුවන් වන,

1. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
2. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
3. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - NARA
4. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - CC & CRM Department
5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - MEPA
7. මධ්‍යම පරිසර අධිකාරිය - CEA

යන ආයතන නියෝජනය කරමින් සාමාජිකයින් සහ සමස්ත ලංකා මාදැල් සංගමය නියෝජනය කරමින් සාමාජිකයින්ද ඇතුළත්ව සැදුම්ලත් කමිටුවක් පත් කිරීම සහ එම කමිටුව මඟින් මෙම ගැටලුව සම්බන්ධයෙන් පුළුල් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර ඇත.

එම කමිටුවේ මූලික රැස්වීමක් 2026.02.16වන දින පවත්වන ලද අතර, මාස 3ක් ඇතුළත මේ සම්බන්ධව නිර්දේශ ලබා දීමට තීරණය විය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - NARA එකේ - මූලිකත්වයෙන් සිදු කිරීම සඳහා කාල රාමුවක් සකස් කර පෙබරවාරි මස අවසන් සතියේ සිට එම අධ්‍යයනය ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.44ට, 2026 පෙබරවාරි 20වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.44க்கு, பாராளுமன்றம் 2026 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.44 p.m. until 9.30 a.m. on Friday, 20th February 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.